කොවිඩ් ව්‍යාප්තිය




# දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின




සතියේ තුනපහ මඩිස්සලේ බද්දර මල්ල අද පත්‍රය සමග

ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ මැදින් අව දියවක ලත් කුජ දින | කාණ්ඩය 112 | පත්‍රය 89 | පිටු 32 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 මාර්තු 30 අඟහරුවාදා



# චීන - ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික සබඳතා සවිමත් කෙරේ

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සහ චීන ජනාධිපති ෂී ජිං පින් මහතා ඊයේ (29) සවස දුරකතන සංවාදයක නිරත වෙමින් සෑම ක්ෂේත්‍රයකම අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සහිත ද්විපාර්ශ්වික සහයෝගිතාව ශක්තිමත් කොට වර්ධනය කිරීමට එකඟත්වය පළ කළහ. පිට 06



# පිළිකාකාරක අඩංගු බව දෙවැනි වරටත් තහවුරුයි

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

## 'ඇෆ්ලටොක්සින්' අඩංගු පොල්තෙල් වෙළෙඳපොළට නිකුත් වී නෑ

රජය අවධාරණය කරයි

අනුර ප්‍රේමලාල්

අලි බ්‍රදර්ස් පෞද්ගලික සමාගම, එදිරිසිංහ එඩිබල් හා කටාන රිෆයිනරීස් යන සමාගම් ඉන්දියාවෙන් ආනයනය කළ පිරිපහදු නොකළ පොල්තෙල් තොගවල ඇෆ්ලටොක්සින් නමැති ප්‍රබල පිළිකා කාරකය ඉහළ ප්‍රතිශතයකින් අඩංගු බවට දෙවන වරටත් ඊයේ සනාථ වූ බව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සඳහන් කරයි. ඒ අනුව එම තෙල් තොග සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීම සඳහා එම වාර්තා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කර තිබේ. පිට 06

## ඉදිරි වසර පහට බදු වෙනස් කරන්නේ නෑ

ජනාධිපති ලේකම් ආචාර්ය පී.බී. ජයසුන්දර පිට 06



# LTTEයට උදවු කරන වෙබ් අඩවියක් පවත්වා ගෙන ගිය දෙදෙනෙක් අත්අඩංගුවට

පිට 06



## තෙල බෙදූ ආණ්ඩුව තෙල්වලින් නාගෙන

පහන් විජේසේකර

ප්‍රසුගිය මැතිවරණවලදී ජනතාවට තෙල බෙදමින් බලය හිමි කර ගත් ආණ්ඩුව දැන් පොල්තෙල් සහ බොරතෙල්වලින්ම නාගෙන සිටිනවා යැයි සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී කබීර් හෂීම් මහතා පැවසීය. පිට 06



කොවිඩ් 19 තත්ත්වය හමුවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතියෙන් සෞඛ්‍ය නීති රීතිවලට අනුගතව ඊයේ (29) බස්නාහිර පළාතේ පාසල්වල සියලු ශ්‍රේණිවල අධ්‍යාපන කටයුතු ආරම්භ කෙරිණි. ඡායාරූපයේ දැක්වෙන්නේ කොළඹ රාජකීය විද්‍යාලයේ 2021 පළමු ශ්‍රේණියට ඇතුළු වූ ශිෂ්‍ය මල්ලිලාගෙන් පන්තිය විමසන ශිෂ්‍ය නායක අයියලා පිරිසක්.

ඡායාරූපය - සමන් ශ්‍රී වෙදගේ

## බස්නාහිර පාසල් සිසුන්ගේ පැමිණීම ඉහළ අගයක

පළාත් අධ්‍යක්ෂ ශ්‍රී ලාල් නෝනිස්

සිතාරා සේනානි

බස්නාහිර පළාතේ පාසල්වල සියලු ශ්‍රේණිවල අධ්‍යයන කටයුතු ඊයේ (29) ආරම්භ වූ අතර, එදින සිසු සිසුවියන්ගේ පැමිණීම සියයට අසූවක් වැනි ඉහළ අගයක පැවති බව බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ශ්‍රී ලාල් නෝනිස් මහතා දිනමිණට පැවසීය. පිට 06



## වන විනාශයේ යම් පාලනයක් කළත් සම්පූර්ණයෙන් නවත්වන්න බැහැ

පිට 06

## රට පුරා රිය අනතුරුවලින් දිනකදී 7ක් මරුට 42කට තුවාල

රක්ෂණී ශ්‍රියන්ත

දිවයිනේ විවිධ ප්‍රදේශවල පෙරේදා (28) සිදුවූ රිය අනතුරුවලින් පුද්ගලයන් 7 දෙනකු මියගොස් 42ක් තුවාල ලබා ඇති බව පොලිසිය පවසයි. පිට 06

## මිලේච්ඡ ත්‍රස්ත ක්‍රියා සැලසුම් කරන, අනුබල දෙන කිසිවකුට නීතියේ රැහැනින් මිදී යෑමට ඉඩ දෙන්න එපා

අගරදගුරු පදවි විශේෂ කම්ටුව පිට 06

## කෝවිඩ් වැලඳී මිය ගිය ෂෙයික්ගේ මව්පියන් ගොනු කළ පෙත්සම විභාගයට

විනිසුරුගේ අකැමැත්ත පිට 06

## සේනාධිපතිට විදෙස්ගත වීමට අවසර

රෝෂන් තුෂාර

ඇවන්ගාඩ් සමාගමේ සභාපති විශ්‍රාමික මේජර් නිශ්ශංක සේනාධිපති මහතාට ලබන 23 දින දක්වා විදෙස්ගත වීම සඳහා අවසර දෙන ලෙස කොළඹ මහාධිකරණ ත්‍රිපුද්ගල විනිසුරු මඬුල්ල ඊයේ (29) නියෝග කළේය. පිට 06



## ජිනීවා යෝජනා ක්‍රියාවට නැංවුවොත් සාම සාධක හමුදාවක් පැමිණීමේ අවදානමක්

එම්.ඒ. සුමන්තිරන් පිට 06

## විදේශයෙන් ආනයනය සීමා කළ කෘෂි භෝග අලුතින් වගාවට හෙක්ටයාර 18,000ක් මහවැලියෙන්

මහින්ද අලුත්ගෙදර

විදේශ රටවලින් ආනයනය සීමා කළ කෘෂි භෝගයන්හි අවශ්‍යතාව සම්පූර්ණ කිරීම වෙනුවෙන් හෙක්ටයාර 18,000ක් අලුතින් වගා කිරීමට රජය තීරණය කරයි. පිට 06



# මහනුවර වටපුළුවේ සච්නි පියාගේත් සහාය ඇතිව
# පරිසර හිතකාමී කාබන් පෑනක් හදයි

**බුද්ධිකා ඉඹුලාන**

පාසල් පද්ධතියෙන් හා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කාර්යාලවලින් බැහැර කරන ප්ලාස්ටික්වලින් තැනූ කාබන් පෑන් නිසා සිදු වන පරිසර හානිය වැළැක්වීමට විකල්පයක් වශයෙන් දිරාපත් වන ද්‍රව්‍ය භාවිතයෙන් සකස් කළ මුළුමනින්ම පරිසර හිතකාමී කාබන් පෑනක් මහනුවර වටපුළුවේ සච්නි ක්‍රිස්ටිනා සුගිර්දන් මෙණෙවිය හා ඇයගේ පියා වන සුගිර්දන් මහතා විසින් හඳුන්වා දී තිබේ.

මේ නව නිපැයුම මුළුමනින්ම පරිසර හිතකාමී වන අතර හිස් වූ කාබන් පෑන් බැහැර නොකර එය පසෙහි රෝපණය කිරීම මගින් එළවළු හා පලතුරු පැළ වගා කිරීමට ද හැකි වන පරිදි මේ නව නිපැයුම හඳුන්වා දී තිබීම සුවිශේෂත්වයකි.

සච්නි ක්‍රිස්ටිනා සුගිර්දන් දැරිය හා ඇයගේ පියා විසින් නිපදවන ලද පරිසර හිතකාමී කාබන් පෑන ඊයේ (29) පෙරවරුවේ පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා වෙත පිළිගන්වනු ලැබීය.

මෙහිදී අදහස් පළ කළ ඇමැතිවරයා අපේ රටේ දිනපතා පාසල් පද්ධතියෙන් පමණක් හිස් කාබන් පෑන් කිලෝ ග්‍රෑම් 80-100ක් අතර පමණ ප්‍රමාණයක් බැහැර කරන බව සඳහන් කළේය. මේ අන්දමින් පරිසරයට බැහැර කරන ප්ලාස්ටික් කාබන් පෑන් නොපෙනී දිරාපත්වීමට අඩු තරමින් වසර 100ක් පමණ ගත වන අතර ක්ෂුද්‍ර ප්ලාස්ටික් අණු වසර 400ක් පමණ පසේ නොදිරා පවතින බව තහවුරු වී ඇතැයි කීය.

එමෙන්ම මේවා පරිසරයට එක්වීම වැළැක්වීමට විශේෂ බහාලුමක් පරිසර අමාත්‍යාංශය විසින් හඳුන්වා දී ඇති අතර එමගින් එකතු කරන කාබන් පෑන් හා දත් බුරුසු INSEE සිමෙන්ති සමාගම හා එක්ව විනාශ කෙරේ. එහෙත් කාබන් පෑන් පිලිස්සීමේ දී ඉන් නිකුත් වන කාබන් සහිත වාතය නිසා වායු ගෝලය අපවිත්‍ර වේ.

එම නිසා මේ දිරාපත් වන අමුද්‍රව්‍යවලින් සකස් කරන ලද කාබන් පෑන ඉතාමත් කාලෝචිත බවත්, පරිසරය සුරක්ෂිතතාව උදෙසා එම දැරිය විසින් සිදු කරන ලද සේවය ඇමැතිවරයා අගය කළේය. මෙවැනි නිෂ්පාදනයක් මින් පෙර ලෝකයේ කිසිදු රටක නිපදවා ඇති බවක් වාර්තා නොවන බව කී ඇමැතිවරයා පැළ රෝපණය හැකි කාබන් පෑනක් යනු ලෝකයේ පළමු වතාවට නිපදවන ලද නිෂ්පාදනයක් විය හැකි බව ද පෙන්වා දුන්නේය. මෙහිදී ඇමැතිවරයා විසින් සුගිර්දන් මෙණෙවිය ඇගයීමේ සහතික පත්‍රයක්ද පිළිගන්වනු ලැබීය.

මෙහිදී අදහස් පළ කළ සච්නි ක්‍රිස්ටිනා සුගිර්දන් දැරිය මේ නිෂ්පාදනය තමන් හඳුන්වා දුන්නේ පරිසර හානිය වැළැක්වීමට බවත්, මේ පෑන පැළ කළ හැකි බවත් කීවාය. මේ පෑන රෝපණය කළ හැකියි. එවිට පලතුරු, එළවළු හා අල වර්ග පවා හදා ගන්න පුළුවන්. මේ පෑනට එම බීජ ඇතුළත් කර නිෂ්පාදනය කර තිබෙනවායැයි ද ඇය සඳහන් කළාය.



පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා වෙත සච්නි ක්‍රිස්ටිනා සුගිර්දන් දැරිය හා ඇයගේ පියා විසින් තමන් නිපදවන ලද පරිසර හිතකාමී කාබන් පෑන පිළිගැන්වූ අයුරු.

# ජනමාධ්‍ය අමාත්‍යාංශ ඇසිදිසි මැඳුරේ පිරිත් පින්කමෙන්.....





ලෝවැසි සැමට සෙත්පතා ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් වාර්ෂිකව පවත්වනු ලබන සර්වරාත්‍රික පිරිත් සජ්ඣායනය ජනමාධ්‍ය ඇමැති ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මහතාගේ හා අමාත්‍යාංශ ලේකම් ජගත් පී. විජේවීර මහතාගේ සහභාගිත්වයෙන් පසුගියදා (24) රාත්‍රී 8.00 සිට 25 වැනි දින පහන්වනතුරු ජනමාධ්‍ය අමාත්‍යාංශ ඇසිදිසි මැඳුරේදී පැවැත්විණි. එදින මහා සංඝරත්නය වෙනුවෙන් පිරිනමන දානමය පුණ්‍යකර්මයෙන් පසුව පින්කමේ කටයුතු නිමාවිය.

සර්වරාත්‍රික පිරිත් සජ්ඣායනය කිරුළපන සිරි ඇලන් මැතිනියාරාමාධිපති යෝගීයානේ සෝහිත තිස්ස අමරපුර මූලවංශික නිකායේ අනුනායක ස්වාමීන් වහන්සේ සහ උඩුවේ ධම්මාලෝක නායක හිමියන් ප්‍රමුඛ මහාසංඝරත්නය විසින් සිදුකරන ලදී. සෞඛ්‍ය ආරක්ෂක උපදෙස්වලට අනුව ඇසිදිසි ක්‍රිකට් ක්‍රීඩා සමාජය හා කාර්ය මණ්ඩලය ඒකාබද්ධව මේ පින්කම සංවිධාන කෙරිණි.

# යාපනයේ තිරුණවේලි පොදු වෙළෙඳසලේ කොරෝනා ආසාදිතයෝ 177ක්

## ගම් කීපයකට සංචරණ සීමා

**උතුරු පළාත් විශේෂ -රසුල දිල්හාර ගමගේ**

යාපනයේ තිරුණවේලී පොදු වෙළෙඳසලේ වෙළෙන්දන් හා ඔවුන් ආශ්‍රය කළ පිරිස් අතරින් 387ක් පී.සී.ආර්. පරීක්ෂණවලට ලක් කිරීමෙන් පසු ඔවුන්ගෙන් 177කට කොරෝනා ආසාදිත වී ඇති බව තහවුරු වූයේ යැයි උතුරු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ඒ.කේතීස්වරන් මහතා පැවසීය.

ගත වූ දින තුනේම දිවයිනේ වැඩිම කොරෝනා රෝගීන් සංඛ්‍යාව වාර්තා වූයේ යාපනයෙන් වීම නිසා යාපනය අනතුරුදායක කලාපයක් බවට ප්‍රකාශයට පත් කොට එහි පළාත් තුනක් හුදෙකලා කොට ඒ ස්ථාන සඳහා සංචරණ සීමා පැනවීමට කටයුතු කළ බවද කේතීස්වරන් මහතා පැවසීය.

යාපනයේ තිරුණවේලී කීරි ගම්මානය අලුතෙන්ම සංචරණ සීමා පනවන ලද ගම්මානය වන අතර යාපනය නගරයේ පොදු වෙළෙඳපොළ පිහිටි ප්‍රදේශයද කන්කසන්තුරේ පාරේ තවත් ප්‍රදේශයක්ද මේ වන විට හුදකලා කර තිබේ.

සංචරණ සීමා පනවන ලද පළාත්වල ආරක්ෂාවට යුද හමුදාව යොදවා ඇති අතර එම ප්‍රදේශවල ජනතාවට අවශ්‍ය අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සපයාදීමටද යාපනය දිසාපති කාර්යාලය පියවර ගෙන තිබේ.

යාපනය අධ්‍යාපන කලාපයේ පාසල් අප්‍රේල් මස 5 වැනිදා දක්වා වසා දමා ඇති අතර යාපනයේ කෝවිල් වල සියලුම උත්සව හා විවාහ මංගල උත්සවද අවලංගු කරන මෙන් ඊට සම්බන්ධ වගකිවයුත්තන්ගෙන් සෞඛ්‍ය බලධාරීහු ඉල්ලීමක් කරති.

යාපනයේ වැසියන්ට අනවශ්‍ය ගමන් බිමන් යාමෙන් වැළකී සිටින ලෙසත් පිටස්තර පුද්ගලයන් තම නිවෙස්වලට කැඳවීමෙන් වැළකී සිටින ලෙසත් සෞඛ්‍ය නිලධාරීන් දැනුම්දී තිබේ.

# යාපනයේ වාසවිලාන් යුද හමුදා කොවිඩ් මධ්‍යස්ථානයෙන් විදේශිකයෝ 160ක් ගම් බිම් බලා යති

**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

යාපනයේ වාසවිලාන් යුද හමුදා කොරෝනා මධ්‍යස්ථානයේදී නිරෝධායනයට ලක් වූ තවත් විදේශීය ශ්‍රමිකයෝ 160ක් දින 14ක සාර්ථක නිරෝධායන ක්‍රියාවලියකින් පසුව 27දා ඔවුන්ගේ ගම් බිම් බලා පිටත්ව ගියහ. යාපනයේ 52 වන සේනාංක මූලස්ථානය මගින් පාලනය වන 521 බලසේනා මූලස්ථනය විසින් මේ නිරෝධායන මධ්‍යස්ථනය පවත්වාගෙන යන අතර නිරෝධායනය වීමෙන් පසුව ඔවුන්ට ඒ පිළිබඳ වූ සහතික පත් පිරිනැමීමද වාසවිලාන් කොරෝනා නිරෝධායන මධ්‍යස්ථනයේදී සිදු විය.

# කළුතර විදුහලේ ආදි සිසු සංගම් 80 වන සංවත්සරයට ලේ දන් දීමේ කඳවුරක් 3 වැනිදා

කළුතර විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය විසින් 80 වන සංවත්සරය වෙනුවෙන් සංවිධාන කරනු ලබන ලේ දන්දීමේ කඳවුර අප්‍රේල් මස 03 වැනි දින (සෙනසුරාදා) පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා කළුතර විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී පැවැත්වේ.

ANNIVERSARY 1941-2021


## ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

**සී/ස ගුවන්තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම**

## ලංසු කැඳවීමයි

**කොළඹ, රත්මලාන ගුවන්තොටුපලේ, ගුවන්තොටුපල පහසුකම් සැපයුම් සංකීර්ණය සඳහා මිල ගණන් කැඳවනු ලැබේ**

**(AIRPORT FACILITY COMPLEX AT COLOMBO AIRPORT, RATMALANA)**

**ලංසු අංකය : 042/T/2019**

සී/ස ගුවන්තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම වෙනුවෙන්, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් කොළඹ, රත්මලාන ගුවන්තොටුපලේ, ගුවන්තොටුපල පහසුකම් සැපයුම් සංකීර්ණය සඳහා මුද්‍ර, තැබූ ලංසු සුදුසුකම්ලත් යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් මෙයින් කැඳවනු ලැබේ. මෙම කොන්ත්‍රාත්තුවට අයත් වැඩ කොටස් සඳහා අවශ්‍ය සියලුම ගොඩනැගිලි ද්‍රව්‍යය, ශ්‍රම අවශ්‍යතා, ප්‍රමාණ සමීක්ෂණ පත්‍රයේ සඳහන් පරිදි සහ අදාළ සැලසුම් හා පිරිවිතර අනුව සිදුකළ යුතුවේ.

ඉදිකිරීම් කාල පරිච්ඡේදය දින හත්සිය තිහකි (730)

ව්‍යාපෘතියේ පිහිටීම – කොළඹ, රත්මලාන ගුවන්තොටුපල

ලංසු පවත්වාගෙන යනු ලබන්නේ ජාතික තරගකාරී ලංසු ඉදිරිපත් කිරීමේ ක්‍රියා පටිපාටිය අනුව වේ.

මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සිදු කරනු ලබන්නේ, පහත සඳහන් අවශ්‍යතා සපුරන ලද යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට වන අතර, මෙම ආයතනයේ මීට පෙර අසාධුගත කොන්ත්‍රාත් නාම ලැයිස්තුවේ නම අඩංගු නොවූ ආයතනයක් විය යුතුවේ. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) (මීට පෙර ICTAD නමින් හැඳින්වූ) ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා C1 ශ්‍රේණියේ හෝ එයට ඉහළ ශ්‍රේණියක ලියාපදිංචි වූ, අදාළ මාදිලියේ ඉදිකිරීම් කටයුතු පිළිබඳ පළපුරුද්දක් ඇති කොන්ත්‍රාත්කරුවන් විය යුතුයි.

මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **29.03.2021 දින සිට 28.05.2021 දින දක්වා ඕනෑම රාජකාරී දිනයක පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා** කාලය තුළ කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ, සී/ස ගුවන්තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) පුද්ගලික සමාගමේ සැපයුම්දම කළමනාකරණ අංශයේ, අංශ ප්‍රධානි – සැපයුම්දම කළමනාකරණ වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ලංසු ගාස්තු වශයෙන් ආපසු නොගෙවන රුපියල් ලක්ෂයක් (රු. 100,000.00) මුදලින් ගෙවීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද එකී ලංසු ලිපි ලේඛන කට්ටලයක් මිලදී ගත හැක. අදාළ ලංසු ලිපි ලේඛන, ඉහත ලිපිනයට පැමිණ ගාස්තුවකින් තොරව නොමිලේ පරීක්ෂා කර බැලීමට ඉඩ සලසා ඇත.

ලංසු සුරැකුම් වෙනුවෙන් සියලුම ලංසුකරුවන්, එක් ලංසුවක් සඳහා රුපියල් මිලියන එකොළහක (රු. 11,000,000.00) මුදල් තැන්පත් කළ කුවිතාන්සිය හෝ ලංසු තොරතුරු ලේඛනයේ කාණ්ඩ 02, වගන්ති අංක 17.2 සඳහන් ආයතනයකින් ලබාගත් ඉල්ලුම මත වූ ලංසු බැඳුම්කරයක් සමග එකී ලංසු ඉදිරිපත් කළ යුතු වේ.

සියලුම ලංසුකරුවන්ට හා ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට **අප්‍රේල් මස 20 වන දින පෙ.ව. 10.30** ට සී/ස ගුවන්තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ, කොළඹ, රත්මලාන ගුවන්තොටුපලේ, ගුවන්තොටුපල කළමනාකර තුමාගේ සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත්වෙන පූර්ව ලංසුකරණ රැස්වීමට සහභාගී වන ලෙස මෙයින් ආරාධනා කරනු ලැබේ.

නිසි පරිදි සම්පූර්ණ කර ලද ලංසු මැයි මස 31 වන සඳුද දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ අතින් ගෙනවිත් හෝ ලියාපදිංචි තැපෑලෙන් කොළඹ 1, ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය, බටහිර කුලුන, 30 වන මහල, ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, ප්‍රසම්පාදන අංශය, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත ලැබීමට සැලැස්විය යුතු වේ. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. එදින එකී වේලාවට ලංසු භාරගැනීම අවසන් වූ විගස, ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරිපිට එකී ලංසු විවෘත කරනු ලැබේ.

ලංසුකරුවන්හට, මේ පිළිබඳව වැඩි විස්තර ලබාගැනීමට අවශ්‍ය නම් කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ සී/ස ගුවන්තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමේ සිවිල් ඉංජිනේරු (සැලසුම් හා නිර්මාණ) අංශයේ, අංශ ප්‍රධානී දුරකථන අංක 011–2263502/03 ඔස්සේ ඇමතීමෙන් සහ ෆැක්ස් අංක 011–2251356 මගින් දැනගත හැක.

**සභාපති,**
**අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව,**
**ප්‍රසම්පාදන අංශය**
**ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යංශය,**
**30 වන මහල, බටහිර කුළුණ, ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය, කොළඹ 01.**


# ජනමාධ්‍යවේදී ශෂී සුබ්‍රමනියම් සහ ස්විස් ජාතික මනුඅල් සුසංයෝගයෙන් ඡායාරූප ප්‍රදර්ශනයක් ස්විට්සර්ලන්තයේදී

කලක් මෙරට ජනමාධ්‍යවේදියකු හා ප්‍රවෘත්ති නිෂ්පාදකවරයකු ලෙස කටයුතු කළ ශෂී සුබ්‍රමනියම්, කලක් දලයි ලාමාගේ නිල ඡායාරූප ශිල්පියා ලෙස කටයුතු කළ ස්විස් ජාතික මනුඅල් බව්අර් (Manuel bauer) සමඟ එක්ව කරන ඡායාරූප ප්‍රදර්ශනයක් අප්‍රේල් මස (2)සිට ස්විට්සර්ලන්තයේ අන්නා ගොල්ඩි කලාගාරයේ දී ආරම්භ පැවැත්වේ.

මේ ප්‍රදර්ශනයේ තේමාව වන්නේ ටිබෙට් ජාතිකයන්ගේ සංක්‍රමණික ජනජීවිතයයි.

මේ ප්‍රදර්ශනයේ ශෂී සුබ්‍රමනියම් විසින් ගන්නා ලද මීටර් හයක උසින් හා මීටරයක පළලින් මුද්‍රණය කළ ඡායාරූප විස්සක් අඩංගුවීම විශේෂත්වයකි.

මීට අමතරව ස්විට්සර්ලන්තයේ ග්ලාරුස්හි ජීවත්වන ටිබෙට් ජාතිකයන්ගේ ජන ජීවිතය අළලා සකස් කෙරුණු ඡායාරූප පෙළක් ද ප්‍රදර්ශනයට ඇතුළත්ය .



සිය පියා සමඟ ටිබෙටයේ සිට හිමාලය හරහා ඉන්දියාවට පා ගමනින් දින අටක් පුරා සංක්‍රමණය වූ දැරියකගේ ජීවිතය අලලා මනුඅල් බව්අර් විසින් ගනුලැබූ ඡායාරූප ඇතුළත් විශේෂාංග චිත්‍රපටයක්ද( Documentary film) මෙහිදී ප්‍රදර්ශනය කෙරේ .

අගෝස්තු මාසය දක්වා පැවැත්වෙන මේ ප්‍රදර්ශනය ඇති විශේෂත්වය වන්නේ ස්විස් ජාතිකයකු ලෙස මනුඅල් බව්අර් ටිබෙට් ජාතිකයන්ගේ ජන ජීවිතය පිළිබඳවත්, ආසියාතික යෙකු ලෙස ශෂී සුබ්‍රමනියම් ස්විට්සර්ලන්තයේ ජීවත් වන ටිබෙට් ජාතිකයන්ගේ ජන ජීවිතය පිළිබඳවත් ඔවුන්ගේ නිර්මාණවලින් එළිදැක්වීමයි. ප්‍රදර්ශනය ලබන අගෝස්තු මාසය තෙක් පැවැත්වේ.

ස්විට්සර්ලන්තයේ සුඩ්ඔෂ්වයිස් (suedostschweiz) පුවත්පතේ ඡායාරූප ශිල්පියකු හා ජනමාධ්‍යවේදියකු ලෙස කටයුතු කරන ශෂී සුබ්‍රමනියම් ඡායාරූප කෘති කීපයක කතුවරයෙක් ද වෙයි.

# නුවරඑළිය නව මහ දිසාපති නන්දන ගලබොඩ වැඩ බාරගනී

නුවරඑළිය දිස්ත්‍රික් මහ දිසාපති ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියකු වන නන්දන ගලබොඩ මහතා පසුගියදා රාජකාරි ආරම්භ කරන ලදී. රාජ්‍ය සේවයේ වසර 29ක අත්දැකීම් ඇති ඒ මහතා නුවරඑළිය දිස්ත්‍රික්කයේම උපත ලබා එම දිස්ත්‍රික්කයේම දිසාපති වූ ප්‍රථමයා ලෙස ඉතිහාස ගතවනු ඇත.

ඒ මහතා නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ හෙළසිරිගම ඉපිද කොත්මලේ වීරසේකර මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය හදාරා උසස් අධ්‍යාපනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ලබා තිබේ. 1992 වසරේ ගුරු විභාගය සමත්ව ගුරු වෘත්තියට පිවිස වසර 08ක පමණ කාලයක් පුණ්ඩළුඔය මහා විද්‍යාලය කුඹල්ඔලුව විද්‍යාලය යන පාසල්වල පුහුණු උපාධි ගුරුවරයකු ලෙස ද සේවය කර ඇති ඒ මහතා 1999 වසරේ පරිපාලන විභාගය ඉතා ඉහළින් සමත් වී ඇත.

අනතුරුව පරිපාලන සේවයට පිවිසෙන ගලබොඩ මහතා 2001 වසරේ පෙබරවාරි මස හඟුරන්කෙත සහකාර ප්‍රාදේශීය ලේකම් ලෙස පත් වන අතර 2006 වසරේ මධ්‍යම පළාත් පේෂකර්ම දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ ලෙසත් රාජකාරී කර ඇත. මේ අතරතුර කැලණිය විශ්වවිද්‍යාලයෙන් පශ්චාත් උපාධිය සමත් වන ඒ මහතා ආපදා කළමනාකරණය පිළිබඳ පුහුණුව තායිලන්තයේ දී ද දරිතා සංවර්ධන පුහුණුව මැලේසියාවේ දී ද ලබා ඇත.

වලපනේ හඟුරන්කෙත උඩුනුවර අකුරණ කොට්ඨාසවල ප්‍රාදේශීය ලේකම් ලෙසත් රාජකාරි කර ඇති ඒ මහතා 2007 වර්ෂයේ වලපනේ කොට්ඨාසයේ සිදු වූ නාය යෑම් ව්‍යසනයේදී ඉතා කෙටි කාලයකින් ජන ජීවිතය යථා තත්ත්වයට පත් කොට සිදු කරන ලද සුවිශේෂී කාර්යභාරය ජනතාවගේ මෙන්ම රජයේ ඇගයීමට ද ලක්විය. එමෙන්ම උඩුනුවර ප්‍රාදේශීය ලේකම් ලෙස සිටි කාලයේ එම ප්‍රදේශයේ සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ගේ ජීවන තත්ත්වය නංවාලීම උදෙසා විශාල වැඩ කොටසක් සිදු කරන ලදි. එම කාල සීමාවේ ජාතික මට්ටමින් පවත්වන ලද ඵලදායිතා සම්මාන ප්‍රදානයේ තුන්වන ස්ථානය මෙන්ම ශ්‍රී ලංකා පරිපාලන ආයතනය සහ මොනෑෂ් විශ්වවිද්‍යාලය එක්ව සංවිධාන කරන ලද තිරස් සමායෝජන වැඩසටහනේ ජාතික මට්ටමේ ප්‍රථම ස්ථානය උඩුනුවරට ලබා ගැනීමට හැකි වූයේ ඒ මහතාගේ දක්ෂ පරිපාලන නායකත්වය හේතුවෙනි.

පළාත් රාජ්‍ය සේවයේ කැපී පෙනෙන පරිපාලන නිලධාරියකු ද වන ඒ මහතා මධ්‍යම පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) ලෙසත් මධ්‍යම පළාත් කර්මාන්ත වනිතා කටයුතු සහ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලේකම් ලෙසත් කටයුතු කර ඇත. 2019 වසරේ ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියකු ලෙස පත් වන නන්දන ගලබොඩ මහතා නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් ලෙස පත් වීමට පෙර මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන ලේකම් ලෙස ද කටයුතු කර තිබේ.



**නිහාල් වතුලියද්ද**



# මහ වැස්සෙන් ඌරුබොක්කේ පහත් බිම් රැසක් ජලයෙන් යට වෙයි

ඌරුබොක්ක විශේෂ - ඒ.පී.දයාචන්ද්‍ර

ඌරුබොක්ක ඇතුළු අවට ප්‍රදේශවලට පෙරේදා (28) සවස ඇති වූ අධික වැසි හේතුවෙන් පහත් බිම් රැසක් ජලයෙන් යට විය. ඌරුබොක්ක, දම්පහල, බෙංගමුව, පස්ගොඩ, බෙරලපනාතර ඇතුළු අවට ප්‍රදේශවලට සවස 3.30ට ආරම්භ වූ වැස්ස රාත්‍රි 10.00 පමණ වනතෙක් පැවැති අතර මාස ගණනාවකට පසු මෙවැනි වැස්සක් ඇති වූ බව ප්‍රදේශවාසීහු පවසති. අධික වැසි හේතුවෙන් පහත් බිම් රැසක් ජලයෙන් යටව තිබූ අතර බෙංගමුව ප්‍රදේශයේ අතුරු මාර්ග ඇතුළු පහත් බිම් පැය ගණනාවක් ගංවතුරින් යට වී තිබුණි. මාර්ග දෙපස පස් කඳු කඩා වැටීම් සිදුව තිබුණි.

ඌරුබොක්ක ඇතුළු අවට ප්‍රදේශවල කුඹුරු යල කන්නයට අස්වැද්දීම ආරම්භ කර ඇතැත් මෙතෙක් වී වැපිරීම සිදුකර නොමැති බැවින් වැස්සෙන් වී වගාවට හානි සිදු වී නොමැත.

ජායාරූපය -ඌරුබොක්ක විශේෂ



## දැඩි සුළඟින් දොම්පෙ, ගස් කඩා වැටීම් හේතුවෙන් නිවාස 45කට හානි



ජී.එස්.තැලිගම - කිරිඳිවැල සමූහ.

පසුගිය දින කීපයේ ඇදහැලුණු මහ වර්ෂාවත් සමග හමා ගිය දැඩි සුළඟ නිසා දොම්පෙ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ගස් කඩා වැටීම් නිසා නිවාස 45කට පමණ අලාභ හානි සිදුවී ඇත. කිතුලකන්ද, පාළුපැල්පිට, රදාවාන උතුර, රඹුටන්වත්ත, අල්ලියවත්ත ග්‍රාමයන්හි පමණක් නිවාස 25කට හානි සිදු වී ඇත. මේ සම්බන්ධයෙන් ලැබුණු තොරතුරු අනුව දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආපදා කළමනාකාර අංශයේ නිලධාරීන් කරන ලද පරීක්ෂණ වාර්තා අනුව නිවාස අලුත්වැඩියා කිරීමේ මුල් අදියර යටතේ මේ සතියේදී එක් නිවෙසකට රු.10000 බැගින් ලබාදීමටත්, අනතුරුව ගෙවිය යුතු සම්පූර්ණ මුදල ඉතාම කඩිනමින් ලබාදීමට සැලසුම් කර ඇති බවත් දොම්පෙ ප්‍රාදේශීය ලේකම් එන්.ඒ.ඒ.එස්.නිස්සංකආරච්චි මහතා පැවසීය.

# මැදින් පොහෝ දින සඳහිරු සෑය වඳින්න මහ සෙනඟක්



රත්නසිරි පතිරණ

මැදින් පුන් පොහොය යෙදී තිබූ පෙරේදා (28) අනුරාධපුර පූජා භූමියට විශාල බැතිමතුන් සංඛ්‍යාවක් පැමිණ සිටි අයුරු දක්නට ලැබිණි. ජය ශ්‍රී මහා බෝධිය, රුවන්මැලි සෑය ඇතුළු අටමස්ථානයන්හි ආගමික වතාවත්වලට විශාල බැතිමතුන් පිරිසක් පැමිණ සිටි අතර අනුරාධපුර පූජා භූමියේ ඉදි වන රණවිරු උපහාර චෛත්‍යය වන සඳහිරු සෑයේ හතරැස් කොටුවේ ධාතු නිධානෝත්සවය ද මැදින් පොහෝ දින උදෑසනට යෙදී තිබිණි. ඉදිවෙමින් පවතින සඳහිරුසෑය වැඳ පුදා ගැනීමට ද විශාල බැතිමතුන් පිරිසක් පොහෝ දින හිමිදිරි උදෑසන සිටම එම පරිශ්‍රයට පැමිණ සිටියහ. හතරැස් කොටුවේ නිදන් වස්තු තැන්පත් කිරීමෙන් අනතුරුව පැමිණ සිටි බැතිමතුන්ට හතරැස් කොටුව දක්වා ගමන්කිරීමට ද අවස්ථාව ලබාදීමට යුද හමුදාව කටයුතු යොදා තිබිණි. කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් බොහෝ කාලයක් අනුරාධපුර පූජා භූමියට බැතිමතුන් නොපැමිණියද මැදින් පොහෝ දින වන්දනා මාන සඳහා දිවයිනේ නන්දෙසින් බැතිමතුන් පැමිණෙන අයුරු දක්නට ලැබීම විශේෂත්වයකි. සඳහිරු සෑ භූමියට ඇතුළු වන බැතිමතුන් සියලු දෙනා දෑත් සේදීම, මුඛ ආවරණ පැළඳීම අනිවාර්ය කර තිබූ අතර එම භූමියට පිවිසෙන ප්‍රධාන දොරටුව අසල ශරීර උෂ්ණත්වය පරීක්ෂා කිරීමට ද සෞඛ්‍ය අංශ හා යුද හමුදාව සියලු පහසුකම් සපයා තිබිණි.

බැතිමතුන් වෙනුවෙන් දන්සල් කීපයක් ද සඳහිරු සෑය අභියස සංවිධාන කර තිබිණි.

ජායාරූප - සුලෝචන ගමගේ

# විදුලි ජනන සැලසුම් සහ සිදු විය හැකි අඩුපාඩු අවම කිරීමට ඇමැති අනුකාරක සභාවක්

චන්දිමා කරුණාරත්න

වර්තමාන විදුලි ජනන සැලසුම් සහ සිදු විය හැකි අඩුපාඩු (Lapses) අවම කිරීමට යෝජිත ක්‍රියාමාර්ග ගැනීම පිණිස වාසුදේව නානායක්කාර, බන්ධුල ගුණවර්ධන සහ වෛද්‍ය රමේෂ් පතිරණ යන අමාත්‍යවරුන්ගෙන් සමන්විත ඇමැති අනුකාරක සභාවක් පත් කර ඇත.

අමාත්‍ය අනුකාරක සභාවේ නිර්දේශ සති දෙකක් (02) ඇතුළත අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු අතර එහි පළමු කමිටු රැස්වීම ඊයේ රැස්වීමට නියමිතය.

පුනර්ජනනීය බලශක්තිය උපරිමයෙන් යොදාගත් විදුලි ජනනයෙන් සියයට 70ක් පිවිතුරු බලශක්ති ප්‍රභවයන් විය යුතු බව, සෞභාග්‍යයේ දැක්මේ අවධාරණය කොට ඇති අතර ඒ අනුව 2025 වසර වනවිට ඩීසල් හා දැවි තෙල් භාවිතය සියයට 5 දක්වා අවම කිරීමත්, 2030 දී එය සියයට 1 ක් දක්වා සීමා කිරීමත් විදුලිබල අමාත්‍යාංශයේ පිළිවෙත වේ.

# දැඩි සුළං හා මහ වැස්සෙන් රාජාංගණයටත් දැඩි හානි

තලාව සමූහ - බී.ඩබ්ලිව්.ඩී. ධර්මකීර්ති

රාජාංගණය ප්‍රදේශයට අධික වැසි හා දැඩි සුළං නිසා නිවාස 150කට වැඩි ප්‍රමාණයකට හානි සිදුවී තිබේ.

ඉකුත් 28දා සවස් කාලයේ සිදුවූ මේ සිද්ධියට ගම්මාන තුනක ජනතාව අපහසුතාවට පත්ව ඇතැයි රාජාංගණය ප්‍රදේශීය ලේකම් සුනිල් අබේකෝන් මහතා පැවසීය. නිවාස හා ව්‍යාපාරික ස්ථාන, බෝග වගාවන්ටද, අධි බලැති විදුලි වයර් හා විදුලි කණුවලටද හානි සිදු වී ඇත.

මෙලෙස හානි සිදු වී ඇත්තේ රාජාංගණය ප්‍රදේශයේ රන්දෙණිගම,ගැමුණුපුර සහ යාය 08 ගම්මානවලටය.



# පොලිස් සැරයන්වරුන් 398ක් ගොනු කළ රිට් පෙත්සම සලකා බැලීම ජූලි මස 5 දා

නෙල්කා මැදගෙදර

වසර දහ තුනකට අධික කාලයක් පොලිස් සැරයන් තනතුරේ සේවය කරන තමන් උප පොලිස් පරීක්ෂක ධූරයට උසස් කරන ලෙස ඉල්ලා සැරයන්වරු 398ක් ගොනු කළ රිට් පෙත්සමක් ලබන ජූලි මස 05 වැනිදා සලකා බැලීමට අභියාචනාධිකරණය ඊයේ (29)තීරණය කළේය.

අභියාචනාධිකරණ සභාපති විනිසුරු අර්ජුන ඔබේසේකර සහ විනිසුරු මායාදුන්නේ කොරයා මහත්වරුන් හමුවේ මේ පෙත්සම කැඳවනු ලැබිණි.

ජාතික පොලිස් කොමිසම, එහි සභාපතිවරයා, එහි සාමාජිකයන්, පොලිස්පතිවරයා, නීතිපතිවරයා ඇතුළු පිරිසක් මෙහි වගඋත්තරකරුවෝ වෙති.

පොලිස් දෙපාර්තමේන්තුවේ වසර 30කට අධික සේවා කාලයක් සම්පූර්ණ කර ඇති තමන් ඉන් වසර 13ක් ම සැරයන් තනතුරේ සේවය කරන බව පෙත්සම්කරුවෝ සඳහන් කරති.

උසස්වීම් ලබාදීමට අදාළව ජාතික පොලිස් කොමිසමේ නිර්දේශ මත පොලිස්පතිවරයා විසින් චක්‍රලේඛය ක් නිකුත් කරන ලදි.

එම චක්‍රලේඛය අනුව තමන් ද උප පොලිස් පරීක්ෂක තනතුරට උසස් කරන ලෙස කරන ලද ඉල්ලීම ජාතික පොලිස් කොමිසම විසින් ප්‍රතික්ෂේප කර ඇතැයි පෙත්සමේ සඳහන් වේ.

පොලිස් දෙපාර්තමේන්තුවේ එකම පිරිසකට දෙයාකාරයකට සැලකීම නිසා තමන්ට අසාධාරණයක් සිදු වන බවට පැමිණිලි කරන පෙත්සම්කරුවන් තමන්ට එම උසස්වීම් ලබාදෙන ලෙස පොලිස් කොමිසමට නියෝගයක් කරන ලෙස ඉල්ලා අධිකරණයෙන් ඉල්ලා ඇත. නීතිඥ ප්‍රදීප් ප්‍රනාන්දු මහතා පෙත්සම්කරුවන් වෙනුවෙන් පෙනී සිටියේය.

# මහයියාව පූර්ණවත්ත ජල කානුවකට වැටී ගසාගෙන ගිය තිදරු මව මරුට

අසේල කුරුළුවංශ

මහනුවර නගරයට පෙරේදා (28) පස්වරුවේ ඇද හැලුණු අධික වර්ෂාවත් සමග මහයියාව පූර්ණවත්ත ප්‍රදේශයේ ජල කානුවකට වැටී ගසාගෙන ගිය තිදරු මවක් මරණයට පත්ව තිබේ.

වර්ෂාවත් සමග පූර්ණවත්තේ පිහිටි තම නිවෙස ඉදිරිපිට කානුවේ පොලිතීන් ඇතුළු කසළ සිරවී එය පිටාර ගැලීම නිසා අදාළ කාන්තාව ඒවා ඉවත් කිරීමට යාමේදී කානුවට වැටී ජලපහරත් සමග ගසාගෙන ගොස් තිබෙන බව පොලිස් පරීක්ෂණවලින් අනාවරණය වී ඇත.

ආනයනය කරන පොල්තෙල් — වෙළෙන්දා
වස විස කවති රවටාගෙන — දිළින්දා
ඔවුනට කමක් නෑ කවුරුද — රජින්දා
මේ මව් බිමට සිදුවන්නේ — කුමන්දා

ලාබය පතන මුදලාලි — බලගතුව
මේ සිදු කරන දේ ඇත සැලකිය — යුතුව
සීනි නැතිව තේ බීමට පෙර — පැතුව
අවුරුදු දාට අතිරස කමු තෙල් — නැතුව!

රටේමුල්ලේ මුදන්නායක

නේවාසිකව තබමින් දෙසතියක් — පුරා
බස් රියැදුරන් විඩිමත් පුහුණුවක් — කරා
ගෙන යයි වැරදි වන්නට ඇති ඉඩ — අහුරා
හරි මග යනෙන අය නොගනී හුස්ම — සොරා



දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2021 මාර්තු 30 අඟහරුවාදා

# තෙල් මාෆියාවට - දඬුවම කුමක් ද?

අලුත් අවුරුදු උත්සව සමය කට ළඟ තිබියදී පොල්තෙල් පිළිබඳ අර්බුදයක් මතුව තිබීම කනගාටුවට කාරණයකි. කොවිඩ් වසංගතය යාන්තම් තුනී වේගෙන යන තත්ත්වයක් තුළ මෙවර හෝ අලුත් අවුරුද්ද සැමරීමේ අපේක්ෂාවක් සිංහල හා හින්දු සමාජ තුළ පවතී. පොල්තෙල් අර්බුදය නිසා එම අපේක්ෂාව හා අවස්ථාව ද ගිලිහී යන්නට පුළුවන. පොල්තෙල්, යනු ශ්‍රී ලාංකික ජන ජීවිතයට බෙහෙවින් සමීප අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යයකි. අලුත් අවුරුදු සමය තුළ එහි අවශ්‍යතාව දෙගුණ - තෙගුණ වෙයි. මේ වනවිට වෙළෙඳපොළ තුළ ඇති පොල්තෙල් පිළිබඳ භීතිකාවක් සමාජය තුළ පවතී. ප්‍රධාන හේතුව ආනයනික පොල්තෙල් තුළ පිළිකා කාරක විෂ රසායනිකයක් ඇතැ'යි පැතිර යන ආරංචියයි.

රටේ වාර්ෂික පොල්තෙල් අවශ්‍යතාව මෙ.ටො. එක් ලක්ෂ අසූදහසක් පමණ වන බව කියති. එයින් හතරෙන් එකක් හෝ දේශීය නිෂ්පාදනවලින් සපිරෙන්නේ නැත. එහි අදහස වන්නේ අවශ්‍යතාවෙන් 70%කට වැඩි කොටසක් ආනයනය කිරීමට සිදු වී ඇත යන්නය. මෙලෙස ආනයනය කරනු ලබන ආහාර ද්‍රව්‍ය පරීක්ෂා කිරීම සඳහා ආයතන කිහිපයක් තිබේ. රේගුව, ප්‍රමිති ආයතනය, පාරිභෝගික සේවා අධිකාරිය හා සෞඛ්‍ය අමාත්‍යාංශය එම ආයතන ලෙස හඳුනාගත හැකිය. ප්‍රශ්නගත පොල්තෙල් තොගය සමාගම් තුනකට අයත්ය. ඉහත ආයතනවල පරීක්ෂාවලට අනුව සමාගම් තුනේම පොල්තෙල් භාවිතයට නුසුදුසු යැයි මේ වන විට ප්‍රතික්ෂේප වී ඇත.

ඇතැම් සමාගම්වලට ඇත්තේ ලාභ ලැබීමේ ඉලක්කය පමණි. සාධාරණ වෙළෙඳාම, මහජන සේවය හා කීර්ති නාමය ගැන බරපතළ හැඟීමක් එම සමාගම්වලට නැත. ඒ අනුව අලෙවි කළ හැකි ඕනෑම කුණු ගොඩක් ආනයනය කිරීමට ඔව්හු පෙලඹෙති. එකිනෙක භාණ්ඩ සම්බන්ධයෙන් කීර්ති නාමයක් උසුලන පිටරට සමාගම් ප්‍රමිතියෙන් තොර නිෂ්පාදන අලෙවි කරන්නේ නැත. එහෙත් ලාභාපේක්ෂාව පමණක් ඇති පිටරට සමාගම් ද තිබේ. ඒවායින් අඩු මිලට භාණ්ඩ ලබාගත හැකිය. අපේ පොල්තෙල් සමාගම් ද පිටරට බාල සමාගම් සමඟ ඒකාබද්ධ වී ජාවාරමක යෙදෙන්නට උත්සාහ කර ඇති බවක් මේ සිද්ධියෙන් හෙළිදරව් වෙයි. ඒ තුළ ආණ්ඩුව අපහසුවට පත් කිරීමේ දේශපාලන කුමන්ත්‍රණයක් ද තිබෙන්නට පුළුවන. ආණ්ඩුවට සතුරු සමාගම් ඕනෑතරම් තිබිය හැකිය.

ආණ්ඩුවේ ප්‍රකාශනවලින් පැහැදිලි වන වැදගත් කරුණු කිහිපයක් තිබේ. එක; විස රසායන අඩංගු පොල්තෙල් බිංදුවක් හෝ වෙළෙඳපොළට නිකුත් වී නැත. නිකුත්වීමට ඉඩ දෙන්නේ ද නැත. දෙක; විස රසායන සහිත පොල්තෙල් ගෙන් වූ සමාගම්වලට එරෙහිව නීතිමය පියවර ගන්නා අතර දූෂිත පොල් තෙල් තොගය ප්‍රති - අපනයනය කිරීමට නියෝග නිකුත් කර ඇත. තුන ; ඉදිරියේදී පොල්තෙල් ආනයනය කිරීමේදී පිරිසුදු කළ පොල් තෙල් පමණක් ආනයනය කිරීමට ඉඩ ලබා දෙන අතර එලෙස ගෙන්වනු ලබන පොල්තෙල් ද දැඩි පරීක්ෂාවකට ලක් කිරීමට කටයුතු යොදනු ලැබේ. හතර; දේශීය පොල් තෙල් නිෂ්පාදනය ඉහළ නැංවීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. එම කරුණු හතර හරියාකාර ලෙස පවත්වා ගත හැකි නම්: පොල්තෙල් පිළිබඳ අර්බුදයක් මතු වීමට ඉඩක් නැත.

රටේ පොල් පරිභෝජනය දෙස බලන විට වාර්ෂික පොල් ගෙඩි අවශ්‍යතාව බිලියන 2.3ක් යැයි සඳහන්ය. එයින් බිලියන 1.8ක් පොල් තෙල් නිෂ්පාදනය සඳහා යොදාගනු ලබන බව ද සඳහන්ය. පොල් ගෙඩි බිලියන හතරක් වාර්ෂිකව ලබා ගත හැකි නම්, පොල් හා පොල් තෙල් සඳහා එම ප්‍රමාණය සෑහෙන බව ද කියති. එහෙත් පොල් පලදාවේ වර්ධනයක් දකින්නට නැත. එක අතෙකින් පොල් ඉඩම් කට්ටි කර විකුණනු ලැබේ. තව අතෙකින් කෘමි රෝගවලින් පොල් වගාවට විශාල හානියක් සිදු වෙයි. අලුතින් පොල් වගා කිරීම ඉතා අඩුය. කටුපොල් වගාව ද පොල් වගාවට අභියෝගයක් එල්ල කර තිබේ. පොල් සංවර්ධන මණ්ඩලය මේ සම්බන්ධයෙන් සලකා බලා අලුත් වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුව තිබේ. පොල් හිඟය ඉතා දැඩි ලෙස දිනෙන් දින වැඩි වෙයි.

මීට දසක දෙකකට පමණ පෙර ශ්‍රී ලංකාවේ පොල් හිඟයක් පැවැතියේ නැත. පොල් ගෙඩියක මිල පාරිභෝගිකයාට දරාගත හැකි විය. එමෙන්ම පිරිසුදු පොල්තෙල් අඩු මිලකට ලබාගත හැකි විය. එකල පොල්තෙල් ආනයනය ද සිදුවූයේ අඩු වශයෙන්ය. අද පොල් ගෙඩියක මිල රුපියල් සියය හා එකසිය විසිපහ දක්වා ඉහළ නැග තිබේ. ඇතැම් විට පොල්ගෙඩිය රුපියල් එකසිය පනහට අලෙවි කරන අවස්ථා ද තිබේ. පොල් ගෙඩියක මිල පාලනය කිරීම පහසු දෙයක් නොවේ. පොල් ගෙඩිය වට ප්‍රමාණය මැන බැලීම, බර කිරා බැලීම ආදිය ප්‍රායෝගික නැත. පාරිභෝගිකයා පොල් ගෙඩියක් තෝරා ගනු ලබන්නේ එහි හැඩය හා මෝරා ඇති ප්‍රමාණයට අනුවය. ගමේ කතාවට අනුව නම් පැසුණු පොල් ගෙඩියක වටිනාකම වැඩිය.

අතීතයේ නම්; පොල් තෙල් මිලට ගැනීම සඳහා වෙළෙඳපොළට ගියේ නැත. නිවසකට අවශ්‍ය පොල්තෙල් ප්‍රමාණය ගෙදරදී නිෂ්පාදනය කරගනු ලැබේ. ඒවා පිරිසුදු පොල් තෙල් වූ අතර ගුණයෙන් ඉහළය. වෙළෙඳපොළෙහි ඇති පොල් තෙල්වලින් බහුතරය කළවම් ඒවා බව කියනු ලැබේ. විවිධ රසායන මෙන්ම පාම් තෙල් ද පොල්තෙල් සමඟ මිශ්‍ර කිරීම සුලබව දැක ගත හැකිය. මේ හැරෙන්නට පොල්තෙල් සුවඳ ගැන්වීම සඳහා තවත් රසායන යොදනු ලැබේ. පිළිකාකාරක විස නැතත් වෙනත් විස රසායන පොල් තෙල්වල තිබිය හැකිය. මේ තත්ත්වයෙන් පාරිභෝගිකයා ආරක්ෂා කරගැනීම සඳහා රාජ්‍ය ආයතන මැදිහත් විය යුතුව තිබේ. ආන්දෝලනාත්මක අවස්ථාවලදී පමණක් නොව; සෑමවිටම පොල්තෙල් පරීක්ෂා කොට වෙළෙඳපොළට නිකුත් කළ යුතුය.

විෂ රසායන සහිත යැයි කියන පොල්තෙල් බහාලුම් දහතුනක් වරායේ සිරවී ඇතැ'යි වාර්තා වෙයි. මේ බහාලුම් දහතුන ප්‍රති අපනයනය කළ යුතු බවට නියෝග ලැබී ඇත. අදාළ පොල්තෙල් තොගය වෙනත් රටක පරිභෝජනය සඳහා යොදාගන්නේ නම්; එය ද බලවත් අපරාධයකි. හොඳම තීරණය විය යුත්තේ විෂ සහිත පොල්තෙල් විනාශ කිරීමය.

---

**දිල්රුකගෙ සිව්පද**

කාලෙකට මුළු රටම හොල්ලන්නෙ බොර තෙල්
ඒ වැඩේ මේ සැරේ බාරගෙන පොල් තෙල්
කට බඩ ද රට තොට ද අවුල් කරවන තෙල්
කොයි අතින් බැලු නමුත් ඇති හොඳක් නැත තෙල්

---

# සේවා වියුක්තියට ස්ථිර විසඳුම් සොයන්නේ කොහොම ද?

සේවා වියුක්තිය යනු ශ්‍රී ලංකාවේ අවුරුදු ගණනාවක් තිස්සේම දක්නට ලැබෙන ප්‍රබල ගැටලුවකි. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ උගත් තරුණ පිරිස අතරේ සේවා වියුක්ති තත්ත්වයක් දැක ගැනීමට හැකි වී තිබෙන බව පෙන්වා දීමට පුළුවන. තවද සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ පවතින මෙම සේවා වියුක්ති තත්ත්වය හේතුවෙන් විශාල ආර්ථික, සාමාජීය ගැටලු රාශියක් ඇති වී තිබේ. සේවා වියුක්තිය හේතුවෙන් පුද්ගලයකුගේ ජීවනෝපාය සඳහා මාර්ගයක් නොමැති වේ.

මෙය පුද්ගලයකුගේ මූලික අවශ්‍යතා පවා ඉටු කර ගැනීමට ඇති හැකියාව මඟ හැරී යෑමට හේතු වේ. මේ නිසා පුද්ගලයකුට නිෂ්පාදන ක්‍රියාවලියෙහි සක්‍රිය ලෙස දායකත්වය ලබා දී කිසියම් ආදායමක් ලබා ගැනීමට ඇති අවස්ථාව මඟ හැරී යයි. තව ද සේවා වියුක්තිය තුළින් ආදායම් අඩු වීම, දරිද්‍රතාවය වැඩි වීම කෙරෙහි මෙන්ම මන්දපෝෂණ තත්ත්වය වැඩි වීම ද සිදු විය හැකිය. ශ්‍රමිකයාගේ කායික හා මානසික ශක්තිය, පෞරුෂ වර්ධනය මෙන්ම මානව සංවර්ධනය කෙරෙහි ද, එමගින් සමස්ත ආර්ථික ක්‍රියාවලියට ද අහිතකර බලපෑම් සිදු වේ.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන මට්ටමින් ඉහළ ස්ථරයක සිටින, උගත් පිරිස අතරේ සේවා වියුක්තිය වැඩි වී තිබීම එක්තරා බේදනීය තත්ත්වයක් වී තිබේ. ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යාපන ක්‍රමය දැනුම මූලික කර ගත් අධ්‍යාපන ක්‍රමයක් බැවින් ඒ තුළින් වෘත්තිය පුහුණුව නොලැබීම, වෘත්තිය පුහුණුව ලබා දෙන පාඨමාලාවන් තුළින් ලැබෙන පුහුණුව වෙළෙඳපළේ ශ්‍රම ඉල්ලුමට නොගැළපීම, තොරතුරු, තාක්ෂණය, භාෂා දැනුම, නායකත්ව ගුණාංග වැනි වර්තමාන සේවා නියුක්ති ඉඩ ප්‍රස්තාවන් ලබා දෙන ගුණාංග අධ්‍යාපන ක්‍රමය තුළින් නොලැබීම නිසා අධ්‍යාපන ලැබුවන් පසුගාමී තත්ත්වයට පත් වීම, අධ්‍යාපනය ලැබීම සමඟ ඇතැම් රැකියා ප්‍රතික්ෂේප කිරීම, අධ්‍යාපනය ලැබූවන්ගේ ආකල්ප ව්‍යවසායකයන්ගේ ආකල්පවලට ප්‍රතිවිරෝධී වීම.

දේශීය, විදේශීය රැකියා අවස්ථා පිළිබඳ නිවැරදි ලෙස සන්නිවේදනය නොවීම, මෙන්ම අධ්‍යාපන ලැබුවන් අතරින් සුදුසු පිරිසක් රාජ්‍ය සේවයට බඳවා ගැනීම පිළිබඳ ප්‍රතිපත්තියක් රජයට නොමැති වීම යන කාරණා ශ්‍රී ලංකාවේ සමීක්ෂණවලට අනුව උගත් අය තුළ සේවා වියුක්තිය වැඩි වීමට බලපාන සාධක වේ.

## සේවා නියුක්තිය සහ වියුක්තිය

කිසියම් රටක ආර්ථික සංවර්ධනය සඳහා එරට ජීවත් වන පුද්ගලයන්ගේ දායකත්වය ලබා දෙන ප්‍රධාන ආකාරයක් ලෙස සේවා නියුක්තිය හැඳින්විය හැකිය. සේවා නියුක්තිය තුළින් විවිධ ක්ෂේත්‍රයන්හි සංවර්ධනය සඳහා ඒ ඒ රටවල මිනිසුන්ට සම්බන්ධ විය හැකිය. ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටක් වුවත් ක්‍රමක්‍රමයෙන් කෘෂිකාර්මික අංශයේ තිබෙන රැකියාවන් ප්‍රමාණයෙන් අඩු වී ගොස්, වර්තමානය වන විට කාර්මික සහ සේවා අංශයේ වර්ධනයක් දක්නට ලැබේ. වර්තමානයේදී සේවා අංශයේ 45%ක් ද, කාර්මික අංශයේ 30%ක පමණ දායකත්වයක් ද, කෘෂිකාර්මික අංශයේ රැකියා 23%ක පමණ අඩු ප්‍රතිශතයක් දක්නට ලැබේ. ලංකාවේ සේවා නියුක්ති තත්ත්වයන් දෙස බලන විට පෞද්ගලික අංශයේ රැකියාවල වර්ධනය වීමක් දක්නට ලැබේ. 1960 දශකයේ කාලයේදී පමණ බොහෝ විට ලංකාවේ ආර්ථිකය හසුරවන ලද්දේ රාජ්‍ය අංශය බැවින්, රාජ්‍ය ආයතන, සංස්ථා පෙරදැරි කර ගත රැකියා බහුලව තිබුණි. ඊට අමතරව කෘෂි කාර්මික අංශයේ රැකියා වැඩි වශයෙන් දක්නට ලැබුණි. එහෙත් වර්තමානයේදී 1970 ගණන්වලදී ඇති වුණ විවෘත ආර්ථිකය හේතුවෙන් පෞද්ගලික අංශයේ රැකියා ක්‍රමක්‍රමයෙන් වර්ධනය වීමක් දක්නට ලැබුණි. නූතනයේදී ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ රැකියා අවස්ථා ක්‍රමක්‍රමයෙන් අඩු වී යෑමත්, පෞද්ගලික අංශයේ රැකියා ක්‍රමක්‍රමයෙන් වැඩි වීමත් දක්නට ලැබේ.

1980 දශකයේ පමණ සිට ලෝකයේ සෑම රටක්ම, ගෝලීයකරණයත් සමඟ ගෝලීය ආර්ථිකයට සම්බන්ධ විය. විශේෂයෙන්ම අන්තර්ජාලය සමඟ කටයුතු කිරීමට ආරම්භ කිරීමෙන් පසු ඒ ඒ රටවල මිනිසුන්ට විදේශ රටවල රැකියා කිරීමට අවස්ථාව හිමි විය. වර්තමානයේදී ලංකාවේ බොහෝ පුද්ගලයින් විදේශ රටවල ආයතන සමඟ එකතු වී අන්තර්ජාලය උපයෝගි කර ගනිමින් එම ආයතනවල රැකියා කිරීමේ ප්‍රවණතාවක් පවතී.



රටක සේවා වියුක්තිය එසේත් නැත්නම් රැකියා විරහිතවීම යන්නෙන් අදහස් වන්නේ, එරට ජනගහනයේ යම් ප්‍රමාණයකට, එක් පැත්තකින් ඵලදායීව රටේ සංවර්ධනය සඳහා දායකත්වයක් දැක්වීමට අවස්ථාව නොලැබී යෑමය. තවත් පැත්තකින් රැකියා වියුක්ත වීම යනු වැඩිහිටි පුද්ගලයකුට ජීවත් වීම සඳහා රැකියාවක් කිරීම තුළින් ආදායමක් උපයා ගැනීමට අවස්ථාවක් නොලැබී යෑමය. කිසියම් රටක සේවා වියුක්තිය වර්ධනය වන විට එය ප්‍රබල සමාජ ගැටලුවක් බවට පත් වේ. ශ්‍රී ලංකාවේ රැකියා වියුක්තිය වැඩි වීම හේතුවෙන් දුපපත්කම, ආදායම් නොමැතිකම, සොරකම්, මංකොල්ලකෑම්වලට යොමු වීම වැනි ගැටලු ඇති විය හැකිය. 1990 ගණන්වලදී දක්නට ලැබුණු 9% ආසන්නව තිබු සේවා වියුක්තිය 2020 වර්ෂයේදී පමණ වන විට දළ වශයෙන් 4.18% පමණ මට්ටමක් දක්නට ලැබුණි. එලෙස බලන විට ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිය 1990 වර්ෂයට වඩා 2020 වර්ෂයේදී අඩු වීමක් දක්නට ලැබීම පිළිබඳව සතුටු විය හැකිය. විශේෂයෙන්ම ලෝකයේ ඉහළ ආදායම් තිබෙන රටවල, පහළ ආදායම් ලබන රටවලට වඩා ශීඝ්‍රයෙන් සේවා වියුක්තිය වැඩි වී තිබේ. උදාහරණ වශයෙන් ඉහළ ආදායම් ලබන රටවල සේවා වියුක්තිය 13.02%ක් ද, අඩු ආදායම් ලබන රටවල සේවා වියුක්තිය 11.9 %ක් පමණ වී ඇත. එසේ බලන විට ශ්‍රී ලංකාවේ සේවා වියුක්තිය, ලෝකයේ පහළ ආදායම් ලබන අනෙකුත් රටවලට වඩා අඩු මට්ටක පවතී. එය සතුටුදායක තත්ත්වයකි.



**සරත් අමරසිංහ**
**රුහුණු විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ විශ්‍රාමික මහාචාර්ය**

## අධ්‍යාපනය සහ රැකියා

විශේෂයෙන්ම ඉහළ ආදායම් ලබන රටවල සේවා වියුක්තිය වැඩි වීමට, ගෝලීය වශයෙන් 1980 දශකයේදී පමණ ලෝකයේ රැකියා අවපාතය හේතු විය. පරිගණක භාවිතය, ස්වයංක්‍රීයකරණය මෙන්ම කොවිඩ් -19 වසංගත තත්ත්වය යන හේතු නිසා රැකියා අංශ අඩු විය. කොවිඩ් - 19 වසංගතය සමඟ ලෝකයේ දියුණු රටවල පවා රැකියා වියුක්තිය වැඩි විය. කොවිඩ් වසංගත තත්ත්වය නිසා ලෝකයේ දියුණු රටවල ඇති වුණු රැකියා වියුක්තියට සමගාමීව ශ්‍රී ලංකාවේ රැකියා වියුක්තිය ප්‍රබල වශයෙන් සිදු නොවීම ද සතුටට කරුණකි.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන තත්ත්වය සමඟ සේවා වියුක්තියේ වෙනස්කම් දක්නට ලැබේ. සාමාන්‍ය පෙළට වඩා පහළින් අධ්‍යාපනය ලබපු පිරිසගේ සේවා වියුක්තිය 7.2%ක් ද, උසස් පෙළ සහ ඊට ඉහළින් අධ්‍යාපනය ලැබූ පිරිසගේ සේවා වියුක්තිය 10.1%ක් වී ඇත. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය වැඩි වශයෙන් ලැබූ පිරිසගේ සේවා වියුක්තිය වැඩි වීමක් දක්නට ලැබේ. සාමාන්‍යයෙන් වැඩි අධ්‍යාපනයක් ලබන පිරිසගේ සේවා වියුක්තිය, අඩු අධ්‍යාපනයක් ලැබූ පිරිසගේ සේවා වියුක්තියට වඩා අඩු විය යුතුය. සාමාන්‍යයෙන් සිදු විය යුත්තේ ශ්‍රී ලංකාවේ වැඩිපුර අධ්‍යාපනය ලබපු පිරිසගේ සේවා නියුක්තිය වැඩි වීමය. ඒ හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ගැලපෙන පරිදි අධ්‍යාපන ක්ෂේත්‍රය වැඩි දියුණු වීම් සිදු කළ යුතු වේ. පිරිමින් තුළ සේවා වියුක්තිය වැඩි වශයෙන් දක්නට ලැබේ. ශ්‍රී ලංකාවේ සේවා වියුක්ත ජනහනයෙන් 65%ක් පමණ කාන්තාවන්ය. විවිධ හේතුන් නිසාවෙන් කාන්තාවන් රැකියා ක්ෂේත්‍රවලට යොමු නොවේ. සේවා වියුක්තවීම වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ නාගරික අංශයට වඩා ග්‍රාමීය සහ වතු අංශවලය. සේවා වියුක්ත පිරිසගෙන් වතු අංශවල 40.2%ක් ද, ග්‍රාමීය අංශවල 34.5%ක් ද, නාගරික අංශවල 31.8%ක් වශයෙන් දක්නට ලැබේ. දිළිදුකම පවතින ග්‍රාමීය සහ වතු අංශවල, නාගරික අංශයට වඩා සේවා වියුක්තියක් තිබෙන බව පෙනී ගොස් තිබේ.

ශ්‍රී ලංකාවේ සේවා වියුක්ත තත්ත්වයට හේතු රාශියක් තිබේ. පොදුවේ ගත් කල්හි කිසියම් රටක ජනගහනයට සාපේක්ෂව, ආර්ථිකයෙහි වර්ධනයක් වීම අවශ්‍යයවේ. ජනගහනය පෝෂණය කිරීමට ආර්ථිකයෙහි වර්ධනය සිදු වීම අනිවාර්යයෙන්ම අවශ්‍ය වේ. වැඩිවන ජනගහනයට අවශ්‍ය සේවා අවස්ථා සපයා දීමත් වඩාත් වැදගත්ය. ශ්‍රී ලංකාව යනු දියුණු වෙමින් පවතින රටකි. මෙරට විවිධ කාල වකවානුවලදී ආර්ථිකයේ වර්ධනයට බලපෑම් ඇති විය. පසුගිය වසර දෙක තුළ දක්නට ලැබුණු වසංගත තත්ත්වය, පසුගිය දශක කිහිපය තුළ තිබුණු යුදමය ගැටලුකාරී තත්ත්වයන්, දේශපාලන අස්ථාවරත්වයන් යන කාරණා හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආර්ථික දියුණුව පසුබෑමට ලක් විය. රටේ ආර්ථිකයේ වර්ධනය අඩු වන විට රටේ සේවා වියුක්තියත් වර්ධනය වේ.

## සේවා වියුක්තියට විසඳුම්

1970 දශකයේ මුල් භාගයේදී , ශ්‍රී ලංකාවේ වැඩිදුර අධ්‍යාපනය හැදෑරූ උගත් පුද්ගලයින් තමන්ගේ අධ්‍යාපන මට්ටමට සමගාමී වන, ලිපිකරු වෘත්තිය, ගුරු වෘත්තිය වැනි සැප පහසුවෙන් සිදු කළ හැකි වෘත්තීන්හි නියැළීමට පෙලඹීම 1970 දශකයේ මුල් භාගයේදී දැක ගත හැකි විය. ලංකාවේ වැනි රටක එවැනි රජයේ රැකියා සීමා සහිත විය. ශ්‍රී ලංකාවේ රැකියා ගැටලුව නැති කිරීමට සේවා වියුක්තිකයින්ගේ ආකල්ප වෙනස් කළ යුතු බව, සේවා වියුක්තිය පිළිබඳව පර්යේෂණයක් සිදු කළ අන්තර්ජාතික කම්කරු සංවිධානය විසින් ලංකාවට එවන ලද ඩඩ්ලි සියර්ස් ආර්ථික විද්‍යාඥයා ඇතුළු පිරිස විසින් හෙළි කරන ලදී.

ලංකාවේ රැකියා වියුක්තිය වැඩි වීමට හේතුව ලංකාවේ රැකියා අවස්ථා නොමැතිවීම නොව ස්වයං රැකියා, කෘෂිකාර්මික රැකියා, විවිධ කුලවලට අයත් රැකියා සිදු කිරීමට පුද්ගලයින් අකමැති වීමය. තවමත් සේවා අපේක්ෂාවෙන් සිටින බොහෝ දෙනා රජයේ රැකියාවක් කිරීමට කැමැත්තක් දක්වන බව, විශ්ව විද්‍යාල විවිධ පීඨවල ඉගෙන ගන්නා සිසුන් ඇසුරින් සිදු කළ පර්යේෂණයක් තුළින් අනාවරණය විය. වර්තමානයේදී රාජ්‍ය අංශයේ රැකියා අඩු වීමත්, පෞද්ගලික අංශයේ රැකියා වැඩි වීමත් දක්නට ලැබේ. ඇතැම් පුද්ගලයින් පෞද්ගලික අංශයේ වැඩි වැටුප් ලබා ගත් පුද්ගලයින්, පසුකාලීනව රජයේ සුළු වැටුපකට රැකියාවන්ට යෑම දක්නට ලැබේ.

ශ්‍රී ලංකාවේ උපාධි, පශ්චාත් උපාධි ලබා ගත් පුද්ගලයින් බොහෝ ප්‍රමාණයක් සිටිය ද පරිගණ ක්ෂේත්‍රයේ කටයුතු කළ හැකි වීම, භාෂා කිහිපයක් සන්නිවේදනය කළ හැකි වීම, නායකත්වය, මෘදු කුසලතා සපුරා තිබීම යනාදී නිපුණතාවන් නොමැති නිසාවෙන් ඔවුන්ට රැකියාවන්ට යොමු වීමට නොහැකි වී තිබේ. කුඩා කාලයේ සිටම දරුවන්ට නවීන රැකියා ලෝකයට ගැලපෙන රැකියාවන් සිදු කිරීම සඳහා අවශ්‍ය අධ්‍යාපනයක් ලබා දීමට වැඩිහිටියන් කටයුතු කළ යුතුය. ඒක් එක් පුද්ගලයාගේ අධ්‍යාපන මට්ටමට අනුව ඔවුන්ට ගැළපෙන ව්‍යවසායකත්වයන්, රැකියා ක්ෂේත්‍ර නිර්මාණය කිරීම රජය ඇතුළු ශ්‍රී ලංකාවේ පෞද්ගලික ආයතන කටයුතු කළ යුතු වේ. විශ්වවිද්‍යාල තුළ දැනට උගන්වන ලබන පාඨමාලා, සිසුන්ගේ ආකල්ප වෙනස් කර කිරීමට හැකි වන පරිදි සකස් කළ යුතු වේ. එවිට සිසුන්ට විවිධ සමාජ තත්ත්වයන් තුළදී ගැටලුකාරී නොවන ආකාරයට ජීවත් වීමට පුළුවන. අනාගතයේදී තිබෙන රැකියා ක්ෂේත්‍ර 50%ක් පමණ නැති වී යන බව ආර්ථික විද්‍යාඥයින් ප්‍රකාශ කර ඇත. ස්වයංක්‍රියකරණය හේතුවෙන් ලෝකය තුළ මිලියන 97 ක් පමණ නව රැකියාවන් බිහි වන බව ද ආර්ථික විද්‍යාඥයින් ප්‍රකාශ කර තිබේ. මේ කාරණාවලට හොඳින් අවධානය යොමු කර නූතන ලෝකයට ගැළපෙන රැකියා ක්ෂේත්‍රවලට යොමු වී, රැකියා වියුක්තියෙන් ජය ගෙන, රැකියා නියුක්තිකයකු වීමට අධිෂ්ඨානය කර ගත යුතුය.



**මදාරා මුදලිගේ**



"හුග දෙනකු තවමත් කලින් අය කළ 40% තරම් ගිනි පොලියක් පවත්වා ගෙන යන බව පෙනෙනවා. ඉදිරියේදීවත් එය අඩු නොවුණොත් ඒ අයට මහජනතාව අතර පැවැත්මක් නැති වෙයි. ඒ වග ඔවුන් හොඳින්ම දන්නවා. අනෙක ඒ අක්‍රමිකතා යළි ඇති නොවන්නට නීති රීති ඇති කිරීමටත් අවධානය යොමු කර තිබෙන වග අපට හඳුනා ගැනීමට ලැබෙනවා."

# අපේ රටේ පවුල් 50,000ක් ක්ෂුද්‍ර මූල්‍ය ණය උගුලේ පැටලිලා ඉන්නවා

**එස්. ඒ. එස්. වික්‍රමසිංහ**
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර මූල්‍ය අධ්‍යක්ෂ

අතමාරුවට හදිසියකට අනුන්ගෙන් ණයට ගැනීම මෙරට ජනතාව අතර නිතර දක්නට ලැබෙන්නකි. එය විවිධ තරාතිරම්වලදී දක්නට පුළුවන. එවැනි කුඩා මිල මුදල් අවශ්‍යතා ක්ෂුද්‍ර මූල්‍ය අවශ්‍යතා වශයෙන් හැඳින්වේ. එහෙත් එසේ සඳහන් කළ විට කෙනකුට මේ පිළිබඳ හරිහැටි නොවැටහෙන්නට පුළුවන. එසේම, සමාජයේ බොහෝ දෙනකුට එය ආගන්තුක නොවේ.

බොහෝ දෙනකු එදිනෙදා අතමාරුවට අවිධිමත් අයුරින් පොලී අනුපාත පිළිබඳ ද නොවිමසමින් මුදල් ණයට ගනිති. ගම්බදව පමණක් නොව නාගරිකව ද එය දක්නට පුළුවන. එහෙත් අවසානයේදී කන, කර ආභරණ, ගේ දොර ඉඩකඩම් පමණක් නොව ඇතැම් විට ජීවිතවලින්ද වන්දි ගෙවීමට ඒ ක්ෂණික ගනුදෙනුව හේතු වනු ඇතැයි බොහෝ දෙනකු සිතන්නට පෙලඹෙන්නේ නැත.

ජාතික වශයෙන් එහි බලපෑම දැඩි වීම හේතුවෙන් මුදල් අමාත්‍යාංශය යටතේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් මහජනතාවගේ ක්ෂුද්‍ර මූල්‍ය අවශ්‍යතා ඉටු කිරීම සහ ඒ හා සම්බන්ධ ගැටලුවලට ස්ථිර පිළියම් යෙදීමේ අවශ්‍යතාව හඳුනාගෙන තිබේ. ඒ සම්බන්ධයෙන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර මූල්‍ය අංශය භාර අධ්‍යක්ෂ එස්. ඒ. එස් වික්‍රමසිංහ මහතා සමග කළ කතාබහකි මේ.

**■ බොහෝ දෙනකු මෑතක සිට වැඩි පොලියක් දෙනවායැයි කියන සමාගම් සමග ගනුදෙනු කිරීමට පෙලඹී සිටිනවා. ඒ ඇයි?**

ලෙඩකට හෝ දුකකට ඉක්මන් මුදල් අවශ්‍යතාවක් ඇතිවූ විට බොහෝ දෙනා පොලිය ගැන විමසන්නේ නැතිව පහසුම කෙනාගෙන් ණයක් ලබා ගන්නයි පෙලඹෙන්නේ. දවස් ණය, සති ණය, මාස් ණය වශයෙන් සරලව හැඳින් වුවත් ඒ තුළ සැඟවුණු පොලිය පිළිබඳ හුග දෙනකුට හරි වැටහීමක් නැති වග පෙනෙනවා.

පොලිය දවසට 1%ක් බවට හඳුන්වා දුන්නත් අවුරුද්දකට එය 365%ක්. ඒ වුණත් රැයක් දහවලක් කියා වෙනසක් නැතිව මොන විදියකින් හරි මුදල් හදිසිය ඉක්මනින් විසඳා ගන්නයි හුග දෙනෙක් උත්සාහ කරන්නේ. ඒ වග එදිනෙදා ණයට අනුන්ට මුදල් දීමට පෙලඹුණු තැනැත්තන් හා එම ආයතන හොඳින් වටහාගෙන සිටිනවා.

ඒ අයුරින් ජනතාවට 40% සිට 330%ටත් වඩා වැඩි පොලියට මුදල් ණයට දීමේ ක්‍රියාවලියක් ඇතැම් පුද්ගලයන් හා ආයතන හරහා මෙරටින් හඳුනා ගැනීමට පුළුවන්. තනි පුද්ගලයන් පමණක් නොව එතරම් ඉහළ පොලී අනුපාත අයකරන ඇතැම් මූල්‍ය ආයතන ක්‍රියාත්මක වන බවත් හෙළිවී තිබෙනවා. ඒවා නිසා අගතියට පත්වූ තැනැත්තන් බොහොමයක් පිළිබඳ නිතර අසන්නට ලැබෙනවා.

රට පුරා පවුල් 50,000ක් පමණ ක්ෂුද්‍ර මූල්‍ය ණය උගුලේ හිරවී ඇතැයි අප මේ වන විට හෙළිකරගෙන තිබෙනවා. නැගෙනහිර පළාතේ මඩකළපුව සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කවල වැඩි පිරිසක් මේ නිසා විවිධ අර්බුදවලට මුහුණ දෙන බවත් අපට දැනගන්නට ලැබී තිබෙනවා. එපමණක් නොවෙයි. පුත්තලම, පොළොන්නරුව, මහනුවර, මාතලේ දිස්ත්‍රික්වලත් සැලකිය යුතු පිරිසක් ඉහළ පොලියට ණය ලබා ගෙන ඒවා ගෙවාගත නොහැකිව අසරණව සිටින අයුරුත් අපට පෙනී ගියා. උතුරු පළාතෙනුත් මේ හා සම්බන්ධ සිද්ධි මාධ්‍ය හරහා දක්නට ලැබෙනවා.

**■ මේ අර්බුදවලින් ජනතාව බේරා ගන්නේ කොහොම ද?**

මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම එහිදී ඉතා වැදගත්. දැනටමත් අනුරාධපුරය, කුරුණෑගල දිස්ත්‍රික්කවල පැවැත්වූ සම්මන්ත්‍රණවලදී අපට ඒ දැනුම සරලව ජනතාවට දීමට හැකි වුණා. රට පුරාම ඒ වැඩසටහන් මේ වසර තුළදී පවත්වා හමාර කරන්නට බලාපොරොත්තු වෙනවා. සමස්ත සමාජයම මේ උගුලෙන් ගලවා ගත හැකි වන්නේ මේ පිළිබඳ සියලු දෙනා හරිහැටි දැනුවත් වුවහොත් පමණයි. රටක ආර්ථිකයට එරට ජනතාවගේ මූල්‍ය සාක්ෂරතාව ඉතා වැදගත්.

ඉදිරියේදී මූල්‍ය සාක්ෂරතාව පාසල් විෂයයට ඇතුළත් කිරීමට නියමිත වන්නේත් ඒ නිසයි. ඒත් උපයන දේ කළමනාකරණයට තවමත් අපේ රටේ හුග දෙනෙක් හුරුවී නොසිටීමයි ගැටලුව. වැඩිපුර මේ උගුලේ පටලැවී සිටින්නේ කාන්තාවන් බවත් කිව යුතුමයි. අප කටයුතු කරන්නේ ඒ සියල්ලන්ටම සහන සැලසීමටයි. දිස්ත්‍රික් භාර සහකාර අධ්‍යක්ෂවරු යටතේ ක්ෂුද්‍ර මූල්‍ය ණය නිසා පීඩාවට පත් ජනතාවට සහන සැලසීමට වෙනම වැඩපිළිවෙළක් ක්‍රියාත්මකයි.

## මඩකලපුවේ, ත්‍රිකුණාමලයේ බොහෝ දුරට පැතිරිලා

## පොලිය ගැන වැටහීමක් බොහෝ දෙනකුට නෑ

## නියාමනයක් වගේම නීති රීති අත්‍යවශ්‍යයි

## මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම වැදගත්

**■ මොකක් ද ඒ අලුත් වැඩපිළිවෙළ?**

සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රකියා හා ව්‍යාපාර සංවර්ධන විෂයයන්ට වෙනමම රාජ්‍ය අමාත්‍යාංශයක් පිහිටුවා තිබෙනවා. අප දැනටමත් මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීමට සම්මන්ත්‍රණ පවත්වා හමාර කළ දිස්ත්‍රික්කවලදී ඉතා අඩු පොලියකට ඉක්මනින්ම කුඩා ප්‍රමාණයේ මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමට ජනතාවට දැන් වැඩිපුර ඉඩ ප්‍රස්ථා ඇතිකර තිබෙනවා. ඒ අනුව 7% වාර්ෂික පොලියට බැංකුවලින් කුඩා ප්‍රමාණයේ ණය සැපයෙනවා.

තවදුරටත් වර්ෂයකට 4% තරම් අඩු පොලියට ව්‍යවසායකත්ව ණය යෝජනා ක්‍රම හඳුන්වාදීම හරහා ස්වශක්තියෙන් නැඟී සිටින්නට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ජනතාවට දිරි දීමට සූදානමින් සිටිනවා.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්ම සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ජනතාවට පැහැබර හෙටක් උදා කිරීමේ පරමාර්ථයෙන් සද්භාවයෙන් යුතුවයි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මේ කඩිනම් වැඩසටහනට උරදී සිටින්නේ. ඒ අනුව දැනටමත් මෙරට ක්ෂුද්‍ර මූල්‍ය අවශ්‍යතාවලින් 50%ක් පමණ අප සපුරාලනවා.

මුළු රටේම ඉතුරුම් තැන්පතුවලින් 30%ක් පමණ පවතින්නේ සමෘද්ධි බැංකු පද්ධතියේ. ඒ අයගේ මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීමෙන් ණය ලබා ගැනීම හා ඒවා නැවත ගෙවීමත් ඉතුරුම් ආයෝජනය ආදිය පිළිබඳ දැනුම්වත් කෙරෙනවා. මේ යටතේ එකවර රුපියල් මිලියන 9000ක් පමණ ගමට යෑමෙන් ඒ ජනතාවගේ මූල්‍ය අවශ්‍යතා කඩිනමින් ඉටු වෙනවා. මෙරට සමෘද්ධිලාභීන් ලක්ෂ 18කට ආසන්න ගණනක් සිටිනවා. ඉන් 80%ක් පමණ කාන්තාවන්. එය සුවිශේෂයි. ඒ පවුලේ සියල්ලන් සමග එක්ව එහි දියුණුවට මුල්වී කටයුතු කරන්නී ඇය නිසයි.

ඊට අමතරව රටපුරා පිහිටි සමෘද්ධි බැංකු 1073කට මහ බැංකුව හරහා තවත් අරමුදල් ඉදිරියේදී අපට ලැබෙන්නට නියමිතයි. ඒ වගේම, ප්‍රජා මූල සංවිධාන 3211ක් අප සතුයි. මේ වර්ෂය තුළ ඒ සියලු ප්‍රජා මූල සංවිධානවලට තම තමන්ගේ ක්ෂුද්‍ර මූල්‍ය අවශ්‍යතා තමන්ටම සම්පූර්ණ කර ගැනීමේ හැකියාව මේ හරහා ලැබෙනවා. එයින් විශේෂ අවධානයක් ජනතාවගේ ක්ෂුද්‍ර මූල්‍ය අවශ්‍යතා ඉටු කිරීමට යොමු කෙරෙනවා.

සමෘද්ධි නිලධාරින්ගේ අධීක්ෂණය යටතේ ඒ කටයුතු ක්‍රියාත්මකයි. රුපියල් 2000 සිට 10,000 දක්වා ක්ෂුද්‍ර මූල්‍ය අවශ්‍යතා ඒ අනුව මසකට 1% පොලියට පිරිමසා ගැනීමට දැන් ජනතාවට පුළුවන්. ඊට තවත් පහසුකම් වැඩි කර තිබෙනවා. ඒ අනුව, කලින් ණයක් ලබා ගැනීමට නම් මාස 3ක් සාමාජිකයකු වශයෙන් සිටිය යුතු වුණා. දැන් ඒ කාලය සති 2ක් දක්වා අඩු කර තිබෙනවා. එකල ආරම්භක ණය වශයෙන් දුන්නේ රුපියල් 50,000යි. එය දැන් 100,000 දක්වා වැඩි කෙරුණා. සමෘද්ධි බැංකු පද්ධතියෙන් 7% පොලියට ප්‍රජා මූල කණ්ඩායම් ඇප මත රුපියල් ලක්ෂයේ සිට ලක්ෂ 10දක්වා ව්‍යවසායකත්ව ණය දෙනවා.

එසේම, සමෘද්ධි බැංකු සමිති 331ක් හරහා රුපියල් ලක්ෂ 20ක් දක්වා ණය නිකුත් කෙරෙනවා. දේපළ ආදී ඇප අවශ්‍ය වන්නේ ඊටත් වැඩි නම් පමණයි. මේ යටතේ දවසේ ඕනෑම වේලාවකදී තමන්ගේ ගමේ අසල්වාසි ප්‍රජා මූල සංවිධාන නායකයා හමුවී ඉතා අඩු මාසික පොලියකට අතමාරුවට ණයක් ලබා ගැනීමේ හැකියාව දැන් පවතිනවා.

එමෙන්ම, සමෘද්ධිලාභියාට මුදල් ඵලදායීව වියදම් කරන විදියත් අපි කියා දෙනවා. ඒ සඳහාත් අපි ව්‍යවසායකත්ව පුහුණු වැඩමුළු රටපුරා පවත්වනවා. ඒ සඳහා කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය හරහා ඉදිරි කටයුතු කෙරෙනවා.

**■ ඒත් ලාභ ලැබීමත් අවශ්‍යයි නේද?**

පැහැදිලිවම. ඒත් ඒ ප්‍රශස්ත ලාභයක් විය යුතුයි. අපේ ප්‍රමුඛ ඉලක්කය ජනතාවට සලසන සේවාවයි. දුප්පත් ජනතාව ආර්ථික වශයෙන් නඟා සිටුවීමේ රජයේ ඉලක්කය ඊට අදාළ රාජ්‍ය ප්‍රතිපත්ති වලට එකඟවයි අප කටයුතු කරන්නේ. එහිදී මුදල් අමාත්‍යාංශය ඇතුළු සෙසු රාජ්‍ය ආයතන නියෝජිතයන් සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව වැඩි මහජන සුබසිද්ධියක් සැලසෙන ආකාරයටයි අප තීන්දු තීරණ ගන්නේ.

**■ එහෙමනම් ගිනි පොලීකරුවන් පසුබහියි නේද?**

දැනටමත් ඒ හුග දෙනෙක් කලින් අය කළ ගිනි පොලිය 40% තරම් මට්ටමක පවත්වාගෙන යන බව පෙනෙනවා. ඉදිරියේදී එය තවත් අඩු නොවුණොත් මහජනතාව අතර පැවැත්මක් ඒ අයට නැති වෙයි. ඒ වග ඔවුන් හොඳින්ම දන්නවා. අනෙක ඒ අක්‍රමිකතා යළි ඇති නොවන්නට නීති රීති ඇති කිරීමටත් අවධානය යොමු කර තිබෙන වග අපට හඳුනා ගැනීමට ලැබෙනවා.

**නුවන් මහේෂ් ජයවික්‍රම**
**ඡායාරූපය**
**රුවන් ද සිල්වා**




# බක් මාසයේ හරි තීරණය

බක් මාසය එළැඹෙන්නේ සියලු සශ්‍රීකත්වය රැගෙනය. බක් මාසයේ මුව විට සිටින අපට ඒ සශ්‍රීකත්වය දැනෙන්නට පටන් ගන්නේ ගස්වැල් පල දරන්නට ගන්නා විටය. ඇතින්-මෑතින් කොහා හඬන්නට ගන්නා විටය. ගෙවල්-දොරවල් අස්පස් කරමින් නවමු උදාවකට සැරසෙන විටය. එහෙත් මෙවර සිංහල-දෙමළ අලුත් අවුරුද්ද උදාවන්නේ දශක ගණනාවකට එපිට සුපුරුදු වටපිටාව සමග නොවේ. දැන් අප සිටින්නේ ලෝකයම දණ ගැස්වූ මහා වසංගතයක අතිශය තීරණාත්මක සංක්‍රාන්තියකය. සූර්යයා මීන රාශියෙන් මේෂ රාශියට යන බවක් මේ වසංගතය නොදනී. දැන උන්නා ද වසංගතයේ රුදුරු මුහුණ ඒ සා සංවේදී මිනිස් සිරිත්-විරිත් ආදිය තකන තාලේ එකක් නොවේ. කොවිඩ් වසංගතය බුවල්ලකු මෙන් ලෝකය වෙළාගෙන, මිනිසාට දඬුවම් දී දැන් වසරක් පසු වූවා පමණි. අපේ කොදෙව්ව වසංගතය සමග සටනට ලක ලෑස්ති වූයේ ඊට ඇවැසි සියලුම අවි ආයුධවලින් සන්නද්ධව නොවුණත් සාපේක්ෂව අපේ ප්‍රති ප්‍රහාර පැසසුම් ලබන මට්ටමේ තිබුණි. පසුගිය සතියේ පාසල් ආරම්භ කෙරුණි. රාජ්‍ය ආයතන සුපුරුදු ලෙස තම සේවා සැපයීම ආරම්භ කෙරුණේ සියලු සේවකයන් රාජකාරියට කැඳවමිනි. කොවිඩ් එන්නත රට පුරා බෙදාහැර මධ්‍යස්ථාන හරහා එන්නත්කරණය සිදු කරයි. රටක් සාමාන්‍ය අතට හැරීමේ ඉඟි සෑම අතින්ම ලැබුණත් අප කොවිඩ් අවදානමෙන් මුළුමනින්ම මිදී නැත. අප තබා වෙනත් බලවත් රටවල් පවා තවමත් සිටින්නේ අවදානම්කාරී පසුබිමකය. කුඩා කොදෙව්වක වෙසෙන අප දැන් කළ යුත්තේ කුමක් ද?

අලුත් අවුරුදු උදාව වෙනුවෙන් උන්මත්තක ලීලාවෙන් සාප්පු සවාරි යෑම නම් නොවේ. එහි අවදානම පිළිබඳ යළි යළිත් කීවත් ඒ නොසලකා සිටීමේ මුග්ධ පිළිවෙතක් අනුගමය කිරීමට ඔබ සිතන්නේ නම් දෙවරක්, තෙවරක් නොව සිය වරක්වත් ඒ පිළිබඳ සිතා බැලිය යුතුය. ස්පර්ශ කරන ස්ථර, ස්පර්ශ කරන ඇඳුම්, බඩු භාණ්ඩ ආදිය පිළිබඳ අතිශය අවධානමෙන් සිටීම වැදගත්ය. කොරෝනා වයිරසය රැඳී ඇති මතුපිටක් ඔබ විසින් නොදැනුවත්වම ස්පර්ශ කළේ නම් අහඹු වාහකයකු බවට පත් නොවන්නේ යැයි කාට කිව හැකි ද? අධික දාහය සහිත මේ දිනවල නියමිත පරිදි මාස්ක් පැලඳ, සැනිටයිසර් හෝ සබන් යොදා අත් සෝදන්නේදැයි ඔබෙන්ම ප්‍රශ්න කළ යුතුය. ප්‍රකට වෙළෙඳසල්, ආපනශාලා සහ සුපිරි වෙළෙඳසල් ආදියට ඇතුළු වන විට පෙර අනුගමනය කළ ක්‍රමවේද දැන් අතිශය ලිහිල් බව සාමාන්‍ය නිරීක්ෂණයකින් සොයා ගත හැකිය.

මාස්ක් පැලඳීම පිළිබඳ කුමක්දෝ හීනෝන්මාදයක් දැන්, දැන් ඇතිව තිබෙන සෑටියකි. උපැස් යුවළක්, තොප්පියක් හෝ පළඳින ආකාරයෙන් මාස්ක් පලඳින්නට බහුතරයක් පුරුදුව ඇත. මාස්ක් ඇත්තේ නිකටේ, බෙල්ලේ හෝ හිසේය. එසේත් නැත්නම් අතේ එල්ලගෙනය. ඩෙස්ක්, මේස, පුටු මත ඔහේ තැබූ මාස්ක් බොහොමයකි. යළි එහි පිටත මතුපිට හොඳ හැටි ස්පර්ශ කරමින්, අතින් පිසදමමින් යළිත් ලා ගන්නා මේ මාස්ක් ඉල්ලා වසංගත ඇඟට දා ගන්නකි.

අවම හික්මීමවත් අහිමිව වඳුරන් සේ මේ කරමින් සිටින්නේ කුමක්ද? වසංගතයක බරපතළ බව තවම වටහා ගැනීමට අසමත් ජාතියක් ලෙස කුප්‍රකට වීමට වුවමනාවක් වේද? මේ සටහන ලියන විට (29දා) වන විට ලංකාවෙන් වාර්තා වී ඇති කොවිඩ් මරණ සංඛ්‍යාව 561කි. වාර්තා වී ඇති මුළු රෝගීන් සංඛ්‍යාව 92,088කි. සුවය ලබා නිවෙස් වෙත පිටත්ව ගිය ගණන 88,623කි. ලෝකයේ තත්ත්වය මීට වඩා අතිශය බරපතළය. මිලියන 127ක් රෝගීන් සිටින අතර සුවය ලැබූ ගණන මිලියන 72.1කි. මරණ සංඛ්‍යාව මිලියන 2.78කි. මේ දත්ත පවසන්නේ තත්ත්වය යහපත් අතට හැරෙමින් පවතින බව මිසෙක තත්ත්වය යහපත් බව නොවේ. වගකිව යුතු පුරවැසියන් කළ යුත්තේ තත්ත්වය යහපත් අතට හැරෙන ආකාරයෙන් වැඩකටයුතු කිරීමයි.

මේ තත්ත්වය යහපත් අතර හැරෙන ආකාරයෙන් වැඩ කිරීමට අයත් දේ මොනවාදැයි ලුහුඬුව කිවහොත් ඊට රංචු වශයෙන් අලුත් අවුරුද්දට ඇඳුම් ආයිත්තම් ගැනීමට යෑම අයත් නොවේ. ස්වාභාවිකවම රංචු වශයෙන් හැසිරීමට ප්‍රිය මිනිසා ඉන් ඈත් කර තැබුණු 'ලොක්ඩවුන්' කාල සීමාවේ සේම හැකි තරම් නිවෙස තුළට වී සිටීම එක් කොන්දේසියකි. අත්‍යවශ්‍ය කාරණා සඳහා පමණක් නිවෙසින් එළියට යෑමේ ස්වයං විනයක් යමකුට පවත්වා ගත හැකි නම් ඉහතින් කී ආකාරයේ වගකීම් සහගත පුරවැසියකු විය හැකිය. අවුරුදු උත්සව සංවිධානය කිරීම රටට කරන යුතුකමක් හෝ වීර ක්‍රියාවක් සේ නොසලකා සිටීමට හැකි නම් එයද උපකාරයකි. ඒ, සමූහ වශයෙන් එක් රැස් වීමෙන් අගතියක් මිසෙක මෙවන් කාලයක ප්‍රතිශක්තියක් නොලැබෙන බව සක්සුදක්සේ පැහැදිලිය. සාමාන්‍ය සිංහල-දෙමළ අවුරුදු කාලයක සෑම නගරයකම ඇති අසාමාන්‍ය තදබදය, මිනිස් හිස් පොදි වශයෙන් දැකිය හැකි වීම මෙවර දක්නට නොලැබේවා යැයි ප්‍රාර්ථනා කිරීම පමණක් නොසෑහේ. ඒ වෙනුවෙන් සංවිධානාත්මකව වැඩ කටයුතු කළ හැකිය.

ආයතනගතව පවා පරිගණකය, අන්තර්ජාලය භාවිත නොකළ බහුතරයක් කොවිඩ් වසංගතයෙන් පසුව ඔන්ලයින් රාජකාරි කටයුතු කිරීමට හුරු වුණි. සූම් හමු හරහා කිසිදා කළ හැකි යැයි නොසිතූ රාජකාරි කටයුතු කෙරුණි. ඔනල්යින් බඩු භාණ්ඩ ඇණවුම් කරන්නට හුරු වුණි. කොටින්ම නිවෙසින් අඩියක් හෝ එළියට නොයා බහුතරයක් ඕනෑ එපාකම් ඉෂ්ට කර ගැනීමේ නව සංස්කෘතියක් බිහි වුණි. මෙකී ඔන්ලයින් ඇණවුම් මඟින් තත්‍ය අවකාශයක බඩු භාණ්ඩ මිල දී ගන්නවාට වඩා මිල අඩුවෙන් සහ පහසුවෙන් මිල දී ගැනීමේ අවකාශයක්ද සැකසුණි. ඒ අතරමැද වංචා සහගත ක්‍රියා සිදු නොවුණේමයි කිව නොහැකි මුත් සාපේක්ෂව මිනිස් ජීවිතය පහසු විය.

වසංගතයක් ගෙනා උපරිම නරක සහ අවාසනාව අතර සුළු වශයෙන් ලැබුණු මේ වාසි ජීවිත පැවැත්මක් ලෙස පරිවර්තනය කර නොගැනීම අපේම වරදක් නොවන්නේ ද?

එසේත් නැත්නම් කොවිඩ් වසංගතයෙන් පසුව ලෝකය හුරු වූ නව සාමාන්‍ය විශ්වාස කරමින් ඒ අනුව කටයුතු කිරීමට කැමති වගකිව යුතු පුරවැසියෙක්දැයි විමසිය යුතුය. මේ උත්සව කාලය පුරා බුද්ධියට ඉඩ දී කටයුතු කළොත් බක් මාසයෙන් ඉක්බිතිවත් අපට සතුටින්, යෙහෙන් වෙසෙන්නට හැකි වනු ඇත. ක්‍රමිකව සාමාන්‍යකරණය වන ශ්‍රී ලංකාවට ඒ ගමන සැනසිල්ලේ යෑමට කුඩා තල්ලුවක් දුන්නා හා සමාන වනු ඇත. එසේත් නැත්නම් වගකීම් රහිත, අත්තනෝමතික පුරවැසියකු ලෙස හැසිරී සියල්ල වියවුලට තල්ලු කිරීමට හැකිය. කාසි උඩ නොදමා, අහඹු දෑ විශ්වාස නොකර හරි තීරණය ගන්න!

**කාංචනා අම්ලානි**

# කෝවිඩ් වැලඳී මිය ගිය ෂෙයික්ගේ මව්පියන් ගොනු කළ පෙත්සම විභාගයට විනිසුරුගේ අකැමැත්ත

**නෙල්කා මැදගෙදර**

කෝවිඩ් -19 වයිරසය ආසාදනය වීමෙන් මියගිය තම දින 21 වයසැති ෂෙයික් ෆායිස් නමැති බිළිඳාගේ සිරුර ආදාහනය කළ ආකාරය සැකසහිත බැවින්, ඒ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදු කරන ලෙසට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ඇතුළු බලධාරීන්ට නියෝග කරන ලෙස ඉල්ලා ගොනු කළ පෙත්සම් විභාගයට සහභාගි වීමට ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු යසන්ත කෝදාගොඩ මහතා ඊයේ (29) පෞද්ගලික හේතූන් මත අකැමැත්ත ප්‍රකාශ කළේය.

මියගිය එම දරුවාගේ දෙමව්පියන් ගොනු කළ එම පෙත්සම සිවු පුද්ගල ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඬුල්ලක් හමුවේ කැඳවූ අවස්ථාවේ දී මේ බව සඳහන් කෙරිණි.

ඒ අනුව එම විනිසුරුවරයා නොමැති විනිසුරු මඬුල්ලක් නම් කිරීම සඳහා හමුවේ පෙත්සම අගවිනිසුරු ජයන්ත ජයසූරිය මහතා වෙත යොමු කරන ලෙස රෙජිස්ට්‍රාර්වරයාට නියම විය.

ප්‍රියන්ත ජයවර්ධන, එල්.ටී.බී. දෙහිදෙණිය, ගාමිණී අමරසේකර, යසන්ත කෝදාගොඩ, කුමුදුනී වික්‍රමසිංහ යන පංච පුද්ගල විනිසුරු මඬුල්ල හමුවේ මේ පෙත්සම කැඳවනු ලැබිණි.

කොළඹ 15, ෆර්ගියුසන් පාරේ පදිංචි මොහොමඩ් ෆාරුක් මොහොමඩ් ෆාහිම් සහ ෆාතිමා ෂෆ්නාස් නමැත්තන් විසින් මේ පෙත්සම ගොනු කර ඇත.

මෙහි වගඋත්තරකරුවන් ලෙස සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන, රිජ්වේ ආර්යා ළමා රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය ජී. විජේසූරිය, සෞඛ්‍ය ඇමතිනී පවිත්‍රා දේවි වන්නිආරච්චි ,ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත හා කෝවිඩ් පැතිරීම වැළැක්වීමේ කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍ය විශේෂඥ වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ, සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් සංජය මුණසිංහ, රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් වෛද්‍ය අමල් හර්ෂ ද සිල්වා සහ නීතිපති නම් කරනු ලැබ සිටිති.

නීතීඥ සංජීව කළුආරච්චි මහතා විසින් ගොනු කර ඇති මේ පෙත්සමේ මෙසේද සඳහන් වේ.

පළමු පෙත්සම්කරු ත්‍රීරෝද රථ රියැදුරෙකි, ඔහු දෙවැනි පෙත්සම්කාරිය සමග 2013 වසරේ ඔක්තෝබර් නීත්‍යනුකූලව විවාහපත් වූහ. දෙදෙනාම ශ්‍රී ලාංකික පුරවැසියන් වෙති. ඔවුන් දෙදෙනාට දාව 2014 දී දියණියක්ද උපත ලැබුවාය. දෙවැනි පෙත්සම්කාරිය සිය දෙවැනි දරු උපත සූදානම් වෙමින් සිටියදී පසුගිය ඔක්තෝබර් 30 වැනිදා ඔවුන් පදිංචිවී සිටි මෝදර ප්‍රදේශය හුදකලා කෙරිණි. ඒ අතර තුර පසුගිය නොවැම්බර් 18 වැනි දින ' ද සොයිසා ' රෝහලේදී දෙවැනි පෙත්සම්කාරිය ෂෙයික් ෆායිස් නමැති දරුවා බිහි කළාය. එම දරුවා උපත ලැබූ අවස්ථාවේදී නීරෝගීමත් දරුවකු වීය.

පසුගිය දෙසැම්බර් 07 වැනිදා එම දරුවා උණ රෝගයෙන් සහ සෙම්ප්‍රතිශ්‍යා තත්ත්වයෙන් පසුවිය. ඒ සමගම දරුවා රිජ්වේ ආර්යා ළමා රෝහලට ඇතුළත් කෙරිණි. එදින රාත්‍රි 11.30ට පමණ එම දරුවාට කෝවිඩ් 19 වයිරසය ආසාදනය වී ඇති බව තහවුරු විය. ඉන්පසුව එම දරුවා දැඩි සත්කාර ඒකකයට ඇතුළත් කෙරිණි.ක්‍රම ක්‍රමයෙන් දරුවාගේ තත්ත්වය උග්‍රවිය.ඊට පසුදින සවස 4.15ට දරුවා මිය ගියේය.

මේ සිදුවීම් මාලාව සිදුවූ කාලය තුළ දරුවාගේ කිසිදු වෛද්‍ය වාර්තාවක් පෙත්සම්කරුවන් වෙත ලබා නොදුන්නේය.

කෙසේ නමුත් පෙත්සම්කරුවන්ට කිසිදු දැනුම් දීමකින් තොරව දරුවාගේ මෘත ශරීරය ආදාහනය කෙරිණි.

ඊට කිසිදු හේතුවක් අදාළ බලධාරීන් විසින් පෙත්සම්කරුවන්ට ලබා නොදුන්හ. පෙත්සම්කරුවන්ගේ දරුවාගේ මෘත ශරීරය ආදාහන කිරීම අභිරහසක් වන අතර එලෙස ආදාහනය කිරීමට සාධාරණ හේතුවක් නොමැත. ඒ වන විටත් , කොවිඩ් වයිරසය වැළඳීමෙන් මිය ගිය පුද්ගලයන් 19 දෙනකුගේ මළ සිරුරු මෘත ශරීරාගාරයේ රඳවා තිබිණි.

පෙත්සම්කරුවන්ගේ දරුවා මෙලෙස ආදාහනය කිරීම ඔවුන්ගේ ආගමට මතවාදයන්ට අනුව පටහැණි ක්‍රියාවක් වේ.

කෝවිඩ් ආසාදිත මෘත ශරීරයකින් වයිරස් භූගත් ජලයට එක් නොවන බව ලෝ ප්‍රකට ක්ෂුද්‍ර ජීව විද්‍යාඥයකු වන මහාචාර්ය මලික් පීරිස් මහතා පවසා ඇත.

මේ සමස්ත ක්‍රියාවලියම හේතුවෙන් පෙත්සම්කරුවන්ගේ මූලික අයිතිවාසිකම් කඩ වී ඇත.

එබැවින් වගඋත්තරකරුවන්ට නොතීසි නිකුත් කරන ලෙසත්, මේ පෙත්සම විභාගයට ගැනීමට අවසර දෙන ලෙසත්, මේ සිද්ධියට අදාළ වෛද්‍ය වාර්තා අධිකරණය හමුවට ඉදිරිපත් කිරීමට නියෝග කරන ලෙසත්, කෝවිඩ් වැළඳී මියගිය අයගේ සිරුරු භූමදානය පිළිබඳ විමර්ශන සඳහා විද්වත් කමිටුවක් පත් කිරීමට නියෝග කරන ලෙසද, සිදුවූ හානියට වන්දි ලබා දෙන ලෙසද පෙත්සම්කරුවෝ සිය පෙත්සමෙන් ඉල්ලා සිටිති.

නීතිඥ සංජීව කලුආරච්චි මහතාගේ උපදෙස් මත ජනාධිපති නීතීඥ ෆායිස් මුස්තාපා මහතා සහ පුලස්ති හේවාමාන්න, ශාන්ත ජයවර්ධන, හෆීල් පාරිස් යන නීතිවේදීහු පෙත්සම්කාර පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටියහ.

නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් නෙරින් පුල්ලේ මහතා නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටියේය.

# මිලේච්ඡ ත්‍රස්ත ක්‍රියා සැලසුම් කරන අනුබල දෙන කිසිවකුට නීතියේ රැහැනින් මිදී යෑමට ඉඩ දෙන්න එපා

## අගරදගුරු පදවි විශේෂ කමිටුව

**සුභාෂිණී සේනානායක සහ චන්දිමා කරුණාරත්න**

මිලේච්ඡ ත්‍රස්ත ක්‍රියාවන් සැලසුම් කරන සහ සිදු කරන මෙන්ම ඒවාට විවිධ ආකාරයෙන් උදව් උපකාර කරන සහ අනුබල දෙන කිසිවකුට නීතියේ රැහැනින් මිදී යෑමට කිසිදු ඉඩක් නැති බව ඔප්පු කර පෙන්වීම සාමය ආරක්ෂා කිරීමේ නීතිය ක්‍රියාත්මක කිරීමේ වගකීමෙන් බැඳී සිටින සියලු නිලධාරීන්ගේ මෙන්ම බලධාරීන්ගේද වගකීම බව අගරදගුරු පදවි විශේෂ කමිටුව දැඩි සේ අවධාරණය කර සිටියි.

එම වගකීම ඉටු නොකිරීම සාපරාධී ක්‍රියාවක් බව පවසන එම කමිටුව ඒ සඳහා අදාළ නිලධාරීන් හා බලධාරීන් විසින් වින්දිත සියලු දෙනාට යුක්තිය ඉටු කිරීමේ වගකීම ඉටු නොකර සිටිය නොහැකි තත්ත්වයට පත් කිරීම මෙරට සියලු පුරවැසියන්ගේ වගකීම බවද පෙන්වා දෙයි.

අගරදගුරු පදවි විශේෂ කමිටුව නිවේදනයක් නිකුත් කරමින් මේ බව අවධාරණය කර සිටියි.

එමෙන්ම එම ක්‍රියාවලිය ස්වාධීනව ක්‍රියාත්මක කිරීම අඩාළ කරන කිසිදු ආකාරයක දේශපාලනික බලපෑමක් නොකරන්නැයි ව්‍යවසනයට ගොදුරු වූ සියල්ලන් වෙනුවෙන් රජයෙන් මෙන්ම විපක්ෂයේ දේශපාලඥයන්ගෙන් තරයේ ඉල්ලා සිටියි.

එමෙන්ම නීතිපතිවරයා ඇතුළු අදාළ අංශවල සියලු නිලධාරීන් නොපමාව තම කාර්යභාරය නොවලහා ඉටු කළ යුතු වන බවද එම නිවේදනයේ දක්වා ඇත.

පාස්කු ප්‍රහාරයේ මිලේච්ඡ මිනිස් සංහාරයට සෘජුව සහ වක්‍රව සැලසුම් කළ මූල්‍යමය ආධාර දුන් මෙන්ම දේශපාලනික රැකවරණ දුන් වගකිව යුතු අය සොයා තවදුරටත් කළ යුතු විමර්ශන කඩිනම් කර කල් නොයවා ඔවුන් නීතිය ඉදිරියට ගෙනෙන සෙලත් මේ වනවිටත් අත්අඩංගුවට ගෙන ඇති සැකකරුවන් පිළිබඳව නීතිමය ක්‍රියාවලිය කඩිනම්ව හා ශක්තිමත්ව ක්‍රියාවට නංවන ලෙසත් එම නිවේදනය මගින් ඉල්ලා සිටියි.

එමෙන්ම මරාගෙන මැරෙන කණ්ඩායමේ මූලිකත්වය දැරුවා යැයි සැක කෙරෙන සහරාන් හෂීම් නැමැත්තා සමග උතුරු නැගෙනහිර යුද සමයේ අවසාන කාලයේ සිට විවිධාකාරයෙන් ගනුදෙනු සහ සබඳතා පැවැත්වූ සියලු පුද්ගලයන් සහ සංවිධාන පිළිබඳව පුළුල් විමර්ශනයක් සිදු කළ යුතු බවද අවධාරණය කරන අගරදගුරු පදවි ප්‍රකාශක කමිටුව මෙම ප්‍රහාරය සම්බන්ධයෙන් ප්‍රමාණවත් බුද්ධි තොරතුරු ලැබී තිබියදීත් ප්‍රහාරය වළක්වාගැනීමේ වගකීම සිතාමතාම පැහැර හැරියාවූ පාස්කු කොමිසම් වාර්තාව විසින් නම් කොට නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු සියලු දෙනාට එරෙහිව ඉක්මනින් නීතිමය පියවර ගත යුතු බවද නිවේදනයේ දක්වා ඇත.

පාස්කු ප්‍රහාරය මුළු මහත් ජාතියටම එල්ල වූ ප්‍රහාරයක් .එම ප්‍රහාරය හේතුවෙන් මුළු මහත් දේශයටම සිදු වූ පාස්කු ප්‍රහාරයෙන් කතෝලික සහ කිතුනු දේවස්ථානයන්හිදී සහ සංචාරක හෝටල් සහ ලැගුම්හල් හිදී ඝාතනයට ලක් වූ, සදාකාලික ආබාධිත වූ සහ රෝගීව ඔත්පළ වූ සිය ගණනක් ජනතාවට සත්‍යය යුක්තිය සහ සාධාරණත්වය ලබා ගැනීමට කොළඹ අගරදගුරු පදවිය දරන පරිශ්‍රමය, අප පතන යුක්තිය සහ සාධාරණත්වය ලැබෙන තුරු නොකඩවා ඉදිරියට ගෙන යාමට තීරණය කර තිබෙනවා. අප ඉල්ලා සිටින සත්‍යය යුක්තිය සහ සාධාරණත්වය කුමක්දැයි පැහැදිලි කරදීමට මේ නිවේදනය නිකුත් කරනවා. පාස්කු ප්‍රහාරයෙන් සිදු වූ ආර්ථික හානිය මෙහිදි අමතක කළ යුතු නැහැ. මෙම ප්‍රහාරයෙන් විනාශ වුවේත් අගතියට පත් වූවේත් කතෝලික සහ ක්‍රිස්තියානි ජනතාව පමණක් නොවේ. මේ රටේ වෙසෙන සිංහල, ද්‍රවිඩ මුස්ලිම් බර්ගර් මැලේ ආදි සියලු ජාතින්ද බෞද්ධ හිනිදු ඉස්ලාම් ක්‍රිස්තියානි සහ කතෝලික ආදි සියලු ආගම්වලට අයත් ජනතාවත් විදේශිකයෝත් ප්‍රහාරයට පත් වුණා යැයිද එම නිවේදනයේ දක්වා ඇත.

ෆ්‍රීලි මුතුකුඩාරච්චි, ෆ්‍රැන්සිස් සේනානායක, ශ්‍රී ලංකා පැවිදි ශ්‍රේෂ්ඨයින්ගේ සම්මේලනයේ සභාපති ඩිලාන් ප්‍රනාන්දු, , සිරිල් ගාමිණී ප්‍රනාන්දු, සිසිල් ජෝයි පෙරේරා, කැමිලස් ප්‍රනාන්දු, ශාන්ත සාගර හෙට්ටිආරච්චි, ලෝරන්ස් රාමනායක, ඩෙනින්ටන් සුබසිංහ යන පියතුමන්ලා එම නිවේදනය සිය අත්සන් තබමින් නිකුත් කර තිබේ.

# වන විනාශයේ යම් පාලනයක් කළත් සම්පූර්ණයෙන් නවත්වන්න බැහැ

## ජවිපෙ ම.කා.ස. සමන්ත විද්‍යාරත්න

**නදී මාණික්කගේ**

ළපටි හුරතල් කතාවලින් පරිසර විනාශය ගැන ඇත්ත කතාව කිව නොහැකි බව ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභික සමන්ත විද්‍යාරත්න මහතා පවසයි.

වත්මන් ආණ්ඩුව බලයට එන්න පරිසර ප්‍රශ්නය පාවිච්චි කළ බවත්, විල්පත්තු වන විනාශය ගැන කතා කරමින් වියත්මග වැනි සංවිධාන කිව්වා පරිසරය ආරක්ෂා කරන්න ගහක් වගේ නායකයෙක් ඕනෑ කියමින් බලයට පත් වූ ආණ්ඩුව පරිසර විනාශය සිදු කරමින් සිටින බවද විද්‍යාරත්න මහතා කීවේය.

# LTTEයට උදවු කරන වෙබ් අඩවියක් පවත්වා ගෙන ගිය දෙදෙනෙක් අත්අඩංගුවට

**රක්ෂණ ශ්‍රියන්ත**

එල්ටීටීඊ ත්‍රස්තවාදය සහ බෙදුම්වාදය ප්‍රවර්ධනය වන ආකාරයට යූ ටියුබ් නාලිකාවක් සහ වෙබ් අඩවියක් පවත්වාගෙන ගිය පුද්ගලයන් දෙදෙනකු සහ අදාළ පරිගණක යන්ත්‍ර යාපනය නගරයේ නාවර්විදිය ප්‍රදේශයේදී ත්‍රස්ත ක්‍රියා විමර්ශන කොට්ඨාසය මගින් ඊයේ (29) උදෑසන අත්අඩංගුවට ගෙන තිබේ.

එල්ටීටීඊ ත්‍රස්තවාදය ප්‍රවර්ධනය වන ආකාරයට යූ ටියුබ් නාලිකාවක් සහ වෙබ් අඩවියක් පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් තොරතුරු රාශියක් ත්‍රස්ත ක්‍රියා විමර්ශන කොට්ඨාසයට ලැබී තිබිණි.

# ඉදිරි වසර පහට බදු වෙනස් කරන්නේ නෑ

## ජනාධිපති ලේකම් ආචාර්ය පී.බී. ජයසුන්දර

**ක්‍රිසන්ති විතාරණ**

ඉදිරි වසර පහට බදු වෙනස් නොකරන බවත්, අලුත් ආදායම් මාර්ග සොයා ගන්නා බවත් ජනාධිපති ලේකම් ආචාර්ය පී.බී. ජයසුන්දර මහතා පැවසීය. එසේම ලබා ගත් ණය අනිවාර්යයෙන් ගෙවන බව ද ඒ අතර ණය නොගන්නා බව ද ඒ මහතා වැඩිදුරටත් කීය. ආචාර්ය පී. බී ජයසුන්දර මහතා මේ බව පැවසුවේ පසුගිය දා කොළඹ දී පැවැති කොළඹ සංවර්ධන සම්මන්ත්‍රණයේ (Colombo Development Symposium) දීය.

කොරෝනාවලින් පසු රටේ ආර්ථිකය නඟාසිටුවීම සඳහා මේ වන විටත් කටයුතු ක්‍රියාත්මක වන බව පැවසූ ඔහු, බොහෝ ව්‍යාපෘතිවල ප්‍රතිඵල ජීවිත කාලයටම ලබා ගත නොහැකි බවත් එවන් ව්‍යාපෘති රැසක් අවලංගු කිරීමට කටයුතු කළ බවත් පැවසීය. එහිදී එම ව්‍යාපෘති සිදු කරන්නේ චීනය ද ඉන්දියාව ද එසේත් නැත්නම් බටහිර හෝ නැගෙනහිර යුරෝපා රටවල්ද යන්න අදාළ නොවූ බව පැවසූ ජනාධිපති ලේකම්වරයා, ඒ සියල්ල ජනාධිපතිවරයාගේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව සිදු කරන බව සඳහන් කළේය.

ඉදිරි පසු වසර තුළ වැට් බද්ද 8% වන අතර කිසිදු බදු වෙනස්කිරීමක් සිදු නොකරන බව ඔහු වැඩිදුරටත් කීය.

# ජිනීවා යෝජනා ක්‍රියාවට නැංවුවොත් සාම සාධක හමුදාවක් පැමිණීමේ අවදානමක්

**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

ජිනීවා මානව හිමිකම් කවුන්සිලයේ යෝජනාවන් නිසි ලෙස ක්‍රියාවට නැංවීමට ශ්‍රී ලංකා රජය පියවර නොගත හොත් එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවක් මේ රටට පැමිණීමේ අවදානමක් ඇති බව දෙමළ ජාතික සන්ධානයේ ප්‍රකාශක එම්.ඒ. සුමන්තිරන් මන්ත්‍රීවරයා 28 දා පැවසීය.

මාධ්‍ය හමුවකට එක්වෙමින් මේ බව කියා සිටි මන්ත්‍රීවරයා සඳහන් කළේ ජිනීවා මානව හිමිකම් කවුන්සිලයේ යෝජනාවන් ක්‍රියාවට නැංවීම සඳහා රජය බැඳී නොමැති බව ඇතැම් ඇමැතිවරු ප්‍රකාශ කළත් සත්‍ය තත්ත්වය වන්නේ එම යෝජනා අනිවාර්යයෙන්ම ක්‍රියාවට නැංවීමට සිදු වන බවයි.

වසර කීපයක්ම යෝජනා වූ ජිනීවා යෝජනාව ක්‍රියාවට නැංවීමට ඒ ඒ කාලවල රජයන් අපොහොසත් වී තිබීම නිසා ශ්‍රී ලංකාවේ තත්ත්වය නරක අතට හැරී ඇති බව කී මන්ත්‍රීවරයා එවැනි පසුබිමක අවාසනාවන්ත තත්ත්වය වන්නේ එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවක් මේ රටට පැමිණීම බවද පැවැසීය.

# මුතුරාජවෙල සංරක්ෂණයට ඒකාබද්ධ කමිටුවක්

මුතුරාජවෙල අභයභූමිය සංරක්ෂණය කිරීම සඳහා වගකිව යුතු සියලු පාර්ශ්වයන්ගෙන් සැදුම්ලත් ඒකාබද්ධ කමිටුවක් පත් කිරීමට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව තීරණය කළේය. ඒ අනුව, එම කමිටුව පරිසර අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතාගේ මූලිකත්වයෙන් ඉදිරි සති දෙක තුළ රැස්වීමට සහ ඉදිරි කටයුතු සැලසුම් කිරීමට එහිදී එකඟතාවය පළ විය. මන්ත්‍රී මහාචාර්ය තිස්ස විතාරණ මහතාගේ සභාපතිත්වයෙන් පසුගියදා පාර්ලිමේන්තුවේදී රැස් වූ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව එම තීරණය ගනු ලැබීය.

1996 අංක 947/13 දරන ගැසට් පත්‍රය මගින් මුතුරාජවෙල අභයභූමියක් ලෙස ගැසට් කර තිබුණද එම අභයභූමියේ මායිම් ලකුණු කිරීමක් මේ දක්වා සිදුනොවීම පිළිබඳව කමිටුවේ අවධානයට යොමු විය.

01 වැනි පිටුවෙන්...

## තෙල බෙදූ ...

කොරෝනා වසංගත සමයේ ඛනිජ තෙල් සංස්ථාව ලාභයක් ලබා තිබූ නිසා සූවස් ඇළේ ප්‍රශ්නය මත තෙල් මිල වැඩි කළ යුතු බවට ප්‍රකාශ කිරීම සුදුසු නැතැයි ද මන්ත්‍රීවරයා සඳහන් කළේ ය.

කුඩා ව්‍යාපාර කරන පිරිස්, බස් රථ හා ත්‍රිරෝද රථ රියැදුරන් සඳහා රජයෙන් ලැබුණු සහන ප්‍රමාණය පිළිබඳ කිසිසේත් සෑහීමකට පත්විය නොහැකි බව කී හෙතෙම ආණ්ඩුවේ අඩු-පාඩු නිවැරදි කර ගැනීමට නොහැකි වී මේ වනවිට දැඩි අපහසුතාවකට පත්ව ඇතැයි ද පෙන්වා දුන්නේ ය.

## රට පුරා රිය ...

නාරම්මල පොලිස් වසමේ නාරම්මල කුලියාපිටිය මාර්ගයේ හොරම්බාව ප්‍රදේශයේදි පෙරේදා (28) සිදුවූ රිය අනතුරකින් රථවාහන රාජකාරිවල යොදවා සිටි පොලිස් නිලධාරීන් දෙදෙනකු අපරීක්ෂාකාරී සහ අන්තරාදායක ලෙස යතුරු පැදියක ගමන් කළ පුද්ගලයන් දෙදෙනකුට නවත්වන ලෙස අණ කර ඇත. එම අවස්ථාවේ යතුරු පැදිකරු රාජකාරි කරමින් සිටි එක් පොලිස් නිලධාරියකු හප්පා පලායාමට සූදානම්ව තිබේ. එම අනතුරෙන් එක් පොලිස් නිලධාරියකු මියගොස් අනෙක් පොලිස් නිලධාරියා තුවාල ලබා තිබේ. යතුරුපැදියේ ගමන් ගත් පුද්ගලයන් දෙදෙනා අත්අඩංගුවට ගෙන ඇති අතර ඔවුන් බීමත්ව සිටි බවට අනාවරණය වී තිබේ.

01 වැනි පිටුවෙන්...

## විදේශයෙන් ආනයනය ...

ඒ අනුව විදේශ රටවලින් ආනයනය සීමා කළ කෘෂිභෝග පමණක් මෙම ඉඩම්වල වගාකිරීමට පියවර ගෙන තිබෙන අතර මහවැලි කලාපයේ ඉඩම් මේ වෙනුවෙන් තෝරාගෙන තිබෙන බව මහවැලි කලාප ආශ්‍රිත ඇළවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්, ඉංජිනේරු වසන්ත බණ්ඩාර පළුගස්වැව මහතා ප්‍රකාශ කරයි.

මේ වෙනුවෙන් බීජ. පොහොර සපයන බව පෙන්වාදෙන ලේකම්වරයා ඒ සඳහා මේ වන විට රජය විසින් රුපියල් ලක්ෂ 420 ක මුදලක් වෙන්කර තිබෙන බවද මේ වැඩපිළිවෙළ හරහා විදේශ විනිමය විශාල ප්‍රමාණයක් රට තුළ ඉතිරි කර ගැනීමට හැකියාව ලැබෙන බවද පෙන්වාදෙයි.

මහවැලි කලාපයේ පිහිටි ගොවිපොළවල මෙම බීජ නිෂ්පාදනය කිරීමට පියවර ගෙන තිබෙන අතර උසස් තත්ත්වයේ බීජ නිෂ්පාදනය කිරීමේ හැකියාව තිබෙන බවද තිරසාර ලෙස එම බීජ ගොවියන් අතට පත් කිරීම සඳහා පියවර ගෙන තිබෙන බවද සඳහන් කරන ලේකම්වරයා මේ වනවිට ගොවිපොළවල් 21ක් පමණ මහවැලි කලාපයේ ස්ථාපිත බව ද පවසයි.

මේ අතර 2021 වර්ෂය තුළ ඉලක්ක රැසක් ජයගැනීම වෙනුවෙන් ක්‍රියාමාර්ග ගෙන තිබෙන බව පෙන්වාදෙන වසන්ත බණ්ඩාර පළුගස්වැව මහතා කිරිගොවිපොළ 1,000ක් හා කිරි සමිති 100ක් සංවර්ධනය, ජලාශ 100 ක මිරිදිය ධීවර කටයුතු සංවර්ධනය, විසිතුරු මත්ස්‍ය ගොවිපළ 800ක් සංවර්ධනය, කුකුළු පාලන ගොවිපළ800ක් සංවර්ධනය, මහවැලි ගොවිපළ 10ක් අභිජනන ගොවිපළ ලෙස සංවර්ධනය ඊට අයත්වන බවද කියාසිටී.

ඊට අමතරව තෘණ භූමි අක්කර 1,150ක් පිහිටුවීම, කිරි සමිති 10ක් ධීවර සමිති 10ක් විසිතුරු මත්ස්‍ය සමිති 5ක් නවීන තොරතුරු තාක්ෂණය සමග සම්බන්ධ කිරීම සහ ගොවීන් හා නිලධාරීන් ඇගයීම ද ඒ අතර වන බව ලේකම්වරයා පෙන්වා දෙයි.

## සේනාධිපතිට...

නිශ්ශංක සේනාධිපති මහතා වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ සම්පත් මෙන්ඩිස් මහතා අධිකරණයෙන් කළ ඉල්ලීමක් අනුව මේ අවසරය ලබා දුන් විනිසුරු මඬුල්ල අදාළ නියෝගය ආගමන විගමන පාලකවරයාට හා අදාළ අංශවලට දැනුම් දෙන ලෙසද දන්වා සිටියහ.

ගාලු වරායේ පාවෙන අවි ගබඩාවක් පවත්වාගෙන යෑම ඇතුළු චෝදනා යටතේ නිශ්ශංක සේනාධිපති මහතා ඇතුළු හත් දෙනකුට එරෙහිව නීතිපතිවරයා පවරා ඇති නඩුවේ හත්වැනි විත්තිකරු ලෙස නම්කර ඇති සිය සේවාදායකයාට වෛද්‍ය ප්‍රතිකාර සඳහා සිංගප්පූරුවට යාමට ඇති බවත්, ඒ සඳහා අවසර ලබාදෙන ලෙසත් නීතිඥවරයා අධිකරණයෙන් ඉල්ලා සිටියේය. රුපියල් ලක්ෂ විසිපහක ශරීර ඇපයක් මත විදෙස් ගමන් බලපත්‍රය මුදා හරින ලෙසට විනිසුරු මඬුල්ල නියෝග කළේය.

මහාධිකරණ විනිසුරු ආදිත්‍ය පටබැඳිගේ, මහාධිකරණ විනිසුරු මංජුල තිලකරත්න හා මහාධිකරණ විනිසුරු මහේන් වීරමන් මහත්වරුන් ඉදිරියේ නඩුව කැඳවීය. ඉදිරිපත් කර ඇති වෛද්‍ය වාර්තා මත ඉල්ලීමට විරුද්ධ නොවන බව නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි රජයේ ජ්‍යෝෂ්ඨ නීතිඥ ජනක බණ්ඩාර මහතා දන්වා සිටියේය.

## බස්නාහිර පාසල්...

බස්නාහිර පළාතට අයත් කලාප අධ්‍යාපන කාර්යාල එකොළහේම තොරතුරු ලබා ගත් බවත්, ඒ සෑම කලාපයකම පිහිටි පාසල්වල සිසුන්ගේ පැමිණීම ප්‍රශස්ත අගයක පැවති බවත්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා කීය. ගුරුවරුන්ගේ පැමිණීම සිසුන්ගේ පැමිණීමට වඩා ඉහළ අගයක පැවති බවද ඒ මහතා සඳහන් කළේය.

සිසුන්ගේ පැමිණීම සම්බන්ධයෙන් දිනමිණ කළ විමසුමකදී බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ශ්‍රී ලාල් නෝනිස් මහතා මේ බව පැවසීය.

සෑම පාසලකම මුළු ශිෂ්‍ය සංඛ්‍යාවම ගෙන්වා ගැනීමට කටයුතු නොකළ බවද, පන්ති කාමරයක සිසුන් අතර මීටරයේ පරතරය පවත්වා ගෙන යා යුතු බැවින් ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි පාසල්වලට කණ්ඩායම් වශයෙන් සිසුන් ගෙන්වා ගැනීමට කටයුතු කළ බවද ඒ මහතා කීය. ඉදිරි දිනවලදී ද කණ්ඩායම් වශයෙන් පාසල්වලට සිසුන් ගෙන්වා ගැනීමට බලාපොරොත්තු වන බවත්, එවිට එක් සිසුවකුට පාසලට පැමිණීමට සිදුවෙන්නේ සතියකට එක් දින දෙකක් හෝ තුනක් පමණක් බවත් පැවසීය.

ළමයින්ට අධ්‍යාපනය ලබා ගැනීමට හැකි අයුරින් පාසල් සුරක්ෂිත කර තිබෙන බවත්, සෞඛ්‍යාරක්ෂිත ක්‍රම අනුගමනය කරමින් පාසල් පවත්වා ගෙන යන බවත් බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා සඳහන් කළේය.

සෑම ළමයකුම මුව ආවරණ පැළඳගෙන පාසල්වල අධ්‍යාපන කටයුතු සිදු කරන බවද, දෑත් සෝදා ගැනීමට අවශ්‍ය සින්ක් මෙන්ම දෑත් පිරිසුදු කාරක ද, ශරීර උෂ්ණත්වය මැන බැලීමට අවශ්‍ය උපකරණ ද පාසල්වලට ලබා දී තිබෙන බවද කීවේය. එසේම මීට අමතරව, ගුරුවන්ට හා මව්පියන්ට අවශ්‍ය මඟපෙන්වීම ද ලබා දී තිබෙන බවත් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වැඩිදුරටත් පැවසීය.

පුද්ගල දුරස්ථභාවය ආරක්ෂා වන සේ පන්ති පැවැත්විය යුතු ආකාරය පිළිබඳ තොරතුරු ඇතුළත් මාර්ගෝපදේශ මාලාවක් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සියලුම පළාත්, කලාප හා කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් මෙන්ම, සියලු විදුහල්පතිවරුන් වෙත ලබා දීමට පියවර ගෙන තිබේ. ඒ අනුව සිසුන් 15 දක්වා සිටින පන්ති සතියේ සෑම දිනකම පැවැත්විය යුතු අතර, සිසුන් 16 සිට 30 දක්වා සිටින පන්ති කණ්ඩායම් දෙකකට බෙදා සතියක් හැර සතියක් පන්ති පැවැත්විය යුතු වේ. එසේම, සිසුන් 30ට වැඩියෙන් සිටින පන්ති කණ්ඩායම් තුනකට බෙදා සමාන දින සංඛ්‍යාවක් වන සේ පන්ති පැවැත්විය යුතුය.

මේ අතර, ඊයේ ආරම්භ වූ පෞද්ගලික පාසල් හා අන්තර්ජාතික පාසල්වල සිසුන්ගේ පැමිණීම ද ප්‍රශස්ත මට්ටමක පැවති බව දැන ගැනීමට ලැබිණි.

## චීන-ශ්‍රී ලංකා ...

ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධනයට දිගටම උදවු කරන බවත්, බහුපාර්ශ්වික වේදිකාවලදී මුහුණපෑමට සිදුවන අයුක්ති සහගත බලපෑම් හමුවේ ශ්‍රී ලංකාව වෙනුවෙන් ස්ථිරසාර ලෙස පෙනී සිටින බවත් චීන ජනාධිපතිතුමා කියා සිටියේය.

ජනාධිපති කාර්යාලයේ සිට චීන නායකයා ඇමතූ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා නොබෝදා අවසන් වූ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 46 වැනි සැසිවාරයේ දී ශ්‍රී ලංකාවට දුන් මහඟු සහයෝගය පිළිබඳව ෂී ජිං පින් ජනාධිපතිතුමාට සහ චීන රජයට සිය හෘදයංගම කෘතඥතාව පළ කළේය.

කොවිඩ් මර්දන එන්නත් මාත්‍රා හය ලක්ෂයක් ශ්‍රී ලංකාවට ප්‍රදානය කිරීම ගැන ද ජනාධිපතිවරයාගේ ස්තූතිය පුද කෙරිණ.

ළඟදී උදාවන සිංහල දෙමළ අලුත් අවුරුද්දට සුබ පැතුම් පුද කරමින් කතා බහට එක් වූ චීන නායකයා කොවිඩ් 19 ප්‍රබල අභියෝගයක් වූවා සේම චීන ශ්‍රී ලංකා සබඳතා නව අවධියකට ඔසවා තැබීමට එය ඉවහල් විණැයි සඳහන් කළේය.

"කොළඹ වරාය නගරය සහ හම්බන්තොට වරාය ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනයට දායකවීමට විශාල විභවතාවක් ඇති ව්‍යාපෘති දෙකක්. ඒවා කඩිනමින් නිම වනු දැකීම අපේ අපේක්ෂාව. වරාය නගරය, විදේශ ආයෝජන ඉඩ ප්‍රස්ථා විශාල ලෙස පුළුල් කිරීමට සමත්. එය රැකියා විරහිතභාවයටත් විසඳුමක්" චීන ජනාධිපතිතුමා කීය.

හම්බන්තොට වරාය සහ සෙසු යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සතුටුදායක ලෙස ඉදිරියට යමින් තිබේ.

චීන - ශ්‍රී ලංකා සබඳතාවන්හි උපාය මාර්ගික ප්‍රවේශය දෘශ්‍ය ප්‍රතිඵල ලැබෙන අයුරින් තවත් දියුණු කිරීමේ අවශ්‍යතාව අවධාරණය කළ චීන ජනාධිපතිතුමා දෙරටේ ජනතාව අතර සබඳතා වර්ධනය කළයුතු බව ද පෙන්වා දුන්නේය.

චීන මහජන බැංකුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට පිරිනැමුණු හුවමාරු මූල්‍ය පහසුකම අගය කළ රාජපක්ෂ මහතා එය ශ්‍රී ලංකාවේ මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කිරීමට නිසැකවම ඉවහල් වනු ඇතැයි කීය.

## පිළිකාකාරක...

ආන්දෝලනාත්මක පිළිකාකාරක අඩංගු ආනයනය කළ පොල්තෙල් වෙළෙඳපොළට නිකුත් වී නැති බව සිදු කළ පරීක්ෂණවලදී හෙළිවී තිබෙන බව රජය අවධාරණය කරයි.

ඒ අනුව මතභේදයට තුඩුදුන් ආනයනික පිරිපහදු නොකළ පොල් තෙල් තොගවල "ඇෆ්ලටොක්සින්" නමැති ප්‍රබල පිළිකා කාරකය අඩංගු බව පාරම්පරික පොල්තෙල් නිෂ්පාදකයෝ මාධ්‍ය හමුවක් පවත්වමින් මීට පෙර කියා සිටියහ.

ඒ අනුව වෙළෙඳ අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා එම අමාත්‍යාංශයේ පැවැති මාධ්‍ය හමුවකදී සඳහන් කළේ ඉකුත් සතිය තුළ මේ සම්බන්ධයෙන් ඉතා ආන්දෝලනාත්මක ප්‍රකාශයක් පැතිර ගියා. මේ ගැන විපක්ෂය ද විශාල ප්‍රචාරයක් සිදු කළා. දැනටමත් රජයේ වගකිව යුතු ආයතන මේ ගැන ප්‍රකාශ නිකුත් කර තිබෙනවා. ලංකාවට අතීතයේත් වර්තමානයෙත් පොල්තෙල් ආනයනය කිරීම සිදු වෙනවා. ආනයනය කිරීම් සිදුකරන්නේ පෞද්ගලික ආයතනයි. පොල්තෙල් පමණක් නොවේ, කිරිපිටි, අල, ලූනු, මිරිස්, පරිප්පු හා ටින්මාළු වැනි භාණ්ඩවර්ග සියල්ලම ආනයනය කරලා වෙළෙඳපොළට නිකුත් කරන්න පෙර ප්‍රධාන ආයතන දෙකක් මේ පිළිබඳ අඛණ්ඩ පරීක්ෂාවට ලක් කරනවා. එහිදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර ආරක්ෂණ අංශය හා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය එම පරීක්ෂාව සිදු කරනවා. මේ පිළිබඳ චෝදනා ඇතත් නැතත් පැමිණිලි කළත් නැතත් නිරන්තරයෙන් මේ පරීක්ෂණ සිදු කරලා තමයි වෙළෙඳ පොළට නිකුත් කරනු ලබන්නේ. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර ආරක්ෂණ අංශය තමයි මුලින්ම මේ පොල්තෙල්වල පිළිකාකාරක අඩංගු බවට කරුණු සනාථ කළේ.

මෙහිදී සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය ඇමැති ලසන්ත අලගියවන්න මහතා පැවසුවේ පාරිභෝගික සේවා අධිකාරිය දැනට වෙළෙඳපොළේ අලෙවි වෙමින් තිබෙන පොල්තෙල් නියැදි එක් දිස්ත්‍රික්කයකින් පහ බැගින් ලබාගෙන නියැඳි එකසිය විසිපහක් ලබාගෙන සිදුකළ පරීක්ෂණවලදී පිළිකාරක නොමැති බවට තහවුරු වූ බව පැවසීය.

ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් විශ්‍රාමික මේජර් ජෙනරාල් විජිත රවිප්‍රිය මහතා පැවසුවේ පැවැති ක්‍රමවේද අනුව රේගු ගුදම්වලින් මෙම පොල්තෙල් අදාළ සමාගම්වල ගුදම්වලට නිකුත් වුවත් ඒවා වෙළෙඳපොළට නිකුත් වී නැති බවයි. එම සමාගම්වල ගුදම්වලින් පොල් තෙල් නිකුත් වීම සිදු වෙලා දැයි සොයා බලා පරීක්ෂා කිරීමට නිලධාරීන් පිරිසක් යවා ඇති බව මෙහිදී කීය.

මේ අවස්ථාවට සෞඛ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකා පාරිභෝගික සේවා අධිකාරිය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ඇතුළු සියලු අදාළ ආයතනවල නිලධාරිහු සහභාගි වී කරුණු ඉදිරිපත් කළහ.

# ගොවියන්ගේ ඉල්ලීමට කන් දෙමින් ප්‍රථම සහල් ආර්ථික මධ්‍යස්ථානය දඹුල්ලෙන්

## ඇමැති ජනක බණ්ඩාර තෙන්නකෝන්

මෙරට ගොවි සංවිධාන සහ මාධ්‍ය ආයතන මඟින් සිදු කරන ලද ඉල්ලීමකට අනුව දිවයිනේ ප්‍රථම සහල් ආර්ථික මධ්‍යස්ථානය දඹුල්ලේ ආරම්භ කිරීම සඳහා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේත් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේත් උපදෙස් මත විෂයභාර අමාත්‍යවරු සමඟ සාකච්ඡා කොට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා පෙරේදා (28) පැවසීය.

මෙරට පවතින සහල් මාෆියාව වී මාෆියාව තුරන් කිරීම සඳහා මාතලේ, පොළොන්නරුව, අනුරාධපුර ආදී දිස්ත්‍රික්ක කිහිපයක ගොවි සංවිධාන නියෝජිතයන් මෙන්ම මාධ්‍යවේදීන් විසින් කරන ලද සමීක්ෂණ වාර්තා අනුව තමන්ගෙන් කරන ලද ඉල්ලීමකට ප්‍රතිචාර දක්වමින් මෙම සහල් අලවිකරණ ගොවි ආර්ථික මධ්‍යස්ථානය පිළිබඳව අවධානය යොමු වී ඇතැයි අමාත්‍යවරයා පෙන්වා දුන්නේය.

මෙම නව වැඩසටහන ක්‍රියාත්මක කළහොත් දේශීය වී ගොවියාට තම වී අලෙවි කරන ක්‍රමවේදය වෙනුවට සහල් අලෙවි කිරීමේ නව වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කළ හැකි බවත් අමාත්‍යවරයා පෙන්වා දුන්නේය.

ගොවියන් එළවළු අස්වැන්න අලෙවි කිරීම සඳහා දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකින්ම ගොවීන් දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට පැමිණේ. එසේ පැමිණෙන අවස්ථාවන්හිදී දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට සමගාමීව නව සහල් ආර්ථික මධ්‍යස්ථානයක් ඉදි කළ හොත් ගොවීන්ට තමන් නිෂ්පාදනය කරන ලද වී තම ප්‍රදේශයේ මෝල්වලින්ම සහල් බවට පත් කොට සහල් ටික ද රැගෙන විත් සහල් ආර්ථික මධ්‍යස්ථානයේ දී අලෙවි කොට එළවළු පලතුරු



ආදී සියල්ල අලෙවි කර ගත හැකි බව මෙම සංවිධානය තමා වෙත පෙන්වා දී ඇති බව අමාත්‍යවරයා සඳහන් කළේය. එසේම ආර්ථික මධ්‍යස්ථානයට එළවළු ධාන්‍ය වර්ග මිලදී ගැනීම සඳහා පැමිණෙන වෙළෙන්දන්ට ආර්ථික මධ්‍යස්ථානය උපයෝගී කරගෙන අඩු මුදලකට පිරිසිදු සහල් තොග මිලදී ගෙන තම වෙළඳ මධ්‍යස්ථානය වෙත රැගෙන යෑමේ හැකියාවක් පවතින බවද මෙම සංවිධාන තමා වෙත පෙන්වා දී තිබුණු බව අමාත්‍යවරයා පැවසීය.

මෙම සහල් ආර්ථික මධ්‍යස්ථාන ක්‍රියාවලිය ආරම්භ කළහොත් මෙරට හාල් මාෆියාවට, වී මාෆියාවට ගොවීන් විසින්ම තිත තබා මෙරට ග්‍රාමීය රැකියා රැසක් නැවත ආරම්භ වන බවත් ගොවියා තම කුඹුරේ වී ටික කුඹුරෙන් ම ව්‍යාපාරිකයන්ට අලෙවි කරන ක්‍රමවේදය වෙනස් කොට වී ගොවියා සහල් නිෂ්පාදකයකු බවට පත් වන බවත් අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා අවධාරණය කළේය.

# පරිසරය විනාශ කළොත් දැඩි දඬුවම් දිය යුතුයි

## මන්ත්‍රී වීරසුමන වීරසිංහ

**වජිර පූජිත ගුණවර්ධන - තෙලිජ්ජවිල සමූහ**

සෑම සංවර්ධන ක්‍රියාදාමයක් සමඟම පරිසර වැඩසටහනක් ක්‍රියාත්මක වෙනවා යැයිද පරිසරයට හානි කරන පුද්ගලයන්ට මිනීමැරුවකුට දෙන දඬුවම් හා සමාන දඬුවම් දිය යුතු යැයිද පරිසරය සම්බන්ධව ඇති නීති රීති ද වෙනස් විය යුතු යැයිද මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වීරසුමන වීරසිංහ මහතා පසුගියදා පැවසීය.



තෙලිජ්ජවිල උඩුකාව උතුර ග්‍රාම නිලධාරි වසමේ රෝස්මවුන්ට් වත්ත නිවාස යෝජනා ක්‍රමයේ පවුල් පනස් හයක් සඳහා මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වීරසුමන වීරසිංහ මහතාගේ මන්ත්‍රී ප්‍රතිපාදන මුදලින් නිම කළ තෙලිජ්ජවිල රෝස්මවුන්ට් වත්ත පානීය ජල ව්‍යාපෘතිය ලෝක ජල දිනයට පෙර දින සවස මන්ත්‍රීවරයා විසින් ජනතා අයිතියට පත් කරන ලද අවස්ථාවේ මන්ත්‍රීවරයා මෙමෙ අදහස් පල කළේය.

එම අවස්ථාවේදී මන්ත්‍රීවරයා මෙසේ පැවැසීය.

අද වැදගත් දවසක්. තමුන්නාන්සේලාට තිබූ බරපතළම ප්‍රශ්නයක්, කාලයක් තිස්සේ දුක් දුන්න ප්‍රශ්නයක් නිරාකරණය වන දවසක්.

අද වනාන්තර හෙළි පෙහෙළි වීම ගැන විශාල කතිකාවතක් සමාජයේ ඇති වී තිබෙනවා. එය හොඳ දෙයක්. එසේම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් විදියට අපි මේ පිළිබඳ දකින්නේ වෙනස් ආකාරයකට. සංවර්ධනයේදී මේ වගේ ගැටලු මතුවීම සාධාරණයි. ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් වෙනවා 2024 වන විට සැමට ජලය ලබා දීම පිළිබඳ. ඒ කරුණ ඉටු කිරීමට නම් මේ පරිසර පද්ධතිය රැක ගැනීම අනිවාර්යයි. ගහ කොළ, පරිසරය රැකුණොත් පමණයි ජල මූලාශ්‍ර රැකෙන්නේ. ඒ නිසයි නිල්වලා ගංගාව අකුරැස්සේ සිට පිටබැද්දර දක්වා ගඟ දෙපස සංරක්ෂණය කරන්නේ. ඒ සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව රුපියල් බිලියන දහ අටක් වෙන් කර තිබෙනවා. ජලය රකින්නට පරිසරය රැකීම අනිවාර්ය වෙනවා. එබැවින් පරිසර විනාශ කරන පුද්ගලයන්ගේ තරාතිරම නොබලා දඬුවම් කළ යුතු වෙනවා. පරිසර විනාශ පිළිබඳව කරුණු කාරණා කිසිවකු හෙළි කරනවා නම් ඔහුගේ දේශපාලනය නොව ඔහු ඉදිරිපත් ඉදිරිපත් කරුණ පිළිබඳවයි අප සැලකිය යුත්තේ. අප ආණ්ඩුව පැත්තෙන් විශාල කාර්යභාරයක් පරිසරය වෙනුවෙන් කරනවා. පරිසර සංරක්ෂණයට අවධානය යොමු කර තියෙනවා. උදාහරණයක් හැටියට කිලෝමීටර් ලක්ෂයක් මාර්ග සංවර්ධන වැඩකටයුතුවලදී, මාර්ග සංවර්ධන අධිකාරියට ඒ හා සමගාමීව එම මාර්ග දෙපස රුක් රෝපණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට පවරා තියෙනවා. ඊයේ පෙරේදා අධිවේගී මාර්ගයේ පිවිසුමක් ආරම්භ කරන්න මුල්ගල තැබුවා. ඒ අවස්ථාවේදී පැළ දහස් ගණනක් සිටුවීමට ව්‍යාපෘතියක් පටන් ගත්තා. අධිවේගී මාර්ගයෙන් විතරක් නෙමෙයි ග්‍රාමීය සෑම පාරක්ම සංවර්ධනය වන විට ඒ හා සමගාමීව පැළ සිටුවීම සිදු කෙරෙනවා. ඒ වගේම යෞවන සමාජ බාලදක්ෂ ව්‍යාපාරය මේ හැම එකකින්ම පැළ සිටුවීම සිදු වෙනවා.

# ආනයනික ආහාර සඳහා දැඩි නීති පැනවීමට ආණ්ඩුවේ අවධානය

## රාජ්‍ය ඇමැති ශෙහාන් සේමසිංහ

**අමිල ප්‍රභාත් වනසිංහ - අනුරාධපුර අතිරේක**

පොල්තෙල්වලට පමණක් නොව ආනයනය කෙරෙන අනෙකුත් ආහාර සම්බන්ධයෙන් ද ආනයනයේදී දැඩි නීති රීති පද්ධතියක් පැනවීමට ආණ්ඩුවේ අවධානය යොමු වී ඇතැයිද ආනයනය කරන ආහාර සම්බන්ධයෙන් ද පුළුල් වැටලීමක් සිදු කිරීම කෙරෙහි ද ආණ්ඩුවේ අවධානය යොමු වී ඇතැයිද මුදල් හා සමෘද්ධි රාජ්‍ය අමාත්‍ය ශෙහාන් සේමසිංහ මහතා සඳහන් කළේය.

රාජ්‍ය අමාත්‍යවරයා මේ බව කියා සිටියේ අනුරාධපුරයේදී පෙරේදා (28) පැවති මාධ්‍ය හමුවකට එක් වෙමිනි. එහිදි තවදුරටත් අදහස් දක්වමින් ශෙහාන් සේමසිංහ මහතා මෙසේද පැවසීය.

පොල්තෙල් ආනයනය කිසිදු විටෙක ආණ්ඩුව විසින් කර නොමැති බවත් මිනිස් පරිභෝජනයට නුසුදුසු ආකාරයේ පොල්තෙල් මෙරටට ආනයනය කර ඇත්නම් එම ආනයනකරුවන්ට විරුද්ධව නීතිය දැඩිව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බවද රාජ්‍ය අමාත්‍යවරයා කියා සිටියේය.

රාජ්‍ය අමාත්‍යවරයා මෙසේද පැවැසීය.

"රටේ වන සනත්වය ඉහළ නැංවීම සඳහා ආණ්ඩුව කටයුතු කරමින් පවතිනවා. මෙරට සිදු නොවන විශාල වන විනාශයක් පිළිබඳව සජිත් ප්‍රේමදාස මහතා සහ ජනතා විමුක්ති පෙරමුණ විසින් ප්‍රචාරය කරමින් ආණ්ඩුවට විරුද්ධව අසත්‍ය චෝදනා එල්ල කරනවා. විපක්ෂය කුමන චෝදනා නැගුවද රට සංවර්ධනය කරා ගෙන යෑමට ආණ්ඩුව කටයුතු කරනවා."



රජයේ මිල ගණන් යටතේ පාරිභෝගිකයන් සඳහා භාණ්ඩ සැපයිය හැක්කේ සතොස සහ සමුපකාරය යන වෙළෙඳ ජාලාවන්ගෙන් පමණක් බැවින් ඒ සඳහා පාරිභෝගික ජනතාවට නැඹුරු වන ලෙස රාජ්‍ය අමාත්‍යවරයා එහිදී ඉල්ලීමක් කළේය.

යහපාලන ආණ්ඩුවේ මෙවැනි ආයතන තමන්ගේ හිතවතුන්ට විකිණීමට කටයුතු කරමින් වී ගබඩා හිතවතුන්ට බදු දීමට කටයුතු කළ හෙයින් කඩා වැටුණු එම ආයතන වත්මන් ආණ්ඩුව මඟින් නියාමනය කරමින් සංවර්ධනය කරනවා යැයිද රාජ්‍ය අමාත්‍යවරයා පවසා සිටියේය.

පාස්කු ප්‍රහාරය සහ බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් වත්මන් ආණ්ඩුවට වගකිව නොහැකි බවත් එයට සම්බන්ධ පුද්ගලයන්ට නීතිය ක්‍රියාත්මක කිරීම වත්මන් ආණ්ඩුවේ වගකීම බවත් රාජ්‍ය අමාත්‍යවරයා කියා සිටියේය.

# ආණ්ඩුවේ වැඩ නිසා ජනතාව ඉන්නේ පීඩාවෙන්

## සජබ පා.ම. ගයන්ත කරුණාතිලක

**පහන් විජේසේකර**



ආණ්ඩුව ගෙන යන අදූරදර්ශී ක්‍රියා පිළිවෙත නිසා රටේ සමස්ත ජනතාව දැඩි ලෙස පීඩාවට පත්ව ඇතැයි සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගයන්ත කරුණාතිලක මහතා පැවැසීය.

බලවත් ව්‍යාපාරිකයන් කිහිපදෙනෙකුගේ අල්ලේ නැටවෙමින් සාමාන්‍ය ජනතාවගේ අමාරුකම් නොහඳුනන තත්ත්වයට ආණ්ඩුව පත්ව ඇතැයිද ඔහු කීවේය. කොළඹ විපක්ෂ නායක කාර්යාලයේ දී ඊයේ (29) පැවති මාධ්‍ය හමුවට එක්වෙමින් ඒ මහතා මෙසේද සඳහන් කළේය.

වත්මන් ආණ්ඩුව බලයට ගේන්න වැඩිම දායකත්යවක් දුන්නේ ගමේ නගරයේ සිටින මධ්‍යම පාන්තිකයන් සහ සාමාන්‍ය දුගී දුප්පත් ජනතාවයි. අද වන විට ආණ්ඩුව බලවත් ව්‍යාපාරිකයන් කිහිපදෙනෙකුගේ අල්ලේ නැටවෙන සාමාන්‍ය ජනතාවගේ අමාරුකම් තුට්ටුවකට මායිම් නොකරන තත්ත්වයට පත් වෙලා. අපේ රටේ ජාතික ආදායමෙන් 35% ප්‍රමාණයක් භුක්ති විඳිනවා ජනගහනයෙන් 10%ක්. ඒ අයට කහ රුපියල් 5,000 කිව්වට ප්‍රශ්නයක් නැහැ. මුං ඇට කිලෝවක් රුපියල් 800යි කිව්වට ප්‍රශ්නයක් නැහැ. උළුඳු කිලෝවක් 1,800 කිව්වට මිලට ගන්නත් ආහාරයට ගන්නත් ප්‍රශ්නයක් නැහැ. ඒ වගේම වාහන ආනයන නතර කිරීම හරහා වාහන මිල වැඩි වෙලා. කළුකඩවලින් වාහන ගන්න වුණා කියලා මේ 10%ට වාහන මිලට ගැනීමේ ප්‍රශ්නයක් නැහැ. ඔවුන්ගේ ජීවන රටාවේ කිසිම වෙනසක් සිදු වී නැහැ.

එහෙත් ආණ්ඩුවට මතක් කර යුතුයි සම්බා හාල් කිලෝව රුපියල් 160 - 170ක් කියන කොට සම්බා හාලේ බතක් කන්න හීනයක් බවට පත් වෙන විශාල පිරිසක් අපේ රට තුළ ජීවත් වන බව. ඒ වගේම තමයි මුංඇට ටිකක් තම්බල කන එක, උළුඳු වඩේ ටිකක් හදන් කන එක, කහ දාපු හොද්දක් කන එක, තමන්ට කියලා ත්‍රිවීලර් එක්ක මෝටර් සයිකලයක් කුඩා වාහනයක් ගැනීමේ හැබෑ නොවන හීනයක් ඇති විශාල පිරිසක් රට තුළ සිටිනවා. මේ පිරිස තමයි රටේ ජාතික ආදායමෙන් 1.8%ක් පමණක් ලබන 10% පිරිස. මෙම පිරිසට තමයි මේ ආණ්ඩුව යටතේ වේලක් හැර වේලක් කන්න වෙලා තියෙන්නේ. මේ පිරිසට තමයි මේ රජයේ ප්‍රතිපත්ති නිසා දිගින් දිගටම බැට කමින් අන්ත අසරණභාවයට පත්වෙලා ජීවත් වෙන්න සිදු වී තිබෙන්නේ. මේ අතර සමෘද්ධිලාභීන් විශාල පිරිසක් සිටිනවා ඒ අය තමන්ගේ මුදලක් ඉතුරු කරලා ආණ්ඩුවට භාර දුන්නා. තැන්පතුවක් විදියට ආරක්ෂා කරන්න. හැබැයි ආණ්ඩුව එම තැන්පතු පාවිච්චි කරලා තමයි පහුගිය කාලේ රුපියල් 5,000 බෙදුවේ. එයින් සතයක් වත තවම ඒ මිනිස්සුන්ගේ ගිණුමට දාලා නැහැ. පසුගිය අයවැයෙන් ඒ වෙනුවෙන් මුදලක් වෙන් වෙලත් නැහැ එහි වගකීමක් රජය භාරගත යුතුය.

ආණ්ඩුවේ අදූරදර්ශී වැඩපිළිවෙළ නිසා දුක් විඳින්නේ ආණ්ඩුව බලයට ගේන්න කටයුතු කර අය පමණක් නොවෙයි මුළු රටේම ජනතාවටයි.

සියලුම පාසල් විවෘත කරා. කෝවිඩ් අරමුදලේ මුදල් දරුවන්ගේ ආරක්ෂාව සඳහා යොදවන්න. අපිට මතකයි සුනාමි මුදල්වලට සිදු වූ දේවල්. කෝවිඩ් අරමුදලට එසේ නොවෙන්න ආණ්ඩුව කටයුතු කර යුතුයි. දින සීයයේ යහපාලන රජය අත්‍යවශ්‍ය තීරණ රාශියක් ගත්තා. එහි රාජ්‍ය සෙවකයන්ගේ වැටුප් වැඩි වීම, තෙල් මිල අඩු කිරී,ම සමෘද්ධිලාභින්ගේ මුදල වැඩි කිරීම, අක්ෂි කාච ගෙන්වීම, විදුලි බිල අඩු කිරීම වැනි සහන ජනතාවට දුන්නා.

# දේශීය වෛද්‍ය අමාත්‍යාංශය කිසිදු දුම්පානයක් ප්‍රචලිත කරන්නේ නෑ

## රාජ්‍ය ඇමැති සිසිර ජයකොඩි

**අමිල ප්‍රභාත් වනසිංහ - අනුරාධපුර අතිරේක**

ආයුර්වේද වෛද්‍ය ක්‍රමය තුළ දුමායනය පැවතිය ද කුරුඳු දුමායනය ඇතුළු කිසිදු දුම්පානයක් ප්‍රචලිත කිරීමට දේශීය වෛද්‍ය අමාත්‍යාංශය කටයුතු නොකරන බව දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍ය සිසිර ජයකොඩි මහතා සඳහන් කළේය.

ඇතැම් මාධ්‍ය ආයතන පෙන්වා දෙන අන්දමට රට තුළ පරිසර විනාශයක් සිදු නොවන බවත් ඇතැම් අන්තවාදී දෙමළ කණ්ඩායම් මෙහෙයවන මාධ්‍ය ජාලාවලට පමණක් සීමා වූ ව්‍යාජ පරිසර විනාශයන් තුළින් වත්මන් ආණ්ඩුවේ සංවර්ධනය කඩාකප්පල් කිරීමට විපක්ෂය ඇතුළු එම කණ්ඩායම් කටයුතු කරමින් සිටින බවත් රාජ්‍ය අමාත්‍යවරයා පැවසිය.

අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ සහ රුවන්වැලි චෛත්‍යරාජයාණන් වහන්සේ පෙරේදා (28) වැද පුදා ගැනීමෙන් අනතුරුව මාධ්‍ය වෙත අදහස් දක්වමින් රාජ්‍ය ඇමැතිවරයා මෙසේ පැවසීය.

පාරම්පරික වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය පිළිබඳව පවතින ගැටලු විසඳීම පිණිස මූලික පියවර ලෙස ඔවුන්ගේ ගැටලු සහ යෝජනා පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා එදින අනුරාධපුරයේ පැවැත්වෙන හමුවට එක්වීමට ප්‍රථම රාජ්‍ය අමාත්‍යවරයා විහාරස්ථාන වැඳ පුදා ගැනීමට කටයුතු කළේය.

එහිදී තවදුරටත් අදහස් දැක්වූ සිසිර ජයකොඩි මහතා මෙසේද පැවසීය.

"රට තුළ වගා ඉඩම් ලක්ෂ 63ක් පවතින අතර එම ඉඩම්වල පවතින කෘෂිකාර්මික පරිවර්තනය කඩාකප්පල් කිරීමට ඇතැම් කණ්ඩායම් කටයුතු කරනවා."



එම්සීසී ගිවිසුම අහෝසි කිරීමෙන් මේ රට අක්කර ලක්ෂ 12කට වැඩි භූමි ප්‍රමාණයක් බේරාගැනීමට වත්මන් ආණ්ඩුව කටයුතු කළ බවත් මේ වන විට ඇතැම් මාධ්‍ය ජාලා සහ අන්තවාදී කණ්ඩායම් යුද ජයග්‍රහණය විවේචනය කළා මෙන්ම රටේ කෘෂිකර්මාන්තය දියුණු කිරීමටද විරුද්ධව හඬ නගමින් සිටින බවත් ඒ රාජ්‍ය ඇමැතිවරයා සඳහන් කළේය.

# අලි වැටට කෝටි 48ක් වියදම් කළත් විසඳුම් ලැබී නැහැ

## නාමල් කරුණාරත්න

**එච්. එම්. රංජිත් කරුණාවීර - මාපාකඩවැව සමූහ**

"අලි වැටවල් සඳහා කෝටි 48ක් වැනි විශාල මහජන මුදල් කන්දරාවක් වියදම් කරලාවත් රටේ ජනතාවට වන අලින්ගෙන් වන පීඩා නතරවෙලා නෑ. පසුගියදා නිකුත් වුණු කෝපි කමිටු වාර්තාවලින් මේ පිළිබඳ අනාවරණය වෙලා තියෙනවා.

අලි පෙන්නලා විතරක් අවුරුද්දකට රුපියල් ලක්ෂ නව දහසකට වඩා හම්බ කරන ආණ්ඩුව අඩු ගානේ ඒකෙන් ලක්ෂ දෙතුන් දාහක් අලි වෙනුවෙන් වියදම් කරලා අලියාට අවශ්‍ය පරිසරය හදන්නේ නෑ. මේ ප්‍රශ්නෙට විසඳුම තුවක්කු දෙන එක නෙවෙයි. අලි වෙඩි දෙන එක නෙවෙයි. විසදුම අලි වැට නෙවෙයි. අලි වැට කියන්නේ ඇස් බැන්දුමක් පමණයි. කරුණාකරලා පැලැස්තර විසඳුම් වෙනුවට, අපි ඉදිරිපත් කරලා තියෙන විද්‍යාත්මක විසඳුම්වලට යන්න කියලා අපි ආණ්ඩුවට බල කරනවා" යැයි සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ සභාපති නාමල් කරුණාරත්න මහතා පසුගියදා (27) පැවසීය. නාමල් කරුණාරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් මහියංගණ නගරයේ පැවැති උද්ඝෝෂණයක් අතරතුර මාධ්‍ය වෙත අදහස් පල කරමින් ඒ මහතා මෙසේ කියා සිටියේය.

අලි මිනිස් ගැටුමට ස්ථිර විසඳුම් ඉල්ලා පසුගියදා (17) සිට අඛණ්ඩව මහියංගන නගරයේ ආරම්භ කරන ලද සත්‍යග්‍රහයට සහාය පල කරමින් නාමල් කරුණාරත්න මහතා ඇතුළු සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ නියෝජිතයන් හා ගොවි ජනතාව විසින් මෙම උද්ඝෝෂණය සංවිධානය කෙරිණි.

එහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් නාමල් කරුණාරත්න මහතා,

"අලියාට අවශ්‍ය කෑම ටික වතුරු ටික පරිසරය සම්පාදනය කර ඒ සතාගේ පරිසරය සුරක්ෂිත කරන්න. ගමේ ඉන්න අලි ටික කැළේ ඇතුළට දාන්න. මහියංගනේ ටවුමට හැන්දෑවට අලි එනවා නම් වටේ තියෙන ගම්මානවලට කුඹුරුවලට කවර කතාද? මේ අම්මලාගේ තාත්තලාගේ ගෙවල් පළමු වරටත් දෙවන වරටත් අඛණ්ඩව අලි ප්‍රහාරවලට ලක් වෙනවා නම්, මේ ටවුම මැද්දෙත් අලි ළගිනවා නම් තවත් මොන කතාද? ඒක නිසා කරුණාකරලා මේ සඳහා සාධාරණ විසඳුමක් දෙන්න. සතාට අවශ්‍ය කෑම ටික වතුර ටික කැලෑ ඇතුළේ නිර්මාණය වුණා පස්සේ අනාරාධිතව ගම්වලට ආපු අලි ඉබේම කැළෑවලට යනවා. මුදල් වියදම් කරලා අලි කැළෑවලට එලවන්න අවශ්‍ය වෙන්නේ නෑ. අන්න ඒක කරන්ඩ කියලයි මේ බල කරලා කියන්නේ.



අන්න ඒ ටික කරනවා වෙනුවට රට පුරා තියෙන කැලෑ ටික කපලා විනාශ කරලා දානවා.

ඔබලාගේ කන් ඇහෙන්නේ නැත්නම් අපි කන් අස්සවන්න ළඟදීම කොළඹට එනවා. අම්පාරෙන් පොළොන්නරුවෙන් අනුරාධපුරෙන් හම්බන්තොටින් මහියංගණයෙන් දහස් ගණනින් ජනතාව කොළඹට අරගෙන ඇවිත් වනජීවි ඇමැතිතුමාගේ කාර්යාලය අභියසට එනවා. එදාටවත් මේ ගැන සාකච්ඡා කරන්න ඉන්නවාද?"යැයිද නාමල් කරුණාරත්න මහතා පැවසීය.

# ආණ්ඩුවට විරුද්ධ ශක්තිමත් ගමනක් යන්න සජබ සමඟ එක් වෙන්න සූදානම්

## හිටපු පා.ම. මහාචාර්ය ආශු මාරසිංහ

**අමිල ප්‍රභාත් වනසිංහ - අනුරාධපුර අතිරේක**

ආණ්ඩුවට විරුද්ධව සමගි ජන බලවේගය මෙන්ම අනෙකුත් සියලුම පක්ෂ සමඟ වුවද එක්ව ඉදිරි ගමන ශක්තිමත් කිරීමට එක්සත් ජාතික පක්ෂය සූදානම් බව එක්සත් ජාතික පක්ෂයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්යආශු මාරසිංහ මහතා සඳහන් කළේය.



අනුරාධපුරයේදි පසුගියදා (21) පැවැති එක්සත් ජාතික පක්ෂ මාධ්‍ය හමුවේ දී මේ බව පවසා සිටි ආශු මාරසිංහ මහතා එහිදී තවදුරටත් මෙසේද පැවසීය.

"සෑම දිස්ත්‍රික්කයකින්ම වන විනාශය වන බවත් මේ වන විට පරිසර විනාශ සියයයකට ආසන්න ප්‍රමාණයක් වුණු බවට තොරතුරු ලැබී තිබෙනවා. වගුරු බිම් ගොඩ කිරීම, ජලපෝෂක ප්‍රදේශ විනාශ කරමින් තිබෙනවා. ඊට එරෙහිව ක්‍රියාකරන සියලු දෙනාට ආණ්ඩුව විසින් බලපෑම් කරනවා.

එමෙන්ම පසුගිය දින 65ක කාලය තුළ මෙරට අලි ඇතුන් 61 දෙනෙකු මරණයට පත්වීම ශෝක ජනක සිද්ධියක්. පසුගිය වසරේදී පමණක් අලි ඇතුන් තුන් සියයක් පමණ මිය ගොස් තිබෙනවා.

එම මාධ්‍ය හමුවේදි අදහස් දැක්වූ හිටපු පාර්ලිමේන්තු සමන් රත්නප්‍රිය මහතා,

"වත්මන් ආණ්ඩුවේ ආර්ථික කළමනාකරණය මෙන්ම දේශපාලන කළමනාකරණය ද දුර්වල වී තිබෙනවා. කොවිඩ් වසංගතය ආණ්ඩුව විසින් බිස්නස් එකක් බවට පත්කර ගෙන තියෙනවා.

වර්තමාන ආණ්ඩුව විසින් සීනිවලින් පමණක් රජයට අහිමි කළ අලාභය රුපියල් කෝටි 1,595ක්. මේ සම්බන්ධයෙන් විශේෂ ජනාධිපති කොමිසමක් පිහිටුවා වංචා කළ පුද්ගලයන් රටට හෙළි කරන ලෙස ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටිනවා.

ඩොලර් බිලියන 1.5ක ණය ප්‍රමාණයක් චීනයෙන් ලබා ගැනීමට ආණ්ඩුව කටයුතු කරමින් සිටිනවා. එම ණය මුදල ලබා ගන්නා පොලී ප්‍රතිශතය රටට හෙළි කළ යුතුයි.

රටේ සිදුවන පරිසර සහ වන විනාශය හේතුවෙන් රටේ තරුණ තරුණියන් හඬ නැගීමට පටන් ගෙන ඇති තිබෙනවා. එය වත්මන් ආණ්ඩුවට මාරාන්තික තත්ත්වයක් බැවින් එම හඬ මර්දනය කිරීමට රාජපක්ෂ රෙජිමය පටන් ගෙන ඇතැයි"ද ඒ මහතා තවදුරටත් මහතා කියා සිටියේය.

# උතුරේ පුරාවිද්‍යා කැණීම් නිසා දෙමළ ජනතාව භීතියෙන්

## දෙජාස පා.ම. චාර්ල්ස් නිර්මලනාදන්

**රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ**

පුරාවිද්‍යා නිලධාරීන් විසින් උතුරේ බොහෝ ස්ථානවල සීමාවකින් තොරව සිදු කරන්නට යන කැණීම් නිසා දෙමළ ජනතාව භීතියට පත්ව සිටින නිසා මේ කැණීම් සම්බන්ධයෙන් ආණ්ඩුව යම් සාධාරණ නියාමනයක් අනුගමනය කළ යුතුව ඇතැයි දෙමළ ජාතික සන්ධානයේ වන්නි දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී චාර්ල්ස් නිර්මලනාදන් මහතා පැවසීය.

මේ දිනවල උතුරු පළාතේ විවිධ ස්ථානවල පුරාවිද්‍යා නිලධාරීන් කැණීම්වල නිරත වන අතර ඒවාට හින්දු කෝවිල් භාරකරුවන් හා මහජනතාව විසින් එල්ල කරන විරෝධයන් පිළිබඳව විමසූ අවස්ථාවේදී මන්ත්‍රීවරයා මේ බව කියා සිටියේය.

උතුරේ දෙමළ ජනතාව මේ කැණීම් නිසා බියට පත්වන්නේ ඔවුන්ගේ ඉඩම් පුරාවිද්‍යාවට පවරා ගැනීමත් කැණීම් සිදු කරණු ලබන ප්‍රදේශවල කෘෂිකාර්මික කටයුතු, ධීවර කටයුතු, මීපැණි එකතු කිරීම්, දර කැඩීම් වැනි දේට අවසර නොලැබීම නිසා යැයිද මන්ත්‍රීවරයා ප්‍රකාශ කළේය.

මේ වන විට මුලතිව්, කුරුදුමලේ, නෙඩුන්කේණි, වෙඩුක්කුනාරි, මන්නාරම කොටුව, යාපනය කොටුව හා තවත් ප්‍රදේශ ගණනාවක ඉඩම්වලට ඒ ඉරණම අයත් වී ජනතාව දැඩි ලෙස පීඩාවට පත්ව සිටින බවද මන්ත්‍රීවරයා පවසයි.

උතුරේ බෞද්ධ සිද්ධස්ථාන සොයමින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කැණීම් සිදු කරන නමුත් අනුරාධපුරය, පොළොන්නරුව, මහනුවර, මාතලේ යන පළාත්වල හින්දු සංස්කෘතියට අයත් ඉපැරණි දේ සෙවීමට එතරම් උනන්දුවක් නොදැක්වීම නිසා දෙමළ ජනතාවට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මේ උතුරු පළාතේ කැණීම් පිළිබඳව විශාල සැකයක් මතුව ඇතැයිද මන්ත්‍රීවරයා මෙහිදී කියා සිටියේය.





# කූරගල පුදබිම සැදැහැවතුන්ගෙන් පිරෙයි

**නුවන් හෙට්ටිආරච්චි**

මානව ශිෂ්ටාචාරයේ ආරම්භය බළන්ගොඩ මානවයාගෙන් තහවුරු වූවා සේ යටපත්ව ගිය බෞද්ධයන්ගේ උරුමයක් නැවත කූරගලින් තහවුරු විය. බළන්ගොඩ බෞද්ධයන්ට මේ පුදබිම ආගන්තුක තැනක් නොවුණත් යම් අන්තවාදීන් නිසා බෞද්ධයෝ ආගන්තුකව සිටියහ. මන්දයත් ආගමික ගැටුම් ඇති කිරීමට බෞද්ධයකුගේ හිතක සිතිවිල්ලක්වත් පහළ නොවන නිසාය. කෙසේ වුවද එම නිහඬවීම ප්‍රයෝජනයට ගත් අන්තවාදීන් යුහුසුලුව ඉතා කෙටි කලකදී සොහොන්, පල්ලි ඉදිකරමින් බිලි පූජා සිදු කරගෙන ගියේ පුදබිම ලේ බිමක් බවට පත් කරමිනි. එහෙත් ඒ සියල්ල මැදින් පුර පසළොස්වක දා එනම් පසුගිය 28දා දිනයෙන් අවසන් විය. යළි කිසි දිනෙක ඊට ඉඩක් නොලැබෙනු ඇත. ඒ බව ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් අනුමත කළහ. කිසි දිනක සත්‍යය යටපත් කළ නොහැකි බව පසක් කරමින් බුදුන් වහන්සේ වැඩහිටි ශාක්‍ය වංශිකයන්ගේ මාන්නය දුරුකරමින් ආශ්චර්යවත් යමාමහ පෙළහර පෑ මැදින් පොහොය දින කූරගල පුදබිමේ ඉහළම ස්ථානයේ අසදිස ශාක්‍ය සුගත මහාසෑය ඉදි කිරීමට මංගල ශිලා ප්‍රතිෂ්ඨාපනය සිදු විය. ඒ රටම දන්නා ගරු බුහුමන් දක්වන යටිහෙලගල විහාරය ප්‍රතිසංස්කරණය කර නෙල්ලිගල විහාරය නිර්මාණය කර කූරගල රාජමහා විහාරය ප්‍රතිනිර්මාණය කිරීමට පැමිණි නුවර අස්ගිරි මහා විහාරයේ පැවිදි බව ලැබූ වතුරකුඹුරේ ධම්මරතන හිමියන්ගේ මූලිකත්වයෙනි.

කූරගල පුදබිම ප්‍රතිසංස්කරණය කිරීමේ මහා මංගල්‍යය ලෙස නම් කර තිබූ 28දා මැදින් පොහොය එසේම විය. දෙලක්ෂ හැත්තෑදාහක් ගඩොල් යොදාගෙන අඩි 100ක් උසට ඉදි කරන චෛත්‍යය සඳහා මංගල ශිලා ප්‍රතිෂ්ඨාපනය කිරීම සියැසින් දැක බලා ගැනීමට පැමිණ සිටි පිරිස ඊට සාක්ෂි සපයයි. පසුගිය මාර්තු 02 දා කන්ටේනර් පෙට්ටියක තම ආවාස ගෙය තනවා දින 27ක් ගෙවුණ තැන කූරගල පුදබිමට ලක්ෂ සංඛ්‍යාත ජනකායක් ගෙන්වා ගැනීමට නෙල්ලිගල හාමුදුරුවන් සිදුකළ අප්‍රමාණ වෙහෙස ඒ අනුව තවදුරටත් පෙන්නුම් කරයි. පසුගිය දිනක අපි විසින් කූරගල පුදබිමට යන විට සිදුකරමින් පැවතියේ ප්‍රතිසංස්කරණ කටයුතුය. නමුත් ඒ කටයුතු සියල්ල පොහොය දින වන විට නිම කරවා බැතිමතුන්ට කූරගල ඉහළ මට්ටමට යෑමට අවශ්‍ය පහසුකම් සලසා

## කූරගල පුදබිම පිළිසකර කිරීමේ මහා මංගල්‍යය

තිබුණි.එනම් එම හිමියන් එදින අපට සඳහන් කළේ මැදින් පොහොය උපාසක උපාසිකාවන් දස දහස් සංඛ්‍යාවක් කූරගල පුදබිමට එනු නියත බවය. එසේම එයද සැබෑවක් කරමින් අක්කර 54ක් වූ කූරගල පුදබිම අතුරු සිදුරු වැසෙන්න බැතිමත්හු පැමිණ සිටියහ. කිසිදු අපහසුතාවකින් තොරව උපාසක උපාසිකාවන් අටසිල් සමාදන් වූ අතර පුදබිම වන්දනාමාන කිරීමට පැමිණි බැතිමතුන්ද ආගමික වතාවත්වල යෙදුණේ කිසිදු ගැටලුවකින් තොරවය. කූරගල පුදබිමට ඉහළ අහස නිල් පාටින් දිලුණු අතර හිරුගේ රශ්මිය සුළඟ මගින් අරගෙන ගියේය. ඒ නිසා කිසිදු බැතිමතෙකුට වෙහෙසක් විඩාවක් නොදැනුණු බවට සාක්ෂි සහිතව ඔප්පු වුණු අතර බළන්ගොඩ ඉතිහාසයේ පුදබිමක් වෙත පැමිණි විශාලම බැතිමතුන් සංඛ්‍යාව ද එය බවට තහවුරු විය.

එහෙත් කලක් තිස්සේ අන්තවාදීන්ගේ ග්‍රහණයට නතුව පිසාච වැඩ කරමින් තිබූ භූමියක් වූ කූරගල පුදබිමට මහා වැසි වැටිණි. ඒ බිලි පූජා පැවති බිම හේදී යන්නට මෙනි. එම වැස්සට යටපත් කළ නොහැකි වූ බෞද්ධයන්ගේ ශ්‍රද්ධාව නොසෙල්වී පැවතිණ. හෝරා කීපයක් එක දිගට වැසි ඇද වැටුණි. ඒ සතුන් දහස් ගණන් මරමින් ජනතාව උදෙසා මිථ්‍යාව වපුරපු බිමක් පුදබිමක් බවට පත්වීමේ පරිවර්තනීය මහා වැස්සක් ආරම්භ වන්නා සේය. වැසි මැද ශ්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ මහානායක ආචාර්ය වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඤාණරතනාභිධාන මාහිමිපාණන් වහන්සේ සියලුම බැතිමතුන් පංචශීලයේ පිහිටු වූහ. එම අවස්ථාවට ත්‍රෛනිකායික සංඝයා වහන්සේ දහසකට ආසන්න ප්‍රමාණයක් කූරගල පුදබිමට වැඩ සිටියහ. නෙල්ලිගල හාමුදුරුවෝ හෙවත් වතුරකුඹුරේ ධම්මරතන හිමියෝ වැඩමවා වදාළ මහා සංඝරත්නය සහ ගිහි බැතිමතුන් පිළිගැනීම සිදු කළහ. එහිදී උන්වහන්සේ මෙසේ පැවසුහ.

“මේ පුදබිමට බෞද්ධයකුට වදින්න පුදන්න එන්න දුන්නේ නැහැ. අන්තවාදී පිරිසක්. අඩුම තරමේ වෙසක් කාඩ් එකක්වත් සාක්කුවේ දාගෙන මේ ඉස්සරහ පාරකින්වත් යන්න බැරිකමක් තමයි තිබ්බේ. අන්න එහෙම පුදබිමක් තමයි අපි මේ භාරගත්තේ. මෙය සම්බුද්ධ ශාසනයේ සජීවීකරණය වූ පුදබිමක් බවට පත්කිරීමයි අපේ අරමුණ. ඒ වගේම වගකීමක් විදිහටත් අපි ඒ ගැන හිතනවා. අන්න ඒ නිසා තමයි දින 27ක් වගේ කාලයක් තුළ ගඩොල් 25000ක් වෙහෙර ඉදිවන කූරගල මුදුනට අරගෙන ගියේ. සෑය හදන්න. ඒ වගේම ගඩොල් 270000ක් කන්ද මුදුනට අරගෙන ගිහින් ලබන වසරේ පෙබරවාරි 04 වැනිදා මේ අසදිස ශාක්‍ය සුගත මහා සෑයේ රන් කොත් පැලැන්දවීම සිදු කරනවා. ඒ වගේම මතක් කරන්න ඕනෑ මේ සෑය ඉදිකිරීමට මූලිකත්වය ගෙන කටයුතු කරන්නේ "විෂ්" පෞද්ගලික රෝහලේ අධිපති ඩබ්ලිව්.ඒ.හෙළරුවන් පසන් කුමාර සහ එම මැතිනියයි. ඒ වගේම මට සංඝරත්නයෙන් ලැබෙන සහාය ද බෞද්ධ ජනතාවගෙන් ලැබෙන සහාය ද ඉතාමත්ම වටිනවා. ඒ සම්බන්ධයෙන් මා සියලුම දෙනාට ස්තූතිවන්ත වෙනවා.”

වැඩමවා වදාළ මල්වතු පාර්ශ්වයේ මහානායක තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල, ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහානායක අග්ගමහා පණ්ඩිත මකුලෑවේ ශ්‍රී විමල, අමරපුර මහා නිකායේ සභාපති සාහිත්‍යසූරි ගන්තුනේ අස්සජි මහා නා හිමිවරුන්ගේ අනුශාසනා අවසන් වන විටද වැසි ඇද වැටීම නතර නොවීය. එහෙත් අසදිස ශාක්‍ය සුගත මහා සෑයේ මංගල ශිලා ප්‍රතිෂ්ඨාපනය කිරීමට උත්සව සභාව අවසන්වූ





විට තද වැසි පොද වැසි බවට හැරිණි. පසුව නෙල්ලිගල හාමුදුරුවන් පිරිවරා පැමිණ සිටි වනජීවී අමාත්‍ය සී.බී.රත්නායක, සංස්කෘතිකරාජ්‍ය අමාත්‍ය විදුර වික්‍රමනායක මහත්වරුන් ඇතුළු ප්‍රාදේශීය දේශපාලනඥයන්, රාජ්‍ය අංශයේ නිලධාරීන් සහ බැතිමතුන් කූරගල කන්ද මුදුනට පිවිසියේ මංගල ශිලා ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහාය. සබරගමුවේ විශාලතම චෛත්‍යය කූරගල කන්ද මුදුනේ ඉදිකිරීමට ඒ අනුව නෙල්ලිගල හිමියෝ මූලාරම්භය යෙදූහ.

ලබන වසරේ පෙබරවාරි 04දා රන් කොත් පැළඳවීමට අවස්ථාව ලැබේවායි එම අවස්ථාවේ පැමිණ සිටි සියල්ලෝම ප්‍රාර්ථනා කළ අතර ලේක්හවුස් ආයතනය වන අපද ඊට එක්වූයේ එකී සුභ ප්‍රාර්ථනාව සමඟිනි.

ඡායාරූප
ගයාන් පුෂ්පික සහ
චේනක වික්‍රමාරච්චි

# විරුද්ධ පක්ෂය විවිධ බිල්ලන් මවමින් ජනතාව බිය ගැන්වීමේ වෑයමක නිරත වෙනවා

## ඇමැති, මහාචාර්ය ජී.එල්. පීරිස් කියයි

**රක්ෂණ ශ්‍රියන්ත**

අද විරුද්ධ පක්ෂයේ ප්‍රධාන වැඩපිළිවෙළ බිල්ලන් මවා ජනතාව බිය ගැන්වීමට උත්සාහ දැරීමත් එම න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩපිළිවෙළ ලෙස ජිනීවා යෝජනා පිළිබඳ ගෙන යන අසත්‍ය කතා පෙන්වා දිය හැකි බව අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා පවසයි.

ඇමැතිවරයා මේ බව ප්‍රකාශ කළේ ඊයේ (29) බත්තරමුල්ල වෝටර්ස් එජ් හෝටලයේ දී ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ පැවැත්වූ විශේෂ මාධ්‍ය හමුවේදීය.

එහිදී අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා වැඩිදුරටත් මෙසේද කීය.

අපි ඉතාමත් සතුටුවෙනවා දීර්ඝ කාලයකට පසු අද දිවයිනේ සියලු පාසල් සියලුම ශ්‍රේණි අපේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා විවෘතවීම ගැන. මේක තමයි අපේ රටේ මව්පියන්ගේ දු දරුවන්ගේ බලවත් ඉල්ලීම වුණේ. අධ්‍යාපන කටයුතු කඩා වැටෙන්න දෙන්න එපා. අධ්‍යාපන ව්‍යුහය යළි ප්‍රාණවත් කරන්න කියා මව්පියන්ගේ ඉල්ලීම වුණා. පාසල් නිවාඩුව පටන් ගන්නවා අප්‍රේල් 09. යළි පාසල් පටන් ගන්නවා අප්‍රේල් 19 වැනිදා. නමුත් දරුවන්ගේ අධ්‍යාපනය දවස් දහයක් හෝ සති දෙකක කාලයක් වුණත් වැදගත්. ළමයින් 15 බැගින් කණ්ඩායම් වශයෙන් සෞඛ්‍ය උපදෙස්වලට යටත්ව දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කරනවා. සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස් පරිදි සංස්කෘතික කටයුතු ක්‍රීඩා කටයුතු එකවිටම ආරම්භ කරන්නේ නැහැ. ඒවා ආරම්භ කරන්නේ අප්‍රේල් 19න් පසුවයි. අපි මවුපියන්ට කියනවා. සිතේ කිසි බයක් ඇති කරගන්න එපා පන්ති පැවැත්වීම ඉතාමත් විධිමත්ව සිදුකරන බව අපි වගකීමෙන් කියනවා.

අද විරුද්ධ පක්ෂයේ ප්‍රධාන වැඩපිළිවෙළ තමයි බිල්ලන් මැවීම. බිල්ලන් මවලා ජනතාව බිය ගැන්වීමට උත්සහ දැරීම තමයි විපක්ෂයේ න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩපිළිවෙළ.ජිනීවා යෝජනාව බිල්ලෙක් හැටියට රටට ඉදිරිපත් කරන්න දැඩි උත්සාහයක් දරනවා. මේ අය කියන්නේ ජාත්‍යන්තර අපරාධ අධිකරණයට අපේ රටේ රණවිරුවන් දේශපාලන නායකයන් ගෙනයන පසුබිමක් මේ යෝජනාවෙන් සකස් කර තිබෙනවා කියා තමයි මේ අය කියන්නේ. එය සම්පූර්ණ අසත්‍යයක්. අන්තර්ජාතික අපරාධ අධිකරණයට කිසිම රටක් ගේන්න අනිවාර්ය කොන්දේසි දෙකක් තිබෙනවා. එම රට ජාත්‍යන්තර අපරාධ අධිකරණය ස්ථාපිත කළ රෝම ගිවිසුමට අත්සන් කර තිබිය යුතුයි. ශ්‍රී ලංකාව රෝම ගිවිසුමට අස්සන් කර නැහැ. එහෙමනම් ඒ රටේ නායකයන් ත්‍රිවිධ හමුදාව අන්තර්ජාතික අපරාධ අධිකරණයට කැඳවිය හැකි වන්නේ නිව්යෝර්ක්හි පිහිටා තිබෙන ආරක්ෂක මණ්ඩලයේ නියෝගයක් අනුවයි. අපි සියයට සියයක් නිශ්චිතව දන්නවා එහෙම නියෝගයක් කිසිම අවස්ථාවකදී ආරක්ෂක මණ්ඩලයෙන් ලැබෙන්නේ නැහැ. ඒකට හේතුව තමයි මේ අවස්ථාවේදී අපේ රටට ඉතාමත් ශක්තිමත් අඛණ්ඩ සහයෝගයක් චීනය සහ රුසියාව ආරක්ෂක මණ්ඩලයේ සාමාජිකයන් වෙනවා. ඒ රටවල් දෙකට නිෂේධ බලය තිබෙනවා. ආරක්ෂක මණ්ඩලයට ඉදිරිපත්වන ඕනෑම යෝජනාවක් ප්‍රතික්ෂේප කිරීමට ඒ නිශේධ බලය ක්‍රියාත්මක කිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නීති හා සම්ප්‍රදායන් අනුව ඒ රටවල්වලට ශක්තිය හා බලය තිබෙනවා. ඒ නිසා කිසිසේත් අපේ රටේ රණවිරුවන් ජාත්‍යන්තර අපරාධ අධිකරණය හමුවට ගෙන යන්න පුළුවන් කමක් නැහැ.

ජිනීවා කවුන්සිලය කියන්නේ සාකච්ඡා මණ්ඩපයක්. ඒකට කාරණා සාකච්ඡා කරන්න පුළුවන් යෝජනා ඉදිරිපත් කර බහුතර ඡන්දයකින් යෝජනා සම්මත කර ගන්න පුළුවන්. හැබැයි ඒ යෝජනා ක්‍රියාත්මක කර ගැනීමේ බලයක් මානව හිමිකම් කවුන්සිලය සතු වන්නේ නැහැ. ක්‍රියාත්මක කිරීමට පුළුවන් වෙන්නේ නිව්යෝර්ක් නගරයේ ආරක්ෂක කවුන්සිලයට පමණයි.

මොන නිගමනයට එන්න වුණත් ඒ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂයක් පවත්වන්න ඕනෑ. ශ්‍රී ලංකාවට එරෙහිව සම්මත කර ගත් යෝජනාවේ හය වන ඡේදයේ සඳහන් වෙනවා. මහකොමසාරිස්වරියට බලය පැවරීම ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට යන්ත්‍රණයක් පිළියෙල කිරීම එය හරිම පුදුම ඡේදයක්. ඒ විමර්ශනය කෙරෙන්නේ වෙච්ච දේවල් විතරක් නොවෙයි. අනාගතයේ සිදුවෙයි කියා අපේක්ෂා කරන යුද අපරාධ සහ නීතිය උල්ලංඝණය වීම සම්බන්ධයෙන්.




අනාගතයේ සිදුවෙයි කියා ඒ අය ඉතාමත් පක්ෂග්‍රාහී ලෙස බලාපොරොත්තු වන දේවල් සඳහා විමර්ශන පැවැත්වීමත් ඒ පත් කරනු ලබන යන්ත්‍රණයේ කාර්ය භාරයට ඇතුළත් වෙනවා. ඒකට වියදම් කරනවා අමෙරිකානු ඩොලර් මිලියන දෙකයි දශම අටක්. එක්සත් ජාතීන්ගේ අයවැය ලේඛනයෙන් ඒ මුදල් වෙන් කර නැහැ. හැබැයි කොච්චර හදිසියක්ද තියෙන්නේ මේක සම්මත කර පැය දොළහක් ගියේ නැහැ. වහාම ක්‍රියාත්මක වුණා අපේ රට අමාරුවේ දාන්න අපට විරුද්ධව මේ වැඩපිළිවෙළ ගෙනියන්න මේ කාර්යාලය සඳහා අයැදුම් පත්‍ර කැඳවන්න දොළොස් දෙනෙක් පත් කිරීමට. එම කාර්යාලයේ එදිනෙදා වියදම් සඳහා අමෙරිකානු ඩොලර් 137400ක්, එක එක සමාගම් එක ආයතන සමඟ ගිවිසුම්වලට එළඹීමට අමෙරිකානු ඩොලර් 130000ක්, මේ විමර්ශනය භාරගන්නා නිලධාරීන්ගේ සවාරි සඳහා ලෝකය වටේම යන්න අමෙරිකානු ඩොලර් 41200ක්, ව්‍යාජ සාක්ෂි සෑදීමට නොයෙක් නොයෙක් පුද්ගලයන් හමුවෙලා ඒගොල්ලො පොලඹවලා ඒ විදියේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට අමෙරිකානු ඩොලර් 75400ක් ඒ විදියට තමයි අපේ රටට විරුද්ධ වැඩපිළිවෙළට මුදල් වෙන් කරන්න බලාපොරොත්තු වෙලා ඉන්නේ.මේ අපේ රටට විරුද්ධ විමර්ශනයට උත්සුක වන පුද්ගලයන්ම මේ මුදල් සපයා දෙනවා.

අපට විරුද්ධව මේ වැඩපිළිවෙළේ නායකත්වය ගත්ත බ්‍රිතාන්‍ය මීට දවස් හයකට කලින් පාර්ලිමේන්තුවේ පනතක් සම්මත කර ගත්තා. ඒ පනතින් කරන්නේ බ්‍රිතාන්‍යයේ ත්‍රිවිධ හමුදාව බ්‍රිතාන්‍යයේ පමණක් නොවෙයි ලෝකයේ ඕනෑම ප්‍රදේශයක කරපු ඕනෑම දෙයක් සම්බන්ධයෙන් යුද අපරාධ චෝදනා ගේන්න බැහැ. ඒ සියල්ලක්ම සම්බන්ධයෙන් ඒ ගොල්ලන්ට පූර්ණ මුක්තිය රැකවරණය ලබාදීම සඳහා ඒ පනත සම්මත කළා. එතකොට බ්‍රිතාන්‍යයේ ත්‍රිවිධ හමුදාවලට විරුද්ධව විමර්ශන නැහැ ඒගොල්ලන් අධිකරණ හමුවට ගේන්න බැහැ. එතකොට ඒ අයට එක නීතියක්. ශ්‍රී ලංකාවට ඊට හාත්පසින් වෙනත් නීතියක්. මේකද මානව හිමිකම් කවුන්සිලයේ ප්‍රතිපත්තිය. කවුරු පිළිගත්තත් අපි පිළිගන්නේ නැහැ. මේක ජාතික ප්‍රශ්නයක් හැටියට සලකා පටු දේශපාලන වාසි ලබාගන්න උත්සාහ දරන්නේ නැතිව පාර්ලිමේන්තුවේ නියෝජනය වන සියලුම පක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු මේක අපේ රටට සෘජුව බලපාන ප්‍රශ්නයක් හැටියට සලකා අපේ රට රැක ගැනීමට සියලු දෙනාම එකතු වෙන්න කියන ආයාචනය සිදුකරනවා.

විදුහල්පති තනතුරුවලට සහ අධ්‍යාපන පරිපාලනයට දේශපාලන හිතවත්කම් මත කිසිදු පත් කිරීමක් සිදුකරන්නේ නැහැ. අපි එවැනි ලයිස්තු හදා නැහැ. පුද්ගලයන් පත්වීම්වලට තීරණ ගන්නේ කුසලතා අනුවයි. පරීක්ෂණයකට ඉස්සෙල්ලා ලැයිස්තු හදන සම්ප්‍රදායක් අපේ ආණ්ඩුවේ නැහැ. සියලු දෙනාම සම්මුඛ පරීක්ෂණයකට පැමිණ ඒ කුසලතා අනුව තමයි පත්වීම් කරන්නේ. ඊට පෙර අපි අහවලා පත්කරනවා කියා කියලත් නැහැ එහෙම කරන්නෙත් නැහැ. ඒ වගේම මම ඇමැතිවරයා ලෙස වැඩ භාර ගත් දිනයේ සිට අද වනතුරු පාසල්වලට දරුවන් ඇතුළත් කිරීමට හෝ අස්කිරීමට කිසිදු ලිස්ට් එකක් හැදුවේ නැහැ. කාටවත් දාන්න හෝ අස් කරන්න මට වුවමනාවක් නැහැ.

**ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ මහා ලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ සාගර කාරියවසම් මහතා -**

විෂකාරක පොල්තෙල් සම්බන්ධයෙන් කතා කරනවානම් මේ ක්‍රමය සම්බන්ධයෙන් සාමාන්‍ය ජනතාවටත් බොහෝ දෙනෙකුට දැනීමක් නැහැ. විපක්ෂය හිතනවා මේ දේ සිදුවෙන්නේ ඔවුන්ගේ කාලයේ සිදුවූ ආකාරයට කියා. ඔවුන්ගේ කාලයේ රේගුවෙන් බඩු නිකුත් වුණේ නිසි ක්‍රියාදාමයට නොවෙයි. ඔවුන්ට ඕනෑ විදියට රේගුවෙන් බඩු නිකුත් වුණා. ඔවුන් හිතනවා තාම ඒක ඒ විදියට වෙනවා කියා. ඒකෙ තමයි ප්‍රධාන ප්‍රශ්නය තිබෙන්නේ. මේකෙ ක්‍රමවේදය තමයි මේ රටට පොල්තෙල් ආවාම ඒ පොල්තෙල්වල සාම්පල ලබාගෙන ඒ සාම්පල සෞඛ්‍ය අංශවලට ප්‍රමිති ආයතනයට යවනවා. ඒ සාම්පලවල වාර්තාව එනකම් ඒ පොල්තෙල් තබා ගන්න තැනක් නැහැ. එතකොට ඒ පොල්තෙල් බහලුම් මුදා හරිනවා. විකිණීම ට නොවෙයි. ඔවුන්ගේ ගුදම්වල තබා ගන්න. නමුත් එය විකිණීමට තහනම්.ඒක තමයි සාමාන්‍ය විදිය. ඒ බහාලුම් සීල් තියා අදාළ ආනයනකරුවන්ගේ ගුදම්වලට යැවීම සිදුකරනවා. ඉන් පසුව දින කීපයක් යනවා මේ වාර්තා එන්න. ඒ වාර්තා ආවාම පසුගිය කාලයේ ගෙන්වූ පොල්තෙල් තොග කීපයක ශරීරයට අහිතකර පිළිකා කාරක ද්‍රව්‍යයක් තිබෙනවා කියන එක වාර්තා වෙලා තිබෙනවා. ඒ වාර්තා වෙලා තිබෙන එක අනුව කටයුතු කළේ මේ විපක්ෂය නෙමෙයි. වහාම ක්‍රියාත්මක වෙලා ඒ වාර්තාව එළියට දාලා ඒ වාර්තාව අනුව කටයුතු කළේ අපේ රජයයි.

දැන් මේ විපක්ෂය මේක අල්ලගෙන දඟලන්න හැදුවාට ඔවුන්ගේ කාලයේ වගේ තමුන්ට කැමැති විදියට තමුන්ගේ හිතවතුන්ට මේක නිකුත් කරන්න අවසර තියෙනවා කියා. එහෙම නැහැ. අපි නීතිය හරියට ක්‍රියාත්මක කරන රජයක්. ඒ අනුව කිසිදු ආකාරයකින් මේ පොල්තෙල් එළියට යවන්න එපා කියන පදනම මත පොල්තෙල් ඔවුන්ගේ ගුදම්වල තබාගන්න ඉඩ තියා වාර්තාව කැඳෙව්වා. පොල්තෙල් ශරීරයට අහිතකරයි කියා වාර්තාව ලැබුණු වහාම ඒ අදාළ ගුදම් සීල් තබලා. දෙවෙනි කොටස තමයි ඔවුන්ට නැවත අවස්ථාවක් ලැබෙනවා. අභියාචනයක් කර දෙවෙනි වතාවට ඒ පරීක්ෂණය කරන්න ඉල්ලීමක් කරන්න. දෙවෙනි සාම්පලයත් අරන් ඒකත් යවා තිබෙනවා. ඒ සාම්පලවල දෙවැනි වාර්තාවත් මම දැක්කා,ඊයේ ඇවිත් තිබෙනවා කියා. ඒ දෙවැනි වාර්තාවත් අසමත් වුණොත් ඒ තෙල් නැවත ප්‍රති අපනයනය කිරීම කරන්නේ.ඒකටත් හේතුවක් තිබෙනවා.

කවුරුහරි කියනවානම් මේක අපේ රටේ විනාශ කරන්න ඕනෑ කියා මම හිතන්නේ ඒ මේ රටට ආදරය නැති රටේ පරිසරය ගැන කිසි හැඟීමක් නැති මනුස්සයෙක් තමයි. මොකද ඔය විදියට ගත්තොත් මේ ලෝකයේ ඕනෑම රටකට ඔවුන්ට පාවිච්චි කරන්න බැරි ඕනෑම කුණු ගොඩක් ලංකාවට එවලා කුණු විනාශ කරන ස්ථානයක් බවට මේ රට පත් කර ගත හැකියි. ඒක නිසා තමයි කිසිදු විටක අපි ඒ දේ කරන්නේ නැත්තේ. යම් කිසි රටකින් අපට පරිභෝජනයට අහිතකර දෙයක් මේ රටට ආවොත් ඒ සම්බන්ධයෙන් ගන්න ක්‍රියා මාර්ගය තමයි වහාම ඒක එවපු රටට ප්‍රති අපනයනය කරනවා. නැත්නම් අපට සිදු වෙනවා ඒ කුණු ගොඩවල් ගෙනැල්ලා අත අරින තැනක් බවට මේ ලංකාව පත් කර ගන්න. අපේ ටෙස්ට් එක ෆේල් වුණාම අපි මෙහෙ විනාශ කරනවා කියා දන්නවානම් හැම රටක්ම අපට කුණු එවන්න පටන් ගනියි. ජාත්‍යන්තර පිළිගත් මතය තමයි යම් කිසි වැරැදි සහගත දෙයක් ආවොත් අපි විනාශ කරන්නේ නැහැ. අපට එවපු රටටම ප්‍රති අපනයනය කරන එක.ඒක විනාශ කිරීමේ වගකීම ඔවුන්ට භාරදීමට. මේ පොල්තෙල්වල විෂ සහිත බව සොයා ගත්තේ මේ රජය ඒ බව ජනතාවට දැනුම් දුන්නේ රජය ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්නේ රජය. මේක විපක්ෂයෙන් හොයාගත්ත දෙයක්වත් නොවෙයි. ආණ්ඩුව ඒ ගැන හොඳින් ක්‍රියා කරගෙන යනවා විපක්ෂයට ආණ්ඩුවට විරුද්ධව කියන්න දෙයක් නැතිවුණාම පොල්තෙල් ටිකට හරි එල්ලෙනවා. මේ කාරණයේදී අපේ ආණ්ඩුව ඉතා වගකීමෙන් යුතුව කටයුතු කර තිබෙනවායිද කීය.

ඡායාරූපය - තුෂාර ප්‍රනාන්දු

# පිළිකාකාරක පොල්තෙල් ප්‍රති අපනයනයට නියෝග දුන්නා

## ඇමැති, ආචාර්ය බන්දුල ගුණවර්ධන

**අනුර ප්‍රේමලාල්**

රජයේ ආයතන නිසි ලෙස පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ වගකීම හා යුතුකම ඉටු කරන්න කටයුතු කර තිබෙන බවත් පිළිකා කාරක පොල්තෙල් යළි අපනයනය කරන්න නියෝග ලබාදී තිබෙන බව වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා ප්‍රකාශ කරයි.

ඒ මහතා මේ බව සඳහන් කළේ ඊයේ (29) වෙළෙඳ අමාත්‍යාංශයේ පැවැති මාධ්‍ය හමුවකට එක්වෙමින්ය. එහිදී වැඩිදුරටත් කතා කළ ඇමැතිවරයා මෙසේද කීය. ඒ නිසා කිසිදු බියකින් හෝ සැකයකින් පොල්තෙල් පාරිභෝජනය කරන්න ඉල්ලනවා. භාණ්ඩ ආනයනය කිරීමේ ක්‍රියාවලියේ ලංකා ආණ්ඩුව නිරත වෙන්නේ නැහැ. ඒක පුද්ගලික ආයතනවලින් තමයි සිදුකරන්නේ. මෙහිදී පොල්තෙල් පමණක් නොවේ බොහෝ ප්‍රධාන ආහාර වර්ග ආනයනය කරනවා. මේ භාණ්ඩ වෙළඳපොළ නිකුත් කිරීමට පෙර සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර ආරක්ෂණ අංශය හා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් අඛණ්ඩ පරීක්ෂණයකට ලක් කරනවා. මේ ආයතන දෙක මගින් නිරන්තරයෙන් සාම්පල් ලබාගෙන මේ පරීක්ෂණ ක්‍රියාවලිය සිදුකරනවා. එම ආයතන දෙක අනුමත කළොත් පමණයි ආනයනය කරන ලද භාණ්ඩ වෙළෙඳපොළට නිකුත් කරනු ලබන්නේ. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආහාර නියාමන අංශය තමයි ආනයනය කරන ලද පොල්තෙල් තොගයක පිළිකාකාරක රසායනික ද්‍රව්‍ය අඩංගු බව මුලින්ම දැනුම් දුන්නේ. ප්‍රමිති ආයතනය ඉකුත් (04) රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත මේ පිළිබඳ දැනුම්දීලා තියෙනවා. එහිදි නිර්දේශ කර තිබෙන්නේ ප්‍රති අපනයන කරන්නයි. කිසිවිටකත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සාම්පල් පරීක්ෂා කරලා ඒවා වෙළඳපොළට නිකුත් කරන්න මොනම ආකාරයකවත් අවසරයක් දීලා නැහැ. රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාත් එම පොල් තෙල් තොගය නිකුත් කරන්න ක්‍රියා කරලා නැහැ. ඊට පසුදිනම (23) දඹුල්ලේදි පැවැති ප්‍රවෘත්ති සාකච්ඡාවකින් පස්සේ. මෙහි පමාවුණේ එම ආයතනවලට අයිතියක් තිබෙනවා ප්‍රති අපනයනය කරන්න කියලා නියෝගය කළාට පස්සේ එම සමාගම්වලට අයිතියක් තිබෙනවා නැවත පරීක්ෂා කරන්න කියලා ඉල්ලීමක් කරන්න. එවිට දෙවන පරීක්ෂණය කරන්න කියලා. එම ඉල්ලීම නිසා තමයි රේගුව විසින් ආනයනය කළ සමාගම්වල ගබඩාවලට මුදාහැර තිබෙන්නේ. කිසිසේත් වෙළඳපොළට නොවේ. දෙවන පරීක්ෂණයේත් ඔප්පු වෙලා තිබෙනවා විෂ රසායනික ද්‍රව්‍ය අඩංගුයි කියලා. ඒ අනුව දෙවන දැනුම් දීමත් කරලා තියෙනවා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා. එය වහාම ක්‍රියාත්මක වන පරිදි මේ පොල් තෙල් තොගය වෙළඳපොළට නිකුත් නොකර නැවත ආපසු යවන්න කියලා. ඒ අනුව එම පොල්තෙල් තොගය ළෙඳපොළට ඉදිරිපත් කරලා නැහැ.

ඒ අතර රාජ්‍ය ඇමැතිගේ සභාපතිගේ උපදෙස් මත පාරිභෝගික කටයුතු අධිකාරිය වෙළෙඳපොළේ දැනට අලෙවිවන පොල්තෙල්වල සාම්පල ලබාගෙන පරීක්ෂණ කටයුතු විවිධ නගරවලදී සිදුකරනවා ඒ නිසා සැකයක් බියක් ඇති කරගත යුතු නැහැ. රජයේ ආයතන විසින් තමන්ගේ යුතුකම වගකීම නිසිලෙස ඉටුකර තිබෙන බව තමයි වගකීමෙන් යුතුව කියන්න තියෙන්නේ.

සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය ඇමැති ලසන්ත අලගියවන්න මහතා මෙවැනි සිදුවීම් පළමුවතාවට සිදුවු දෙයක් නොවේ. උදහරණයක් ලෙස 2019 වසරේදී මෙවැනි සිද්ධියක් නිසා මෙට්‍රික් ටොන් හැටක් ප්‍රති අපනයනය කර තිබෙනවා. එයත් මේවගේම සිද්ධියකී. මිරිස් වගේම මේ ක්‍රියාවලියේ දිගින්දිගටම සිදුවෙනවා. නමුත් මෙහිවගකීමක් රජයට තියෙනවා පාරිභෝගිකයන් ආරක්ෂා කරන්න. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වත්මන් ආණ්ඩුව මෙහි තිබෙන බරපතළකම තේරුම් ගත් නිසා තමයි වෙනම පාරිභෝගික ආරක්ෂණ අමාත්‍යාංශයක් ඇති කර තිබෙන්නේ. ඒක මුලින්ම තේරුම් ගත යුතුයි. අපේ රටේ මේ ප්‍රශ්නයේ සංකීර්ණ තාවය කිව්වොත් එච්.එස් කෝර්ඩ් පන්දහස් ගණනකින් රටට බඩු ගේනවා. නමුත් එක්දහස් තුන්සීයක් තමයි රාජ්‍ය ආයතන බලන්නේ. තවත් තුන්දහස් පන්සීයක් පමණ භාණ්ඩ තිබෙනවා කිසිදු රාජ්‍ය ආයතනයක් අධීක්ෂණයකින් තොරව තමයි මේ භාණ්ඩ රටට ඇතුළත් වෙන්නේ ඒවා ආහාර ද්‍රව්‍ය නොවේ. දැන් අපි ඉදිරි වසර දෙක තුළ දැනට අධික්ෂණය කරන භාණ්ඩ එක්දහස් දෙසීය ගෙන්වීමේදි තිබෙන අඩුපාඩුකම් ගැන සොයා බලනවා මින් ඉදිරියේදි කිසිදු ආහාර ද්‍රව්‍යක් අවසාන පරීක්ෂණයකින් තොරව රේගුවෙන් එළියට දමන්නේ නැහැ. .

රේගු අධ්‍යක්ෂ ජනරාල් (විශ්‍රාමික) මේජර් ජනරාල් විජිත රවිප්‍රිය මහතා -.මේ ආන්දෝලනාත්මක පොල්තෙල් තොගය ආනයනය කර තිබෙන්නේ සමාගම් තුනක් එනම් අලිබ්‍රදර්ස්, කටාන රිෆයිනරීස් හා එදිරිසිංහ එඩිබල්. අද තමයි දෙවන නියැදිය පරීක්ෂා කරලා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මට ලිඛිතවට දැනුම් දුන්නේ මේ සමාගම් තුන ආනයනය කළ පොල් තෙල් තොගවල එම විසකාරක රසායනික ද්‍රව්‍ය අඩංගුයි කියලා. මේවනවිට මම ඒ අයට ලිඛිතවා දන්වලා ඉවරයි මේ තෙල් තොග ප්‍රති අපනයනය කරන්න කියලා.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, සෞඛ්‍ය අමාත්‍යාංශය, පාරිභෝගික සේවා අධිකාරිය ඇතුළු මීට අදාළ සියලු ආයතනවල නිලධාරි මහත්ම මහත්මිහු මේ මාධ්‍ය හමුවට සහභාගිවී සිටියහ.



ඡායාරූපය– තුෂාර ප්‍රනාන්දු

# තරුණ ව්‍යවසායකයන්ට නව ඇණවුම්වලට ඉඩකඩ නිර්මාණය කර දීම

## ‘ලක්කම් අලෙවි සල්පිලෙහි’ අරමුණයි

## ඇමැති විමල් වීරවංශ



**රක්ෂණා ශ්‍රියන්ත**

දේශීය තරුණ ව්‍යවසායකයන්ට සහ නිෂ්පාදකයන්ට නව වෙළෙඳපොළ අවකාශයක් සහ නව ඇණවුම් සඳහා ඉඩකඩ නිර්මාණය කර දීම ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් දීපව්‍යාප්තව පැවැත්වීමට කටයුතු යොදා ඇති 'ලක්කම් අලෙවි සල්පිලෙහි' අරමුණ බව කර්මාන්ත ඇමැති විමල් වීරවංශ මහතා සඳහන් කරයි.

ඊයේ (29) කොළඹ දිස්ත්‍රික් සමාරම්භක ලක්කම් අලෙවි සල්පිල දියත උයනේදී විවෘත කරමින් ඒ මහතා මෙසේ පැවසීය.

ලක්කම් අලෙවි සල්පිල, නමින් ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය දේශීය නිපැයුම් අලෙවි ප්‍රදර්ශනයක් හා අලෙවි පොළක් රට පුරා පැවැත්වීමට නියමිතයි. ඊයේ (29) කොළඹ දියත උයනේ දී විවෘත වූයේ කොළඹ දිස්ත්‍රික්කයේ සමාරම්භක අලෙවි සල්පිලයි. එය 30 සහ 31 දෙදින තුළත් පැවැත්වීමට කටයුතු යොදා තිබෙනවා. මේ රටේ දේශීය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් හා නිෂ්පාදකයන්ට තිබෙන වෙළඳපොළ අවකාශය ඉතා සුළු නිසා එය පුළුල් කර දීම හා නව ඇණවුම් ලබා ගැනීමට අවකාශය සලසා දීම මෙහි අරමුණයි.

එසේ කටයුතු කර විශේෂයෙන් තරුණ දේශීය ව්‍යවසායකයා දිරිගැන්වීම හා බල ගැන්වීම අවසානයේදී අපි බලාපොරොත්තු වෙනවා යනුවෙන් ද එහිදී කර්මාන්ත ඇමැතිවරයා පැවසීය.

මේ වනවිට කෑගල්ල, කළුතර හා ගම්පහ දිස්ත්‍රික්කවල ප්‍රධාන නගර තුනක ලක්කම් අලෙවි සල්පිල් පවත්වා ඇති අතර ඉදිරි දිනවලදී අනුරාධපුර, ගාල්ල මාතර දිස්ත්‍රික්කවල අලෙවි සල්පිල් පැවැත්වීමට නියමිතය. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයෙහි ලියාපදිංචි ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ දේශීය නිපැයුම් එම ලක්කම් අලෙවි සල්පිලවලදී මිලදී ගැනීමට මෙරට දේශීයත්වය අගයන ජනතාවට අවස්ථාව ලැබී ඇති බව ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ සභාපති උපසේන දිසානායක මහතා පවසයි. මේ වසර අවසන් වන විට මෙවැනි ලක්කම් අලෙවි සල්පිල් 200ක් රට පුරා පැවැත්වීමට ද ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය සැලසුම් කර ඇත.

# ජනතාවට සහන සලසන්න පළාත් පාලන ආයතනවලට වැඩි බලයක් දිය යුතුයි

## ඇමැති දිනේෂ් ගුණවර්ධන

**මහින්ද අලුත්ගෙදර**

ගමේ සංවර්ධන කටයුතු වේගවත් කර ජනතාවට ඉක්මනින් සහන සැලසීම සඳහා පළාත් පාලන ආයතනවලට වැඩි බලයක් ලබාදිය යුතු බව විදේශ කටයුතු ඇමැති දිනේෂ් ගුණවර්ධන මහතා පවසයි.



ගමේ සංවර්ධනයට වෙන්කරන මුදල් කෙළින්ම පළාත් පාලන ආයතන වෙත ලබාදිය යුතු බව පෙන්වාදෙන ඒ මහතා විවිධ රාජ්‍ය ආයතන හරහා ගමට මුදල් ලබාදිමේ දී දීර්ඝ කාලයක් ගතවීම ජනතාවට කඩිනම් සේවාවක් සැපයීමට බාධාවක් වී ඇති බවද කියා සිටී.

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තාවල්ගොඩ ග්‍රාමයේ ප්‍රජා ශාලාව ජනතා අයිතියට පත්කිරීම නිමිත්තෙන් පැවැති උත්සව සභාවක් අමතමින් ඇමැතිවරයා මේ බව සඳහන් කළේය.

මේ රටේ බහුතර ජනතාව ජීවත් වෙන්නේ ගම්වල වන අතර ඒ අයට ඉතාම සමීප රාජ්‍ය ආයතනය පළාත් පාලන ආයතනය බව පෙන්වාදුන් විදේශ කටයුතු ඇමැතිවරයා ඒ නිසා ජනතාව ගැන දන්න ඔවුන්ගේ වුවමනාවන් ගැන දන්න පළාත් පාලන ආයතනවලට ගමේ ජනතාව වෙනුවෙන් වැඩියෙන් වැඩ කිරීම සඳහා රජය ගමේ සංවර්ධනයට වෙන්කරන මුදල් කෙළින්ම පළාත් පාලන ආයතනවලට දිය යුතු බවද පෙන්වා දුන්නේය.

එසේ වුණොත් ජනතාවත් සහභාගි කරවා ගෙන ගම්වල අවශ්‍යතා කඩිනමින් ඉටුකර ජනතාවට උසස් කඩිනම් සේවාවක් සැපයීමට අවස්ථාව හිමිවන බවද හෙතෙම සඳහන් කළේය.

ගමේ ජනතාවට තමන්ගේ අවශ්‍යතාවලින් බොහෝමයක් ඉටුකර ගන්න නගරයට යෑමට සිදුව තිබෙන බව පැවසූ ඇමැතිවරයා මේ නිසා ඔවුන්ගේ කාලයත් ශ්‍රමයත් මුදලුත් අපතේ යන බවද මේ තත්ත්වය වළක්වා ගෙන ගමේ ජනතාව ඇතිහැකි අය කරන්නටත් තරුණ පරපුර ගමේ සංවර්ධනයට යොමු කරගැනීමටත් පළාත් පාලන ආයතනවලට ගමට වැඩ කරන්න වැඩි බලයක් ලබාදිය යුතුයි යන ස්ථාවරයේ සිටින බවද සඳහන් කළේය.

එවැනි බලයක් පළාත් පාලන අයතනවලට ලබාදීමෙන් ජනතා ජයග්‍රහණ වැඩිකර ගතහැකි බවද මේ තත්වය ඇතිකිරීමට මෙයට පෙර ග්‍රාමීය සංවර්ධන කමිටු ඇති කරන්න උත්සහ කළ අවස්ථාවේ ඇතැම් පිරිස් ඊට එරෙහි වීම නිසා එය වැළකී ඇති බවද ඇමැතිවරයා සඳහන් කෙළේය.

පාර්ලිමේන්තු මන්ත්‍රී යදාමිණි ගුණවර්ධන, සීතාවක ප්‍රාදේශීය සභාවේ සභාපති ජයන්ත රෝහණ මහත්වරුන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට සහභාගී වී සිටියහ.

# පාරිසරික බලපත්‍රය ලබා දීමට රු. 7,000ක අල්ලස් ගත්තැයි PHI රිමාන්ඩ්

**සිරන්ජනි කුමාරි**

ජලය අලෙවි කිරීමේ ව්‍යාපාරයකට ෆිල්ටර් සවි නොකිරීම සම්බන්ධයෙන් නීතිමය කටයුතු නොකිරීම හා පාරිසරික බලපත්‍රය ලබා දීමට රුපියල් හත් දහසක අල්ලස් ඉල්ලා ලබා ගත්තැයි කියන සිද්ධිය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ වාරියපොළ මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයකු ලබන 12 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් බුද්ධික ශ්‍රී රාගල මහතා ඊයේ (29) නියෝග කළේය.

වාරියපොළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයකු ලෙස සේවය කරන නලින් චන්දන යන අය මෙලෙස රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි.

පාදෙණිය පදිංචි කුමාර අතපත්තු යන අය විසින් පසුගිය මාර්තු මස 23 වන දින කරනු ලැබූ පැමිණිල්ලකට අනුව මෙම වැටලීම සිදු කළ බව අල්ලස් කොමිසම අධිකරණයට දැනුම් දුන්නේය.

වාරියපොල ප්‍රදේශයේ වෙළෙඳසැල් හිමිකරුවෙකු වන පැමිණිලිකරු පිරිසිදු කරන ලද ජලය අලෙවි කිරීමේ ව්‍යාපාරයක් කරගෙන යන බවත්, ඔහු විසින් නිකුත් කරනු ලබන ජල ටැංකියේ ෆිල්ටර් සවි නොකිරීම සම්බන්ධව නීති මගින් කටයුතු නොකර සිටීමට සහ පාරිසරික බලපත්‍රය ලබා ගැනීමට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයෙන් අවශ්‍ය නිර්දේශ ලබා දීමට මාසිකව අල්ලස් වශයෙන් රු.7000 බැගින් ඉල්ලා පෙබරවාරි මාසයේ සිට එම මුදල් ලබා ගත බවට පැමිණිල්ලේ සඳහන්ය.

ඒ අනුව මාර්තු මාසය සඳහා වූ රු.7000 ක මුදල ඉල්ලා සැකකරු විසින් පැමිණිලිකරු පදිංචි නිවසට පැමිණ අල්ලස් මුදල ඉල්ලා ලබා ගැනීමේදී අල්ලස් කොමිසමේ නිලධාරින් විසින් මාර්තු මස .24 දින සැකකරු අත්අඩංගුවට ගෙන වාරියපොළ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරිමෙන් පසු ඊයේ කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ ඉදිරිපත් කෙරිණි.

පැමිණිල්ල කොමිසමේ වෙනුවෙන් අල්ලස් උපපොලිස් පරීක්ෂක බණ්ඩාර මහතා හා උපපොලිස් පරීක්ෂක පෙරේරා මහතා අධිකරණය හමුවේ පෙනී සිටියහ.

# කෝට්ටේ මහානගර සභාවේ කාරක සභා කමිටුවට වාරණ නියෝගයක්

**රෝෂන් තුෂාර**

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහානගර සභාවේ කාරක සභා කමිටු සඳහා අභිනවයෙන් පත්වු සභාපතිවරුන් සහ කාරක සභිකයන් සිය ධූරයන්හි කටයුතු කිරීම වළක්වමින් එම නගර සභාවට වාරණ නියෝගයක් කොළඹ ප්‍රධාන දිසා විනිසුරු අරුණ අලුත්ගේ මහතා පසුගිය (26 )දින නිකුත් කළේය.

නගර සභාවේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නාගරික මන්ත්‍රී කර්නල් සමිත ඉමදූවගේ මහතා ගොනු කළ පැමිණිල්ලක් සලකා බැලීමේ පසුව මෙම වාරණය නිකුත් කළේය.

පසුගිය 17වන දින තොරාපත්කරගන්නා ලද නව කාරක සභා සභාපතිවරුන්ගේ හා කාරක සභා සභිකයින්ගේ පත්වීම් ක්‍රියාවලිය නගර සභා නිතියට පටහැනි බව පවසමින් මෙම නඩුව පැවරා තිබිණි.

පැමිණිලිකරු ශ්‍රී ජයවර්ධනපුර නගර සභාවේ සෞඛ්‍ය කාරක සභාවේ සභාපතිවරයා ලෙස තේරි පත්ව ඇත.

මාර්තු 17 වැනි දින ලිපියක් මගින් නාගරික ලේකම්වරයා විශේෂ මහ සභාවක් පවත්වා එදින නව කාරක සභා කමිටු සාමාජිකයින් පත් කිරිම සිදුකළ බවත්,මෙම ක්‍රියාව නගර සභා නීතිය අනුව නීතියට පටහැනි බව පැමිණිලිකරු ආණ්ඩුකාරවරයාට දැනුම් දුන් බවත් අධිකරණය කරුණු ඉදිරිපත් කළේය.

නීතියට පටහැනිව තෝරාපත් කර ගැණුන කාරක සභා සභිකයින් සිය ධූරයන්හි කටයුතු කිරීම වළකාලන වාරණ නියෝගයක් නිකුත් කරන ලෙසද පැමිණිලිකරු සිය පැමිණිල්ලෙන් ඉල්ලා සිටියේය.

# පොළොන්නරුව ජාතික උද්‍යානය හරහා මාර්ගයක් ඉදිකිරීම වළක්වාලන්නැයි පාරිසරික යුක්ති කේන්ද්‍රයෙන් පෙත්සමක්

**නෙල්කා මැදගෙදර**

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පිහිටි ජල ගැලුම් නිම්න ජාතික උද්‍යානය හරහා මාර්ගයක් ඉදිකිරීම වළක්වාලන රිට් ආඥාවක් නිකුත් කරන ලෙස ඉල්ලා පාරිසරික යුක්ති කේන්ද්‍රය විසින් අභියාචනාධිකරණයට ඊයේ (29) රිට් පෙත්සමක් ගොනු කර තිබේ.

ජල ගැලුම් නිම්න උද්‍යානය සහ සෝමාවතී ජාතික වන උද්‍යාන ආරක්ෂා කිරීමට පියවර ගන්නා ලෙස වනජීවී අධ්‍යක්ෂ ජනරාල් , වනජීවී අමාත්‍යවරයා ඇතුළු බලධාරීන්ට ද නියෝග කරන රිට් ආඥාවක් නිකුත් කරන්නැයිද එම පෙත්සම මගින් ඉල්ලා ඇත.

පාරිසරික යුක්ති කේන්ද්‍රය වෙනුවෙන් එහි විධායක අධ්‍යක්ෂ හේමන්ත රංජිත් සිසිර කුමාර මහතා මෙහි පෙත්සම් කරු වේ.

එහි වගඋත්තරකරුවන් ලෙස වනජීවී අධ්‍යක්ෂ ජනරාල් චන්දන සූරියබණ්ඩාර, වනජීවි ඇමැති සී.බී. රත්නායක මහත්වරුන් ඇතුළු අට දෙනෙක් නම් කරනු ලැබ සිටිති.

නීතිඥ රවින්ද්‍රනාත් දාබරේ මහතා මාර්ගයෙන් ගොනු කර ඇති පෙත්සමේ මෙසේ ද සඳහන් වේ. පෙත්සම්කාර ආයතනය පාරිසරික ගැටලු පිළිබඳ උනන්දුවක් දක්වන ආයතනයකි.ජල ගැලුම් නිම්න ජාතික උද්‍යානය පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.ශ්‍රී ලංකාවේ පිහිටි එකම ජලගැලුම් නිම්න ජාතික උද්‍යානයද මෙය වේ. මෙම උද්‍යානය 1984 අගෝස්තු 07 වැනිදා ජාතික උද්‍යානයක් වශයෙන් ප්‍රකාශයට පත් කෙරිණි.මෙම ජාතික උද්‍යානය ජෛව විවිධත්වයෙන් අනූනවේ. මේ අතර මෙම ජාතික උද්‍යානය හරහා කිලෝමීටර් 13 ක පාරක් සකස් කිරීමට සැලසුම් කරන බව පෙත්සම්කාර ආයතනයට දැන ගන්නට ලැබිණි.මී අමතරව මෙම උද්‍යානය අවට ප්‍රදේශවාසීන් ගෙන් විවිධාකාර හිරිහැරයන්ට ලක්වීමද සිදුවේ.තවද වී ගොවිතැන ද නීතිවිරෝධීව සිදු කෙරේ.

මෙම සමස්ත ක්‍රියාවලිය තුළින් සමස්ත පරිසර පද්ධතියට හානි සිදුවන සේම , මෙම ප්‍රදේශයේ පිහිටා තිබෙන සෝමාවතිය ජාතික වන උද්‍යානයටද මෙම ඉරණම උදාවී තිබේ.

එබැවින් වගඋත්තරකරුවන්ට නොතීසි නිකුත් කරන ලෙසද වනජීවි සහ වෘක්ෂලතා පනතේ විධිවිධාන අනුව ජල ගැලුම් නිම්න ජාතික උද්‍යානය සහ සෝමාවතී ජාතික උද්‍යානය ආරක්ෂා කිරීමට කටයුතු කරන ලෙසට නියෝග කරමින් වගඋත්තරකාර වන ජීවි අධ්‍යක්ෂ ජනරාල් , වන ජීවි ඇමැති ඇතුළු පිරිසට රිට් ආඥාවක් නිකුත් කරන ලෙසද , ජල ගැලුම් ජාතික උද්‍යානය හරහා මාර්ගයක් ඉදිකිරීම වළක්වාලන ප්‍රොහිබිෂන් රිට් ආඥාවක් නිකුත් කරන ලෙසද පෙත්සම්කරු සිය පෙත්සමින් ඉල්ලා ඇත.

# කිංග්ස්බරි ප්‍රහාරයට සැක ෆස්කාන් රඳවාගෙන ප්‍රශ්න කරන බව අධිකරණයට දන්වයි

**සුභාෂිණී සේනානායක**

පාස්කු ඉරු දිනයේ කොළඹ කිංග්ස්බරී හෝටලයට ප්‍රහාරයක් එල්ල කිරිමට සම්බන්ධ වූ බවට මොහොමඩ් අයුබ් මොහොමඩ් ෆස්කාන් නැමැති සැකකරුවකු රදවා ප්‍රශ්න කරන බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඊයේ29 කොටුව මහේස්ත්‍රාත් ප්‍රියන්ත ලියනගේ මහතා හමුවේ මෝසමක් ගොනු කරමින් දැනුම් දුන්නේය.

එමෙන්ම මෙම සිද්ධිය සම්බන්ධයෙන් බූස්ස බන්ධනාගාරයේ සිටින ෆස්රුල් රහුමාන් යන සැකකරුගෙන් ප්‍රහාරයට ඇදැළව ප්‍රකාශයක් ලබා ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණයෙන් අවසර ඉල්ලා සිටි අතර ඊට අවසර ලැබිණි.

සිද්ධිය සම්බන්ධයෙන් රක්ෂිත බන්ධනාගාර ගතව සිටින සැකකරුවන් ලබන මැයි මස 05 වනදා දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර තිබේ.

නඩුව කැඳවන ඉදිරි දින විමර්ශන ප්‍රගතිය අධිකරණයට ඉදිරිපත් කරන ලෙස මහේස්ත්‍රාත්වරයා රහස් පොලිසියට නියෝග කළේය.

# කිරින්දේ වැලි නිධිය ඉන්දීය සමාගමකට පවරා දී නෑ

## ඇමැති මහින්ද අමරවීර

**බුද්ධිකා ඉඹුලාන**

කිරින්ද ප්‍රදේශයේ වැලි නිධිය ඉන්දීය සමාගමකට පවරා දී නැති බවත් මේ වැලි නිධීය පිළීබඳ ඉදිරි පියවර, ප්‍රදේශයේ දේශපාලන නියෝජිතයන්ගේ සහ ජනතාවගේ මතය අනුව ගන්නා බවත් පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා කියයි.

එමෙන්ම ,ඉන්දියානු සමාගමක් දැනට මේ ප්‍රදේශයේ වැලි පිළිබඳව ගවේෂණ බලපත්‍රයක් පමණක් ලබාගෙන තිබෙන බවත් එම සමාගම විසින් මේ ප්‍රදේශයේ ජනතාව එකතුකොට ලබාදෙන වැලි මිලදී ගැනීමක් සිදුකරන බවත් ඇමැතිවරයා පවසයි. එම වැලි අලෙවි කිරීමෙන් එම ප්‍රදේශයේ ජනතාව දිනකට රුපියල් 4000-5000ක පමණ ආදායමක් උපයන බව ද ඇමැතිවරයා පවසයි. ස්වභාවිකව මුහුදෙන් වෙරළ තීරයට එකතුවන වැලි විකිණීමෙන් එම ප්‍රදේශයේ ජනතාව ප්‍රතිලාභ අත්කර ගන්නා බවද අමරවීර මහතා පෙන්වා දෙයි.

# මුහුදු කූඩැල්ලන් කිලෝ 6ක් නීති විරෝධිව ගෙන්වූ දුම්වැටි ළඟ තබා ගත් විදේශිකයාට දඩ

**සුභාෂිණී සේනානායක**

නිසි බලපත්‍රයක් නොමැතිව මුහුදු කූඩැල්ලන් කිලෝ 6 අධික ප්‍රමාණයක් සහ නීති විරෝධී ලෙස ගෙන්වන ලද දුම්වැටි 100ක් ළග තබාගත් චීන ජාතිකයෙක් ට රුපියල් 60000 දඩ මුදලක් ගෙවන ලෙස කොටුව මහේස්ත්‍රාත් ප්‍රියන්ත ලියනගේ මහතා ඊයේ 29 නියෝග කළේය.

කොල්ලුපිටිය පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ චීන ජාතික ලී කියු ෆෙන් යන අය වරද පිළිගැනීම මත මෙම දඩ මුදල් නියම කෙරිණි.

# 'සඳහිරු සෑය' අපේ රටේ ජාතික වීරයන්ට කළ හැකි හොඳම උපහාරයයි

## ● ලංකාරාමාධිකාරී රළපනාවේ ධම්මජෝති හිමියෝ කියති

**රත්නසිරි පතිරණ - අමිල ප්‍රභාත් වනසිංහ (අනුරාධපුර අතිරේක) සහ අනුරාධපුර දිසා විශේෂ**

ජාතික වීරයන් වෙනුවෙන් උපහාරයක් විදියට සඳහිරු සෑය ඉදිකිරීම ඔවුන් වෙනුවෙන් කරන හොඳම උපහාරය බවත් දාගැබේ හතරැස්කොටුවේ ධාතු නිධානෝත්සවය සිදු කරන අද දවස දේශාභිමානය දේශප්‍රේමය ඔද වැඩෙන අවස්ථාවක් ලෙස හැඳින්විය හැකි බවත් ඓතිහාසික ලංකාරාමාධිකාරී රළපනාවේ ධම්මජෝති හිමියෝ සඳහන් කළහ. උන්වහන්සේ මේ බැව් සඳහන් කළේ පෙරේදා (28) මැදින් පොහෝදින සඳහිරු සෑයේ හතරැස්කොටුවේ ධාතු නිධානෝත්සවය වෙනුවෙන් පැවැති දහම් හමුවේ ප්‍රධාන අනුශාසනාව කරමිනි. අපි මේ රැඳී සිටින භූමිය වගේම අපි ඉපදුණු මාතෘභූමිය හරිම පුණ්‍යවන්තයි. බුදුන් වහන්සේ තෙවරක් වැඩිය මේ බිම බුද්ධ භූමියක් වගේම පුණ්‍යභූමියක්. ඒ වගේම අනුබුදු මිහිඳු මහනාහිමියන්ගේ පාදස්පර්ශයෙන් පවිත්‍ර වුණු බිමක්. ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ආශිර්වාදයෙන් රැකවරණය ලැබෙන රටක්. මේ රට කාටවත් සතුරුකම් කරන්න විනාශ කරන්න බැහැ. ඈත අතීතයේ සිටම මේ පින්බිමට එරෙහිව සතුරු බලවේග ක්‍රියාත්මක වුණත් ඒ සියලු බලවේග පරාජය කරන්න අපේ රජ දරුවන් කටයුතු කළ බව සඳහන් කළ ධම්මජෝති හිමියෝ කලින් කලට චෝල, පාණ්ඩ්‍ය ආදී පරසතුරු බලවේග විනාශ කර රට එක්සේසත් කළ ගැමුණු, විජයබා, ගජබා, පැරකුම් රජ දරුවන් ද මේ මොහොතේ අප සිහිපත් කළ යුතු බව ද පැවසූහ.





වැඩිදුරටත් ධම්මජෝති හිමියෝ මෙසේද පැවසූහ. වසර තිහක් ජීවිත විසිනව දහසකට අධික සංඛ්‍යාවක් අහිමි කර ගනිමින් අපේ මව්බිම රැකගන්න රණවිරුවන් යුද්ධ කළා. ඇස්, ඉස්, මස්, ලේ පමණක් නොවෙයි තමන්ගේ වටිනා ජීවිතය පවා කැප කරමින්. ඒ වීරෝදාර දරුවන් වෙනුවෙන් මෙවැනි උපහාර දාගැබක් ඉදිකිරීමට මුල්වුණු අපේ හිටපු ජනපති වර්තමාන අගමැති මහින්ද රාජපක්ෂ මහතාටත් එවකට ආරක්ෂක ලේකම් ලෙස කටයුතු කළ වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාටත් අපේ ගෞරවය මේ මොහොතේ පුද කළ යුතුයි. ඒ වගේම එවකට වන්නි ආරක්ෂක සේනා ආඥාපති වත්මන් ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න මහතාත් මේ මොහොතේ සිහිපත් කරනවා. මෙතුමන්ලා නොසිටින්න අපි අදත් මේ ගම්වල මැරි මැරී උපදිනවා. කොටි ත්‍රස්තවාදීන් මොන තරම් අපරාධයක් මේ රටට සිදු කළාද? අපි අද සැනසීමෙන් නිදහසේ ජීවත් වෙන්නේ ත්‍රිවිධ හමුදාවේ පොලිසියේ සහ සිවිල් ආරක්ෂක බළකායේ වීරෝදාර රණවිරුවන්ගේ ආරක්ෂාව මේ රටට දුන් නිසා බව ද උන්වහන්සේ සඳහන් කළහ.

"මාගේ මේ ව්‍යායාමය සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය උදෙසාමයි." දුටුගැමුණු රජතුමා කියපු ඒ උදාර වදන මට මේ සඳහිරු සෑය අභියසදී යළිත් සිහිපත් වුණා. එවැනි හැඟීමකින් තමයි මහින්ද රාජපක්ෂ, ගෝඨාභය රාජපක්ෂ මහත්වරුන් ත්‍රිවිධ හමුදාවට නිවැරදි නායකත්වය දෙමින් කරපු ඒ කැපකිරීම් නිසා තමයි වීරෝදාර රණවිරු කොල්ලො මේ රට රැකගත්තේ. ඒ නිසා රුවන්මැලි මහා සෑය, මිරිසවැටිය, අභයගිරිය වැනි මහා දාගැබ් ඉදි කළේ.

රට එක්සේසත් කිරීමේදී ජීවිත කැප කළ ජාතික වීරයන්ට උපහාර පිණිසයි මේ ඉදිවන සඳහිරු සෑය ඉදි වන්නේ. මෙය එවැනි උපහාර චෛත්‍යයක්. සිංහල රජ දරුවන්ගෙන් පසුව මේ මාතෘභූමියේ ඉදිවන විශාලතම දාගැබ සඳහිරුසෑය බව ද ධම්මජෝති හිමියෝ වැඩිදුරටත් සඳහන් කළහ.



**ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න මහතා -**

වසර තිහක් මේ රට විනාශ කළ යුද්ධය අපේ රණවිරුවන් අවසන් කළේ මුළු ලෝකයම මවිතයට පත්කරමින්. ඒ සඳහා නිවැරදි නායකත්වය අපට දුන් එදා ජනාධිපති ධුරය හෙබවූ, වත්මන් අගමැති මහින්ද රාජපක්ෂ මහතාත් එදා ආරක්ෂක ලේකම්, වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාත් මේ මොහොතේ මහත් ගෞරවයෙන් සිහිපත් කරනවා. ඔවුන් දෙදෙනාගේ උපදෙස් හා මගපෙන්වීම මතයි මේ ඓතිහාසික විජයග්‍රාහී භූමියේ රණවිරු උපහාර සඳහිරු සෑය ඉදි කරන්නේ. 2009 මැයි 18 අපි යුද්ධය මුළුමනින්ම අවසන් කළා. ඒ වෙනුවෙන් යුද, ගුවන්, නාවික, පොලිස් සහ සිවිල් ආරක්ෂක බළකායන්හි වීරෝදාර රණවිරුවන් විසිනව දහසකට අධික පිරිසක් මේ මවුබිමේ ජීවිත පූජා කළා. තවත් හැට දහසකට අධික පිරිසක් තුවාල ලැබුවා. ඉන් දාහතර දහසක් සදාකාලික අබ්බගාත වුණා. මේ මොහොතෙත් ඔවුන්ගෙන් ඇතැමෙක් රෝද පුටුවල, තවත් අය රෝහල්වල ගිලන් ඇඳන් මත දිවි ගෙවනවා. ඕකයි යුද්ධයේ යථාර්ථය. ඔවුන් සියලු දෙනා වෙනුවෙන් අපට කළ හැකි ඉහළම උත්තමාචාරය වෙනුවෙන් තමයි සඳහිරු සෑය ඉදිකරන්න තීරණය කළේ. දුටුගැමුණු. පැරකුම්බා, වලගම්බා, විජයබා වැනි නරවිරුවන් එදා රට එක්සේසත් කර ඒ බව සංකේතවත් කිරීමට රුවන්මැලි සෑය, මිරිසවැටිය, අභයගිරිය, ජේතවනාරාමය වැනි මහා දාගැබ් ඉදි කළා සේම වත්මන් විජයග්‍රහණය සංකේතවත් කිරීමට මේ මහා චෛත්‍ය ඉදිකළ බව ද ආරක්ෂක ලේකම්වරයා සඳහන් කළේය.

අපි මේ දාගැබට සඳහිරුසෑය කියා නම තිබ්බේ ඉර හඳ පවතින තුරු රණවිරුවන් කළ කැපකිරීමට උපහාරයක් පිණිසයි. මම හිතනවා මේ දාගැබට කළගුණ සෑය කියා කීවත් කමක් නෑ කියලා.

මේ වන විට සඳහිරු සෑයේ උස අඩි 124ක් දක්වා ඉදිකර අවසන්. එසේම දේවතා කොටුවේ තැන්පත්කිරීම සඳහා නිධන් වස්තු ලබාදීමේදී මේ රටේ දුගී දුප්පත් ජනතාව පවා තම සන්තකයේ තිබූ කණකර ආභරණ පවා ගලවා නිදන් වස්තු ලෙස තැන්පත් කිරීමට දුන් බවත් ඒ සෑම සියලු දෙනාටමත් ගඩොළින් ගඩොළ තබමින් මේ මහා දාගැබ ඉදි කරන්න ශ්‍රමය ඩහදිය කැපකළ රණවිරුවන් සැමටත් ස්තුතිය පුද කරන බව ද ආරක්ෂක ලේකම්වරයා සඳහන් කළේය. චූඩාමාණික්‍ය පරිත්‍යාග කළ දානපති ආතර් සේනානායක මහතාටත් මේ දාගැබේ සලපතළ මළුව ඉදිකිරීමට විශාල දායකත්වයක් සපයන නාඋයන ආරණ්‍ය සේනාසනයටත් පුණ්‍යානුමෝදනා කරන බව ද කමල් ගුණරත්න මහතා වැඩිදුරටත් සඳහන් කළේය.

දහම් හමුවේ පංචශීලය පිහිටුවීම ඓතිහාසික සෝමාවතී රාජමහා විහාරාධිපති පහමුණේ සුමංගල හිමියන් විසින් සිදුකරන ලදී. අටමස්ථානාධිපති පල්ලේගම සිරිනිවාස හිමියන්, අටමස්ථානාධිකාරී හිමිවරුන්, පැපිලියාන සුනේත්‍රා මහා දේවී පිරිවෙනේ පරිවේණාධිපති මහාචාර්ය මැදගොඩ අභයතිස්ස හිමියන් ඇතුළු මහා සඟරුවනද, යුද හමුදාපතිවරයා වෙනුවෙන් යුද හමුදා මාණ්ඩලික ප්‍රධානී, ගුවන් හමුදාපති, නාවික හමුදාපති, පොලිස්පති, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, උතුරුමැද පළාත් ආණ්ඩුකාර මහීපාල හේරත්, ඇමැති එස්. එම්. චන්ද්‍රසේන මහත්වරුන් ඇතුළු ත්‍රිවිධ හමුදාවේ, පොලිසියේ සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීහු සහ බැතිමත්හු විශාල පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

**ඡායාරූප - සුලෝචන ගමගේ**





ශ්‍රී ලංකාවත් - පාකිස්තානයත් අතර දිගුකලක සිට පැවත එන මිතුදම තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් පාකිස්තාන ජනාධිපති ආචාර්ය අරිෆ් අලවි මහතා සහ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා අතර සුහද හමුවක් පසුගියදා පාකිස්තාන ජනාධිපති මන්දිරයේදී පැවැත්විණි. එහිදී දෙරට අතර ආරක්ෂාව, සංචාරක, සමුද්‍රීය ආරක්ෂාව, අධ්‍යාපනය, පරිසරය සහ ආර්ථික ක්ෂේත්‍ර පිළිබඳ පුළුල්ව සාකච්ඡා කර ඇත. පාකිස්තාන යුද හමුදාපති ජෙනරාල් ජාවඩ් බජ්වා මහතාගේ ආරාධනයෙන් පාකිස්තාන ජාතික දින සැමරුම මෙන්ම එරට ජාතික ත්‍රිවිධ හමුදා උත්තමාචාර දිනය වෙනුවෙන් විශේෂ ආරාධිතයකු ලෙස සහභාගි වූ ශවේන්ද්‍ර සිල්වා මහතා එහිදී එරට ජනාධිපතිවරයා හමු වී මෙලෙස ද්විපාර්ශ්වික සාකච්ඡා පවත්වා තිබේ.

**සටහන - රත්නසිරි පතිරණ**

# 2015දී වගේම ව්‍යාජ මතවාද වපුරා විරෝධතා රැල්ලක් ඇති කිරීමට ඇතැමුන් උත්සාහ කරනවා

## ● ඇමැති ප්‍රසන්න රණතුංග



**මහින්ද අලුත්ගෙදර**

2015 වසරේ දී මහින්ද රාජපක්ෂ ආණ්ඩුව පෙරළා දැමීමට සිදුකළ ආකාරයටම අන්තර්ජාතික බලවේගවල අවශ්‍යතාව මත වත්මන් රජයට එරෙහිව ව්‍යාජ මතවාද පතුරන විරෝධතා රැල්ලක් ඇති කිරීමට ඇතැමුන් උත්සාහ කරන බව සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා පවසයි.

දෙදහස් පහළොවේ දී අන්තර්ජාතික බලවේගවල අවශ්‍යතාව මත රජයට එරෙහිව ක්‍රියාත්මක වූ රත්තරන් අශ්වයෝ, ලැම්බෝගිනි, ඩුබායි බැංකු ගිණුම් වැනි ව්‍යාජ මතවාද රැල්ලක් මගින් බලයට පැමිණි යහපාලන රජය රට තවත් වසර විස්සක් ආපස්සට රැගෙන ගිය බවද ඒ මහතා පෙන්වා දෙයි.

මිනුවන්ගොඩ දී පැවති තරුණ සංවිධාන නියෝජිත හමුවේදී ඇමැතිවරයා මේ බව සඳහන් කළේය.

පරිසරය විනාශ කිරීම සම්බන්ධයෙන් විවිධ රටවල ඡායාරූප යොදා ගනිමින් සහ පෞද්ගලික ඉඩම්වල ඉදිකෙරෙන ගොඩනැගිලිවල ඡායාරූප සමාජ මාධ්‍ය ද ඔස්සේ ඉදිරිපත් කරමින් ගෙනයන ව්‍යාජ මතවාද රැල්ල ද මේ ව්‍යාපාරයේ තවත් එක් පියවරක් බව පෙන්වා දෙන ඒ මහතා පසුගියදා විහාර මහාදේවී උද්‍යානය අසල පරිසර හිතකාමී චිත්‍රයක් ඉවත් කිරීම සම්බන්ධයෙන් රජයට එරෙහිව සමාජ මාධ්‍යවල දැඩි විවේචනයක් එල්ල කිරීමේ සිද්ධිය පසුපස හිටපු ඇමැති මංගල සමරවීර මහතා සිටින බවට අනාවරණය වී තිබෙන බවද කියා සිටී.

දෙදහස් පහළොවේ දී යහපාලන රජය බලයට පත්වීමත් සමඟ මහබැංකු මංකොල්ලය සිදුකිරීම නිසා රට ආර්ථිකමය වශයෙන් දැඩි පීඩනයකට පත්වූ බව පෙන්වා දුන් ඇමැතිවරයා එම රජයේ බැංකු මංකොල්ලයට සෘජුව හෝ වක්‍රව චෝදනා ලැබූ ඇතැම් පිරිස් අද ජනතා සහනයක් ලෙස වත්මන් රජය දුන් සීනි බදු අඩුකිරීම දැවැන්ත වංචාවක් ලෙස හුවා දක්වමින් සිටින බවද පවසයි.

යහපාලන රජයේ බල අරගලය මත ජාතික ආරක්ෂාව බිඳවැටීම නිසා අමානුෂික ලෙස අප්‍රේල් 21 පාස්කු ප්‍රහාරය එල්ල වූ අතර එයින් දෙසිය පනහකට අධික පිරිසක් මරණයට පත්වී තවත් පිරිසක් සදාකාලික ආබාධිතයන් බවට පත්විය. වසර තිහක් පැවති ත්‍රස්තවාදය අවසන් කිරීමට 2009 වසරේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා ප්‍රමුඛ රජය දැඩි කැපවීමකින් කටයුතු කළ අතර රට නිදහස් නිවහල් රාජ්‍යයක් බවට පත්කර සංවර්ධනය කිරීමේ මාහැඟි කර්තව්‍යයට පණදුන් අවස්ථාවක දී අන්තර්ජාතික බලවේගවල අවශ්‍යතාව අනුව රජයට එරෙහිව ව්‍යාජ මතවාද රැල්ලක් ක්‍රියාත්මක කොට එම රජය පෙරළා දැමීමට කටයුතු කෙරිණි.

වර්තමානයේ දී සිදුවෙමින් පවතින්නේ කොවිඩ් වසංගතයට සාර්ථකව මුහුණදෙන අතරතුර බිඳ වැටෙමින් පවතින සෑම අංශයක්ම ගොඩනැංවීමට වත්මන් රජය සාර්ථක ක්‍රියාදාමයක් ගෙනයමින් තිබිය දී විවිධ අසත්‍ය මතවාද පතුරමින් ව්‍යාජ විරෝධතා රැල්ලක් ඇතිකර නැවත රට අරාජිකත්වයට ගෙනයෑමේ සැලැස්මක් බවද මෙවැනි වාතාවරණයක් තුළ 2015 දී සිදුවූ ආකාරයට බොරු රැල්ලකට හසුනොවී රට ගොඩනැංවීමේ ජාතික වැඩපිළිවෙළට රජය සමඟ අත්වැල් බැඳගන්නැයි ඇමැති ප්‍රසන්න රණතුංග මහතා ජනතාවගෙන් ඉල්ලා සිටී.

# ස්වීඩනයේ ශ්‍රී ලංකා තානාපති එම්. පෙරේරා 16 වැනි ගුස්ටාෆ් රජතුමාට සිය අක්ත පත්‍ර පිළිගන්වයි

**මහින්ද අලුත්ගෙදර**

ස්වීඩන් රාජධානියේ ශ්‍රී ලංකා තානාපතිවරයා වශයෙන් පත්කළ එම්. පෙරේරා මහතා එරට 16 වැනි ගුස්ටාෆ් රජතුමාට සිය අක්ත පත්‍ර පිළිගන්වා තිබේ. ඒ අනුව තානාපති දර්ශන එම්. පෙරේරා මහතා විසින් ස්වීඩන් රාජධානියේ ශ්‍රී ලංකාවේ තානාපතිවරයා ලෙස පිළිගන්නා ලද අක්තපත්‍ර විශේෂ විධිවිධානයක් මගින් ස්වීඩනයේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ කෙටුම්පත් දෙපාර්තමේන්තුව හරහා කාල් 16 වැනි ගුස්ටාෆ් රජතුමා වෙත ඉදිරිපත්කර තිබෙන බව විදේශ කටයුතු අමාත්‍යාංශය පවසයි.

ස්වීඩනයේ පවත්නා සෞඛ්‍ය ක්‍රියාපිළිවෙත් අනුගමනය කරමින් මේ විශේෂ වැඩසටහන පසුගියදා සිදුකර තිබේ.

1996 දී ශ්‍රී ලංකා විදේශ සේවයට බැඳුණු තානාපති දර්ශන පෙරේරා මහතා වසර 25කට ආසන්න සේවා කාලයක් සම්පූර්ණ කර තිබෙන අතර විදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රචාරක, දකුණු ආසියා සහ සාර්ක්, මැදපෙරදිග සහ යුරෝපා කටයුතු යනාදී අංශවල විවිධ තනතුරුවල සේවය කර ඇත. වොෂිංටන් ඩීසීහි ශ්‍රී ලංකා දූත මණ්ඩලය, නිව්යෝර්ක්හි එක්සත් ජාතීන්ගේ නිත්‍ය දූත මණ්ඩලය, බැංකොක්, මොස්කව්, රෝමය සහ ජකර්තා තානාපති කාර්යාල ද ඒ මහතා රාජ්‍යතාන්ත්‍රික පත් කිරීම්වලට අයත් විය.

ස්ටොක්හෝම් සඳහා පත්කිරීමට පෙර, ඒ මහතා විදේශ අමාත්‍යාංශයේ උතුරු අමෙරිකා අංශයේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස ද සේවය කළේය. මීට පෙර විදේශ පැවරුමෙහි දී ඉන්දුනීසියාවේ ශ්‍රී ලංකා තානාපතිවරයා සහ ආසියාන් සංවිධානයේ ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙස ද කටයුතු කර තිබේ.

# වයඹ වෙරළබඩ තීරයේ කඩොලාන, ඇතුළු වගුරු බිම් සිතියම් ඇතුළත් 'ඇට්ලස් පොත' අමාත්‍යාංශ ලේකම් අතට

**බුද්ධිකා ඉඹුලාන**

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන ( UNDP) මගින්, වයඹ වෙරළබඩ තීරයේ කඩොලාන, ලවණ කලපු හා වගුරු බිම් සම්බන්ධයෙන් සකස් කළ, පරිසර තොරතුරු සහ සිතියම් ඇතුළත් 'ඇට්ලස් පොත' පරිසර ඇමැති මහින්ද අමරවීර සහ අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතාට පිරිනැමීම පසුගියදා අමාත්‍යායංශයේ දී සිදු කෙරිණි.

එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩසටහනේ මෙරට නියෝජිත Robert Juhkam, 'ඇට්ලස්' පොත සකස් කිරීම බාරව කටයුතු කළ එහි කර්තෘ ආචාර්ය වික්‍රම ගමගේ, මහත්වරුන් හා ඔවුන්ගේ නියෝජිත පිරිසක් මේ අවස්ථාවට සහභාගි වූහ. මේ ග්‍රන්ථයේ වයඹ වෙරළබඩ තීරයේ පවතින කඩොලාන, කලපු, ලවණ වගුරු බිම් හා වැලි නිධි පිළිබඳ තොරතුරු රැසක් අන්තර්ගත වේ.



**එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩසටහනේ මෙරට නියෝජිත Robert Juhkam මහතා-** ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් මෙන්ම ස්වාභාවික සම්පත් පිළිබඳ මෙවැනි ග්‍රන්ථයක් සකස් කිරීමට දායකත්වය ලබාදීමට හැකි වීම සම්බන්ධයෙන් තමන් පෞද්ගලිකවම සතුටු වන බව කීය.

**අමාත්‍යංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා-** මේ ඇට්ලස් පොගෙන් අපේ රටේ වයඹ දිග වෙරළ තීරයේ පවතින ස්වාභාවික සම්පත් වන කඩොලාන,වැලි නිධි සම්බන්ධව මෙන්ම පක්ෂි පර්යටනය පිළිබඳ අතිශය වැදගත් තොරතුරු රැසක් පළ කර ඇති බව කීය.

එසේම මේ වයඹ වෙරළබඩ කලාපය ආශ්‍රිතව ජීවත් වන ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම, දිළිඳුකම පිටු දැකීම, සංචාරක කර්මාන්තය නංවාලීම මෙන්ම තිරසර සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම් සඳහා මෙවැනි ග්‍රන්ථයක් සම්පාදනය වීම අතිශය වැදගත් බව ද කී ලේකම්වරයා ඒ සම්බන්ධව එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩසටහනට තම කෘතඥතාව පළ කළේය.

Sports ක්‍රීඩා

sports.dinamina@lakehouse.lk

# ක්‍රිකට් අතුරු කමිටු පත් නොකරන්නැයි ක්‍රීඩා සමාජ 50කට වැඩි පිරිසක් ඉල්ලති

**ප්‍රින්ස් ගුණසේකර**

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ඉදිරි නිලවරණයෙන් නව නිලධාරීන් පත් වන තෙක් ක්‍රිකට් පරිපාලනය සඳහා අතුරු කමිටු පත් නොකරන ලෙස ක්‍රීඩා සමාජ 50කට වැඩි පිරිසක් ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතාට ලිපි යොමුකොට ඇත. ශ්‍රී ලංකා ක්‍රිකට් පරිපාලනය ගොඩ නැඟෙන්නේ ක්‍රීඩා සමාජවල ඡන්දයෙන් බැවින් බහුතර ක්‍රීඩා සමාජවල ඉල්ලීම ඉටු කරන ලෙස ක්‍රීඩා ඇමැතිවරයාට යොමු-කළ ලිපිවලින් ඉල්ලා තිබේ. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලවරණයට ලියාපදිංචි ක්‍රීඩා සංගම් හා ක්‍රිකට් සමාජ 84ක් ඇති අතර, නිලවරණයේදී පළාත් ක්‍රිකට් සංගම්, දිස්ත්‍රික් ක්‍රිකට් සංගම්, පරිපාලන ක්‍රීඩා සමාජ, අනුබද්ධිත ක්‍රීඩා සමාජ සහ ක්‍රිකට් සංගම්වලින් ඡන්ද 144ක් ප්‍රකාශ වේ.

ශ්‍රී ලංකා ක්‍රිකට් හිටපු නිලධාරී මණ්ඩලයේ නිල කාලය පසුගිය පෙරවාරි මස 20 වැනිදා අවසන් වූ බව නීතිපතිවරයා දැනුම් දී ඇති අතර, එම නිලධාරීන් මණ්ඩලය තව දුරටත් කටයුතු කිරීම නීති විරෝධී යැයි කෝල්ට්ස් ක්‍රිකට් සමාජය ඇමැති නාමල් රාජපක්ෂ මහතාට ලිපියක් යොමු කොට තිබිණි. එම විරෝධතාව ක්‍රීඩා ඇමැතිවරයා නීතිපතිට යොමු කිරීමෙන් පසුව එයට ප්‍රතිචාර ලෙස මෙම තීරණය ක්‍රීඩා ඇමැතිවරයාට දැනුම් දී තිබේ.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලවරණය ලබන මැයි මස 20 වැනිදා පැවැත්වීමට නියමිතව ඇති අතර, ශ්‍රී ලංකා ක්‍රිකට් නිලවරණයේ නාම යෝජනාවලට එරෙහිව එල්ල වූ විරෝධතා 36ක් ම ප්‍රතික්ෂේප කිරීමට නිලවරණ කමිටුව කටයුතු කොට තිබිණි. ක්‍රිකට් නිලවරණයේ නාම යෝජනාවලට එරෙහි විරෝධතා විභාගය අවසන් වූ අතර එහි නිල ප්‍රකාශය නිලවරණයට මාසයකට පමණ පෙර නිකුත් කිරීමට නිලවරණ කමිටුව තීරණය කොට ඇත.

ක්‍රිකට් නිලවරණයට නාම යෝජනා භාර දී තිබූ ප්‍රධාන නිලතල සියල්ලටම විරෝධතා ගොනු වී තිබූ අතර, නිලවරණ කමිටු සභාපති විශ්‍රාමික අභියාචනාධිකරණ විනිසුරු මාලනී ගුණරත්න හා විශ්‍රාමික උපරිමාධිකරණ විනිසුරු ශිරෝමී පෙරේරා, හිටපු ජ්‍යෙෂ්ඨ ලේකම්වරයකු වූ ආචාර්ය ඩී.එම්. ආර්.බී. දිසානායක යන මහත්ම මහත්මීන් විසින් විරෝධතා සියල්ල විමර්ශනයකට ලක් කරනු ලැබීය.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ඉදිරි වසර දෙකක කාලසීමාව සඳහා සභාපති, උප සභාපතිවරු දෙදෙනකු, ලේකම්, උප ලේකම්, භාණ්ඩගාරික සහ උප භාණ්ඩාගාරික තනතුරු සඳහා නාමයෝජනා කැඳවා ඇත.

# තිසර පෙරේරා වාර්තාපොත අලුත් කරයි

**ෆවුස් මොහොමඩ්**

ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ තුන්ඉරියව් ක්‍රීඩක තිසර පෙරේරා ඕවරයකදී හයේ පහර 6ක් එල්ල කළ පළමු ශ්‍රී ලාංකික පිතිකරු ලෙස වාර්තාපොතට එක් විය.

මේ දිනවල පැවැත්වෙන අන්තර් සමාජ එක්දින තරගාවලියේදී යුද හමුදා ක්‍රීඩා සමාජය නියෝජනය කරන තිසර පෙරේරා බ්ලූම්ෆීල්ඩ් ක්‍රීඩා සමාජයට එරෙහිව මේ දස්කම පෑවේය.

අන්තර්ජාතික ක්‍රිකට් පිටියේදී එක් ඕවරයකට හයේ පහර 6ක් එල්ල කළ 9 වැනි පිතිකරුවා ලෙසත් වාර්තාපොතට එක්වූ තිසර පළමු පෙළ තරගයකදී එවැනි දස්කමක් පෑ පළමු ක්‍රීඩකයා ද වේ.

බ්ලූම්ෆීල්ඩ් කණ්ඩායමේ දිල්හාන් කුරේ විසින් යවනු ලැබූ එම ඕවරයේදී හයේ පහර 6ක් එල්ල කරමින් සිය අර්ධ ශතකය පන්දු 13කින් වාර්තා කළ තිසරගේ දේශීය තරග ඉතිහාසයේ දෙවැනි වේගවත්ම අර්ධ ශතකයට ද හිමිකම් කීවේය.

පනාගොඩ යුද හමුදා පිටියේ පැවැති ඕවර 41කට සීමා වූ මේ තරගයේ පළමුව පන්දුවට පහර දුන් යුද හමුදා පිල නියමිත ඕවර 41 ඇතුළත කඩුලු 3ක් දැවී ලකුණු 318ක් රැස් කළේය. තිසර පෙරේරා ලකුණු 52ක් ලබා ගත් අතර, අෂාන් රන්දික රැස් කළ ලකුණු සංඛ්‍යාව 124කි. හිමාෂ ලියනගේ නොදැවී ලකුණු 101ක් රැස් කිරීමට සමත් විය.

පිළිතුරු ඉනිම ක්‍රීඩා කළ බ්ලූම්ෆීල්ඩ් පිල ඕවර 17ක් නිමා වන විට කඩුලු 6ක් දැවී ලකුණු 73ක් ලබා සිටි අතර අයහපත් කාලගුණය හේතුවෙන් විසඳුමකින් තොරව නිමාවට පත් විය.







# ජාතික මහා ක්‍රීඩා උලෙළේ පාපැදි ජය සඳරුවන්ට සහ දිල්රුක්ෂිට

හතළිස් හය වැනි ජාතික මහා ක්‍රීඩා උලෙළේ පාපැදි තරගාවලිය ජය ගැනීමට දකුණු පළාත නියෝජනය කළ එච්. ආර්. තරිඳු සඳරුවන් සමත් වෙද්දී කාන්තා තරගය ජය ගැනීමට වයඹ පළාතේ ඒ.එම්.ඩී. දිල්රුක්ෂි සමත් වූවාය.

කතරගම බස් නැවතුම් පළ ඉදිරිපිටින් ඊයේ උදෑසන ආරම්භ වූ මේ තරගයට දිවයිනම ආවරණය වන පරිදි ක්‍රීඩකයන් 186 දෙනකු එක්වී සිටි අතර, කිලෝමීටර් 158ක දුර ප්‍රමාණයකින් සමන්විත තරගය පැය 3කුත්, මිනිත්තු 40ක් සහ තත්පර 34කින් නිමා කළ තරිඳු සඳරුවන් කුසලානය සමඟ මුදලින් රුපියල් පනස් දහසක ත්‍යාගය දිනා ගත්තේය. තරගයේ අනු ශූරතාව බස්නාහිර පළාත නියෝජනය කළ කේ.ආර්.කේ. ආර්.සුරංග රණවීර දිනා ගත් අතර, තරගය නිමා කිරීමට ඔහුට ගත වූ කාලය පැය 3කුත්, මිනිත්තු 40ක් සහ තත්පර 35කි. බස්නාහිර පළාත නියෝජනය කළ තුෂාන් රාජපක්ෂ පැය 3කුත්, මිනිත්තු 40ක් සහ තත්පර 42කින් තරගය නිමා කරමින් තුන්වැනි ස්ථානයට පත් විය.

කිලෝමීටර් 79ක දුරකින් සමන්විත කාන්තා තරගයේ ජයග්‍රහණය අත්කර ගත් දිල්රුක්ෂි පැය 2කුත්, මිනිත්තු 26ක් සහ තත්පර 20කින් තරගය නිමා කළ අතර, දෙවැනි ස්ථානය ද වයඹ හිමි කර දෙමින් පී.ඒ.එස්. ප්‍රියදර්ශනී එම කාලයම වාර්තා කිරීම කැපී පෙනුණි. බස්නාහිර පළාත නියෝජනය කළ කේ.ඒ.සෙනාලි මධුමිකා පෙරේරා පැය 2කුත්, මිනිත්තු 27ක් සහ තත්පර 03ක කාලයක් වාර්තා කරමින් තුන්වැනි තැන දිනා ගත්තාය.

ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යංශය සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව එක්ව සංවිධාන කරන ජාතික මහා ක්‍රීඩා උලෙළේ පාපැදි තරගයේ සමාරම්භය ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අමල් එදිරිසූරිය මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි.

මොණරාගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී, දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපති කුමාරසිරි රත්නායක මහතාගේ ප්‍රධානත්වයෙන් කතරගම ප්‍රධාන බස් නැවතුම්පොළ පරිශ්‍රයේ දී පැවැති ත්‍යාග ප්‍රදානෝත්සවයට

ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතාගේ සම්බන්ධීකරණ ලේකම් රොනී ඊබ්‍රාහිම්, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අමල් එදිරිසූරිය, කතරගම ප්‍රාදේශීය සභාවේ සභාපති චානක අනිල් රංග, කතරගම පොලිස් ස්ථානාධිපති ලියනගමගේ, නෙස්ලේ ලංකා සමාගමේ ආයතනික කටයුතු පිළිබඳ උප සභාපති බන්දුල එගොඩගේ, නෙස්ලේ ලංකා සමාගමේ කිරි ආහාර නිෂ්පාදන අංශයේ උප සභාපති රුවන් වැලිකල මහත්වරු ද එක්ව සිටියහ.

MINISTRY OF YOUTH & SPORTS

NestOmalt 2021

46th National Sports Festival

# ජාතික මහා ක්‍රීඩා උලෙළේ සංවිධාන කටයුතු පළාත් සභාවලට

**ප්‍රින්ස් ගුණසේකර**

ජාතික මහා ක්‍රීඩා උලෙළේ සංවිධාන කටයුතු වසරක් හැර වසරක් එක් එක් පළාත් සභාවට භාර දීමට ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතා අපේක්ෂා කරයි. එවිට පළාත් සභාවකට ජාතික මහා ක්‍රීඩා උලෙළ පැවැත්වීමේ හැකියාව ලැබෙනු ඇතැයි ක්‍රීඩා ඇමැතිවරයා සඳහන් කළේය. ලබන වසරේදී පළාත් කිහිපයක සින්තටික් ධාවන පථ සහිත ක්‍රීඩා සංකීර්ණ ඉදි වන බැවින් මලල ක්‍රීඩා තරග පැවැත්වීමේ හැකියාව ලැබෙන බවත්, සින්තටික් ධාවන පථ නොමැති පළාත් සභා ඔවුන්ට ආසන්නයේ ඇති ක්‍රීඩා සංකීර්ණයක මලල ක්‍රීඩා තරග පමණක් පැවැත්වීමට සූදානම් විය යුතු බවත් රාජපක්ෂ මහතා පැවැසීය.

"ජාතික මහා ක්‍රීඩා උලෙළේ තරග ඉසව් වැඩි ප්‍රමාණයක් පළාත් සභා සීමාව තුළ පිහිටි ක්‍රීඩාංගණවල පැවැත්වීම මෙහි අරමුණයි. එවිට විශාල පිරිසකට ජාතික මහා ක්‍රීඩා උලෙළට සම්බන්ධවීමේ හැකියාව ලැබෙනවා. ලබන වසර වෙද්දී කුරුණෑගල ප්‍රදේශයට සින්තටික් ධාවන පථයක් ලැබෙනවා. බෝගම්බර හා ටොරින්ටන් ක්‍රීඩාංගණවලටත් සින්තටික් ධාවන පථ ලැබෙනවා. යාපනයේ දොරේ අප්පා ක්‍රීඩා පිටියට මංතීරු 9ක අන්තර්ජාතික මට්ටමේ සින්තටික් ධාවන පථයක් ඉදිවෙනවා. එම සින්තටික් ධාවන පථ ඉදි වීමත් සමග වයඹට, මධ්‍යමට හා උතුරට ජාතික මහා ක්‍රීඩා උලෙළේ සියලු ක්‍රීඩා සහිතව සාර්ථකව සංවිධාන කිරීමේ හැකියාව ලැබෙනවා. මීටර් 130 දුරකින් යුත් තවත් සින්තටික් පුහුණු ධාවන පථ 10ක් රටපුරා ඉදිකිරීමට අපේක්ෂා කරනවා" ඇමැතිවරයා පැවැසීය.

මේ සම්බන්ධව සියලුම ආණ්ඩුකාරවරු සමග ඉදිරියේදී සාකච්ඡා කොට පළාත් මට්ටමින් ජාතික මහා ක්‍රීඩා උලෙළේ සංවිධාන කටයුතු භාරදීම සිදුකිරීම ආරම්භ කරන බව ද ඇමැති නාමල් රාජපක්ෂ මහතා පැවැසීය.

කොරෝනා අර්බුදය හේතුවෙන් පසුගිය වසරේ ජාතික මහා ක්‍රීඩා උලෙළේ තරග පැවැත්වීමට නොහැකිවූ අතර එම පළාත් ක්‍රීඩා තරග සියල්ල මැයි 31වැනි දිනට පෙර අවසන් කළ යුතු බව පළාත් ක්‍රීඩා ප්‍රධානීන්ට ක්‍රීඩා අමාත්‍යාංශය දැනුම්දී ඇත. කොරෝනා අර්බුදය මතු වෙද්දී ජාතික මහා ක්‍රීඩා උලෙළේ දිස්ත්‍රික් හා පළාත් මට්ටමේ තරග පැවැත්වෙමින් තිබිණි. එහෙත් ඇතැම් පළාත්වල ක්‍රීඩා ඉසව් කිහිපයක තරග අවසන් අදියරේ පැවැත්වුණි.

කොරෝනා හේතුවෙන් ක්‍රීඩක ක්‍රීඩිකාවන් එකිනෙකා ස්පර්ශ වන ක්‍රීඩා ඉදිරියට ගෙන යෑම බාධාවක්ව පැවැති අතර, ක්‍රීඩක ක්‍රීඩිකාවන් එකිනෙකා ස්පර්ශ නොවන කැරම්, බැඩ්මින්ටන්, ක්‍රිකට්, ටෙනිස්, කායවර්ධන හා බර ඉසිලීම වැනි තරග කොරෝනා තර්ජනය තිබියදීම අවසන් කිරීමට දිස්ත්‍රික් හා පළාත් ක්‍රීඩා ප්‍රධානීහු කටයුතු කළහ. මේ වසරේ පැවැත්වෙන ජාතික මහා ක්‍රීඩා උලෙළෙ පසුගිය වසරේ නොපැවැත්වූ ක්‍රීඩා උලෙළෙ හා ඒකාබද්ධ කොට පැවැත්වීමට දැනටමත් තීරණය කොට ඇති අතර පසුගිය වසරේ වැය කිරීමට නියමිතව තිබූ ජාතික මහා ක්‍රීඩා උලෙළේ රුපියල් මිලියන 200ක පමණ මුදල් ක්‍රීඩා අරමුදලට බැර කෙරිණි.

# දකුණු ආසියා ටයිකොන්ඩෝ ශූරයන් අගයයි




නේපාලයේ කත්මණ්ඩු නුවර පැවැති 13 වැනි දකුණු ආසියා ක්‍රීඩා උලෙළේදී ටයිකොන්ඩෝ ක්‍රීඩාවෙන් ශ්‍රී ලංකාවට ගෞරවය අත් කර දුන් ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඇගයීමේ උත්සවය ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

ශ්‍රී ලංකාවේ කොරියානු තානාපති වුන් ජින් ජියෝන් සහ ශ්‍රී ලංකා ටයිකොන්ඩෝ සම්මේලනයේ සභාපති කංචන ජයරත්න මහත්වරුන්ගේ සහභාගීත්වයෙන් තලවතුගොඩ 'ග්‍රෑන්ඩ් මොනාක්' හෝටලයේ පැවැති මෙම ඇගයීමේ උත්සවයේදී පදක්කම් දිනාගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පුහුණුකරුවන්ට ද තිළිණ ප්‍රදානය කෙරිණි.

දකුණු ආසියා ක්‍රීඩා උලෙළේදී ශ්‍රී ලංකාව වෙනුවෙන් වැඩිම පදක්කම් දිනාගත් ක්‍රීඩා අතුරින් 3 වැනි ස්ථානය දිනා ගැනීමට ටයිකොන්ඩෝ ක්‍රීඩාවට හැකි වූ අතර, එහිදී රන් පදක්කම් 4ක්, රිදී පදක්කම් 7ක්, ලෝකඩ පදක්කම් 16ක් දිනාගත්තේය. මෙරට ක්‍රීඩා ඉතිහාසයේ ශ්‍රී ලංකා ටයිකොන්ඩෝ ක්‍රීඩාවේ විශාලතම පදක්කම් ජයග්‍රහණය සනිටුහන් කරමින් සමස්ත පදක්කම් 27ක් දිනාගැනීමට සමත් විය.

මෙම ක්‍රීඩා උලෙළට ටයිකොන්ඩෝ ක්‍රීඩාව නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 29ක් සහභාගි වූ අතර, ඉන් 27ක් පදක්කම් දිනාගැනීම ද විශේෂත්වයකි. 13 වැනි දකුණු ආසියාතික තරගාවලියේ ශ්‍රී ලංකාව නියෝජනය කළ සියළුම ක්‍රීඩා අතුරින් පදක්කමක් ජයග්‍රහණය කිරීමේ වැඩිම ප්‍රතිශතය වාර්තා කිරීමට ද ශ්‍රී ලංකා ටයිකොන්ඩෝ කණ්ඩායම සමත් විය. මේ අවස්ථාවට ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල රාජ්‍ය අමාත්‍ය තේනුක විදානගමගේ, ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් අනුරාධ විජේකෝන්, ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් රවීන්ද්‍ර සමරවික්‍රම, ජාතික ඔලිම්පික් කමිටු මහා ලේකම් මැක්ස්වෙල් ද සිල්වා හා ක්‍රීඩා විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ සජිත් ජයලාල් මහතා ඇතුළු පිරිසක් එක්ව සිටියහ.

# කොරෝනා ක්‍රිකට් රෙගුලාසි ජූලි දක්වා දීර්ඝ වෙයි

මධ්‍යස්ථ නොවන විනිසුරුවන් අන්තර්ජාතික ක්‍රිකට් ක්‍රීඩාවේ දිගටම කටයුතු කිරීමේ තීරණය ඇතුලත් පසුගිය වසරේ ක්‍රියාත්මක කළ කොරෝනා රෙගුලාසි 2021 ජූලි දක්වා දීර්ඝ කිරීමට අන්තර්ජාතික ක්‍රිකට් කවුන්සිලය තීරණය කරයි. අයිසීසී ක්‍රිකට් කමිටුව මෙම සතිය අවසානයේදී මාර්තු 31 සහ අප්‍රේල් 1 දිනවල රැස්වන අතර, එහිදී මෙම රෙගුලාසි අනුමත කෙරේ.

හිටපු ඉන්දීය නායක අනිල් කුම්බ්ලේ මහතාගේ සභාපතිත්වයෙන් යුත් අයිසීසී ක්‍රිකට් කමිටුව මීට පෙර රැස්වී තරග නිලධාරීන්ගේ දෙමුහුන් ආකෘතියක් අනුමත කර තිබේ. එහිදී එක් මධ්‍යස්ථ විනිසුරුවරයකුට සහ තරග පැවැත්වෙන රටේ විනිසුරුවන් තිදෙනකුට තරගයක දී ක්‍රියාත්මක වීමට ඉඩ සැලසීමයි. නමුත් මෙම ආකෘතිය නිරෝධායනයකින් තොරව මධ්‍යස්ථ විනිසුරුවන්ට ගමන් කළ හැකි රටවලට පමණක් සීමා වේ. ලෝක ටෙස්ට් ශූරතා තරගාවලියේ අවසන් මහා තරගය ජුනි 18 සිට 22 දක්වා ඉන්දියාව සහ නවසීලන්තය අතර එංගලන්තයේ සදම්ටන් හිදී පැවැත්වීමට නියමිත අතර, එය මධ්‍යස්ථ විනිසුරුවන් කණ්ඩායමක් විසින් මෙහෙයවනු ඇත. ක්‍රිස් බ්‍රෝඩ් තරග තීරකවරයා වන අතර, රිචඩ් කෙට්ල්බරෝ, මයිකල් ගොග් සහ රිචඩ් ඉලිංවර්ත් ඇතුළු 12කගෙන් යුත් මණ්ඩලයක් කටයුතු කරති.

# මේයර්ස් සහ බ්‍රැත්වේට් කොදෙව් ඉනිම පිළිසකර කරති



ලක්මාල්ගේ පන්දුවකට බොනර්ගේ කඩුල්ල බිඳී ගිය අයුරු.

සංචාරක ශ්‍රී ලංකා පිල සහ බටහිර ඉන්දීය කොදෙව් දූපත් පිල අතර ඊයේ ඇන්ටිගුවා හි ශ්‍රීමත් විවියන් රිචඩ්ස් ක්‍රීඩාංගණයේදී ආරම්භ වූ දෙවැනි හා අවසන් ටෙස්ට් තරගයේ පළමු දිනයේ දිවා ආහාරය වන විට පළමුව පන්දුවට පහර දෙමින් සිටින කොදෙව් පිල කඩුලු 2ක් දැවී ලකුණු 86ක් ලබා සිටියේය.

නොදැවී කඩුල්ලේ රැඳී සිටි නායක ක්‍රෙග් බ්‍රැත්වේට් ලකුණු 26ක් ද, කයිල් මේයර්ස් ලකුණු 49ක් ද ලබා සිටියහ.

කාසියේ වාසිය දිනා ගත් ශ්‍රී ලංකා පිලේ නායක දිමුත් කරුණාරත්න පළමුව පන්දු යැවීම තෝරා ගත් අතර, ආරම්භයේ සිටම දැඩි ආක්‍රමණශීලී පන්දු යැවීමක නිරත වූ වේග පන්දු යවන සුරංග ලක්මාල් කොදෙව් පිලේ මුළු ලකුණු සංඛ්‍යාව 15ක්ව තිබියදී කඩුලු 2ක් දවාලීමට සමත් විය. එහෙත් ඉන් පසුව බ්‍රැත්වේට් සමඟ එක් වූ කයිල් මේයර්ස් වේගවත් ඉනිමක් ක්‍රීඩා කරමින් කොදෙව් ඉනිම පිළිසකර කළේ තුන්වැනි කඩුල්ලට ලකුණු 71ක සම්බන්ධතාවක් ද ගොඩ නගමිනි.

මුළු ලකුණු සංඛ්‍යාව 11කදී ආරම්භක පිතිකරු ජෝන් කැම්බල් දැවී ගියේ කඩුලු රකින නිරෝෂන් දික්වැල්ල අතට උඩපන්දුවක් දෙමිනි. අනතුරුව තවත් ලකුණු 4ක් එක් වෙද්දී ලක්මාල් යැවූ පන්දුවක් බොනර්ගේ කඩුල්ල බිඳ දැමුවේ ඔහු ලකුණු ලැබීමටත් පෙරය.

සුරංග ලක්මාල් යැවූ පළමු ඕවර 6ම නොඉඳුල් ඕවර ලෙස සටහන් වීම කැපී පෙනුණි.

අද තරගයේ දෙවැනි දිනයයි.

**බටහිර ඉන්දීය කොදෙව් දූපත් පිල - 86/2 (දිවා ආහාරය වන විට)**

කයිල් මේයර්ස් නොදැවී 49, ක්‍රෙග් බ්‍රැත්වේට් නොදැවී 26 (සුරංග ලක්මාල් 25/2)

# ශ්‍රී ලංකා පිල අවසන් තැන

වසර 2023 එක්දින ලෝක කුසලාන තරගමාලාවට සෘජු සුදුසුකම් ලැබීමේ අයිසීසී එක්දින ලෝක කුසලාන සුපිරි ලීග ක්‍රිකට් තරගාවලියේ නවතම ප්‍රසාද ලකුණු සටහනට අනුව ශ්‍රී ලංකාව අවසන් තැනට පත් වී සිටී.

ශ්‍රී ලංකාව අවසන් තැනට ඇද වැටුණේ පසුගියදා නිමා වූ කොදෙව් පිලට එරෙහි එක්දින තරගාවලිය 3-0කින් පරාජයට පත් වීමෙනි. එම තරගාවලිය අතරතුර නියමිත කාලය තුළ ඕවර 50 සම්පූර්ණ කිරීමට නොහැකි වීම නිසා දඩුවම් ලකුණු දෙකකට ද හිමිකම් කියන ශ්‍රී ලංකා පිලට මීළඟ තරගය ජය ගැනීමෙන් ලැබෙන ප්‍රසාද ලකුණු සංඛ්‍යාවත් අඩු වනු ඇත.

නවතම ලැයිස්තුවට අනුව තරග 8කින් 4ක් ජයගෙන ප්‍රසාද ලකුණු 40ක් ලබා සිටින එංගලන්තය පෙරමුණේ පසුවන අතර, දෙවැනි තැන ඔස්ට්‍රේලියාවට හිමි වී තිබේ. නවසීලන්තය තුන්වැනි ස්ථානයේ පසුවන අතර, සිවුවැනි ස්ථානයේ සිටින්නේ ඇෆ්ගනිස්තාන කණ්ඩායමය.

# ආලින්දය



## දැන් මට වෙනදාට වඩා
## ලොකු වගකීමක් තිබෙනවා

### සෙනාලි ෆොන්සේකා

සෙනාලි ෆොන්සේකා කියන්නේ ෆොන්සේකා කලා පවුලේ තවත් පුංචි පුරුකක්. පුංචි පුරුකක් වුණාට ඇය දැන් කලා ලොවේ රුක්ෂ ගසක ශක්තිමත් අත්තක්. එංගලන්තයේ ඉපදී එහි හැදුණු වැඩුණු සෙනාලි ශ්‍රී ලාංකික සුන්දර අව්‍යාජ ගැමි තරුණියකගේ රූ සපුවකට හිමිකම් කියනවා. 'සිරි පැරකුම්' චිත්‍රපටයේ මතක සිටින චරිතයකට පණ පොවමින් ඇය ඇයගේ රංගන කෞශල්‍යය මුළු රටටම පෙන්නුවා. එතැන් සිට ඇරැඹි ඇයගේ රංගනය චිත්‍රපට සහ ටෙලිනාට්‍යවල විවිධ චරිත තුළින් මැනවින් විදහා දැක්වූවා. මේ දිනවල පුංචි තිරයේ අතිශයින් ජනප්‍රියට පත් 'නාඩගම්කාරයෝ' ටෙලිනාට්‍යයේ ද ඇය සැමගේම සිත් දිනා ගෙන සිටී. මේ කතා බහ ඇය සමඟයි.





**● ඔබ මේ දවස්වල මොනවද කරන්නෙ?**

මම මේ දවස්වල හැමෝම දන්න 'නාඩගම්කාරයෝ' එක්ක සම්බන්ධ වෙලා වැඩ කරනවා. මෙ දවස්වල කාලය වෙන් කරලා තියෙන්නේ ඒ සඳහායි.

**● දිගටම ශ්‍රී ලංකාවෙම රැඳී ඉන්න ද බලාපොරොත්තුව?**

මම කොහොමත් එදා ඉඳලම ලොකු කැමැත්තක් තිබුණේ ශ්‍රී ලංකාවේ ඉන්න. එංගලන්තය එක්ක සම්බන්ධකම් තිබුණේ හැදුණෙ වැඩුණේ ඒ රටේ නිසයි. එහේ මතකයන් තියෙන්නේ තාත්ති එක්ක. දැන් තාත්ති නැති නිසා එහේ එයාර්පෝට් එකේ බහින්නවත් මම කැමති නැහැ. මට තාත්ති මතක් වෙනවා. එතකොට දුකයි. ඒත් මගේ ගෙවල් තියෙන්නේ එංගලන්තයේ නිසා මට කවද හරි එහේ යන්න වෙනවා. ඉගෙනීම් කටයුතු ඉවර කරන්නත් ඕනෑ නිසා මම එහේ යාවි. නමුත් වැඩිපුර බලාපොරොත්තුව ශ්‍රී ලංකාවේ ඉන්නයි.

**● නාඩගම්කාරයෝ ටෙලි නාට්‍යයට ලැබෙන ප්‍රතිචාර කොහොම ද?**

'නාඩගම්කාරයෝ' මිනිස්සු අතරට ඇවිත් තවම මාස දෙකයි දවස් ගණනයි ගත වෙන්නේ. ඒ කෙටි කාලයට අපේ රටේ ඉන්න හැමෝගෙන්ම වයස් භේදයකින් තොරව මේ නිර්මාණයට හොඳක් අහන්න ලැබෙනවා. මම හිතුවෙ නැහැ මෙච්චර හොඳ ප්‍රතිචාර ලැබෙයි කියලා. 'නාඩගම්කාරයෝ' තිර රචනය සද්ධා මංගල සූරිය බණ්ඩාර මහතාගේ, අධ්‍යක්ෂණය ජයප්‍රකාශ් සිවගුරුනාදන් මහතාගේ, මෙහි නිෂ්පාදනය චාමර සමරවික්‍රම මහතාගේ. මේ තුන් දෙනා එකතු වෙලා වැඩක් කළාම ඒ වැඩේ ජනප්‍රියත්වයට පත් වෙනවා සහ මිනිස්සු අතරට යනවා කියලා මට විශ්වාසයක් තිබුණා. 'හාරකෝටිය' ටෙලි නාට්‍යයත් ඒ වගේම ජනප්‍රිය වුණා. 'නාඩගම්කාරයෝ' ටෙලිනාට්‍යයටත් ඉහළින්ම ප්‍රතිචාර තිබෙනවා. සමාජ මාධ්‍යවලත් එහෙමයි. ප්‍රධාන චරිතයේ ඉඳලා සුළු චරිතය දක්වාම චරිතවලට චිත්‍ර අඳින්න, කවි ලියන්න තරම් හොඳ ප්‍රතිචාර තිබෙනවා. අපේ හැකියාවන් බලලා මේ චරිත ආදරයෙන් වැලඳගන්න ප්‍රේක්ෂකයන්ට අපි ස්තූතිවන්ත වෙනවා. අපි හැමෝම ඒ අයට ආදරෙයි.

**● 'නාඩගම්කාරයෝ' ටෙලිනාට්‍යයේ රංගනය නිසා ඔබ සුමති ටෙලි සම්මාන උළෙලේ ජනප්‍රියම නිළිය වුණා. ඒ ගැන ඇතිවෙන හැඟීම කොහොම ද?**

ඇත්තටම මම නොසිතූ විදියටයි මට මේ සම්මානය ලැබුණේ. හැම නළුවෙකුටම, නිළියකටම බලාපොරොත්තුවක් තිබෙනවා හොඳම නළුවා හෝ නිළිය වෙන්න සහ ජනප්‍රියම නළුවා හෝ නිළිය වෙන්න. සිරිපැරකුම්වලින් අවුරුදු 7කට පස්සේ මම ජනප්‍රියම නිළිය ලෙස සුමති ටෙලි සම්මාන උළෙලේ නිර්දේශ වෙලා තිබුණේ. එහි විශේෂ ස්තූතිය යන්න ඕනේ 'නාඩගම්කාරයෝ' ටෙලි නිර්මාණයට ආදරය කරන අපේ ප්‍රේක්ෂක ප්‍රේක්ෂිකාවන්ට. ඒ අයගේ ආදරය සහ ශක්තිය තමයි මට සම්මානයක් විදියට ලැබුණේ. ඒ සතුට මට කියා නිම කරන්න බැහැ. විශේෂයෙන්ම මේ ප්‍රේක්ෂකයින් මට දුන්න දේ නිසා මට රංගන ශිල්පිනියක් විදියට සහ 'නාඩගම්කාරයෝ' ටෙලිනාට්‍යයේ 'සුදු චූටි' විදියට දැන් මට ලොකු වටිනාකමක් දැනෙනවා. ඇත්තටම ගොඩක් පින් හැමෝටම. දැන් මට වෙනදට වඩා ලොකු වගකීමක් තිබෙනවා. මම කෙරෙහි තැබූ විශ්වාසය සහ ආදරය ඉදිරියටත් ආරක්ෂා කරන්න මට පුළුවන් වෙයි කියලා මම හිතනවා.

**● ඉදිරියේදී තිරගත වීමට නියමිත චිත්‍රපට මොනවා ද?**

2020දි චිත්‍රපට කිහිපයක් තිරගත වෙන්න නියමිතව තිබුණත් කොරෝනා වසංගත තත්ත්වය නිසා ප්‍රේක්ෂකයන්ගේ ආරක්ෂාව පිළිබඳව සැලකිලිමත් විය යුතු නිසා චිත්‍රපටශාලා විවෘත වුණේ නැහැ. ක්‍රිස්ටි ෂෙල්ටන් ප්‍රනාන්දු මහතාගේ 'යාත්‍රා', ජැක්සන් ඇන්තනි මහතාගේ 'එකගෙයි සොකරි', ධනුෂ්ක රේමන් මහතාගේ 'පරිස්සමින් ඉන්න', හර්ෂ උඩකන්ද මහතාගේ 'කබඩි' යන චිත්‍රපට ඉදිරියේදී තිරගත වීමට නියමිතයි.

**● ඔබගේ උසස් අධ්‍යාපන කටයුතු සහ ඉදිරි බලාපොරොත්තු මොනවා ද?**

මම මේ වෙනකොට කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයෙන් ජීව විද්‍යා අංශයෙන් විද්‍යාඥවරියක් විදියට පළමු පෙළ උපාධියක් අරගෙන තිබෙනවා. ගිය අවුරුද්දෙ මගේ තාත්ති නැති වුණේ කොවිඩ් නිසා. මගේ තාත්තිගෙ කලා පවුලෙ ඉගෙනීමට නැඹුරු වෙලා හිටියෙ මගේ තාත්ති විතරයි. අපේ පවුලෙ එකම දරුවා විදියට තාත්තිගෙ ලොකු ආසාවක් තිබුණා මට හොඳින් උගන්වලා හොඳ තැනකට ගේන්න. ඒ නිසා ජීව විද්‍යා අංශයෙන් තවත් ඉදිරියට ගිහින් මාස්ටර්, පශ්චාත් උපාධි තෙක් ඉහළට ගිහින් තාත්තිව සතුටු කරන්න මම බලාපොරොත්තු වෙනවා. කාලයත් එක්ක ඒ දේවල් සිදු වේවි. මම කැමති එංගලන්තයේ ඉගෙන ගෙන ශ්‍රී ලංකාවට සේවයක් කරන්න. එංගලන්තයේ ඕනෑ තරම් පහසුකම් තිබෙනවා.

**● ඔබගේ වැඩ කටයුතුවලට පවුලෙන් ලැබෙන සහයෝගය කොහොම ද?**

මගේ තාත්ති උපාලි ෆොන්සේකා. අම්මා සේනානි ෆොන්සේකා. මගේ නම දාලා තියෙන්නෙත් ඒ දෙන්නගේ නම් දෙකේ එකතුවෙන්. පවුලේ එකම ළමයා වුණාම ඉල්ලන ඉල්ලන දේ දීලා හිතුවක්කාර විදියට තමයි ඒ ළමයා හැදෙන්නේ.ඒත් මම හිතුවක්කාර චරිතයක් නොවී මේ විදියට ඉන්න ලැබුණු එකට ගෞරවය හිමි වෙන්න ඕනෑ මගේ අම්මටයි තාත්තිටයි. මට ඉල්ලන ඉල්ලන දේ එයාලා දුන්නේ නෑ. ඒ නිසයි මම මේ විදියට හැදුණේ. මම කලා ලෝකෙට අවතීර්ණ වුණේ 'පුංචි පැංචි' වගේ වැඩසටහන්වල නිවේදන කටයුතු කරලයි. මගේ පළමු චිත්‍රපටය 'සිරි පැරකුම්'. ඒ හැම දේටම මගේ පස්සෙන් හිටියේ අම්මයි තාත්තියි. තාත්ති මට හයියක් වෙලා මගේ අධ්‍යාපන කටයුතු ඉදිරියට ගෙන යන්න උදවු වුණා. ඒ දෙන්නා නැත්නම් මම මේ විදියට ඉන්නේ නෑ. කවුරු හරි මම දිහා බලලා, කුඩා ළමයෙක් හරි මම වගේ වෙන්න ඕනෑ කියලා කිව්වොත් ඒ මුළු ගෞරවයම හිමි වෙන්න ඕනෑ මගේ අම්මිටයි තාත්තිටයි.

**● මම දකින්නේ ඔබ ඉතා සරල කෙනෙක් විදියට. සැබෑ ජීවිතයේත් ඔබ විලාසිතා කරන්නේ නැද්ද?**

මම ලොකුවට ආභරණ පලඳින්නේ නැහැ. විච්චූරණ ඇඳුම් පැලඳුම් ඇඳගෙන මට ඉන්නත් බැහැ. ඒවා මට බරක්. මට ඕනෙ සරලව ඉන්න. නමුත් මම ගැහැනු ළමයෙක් විදියට මමත් ආසයි කරාබු, මාල, වළලු, ඇඳුම් පැලඳුම්, ලස්සන අත් බෑග්වලට. ඒවායේ එකතුවක් මා ළඟ තිබෙනවා. සමහර ගැහැනු ළමයි කැමති එක එක 'බ්‍රෑන්ඩ්'වලින් අඳින්න පලඳින්න. මට එහෙම වෙන්න ඕනකමක් නෑ. මම යන තැන අනුව ඒ ඒ විලාසිතා කරනවා. ඒත් මට ඕන මම, මම විදියට, සෙනාලි විදියට පෙන්වන්න මිසක් මාල වළලු පෙන්වන්න නෙමෙයි.

**චතුමී පිටිපන**
**ඡායාරූප - ශාන් රූපස්සර**
**තිලක් පෙරේරා**

## Bollywood

### ශාරුක් දැන් හරි ගණන්....



ජනප්‍රියකම, දක්ෂකම, සිනමා පටයේ සාර්ථකත්වය මත බොලිවුඩ් තරුවකට ගෙවන මිල ගණන් ඉහළ පහළ යයි. ඛාන් සුපිරි තරුව ශාරුක් ඛාන් අවසන් වශයෙන් රසිකයන් හමුවට පැමිණියේ 2018 දී තිරගත වූ සීරෝ සිනමා පටයෙනි. වාණිජ වශයෙන් සිනමාපටය අසාර්ථක වුණත් ශාරුක්ගේ ජනප්‍රියකමට නම් එය කිසිසේත්ම බලපා නැති පාටය. එනිසා ඔහු ඉදිරියට තිරගත වීමට නියමිත 'පතන්' සිනමාපටය සඳහා ඉන්දියානු රුපියල් කෝටි 100 ක් අය කර තිබේ. මෙය ශාරුක් අනාගතයේ අක්ෂේ කුමාර්, සල්මන් ඛාන් අභිබවා යන බවට ඉඟියක් ද? එසේ වුව හොත් පනස් හය හැවිරිදි ශාරුක් 2021 වසරේ වැඩිම මුදලක් අය කරන නළුවා බවට පත් වනු ඇත.

'පතන්' 2022 දී තිරගත කිරීමට නියමිතය. මෙහි සල්මන් ඛාන් ද ආරාධිත රංගනයක යෙදෙයි. දීපිකා පදුකෝන්, ජෝන් ඒබ්‍රහම් 'පතන්'හි රඟන සෙසු ප්‍රධාන තරුය. ශාරුක් මේ දිනවල ඩුබායි ගොස් සිටින්නේ රූගත කිරීම්වලට සහභාගී වීමටයි.

මිලෙන් ඉහළ නළුවන් දහ දෙනා අතර ශාරුක් සිටියේ තුන්වැනි තැනය. පළමු තැන හිමි කර ගෙන සිටින්නේ අක්ෂේ කුමාර්ය. ඔහු ඉන්දියානු රුපියල් කෝටි 135 ක මුදලක් සිනමාපටයක් සඳහා අය කරයි. සල්මන් ඛාන් දෙවැනි තැන හිමි කර ගන්නේ ඉන්දියානු රුපියල් කෝටි 70 - 75 ක් අය කරමිනි. තෙවැනියා වූ ශාරුක් 2021 දී සිනමා පටයෙන් ලැබෙන ලාබයෙන් සියයට 45කට හිමිකම් කීමේ ගිවිසුමකට අත්සන් කරන ලදී. එතෙක් ඔහු අය කළේ ඉන්දියානු රුපියල් කෝටි 50කි.



### 66 දුකින් ජය ගත්තෝ....

ෆිල්ම් ෆෙයාර් සම්මාන උළෙල උදාවන තුරු රංගනය වෙනුවෙන් අපමණ දුක් කන්දරාවක් දර්ශන තලවලදී විඳි තරු බලා සිටින්නේ මහත් බලාපොරාත්තු දල්වා ගෙනය. පසුගියදා ඒ දිනය උදා විය. මෙවර සම්මාන රාත්‍රිය සතුට වාගේම දුක ද මුසු වූ සම්මාන රාත්‍රියක් වූයේ ඉර්ෆාන් ඛාන් පිළිබඳ මතකය අවදි වීම නිසාය. ඔහු හොඳම නළුවා ලෙසින් අන්ග්‍රේසි මීඩියම් සඳහා සම්මානයට පාත්‍ර වූ අතර යාවජීව සම්මානය ද වෙන්වූයේ ඔහුගේ නමිනි. බාබිල් පියාට හිමි සම්මාන හිමි කර ගත් අතර ඔහුට හිමි සම්මාන ලබා ගත්තේ පුතු බාබිල් විසිනි. බාබිල්ට මව සුතාපා විසින් ඉර්ෆාන් ඇඳි ඇඳුමක් අන්දවා තිබූ අතර සම්මාන පියා වෙනුවෙන් ලබා ගනිමින් ඔහු කියා සිටියේ රසිකයන් තමන්ට පියා හා සමාන වීමට නොහැකි බව නිතර පැවසුවත් ඇඳුම්වලින්වත් ඔහුට සමාන විය හැකි වීම සතුටක් බවයි. ඉදිරියේදී තමන් ද රංගනයට එක් වන බව බාබිල් පවසා තිබේ. මෙවර හොඳම නිළිය වූයේ තාපාඩ්හි රැඟූ තපාසි පානුය.

### අයිෂ්ගේ රස රහස....

අයිෂ්වර්යා රායි බච්චන් සමඟ කොතෙක් ආදරබර ජවනිකා රූගත කළ ද තිරයේ පෙම්වතාට කිසිදු අවස්ථාවක ඇයට හාදුවක් දීමට නම් ඉඩක් ලැබෙන්නේ නැත. ඊට හේතුව අයිශ්වර්යා තිරයේදී හාදු දීම ප්‍රතික්ෂේප කර තිබීමයි. වරක් ලෝක ප්‍රකට ඔප්‍රා වින්ෆ්‍රේ සමඟ සමුමුඛ සාකච්ඡාවකදී අයිශ්වර්යාගෙන් ඇසූ මේ පැනයට පිළිතුරු දුන්නේ සැමියා අභිෂේක් බච්චන්ය. " බටහිරට වගේ ඉන්දියාවට හාදුවේ අවශ්‍යතාවක් නැහැ. අපි හාදුවක් වෙනුවට ගීතයක් යොදා ගන්නවා. " ඔහු පැවසීය. අභිෂේක් එදින දෙදෙනාගේ ආදර කතාව ඇරැඹුණු හැටි ද පැවසීය. " සිනමා පටයක් නිව්යෝර්ක් නුවර රූගත කරද්දී අපේ කතාව ඇරැඹුණා. සිනමා පටයේ රූගත කිරීම් අවසාන වුණාම හෝටලයේ බැල්කනියට වෙලා අවට බලන එක මගේ සිරිතක්. එදා එහෙම බලන් ඉන්න කොට මට අයිශ්වර්යා රායි සමඟ විවාහ වන්න ඇත්නම් හොඳයි කියලා හිතුණා. ඒ බැල්කනියේදීම මං එයාට විවාහ යෝජනාවක් ගෙනාවා." අභිෂේක් පැවසූ විට අයිශ්වර්යා පැවසුවේ එය සැබෑම සුන්දර අත්දැකීමක් බවයි.



අන්තර්ජාලයෙනි
චම්පිකා දීපානි රණසිංහ

# රසමංජරිය
සතියේ රස මංජුසාව





# ඔටුනු නොපලන් සිහින කුමාරයාගේ 35 වැනි සිනමා සැමරුම



කුමාර තිරිමාදුර කියන නම ඇසූ පමණින් ඔහු ගැන නොදන්නා කෙනෙක් නැහැ. ධර්ම යුද්ධයෙහි සැර පරුෂ පොලිස් නිලධාරියා නම් කුඩා දරුවකුටවත් අමතක වෙන්න විදියක් නැහැ. ඒ වගේමයි මෑතකදී තිරගත වුණු 'ද නිවුස් පේපර්' චිත්‍රපටය. එහිත් ඔහු අමතක නොවන චරිතයක් නිරූපණය කළා. ජැක්සන් ඇන්තනීගේ ජූලියට්ගේ භූමිකාව චිත්‍රපටයෙන් චිත්‍රපට රංගනයට පිවිසි කුමාර තිරිමාදුර ඔහු රංගනයට පිවිසුණේ කෙසේදැයි ඔහුගේ වචනවලින්ම පැවසුවේ මෙහෙමයි.

"මම සිනමා රංගනයට පිවිසෙන්න හේතුවක් වුණේ මගේ අම්මයි. ඇය 1978 ඔක්තෝබර් 28 වැනිදා එක පාරටම පපුවට ගසා ගෙන බිම පෙරළිලා ඇඬුවා. අම්මා එහෙම ලොකු වේදනාවකින් ඇඬුවේ එදා රුක්මනී දේවි මැරුණු වෙලාවේ. අපි පොඩි කාලේ අම්මා අපිව වැල්ලවත්ත රොකී සිනමා ශාලාවට එක්ක ගියා චණ්ඩියා චිත්‍රපටය බලන්න. ඒක බලපු වෙලාවෙ ඉඳලා මම ගාමිණී ෆොන්සේකට පිස්සු හැදිලා හිටියේ. මගේ අම්මටත් ඕනෑ වුණේ මාව නළුවෙක් කරන්න. එදා ඒ චිත්‍රපටය ඉවර වෙද්දි රෑ 11-12 විතර වුණා. අපට ගෙදර යන්න එක වාහනයක්වත් තිබුණේ නෑ. ඔහොම ඉන්නකොට පත්තර වෑන් එකක් ඇවිත් නැවැත්තුවා. ඒක ලේක්හවුස් එකේ වාහනයක්.

මම වසර 25ක් ජනමාධ්‍යවේදියෙක් විදියට වැඩ කළා. එක දවසක් දිවයින පුවත්පතේ සෝදුපත් අංශයේ සේවය කරන කොට ලස්සන සිදුවීමක් වුණා. අද දිනමිණ පුවත්පතේ ප්‍රධාන කර්තෘතුමා ගාමිනී ජයලත් මහතා එක්ක මම පත්තර පිටු බිම එළාගෙන නිදා ගෙන හිටියා. කවුරු හරි ගාමිණීට කොපි හෝල්ඩර් එකකින් ගහලා. එයා හිතුවේ මමයි ගැහැව්වේ කියලා. ගාමිණී මට එළවගෙන ආවා ගහන්න. ඒ වගේ සුන්දර අතීතයක් අපට තිබුණේ පත්තර කලාවත් එක්ක."

පත්තර කලාවට ආයුබෝවන් කියා සිය මවගේ මනදොළ සපුරන්නට සිනමාවට පිවිසි කුමාර තිරිමාදුර අද වන විට ඔහුගේ සිහින කුමරා වන ගාමිණී ෆොන්සේකා තරමටම ජනප්‍රිය වී සිටී. හාස්‍යය කොතැන ද කුමාර එතැන ඇත. කොරෝනා වසංගතය නිසා අකර්මණ්‍යව පවතින සිනමාවට කුමාර අලුත් වැස්සක් දෙන්නයි සූදානම් වෙන්නේ. ඒ ඔහුගේ "ඔටුනු නොපලන් කුමාරයාගේ දැනුණු සිනමා පෙළහර"යි. මෙවැනි සිනමා උළෙලක් මේ දිනවල පැවැත්වීමට හේතුභූත වුණ කරුණු පිළිබඳව කුමාර පැවසුවේ මෙහෙමයි,

"කොරෝනා පළමු රැල්ල ආවාම චිත්‍රපට ශාලාවලට නිකුත් කිරීම නැවතුණා. පාළු සොහොනකට දැම්මා වගෙයි අපි 'ද නිවුස් පේපර්' සිනමා ශාලාවලට ගිහින් දැම්මේ. කොරෝනා දෙවැනි රැල්ල ඇවිත් ආයෙත් සිනමා ශාලා වැහුණා. මේ නිසා උපුල් නිශාන්ත කිව්වා චිත්‍රපටි උළෙලක් තියමු කියලා. අපි මෙම චිත්‍රපටි උලෙළ මාර්තු 31 සිට අප්‍රේල් 4 වැනිදා දක්වා කොල්ලුපිටිය ලිබර්ටි සිනමා ශාලාවේ පවත්වනවා.

මාර්තු 31 - වෙයියා රවීගේ 'ධර්ම යුද්ධය', අප්‍රේල් 01 - සුනිල් ප්‍රේමරත්නගේ 'ටවුමෙ ඉස්කෝලේ', අප්‍රේල් 02 - සරත් කොතලාවල සහ කුමාර තිරිමාදුරගේ 'ද නිවුස් පේපර්', අප්‍රේල් 03 - නිලේන්ද්‍ර දේශප්‍රියගේ 'තණ්හා රතී රඟා', අප්‍රේල් 04 - සරත් වීරසේකරගේ 'ගාමණී'.මෙම චිත්‍රපට දර්ශන වාර තුනකදී පෙන්වනවා. උදේ 10.30, සවස 2.30 සහ 6.30 වශයෙන්."

කුමාර තිරිමාදුර රංගන ශිල්පියාගේ කලා දිවියට වසර 35ක් පිරීම නිමිත්තෙනුයි මෙම සිනමා උලෙළ පවත්වනු ලබන්නේ. ඔහු පවසන ආකාරයට සිනමාවේ මිනිසුන් අසරණ වී සිටින අවස්ථාවක ඔවුනට ශක්තියක් වෙන්නටයි ඔහුට ඕනෑ කර තිබෙන්නේ. වටු කුරුළු රැළ දැල ඔසවා ගෙන ගියාක් මෙන් කවුරුත් එකතු වී සිනමාව ගොඩ ගැනීමටයි ඔහුට ඕනෑ කර තිබෙන්නේ. වසර 35ක සිනමා දිවියට අපි ඔහුට සුභාශිංසන එක් කරමු.

**චතුමී පිටිපන**
**ඡායාරූප - තිලක් පෙරේරා**



# ගී 50ක් ලියූ ගෞතම්





සිංහල සහ ප්‍රංශ භාෂා එකට එක් කරන පාලමක් ගී පදවැල් ඔස්සේ ගොතන්නට වෙර දරන තරුණයෙක් ඉකුත් දා අපට හමු විය. මෙරට සංගීත ක්ෂේත්‍රයේ නිතර නෑසෙන නමකට උරුමකම් කීමෙන් ඩිලාන් ගෞතම දාස් නමැති ඔහුට එක්තරා විශේෂත්වයක් අත් වී ඇති සැටියකි.

අද ඊයේ නොවෙයි සත් වසරකට කලින් ගෞතම් ගී පද රචනාවට අත් පොත් තැබුයේ හිමි වෙන්නේ නැති තරම් ගීයෙනි. සහරා ෆ්ලෑෂ් සංගීත කණ්ඩායම හරහා ඊට ඉමහත් ජනප්‍රියත්වයක් ලැබුණි. ඉන් ඉක්බිතිව ශෘංගාරේ ගීයෙන් රටම හඳුනාගත් මේ යොවුන් ගේය පද රචකයා රහල් අල්විස් ගායන ශිල්පියාගේ හඬින් ශ්‍රාවක හදවත්වලට සමීප විය. සසංක පෙරේරා ගායනා කරන 'ආලයේ කතාවක්' ගීතයෙන් ගෞතම් මේ දිනවල තවත් වතාවක් තරුණ හදවත්වලට සමීප වී සිටියි.

එසේම කලක් තිස්සේ වේග රිද්මයෙන් එකම මාදිලියෙන් ප්‍රසංග වේදිකාවට ගොඩ වැදුණු ගායක ගායිකාවන් වෙනස්ම මුහුණුවරකින් සංගීත ලෝලීන්ට මුණ ගැස්වීම ද ඔහු කළ වෙනසකි.

ගෞතම් ප්‍රසංග වේදිකාවේ දී දකිනවාට වඩා වෙනස්ම 'දුක දන්නේ නම් ඇස් මගේ' ගීතයෙන් ජනප්‍රිය ගායිකා ජින්ජර් වයිට් රට හමුවට කැඳවා ගෙන එමින් පෙරළියක් කළ බවට තරුණ තරුණියන් අතරේ කතාබහට ලක් වෙයි.

එවන් ගෞතම් උදය නදීශාන්ගේ 'පිටු පාලා ගිය දාට' කලන පීරිස්ගේ 'ආඩම්බරකාරී' ආදී ගී පද රචනා රාශියක් ඔස්සේ දැන් අප හමුවට පැමිණ සිටියි.

"අලුත් ගායක ගායිකාවන් හුග දෙනකුට මුල්ම ගීතය ලියා දෙන්නට ලැබීම මට ලොකු සතුටක්. මේ වෙද්දි මං ගීත 50ක් ලියා තිබෙනවා. එයින් කිහිපයක් රූප රචනා සහිතව එළිදක්වා තිබෙනවා. මෙතෙක් පැමිණි ගමන් මඟ දෙස ආපස්සට හැරී බලද්දී මට සතුටුයි. මම මියුසික්වලට ආසාවෙන් කලාවට පැමිණි කෙනෙක්. සින්දු ලියන්නේ සංචාරක ව්‍යාපාරයේ නිරත වන අතරයි. ඒ හරහා ලැබුණු භාෂා දැනුම උපයෝගී කරගෙන ප්‍රංශ සිංහල භාෂාවල එකට පෑහීමක් ගීතය හරහා මං මේ දිනවල සොයමින් සිටිනවා."

ගෞතම් කෙටියෙන් අපට අදහස් පෙළගැස්වූ වූයේ එසේය.

**නුවන් මහේෂ් ජයවික්‍රම.**

## ගීත ක්ෂේත්‍රයේ අභිවෘද්ධියට ACPOSL නව ගමනක



ඩබ්. බී. ගනේගල | සුනිල් ආර්. ගමගේ | සරත් ද අල්විස් | නිලාර් එන්. කාසිම් | නලීන් පෙරේරා



රංග දසනායක | රාජ් කුමාර්

ශ්‍රී ලංකාවේ ගීත හා සංගීත කලාව සම්බන්ධව ක්‍රියාත්මක ප්‍රධාන සංවිධාන වන ඔස්කා හා ඇක්පෝ ජාත්‍යන්තර සාමූහික සංගම්වල නිර්ණායක හා මඟ පෙන්වීම අනුව ප්‍රතිසංවිධානය වී තිබේ. ඒ අනුව ඇක්පෝ ශ්‍රී ලංකා (ACPOSL) සංවිධානයේ නව අධ්‍යක්ෂ මණ්ඩලයක් ද පසුගියදා පත් කෙරිණ. ඩබ්. බී. ගනේගල, සුනිල් ආර්. ගමගේ, සරත් ද අල්විස්, නිලාර් එන්. කාසිම්, නලීන් පෙරේරා, රංග දසනායක සහ රාජ් කුමාර් යන අය මෙහි අධ්‍යක්ෂ ධුර හොබවති. ගීත ක්ෂේත්‍රය පිළිබඳ වැදගත් තීරණ රැසක් ගනිමින් එහි පළමු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම පසුගියදා පැවැත්විණි. ගීත නිර්මාණකරුවන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීම හා කර්තෘභාග එකතු කිරීම යන කාරණා මුල් කරගනිමින් සාමූහික සංගමයක් ලෙස කටයුතු කරන සංවිධානය WIPO සහ CISAC වැනි ජාත්‍යන්තර සංවිධාන සමඟ ද සබඳතා ගොඩ නඟාගෙන තිබේ.

ගුවන්විදුලි හා රූපවාහිනී මාධ්‍ය තුළින් ඉදිරිපත් කෙරෙන ගීතවල කර්තෘභාග හා ශිල්පීන්ගේ අයිතීන් පිළිබඳ කටයුතු කිරීමේ නෛතික හැකියාව ද මෙම සංවිධානය සතු වේ.

නව ප්‍රතිසංවිධානය යටතේ ගීත රචකයන්, සංගීත අධ්‍යක්ෂවරුන් සහ සංගීත ප්‍රකාශකයන් ඇක්පෝ සංවිධානය යටතේ සහ ගායක ගායිකාවන් සහ සංගීත නිෂ්පාදකයන් ඔස්කා සංවිධානය යටතේ පෙළගැසෙනු ඇත.

ඔස්කා හා ඇක්පෝ සංවිධාන දෙකම පනතකින් සම්මත වූ ආයතන දෙකක් වන අතර එය ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ කාර්යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. නව වැඩපිළිවෙළ අනුව සාමාජිකයන්ගේ නිර්මාණ වෙනම අංකයක් යටතේ ජාත්‍යන්තර වශයෙන් ලියාපදිංචි වීමක් සිදු වේ. මෙරට ගීත නිර්මාණ යම් ආකාරයකින් වෙනත් රටක භාවිත කරන්නේ නම් එය අධීක්ෂණය කිරීමේ විධිමත් ක්‍රමවේදයක් මෙතෙක් නොතිබිණි. ප්‍රතිව්‍යුහගත වීමත් සමඟ නිර්මාණකරුවකුගේ අයිතිවාසිකමක් උල්ලංඝනය වන්නේ නම් ඒ පිළිබඳ සොයා බැලීමේ හැකියාව ද මෙම සංවිධානය සතුවනු ඇත. ඉදිරියේදී ගීත නිර්මාණ පිළිබඳ සංචිතයක් පවත්වා ගෙන යාමට ද ඒ ඒ නිර්මාණවල හිමිකම, මිය ගිය අයගේ නිර්මාණවල හිමිකම කවුරුන් සතු වේ ද යන කාරණා ද විධිමත් කළ හැකි වනු ඇත. ශ්‍රී ලංකාවේ සහ ඉන් පිටත ගීතවලට අදාළ කර්තෘ භාග එකතු කිරීමේ අධිකාරි බලයලත් ආයතන වන්නේ ද OSCA සහ ACPOSL බැවින් සියලුම ගීත රචකයන්, සංගීත අධ්‍යක්ෂවරුන් හා ගීත ප්‍රකාශකයන් සිය ප්‍රතිලාභ ලබා ගැනීමට නම් අනිවාර්යයෙන්ම ACPOSL යටතේ ලියාපදිංචි විය යුතුය.

## සිනමා අධ්‍යක්ෂකවරුන්ගේ සංසදයේ මහ සභා රැස්වීම

දේශීය සිනමා අධ්‍යක්ෂකවරුන්ගේ එකමුතුව වන 'ශ්‍රී ලංකා සිනමා අධ්‍යක්ෂකවරුන්ගේ සංසදයේ' වසර දෙකකට වරක් පවත් වනු ලබන මහ සභා රැස්වීම මෙම වසරේ අප්‍රියෙල් මස 06 වන දින සවස 3.30 ට කොළඹ 07, ශ්‍රී ලංකා පදනම් ආයතන ශ්‍රවණාගාරයේ දී පැවැත්වීමට කටයුතු යොදා තිබේ.

ශ්‍රී ලංකා සිනමා අධ්‍යක්ෂකවරුන්ගේ සංසදයේ දැනටමත් සාමාජිකත්වය ලබා ගෙන ඇති සියලු දෙනාට සහ නව සාමාජිකයින් ලෙස සංසදයට බැඳීමට කැමති සෑම දෙනාටම මහ සභා රැස්වීම සඳහා සහභාගි විය හැකිය.

මහ සභා රැස්වීම සඳහා සහභාගි වීමට සුදුසුකම් ලැබීමට චිත්‍රපට අධ්‍යක්ෂකවරයකු ලෙස එක් චිත්‍රපටයක් හෝ තිරගත කර තිබීම අත්‍යවශය වන අතර, තම චිත්‍රපටය තවම තිරගත කර නොමැති වුවත් ඒ සඳහා ජාතික හෝ අන්තර්ජාතික මට්ටමින් සම්මාන දිනා තිබේ නම් රැස්වීමට සහභාගි වීමට අවස්ථාව සැලසේ.

විවිධ අභියෝග හමුවේ පසුගිය වසර දෙක පුරා ශ්‍රී ලංකා සිනමා අධ්‍යක්ෂකවරුන්ගේ සංසදයේ ප්‍රගතිය සහ කාර්යක්ෂමතාවය පිළිබඳ කරුණු පැහැදිලි කිරීමටත්, වර්තමානයේ සිංහල සිනමා කර්මාන්තය වෙනුවෙන් ගත යුතු සෘජු තීන්දු පිළිබඳ සාකච්ඡා කිරීමටත් මෙම මහ සභා රැස්වීම අවස්ථාවක් වනු ඇත. 2021-2023 යන දෙවසර සඳහා නව විධායක කමිටුව තෝරා පත් කර ගැනීම ද එදින සිදු කරනු ලබයි.

## සංගීත ශිල්පීන්ගේ තොරතුරු එක්රැස් කෙරේ

කීර්ති පැස්කුවල් සංගීතවේදියාණන්ගේ සංකල්පයකට අනුව 1997 වර්ෂයේ සිට අඛණ්ඩව එළිදක්වන ලද සොනික් දුරකථන නාමාවලිය යාවත්කාලීන කර 2021 වසර සඳහා නිකුත් කිරීමට සැළසුම් කර ඇති බැවි, සංගීත ක්ෂේත්‍රයට අනුයුක්ත සියලුම ශිල්පීන්ගේ සහ ආයතනයන්ගේ (ගායක-ගායිකා, ගීත රචක, සංගීත අධ්‍යක්ෂවරුන්, වාද්‍ය ශිල්පීන්, සංගීත කණ්ඩායම් , ශබ්දාගාර, සංගීත භාණ්ඩ අලෙවිසැල්, සංගීත පුහුණු ආයතන ඇතුළු) දුරකථන අංකයන් එළැඹෙන අප්‍රියෙල් 30 වන දිනට පෙර පහත සඳහන් අංකයන්ට වට්ස්ඇප් මගින් , කෙටි පණිවුඩ මගින් හෝ විද්‍යුත් ලිපිනයට, සාමාන්‍ය තැපැල් මඟින් ලැබීමට සලස්වන්න. තම තොරතුරු එවීමේදී තමන් නියෝජනය කරන අංශය ද සඳහන් කරන්න. දැනට මෙම නාමාවලියේ නම සඳහන්ව ඇති, දුරකථන අංක වෙනස්ව ඇති අය ද තමන්ගේ නවතම අංකය අපවෙත යොමු කරන්න. වට්ස්ඇප් සහ කෙටි පණිවුඩ සඳහා 0770212043 / 071 8954214. විද්‍යුත් ලිපිනය antonjocic@gmail.com තැපැල් මඟින් සොනික් දුරකථන නාමාවලිය, අංක 52/8/ඩී, මඩපාත පාර, කොළමුන්න, පිළියන්දල.

## ප්‍රවීණ නිවේදක ප්‍රියන්තට සම්මානයක්



නිවේදන ක්ෂේත්‍රයේ දශක තුනකට ආසන්න කාලයක් පුරා තම ගැඹුරු හඬින් ආමන්ත්‍රණය කළ ප්‍රවීණ නිවේදක ප්‍රියන්ත විජේසිංහ පසුගියදා කලාකීර්ති සම්මානයෙන් පිදුම් ලැබීය. වත්මනෙහි 'සිරස' මාධ්‍ය ආයතනයෙහි සේවය කරන ඔහුට, ප්‍රසංග වේදිකාවේ ප්‍රාසාංගික නිවේදකයකු වශයෙන් ද, ගුවන්විදුලි රූපවාහිනී නිවේදකයකු ලෙස සහ විවිධ සමාජීය සහ කලා මාධ්‍යයට කළ මෙහෙවර උදෙසා මෙම ගෞරව සම්මානයෙන් පිදුම් ලැබීමට හේතු විය. මානව හිමිකම් මාධ්‍ය ඒකකය වෙතින් මෙම සම්මානය ඔහුට පිරිනමනු ලැබුණි.

**- දර්ශ**



මන්ත්‍රී පුටුව කඩාගෙන බිමට වැටිලා
පිටුව 16



ආනවිලුන්දාව ලස්සන කරන රොබෙරෝසියා
පිටුව 16



ගම් රැසකට අලි තර්ජන
පිටුව 17

සම්පත් ප්‍රියනන්දන - බලන්ගොඩ විශේෂ



# බලන්ගොඩ හාගල රක්ෂිතයේ අතරමං වී සිටි හතරක් බේරා ගනී

බලන්ගොඩ ඉඹුල්පේ හාගල රක්ෂිතය තරණය කිරීම සඳහා ගොස් එහි අතරමං වී සිටි තරුණයන් දෙදෙනකු සහ තරුණියන් දෙදෙනකු පෙරේදා (28) රාත්‍රියේ බේරා ගත් බව පොලීසිය පැවසීය.

කැලණිය ප්‍රදේශයේ පදිංචි තරුණයන් දෙදෙනකු සහ තරුණික හා ගනේමුල්ල ප්‍රදේශයේ පදිංචි තරුණියක මෙලෙස බේරා ගෙන ගත් බව පොලීසිය පවසයි. වයස අවුරුදු විසි පහ සහ විසි අට අතර වයස්වල පසුවන හතර දෙනෙකු මෙලෙස බේරා ගෙන තිබේ. ඔවුන් ඉකුත්දා (27) දහවල් හාගල රක්ෂිතයේ සංචාරය කිරීම සඳහා ඉඹුල්පේ ලදුයාය ප්‍රදේශයෙන් හාගල රක්ෂිතට නැඟ ඇත. එහි අට්ටාලයක් ඉදිකර එදින එහි කාලය ගත කර ඇති අතර පෙරේදා (28) නැවත පිටව යෑම සඳහා හාගල රක්ෂිතයේ පස්සරමුල්ල දෙනගම දෙසට පැමිණ ඇති අතර පස්වරුවේ පැවැති අධික වර්ෂාවත් සමඟ පැවැති මිහිදුම් තත්ත්වය නිසාවෙන් ඔවුන්ට මාර්ගය සොයා ගැනීමට නොහැකි වී අතරමං වී ඇති පොලීසිය කියයි. පසු ඔවුන් විසින් 119 පොලිස් හදිසි දුරකතය අංකයට දැනුම් දීමක් කර තිබෙන අතර බලන්ගොඩ පොලීසියේ නිලධාරීන් සහ ඉඹුල්පේ ලදුයාය ප්‍රදේශයේ පදිංචි තරුණ තරුණියන් එක්ව පෙරේදා (28) රාත්‍රියේ විශාල පරිශ්‍රමයක් යොදා ඔවුන් බේරා ගෙන තිබේ.

බලන්ගොඩ පොලීසියේ වැඩබලන ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඒ.එම්. මයුරසිංහ මහතාගේ උපදෙස් පරිදි කුමාරසිංහ (47524), දයාවංශ (38064), ගාමිණී රියැදුරු (459) යන නිලධාරීහු විසින් එම මෙහෙයුම සිදු කළහ.

සීගිරිය විශේෂ

# පුතා තාත්තාට පහරදී අතපය කපලා

හතරවැනි වතාවටත් තම පියාට පහර දී අත් පා සහ පිරිමි ඇඟ කපා තුවාල කළ පාපතර පුතකු සොයා ගලේවල පොලිසිය විශේෂ සෝදිසි මෙහෙයුමක් ආරම්භ කර තිබේ.

ගලේවෙල පොලිස් බල ප්‍රදේශයට අයත් දේවහුව ප්‍රදේශයේ පදිංචි දෙදරු පියකු වූ ජනක හෙට්ටිආරච්චි (52) මහතාට මීට දින 5කට ඉහතදී සිය පුතා විසින් පිහියකින් අතපය කපා රහස් ප්‍රදේශයටද බරපතළ හානි සිදු කොට ඇතැයි පොලිසියට පැමිණිලි කොට තිබේ.

සිය පුත්‍රයාගෙන් පහරකෑමට ලක්ව තුවාල ලැබූ පියා මේ වන විට දඹුල්ල මූලික රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටී. සුදු පුතා නමින් ප්‍රදේශයේ පුරා ප්‍රසිද්ධ මේ පහර දුන් පුත්‍රයා විසිඅට හැවිරිදි එක්දරු පියකු බව පොලිසිය ප්‍රකාශ කළේය. මීට පෙර අවස්ථා හතරකදී මේ පුතා පියාට දැඩි ලෙස පහරදී තිබෙනා බවත් මොහු තම ගැබිනි බිරියට ද මෙයාකාරයෙන් අත්වලට තියුණු ආයුධවලින් කපා හිරිහැර කර ඇතැයි ප්‍රදේශවාසීහු පොලිසියට පවසා තිබුණිහ.

පියාට පහර සුදු පුතා නමැති තරුණයා සොයා ගලේවෙල පොලිසිය විශේෂ පොලිස් කණ්ඩායම් කිහිපයක් එම ප්‍රදේශයට පිටත්කර යවා තිබෙනා බවද ඔහු ප්‍රදේශයෙන් පලා ගොස් තැනින් තැන රැඳී සිටිනා බවට තොරතුරු වාර්තා වී ඇති බවද පොලිසිය ප්‍රකාශ කළේය.

ඒ. පී. දයාචන්ද්‍ර - ඌරුබොක්ක විශේෂ

# හක්කපටස් ළඟ තබා ගත්තාට 10,000ක් දඩ

බලපත්‍ර නැතිව හක්කපටස් ළඟ තබාගෙන සිටි පුද්ගලයකු ඌරුබොක්ක පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන මොරවක මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව වැරදිකරු බවට පිළිගත් සැකකරුට මොරවක මහෙස්ත්‍රාත් අතිරේක දිසා විනිසුරු ශෂිකා මිතුන ආරච්චිගේ මෙණෙවිය විසින් රුපියල් දසදහසක මුදලක් දඩ වශයෙන් ගෙවනා ලෙසට නියෝග කර තිබේ. මෙසේ දඩ මුදල් ගෙවීමට නියම වූයේ බෙරලපනාතර, කැටවලගම විතාරණගේ අසේල සම්පත් නමැත්තකුටය.

පැමිණිල්ල වෙනුවෙන් ඌරුබොක්ක පොලිස් ස්ථානාධිපති ප්‍ර.පො.ප. සමරවික්‍රම මහතාගේ උපදෙස් අනුව පො.සැ. (56012) ජේමරත්න මහතා අධිකරණයට කරුණු දක්වා සිටියේය.

ප්‍රසන්න පත්මසිරි - ඌව පළාත් සමූහ



# සිව් නිවුන් දරුවන් හදා ගන්න දෙන්න ඔබෙන් උපකාර

"පසුගිය මාසයේදී දරුවන් සිව්දෙනා කොළඹ කාසල් වීදියේ කාන්තා රෝහලේදී උපත ලැබුවා. දරුවන් සිව්දෙනා ඉතාම නිරෝගිමත්ව සිටිනවා. එම රෝහලේ ප්‍රසව හා නාරිවේද වෛද්‍ය ටී. කඩොම්ගජන් මහතාට ස්තූති කළ යුතුයි. මගේ ලොකු දුවගේ වයස අවුරුදු හතරහමාරයි. දරුවන් සිව්දෙනකු එකපාරම ලැබෙයි කියලා මම හිතුවේ නෑ. නමුත් පසුව පසුව තමයි වෛද්‍ය සායනවලදී දැනගත්තේ. එතකොට ගොඩාක් සතුටු හිතුණා. දරුවන් බලා ගන්නත් අම්මලා නංගිලා ඇතුළු පවුලේ අය උදව් කරනවා. මට මාස තුනේ ප්‍රසූත නිවාඩුව නම් මදිවෙනවා. ඒකටනම් විසඳුමක් අවශ්‍ය" යැයි සිව් දරු මවක් පවසන්නීය.

බිබිල මැතිවරණ කොට්ඨාසයට අයත් මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පුවක්ගොඩ ගම්මානයේ එක්දරු මවකට සිව් දරු උපතක් සිදුව තිබේ. කොළඹ කාසල් වීදියේ කාන්තා රෝහලේදී මාස එකහමාරකට පමණ පෙර බිහිවූ දරුවන් සිව්දෙනා පසුගියදා මඩුල්ලේ තම නිවෙසට ගෙනආ බව ඇය පැවසීය.

නීරෝගී සුවයෙන් පසුවෙනා පිරිමි දරුවන් දෙදෙනකු හා ගැහැනු දරුවන් දෙදෙනකු ද ඇයට සිටී. දරුවන් සිව්දෙනාට එන්. ටී. මනාරා සදිසි, එන්. ටී. යසාරා විදැසි, එන්. ටී. යසිතු රසිර, එන්. ටී. ලසිතු මහිර යනුවෙන් නම් තබා ඇත. දරුවන්ගේ මව ඒ. එම්. බී. දේවිකා ප්‍රියදර්ශනී 35 වියේ පසුවන්නීය. ඇය මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරිනියක ලෙස සේවය කරන අතර දරුවන්ගේ පියා මඩුල්ල ප්‍රාථමික විදුහලේ ගුරුවරයකු වන තිස්පස් වැනි වියේ පසුවන එන්. ටී. අමිල ඉන්දික සෙනරත්ය.

මව්පියන් දෙපළට දාව උපන් අවුරුදු හතරහමාරක් වයසැති එන්. ටී. කලාරා තිදුසි දියණිය පෙරපාසල් යන වයසේ පසුවෙති. සිව්නිවුන් දරුවන්ගේ මව්පියන් දෙපළ රජයේ රැකියාවක නිරතව සිටියත් දරුවන් පස්දෙනකු රැකබලා ගැනීමට අඟහිඟකම් ගැන නොකීවාට එය නැතුවාම නොවේ. දරුවන්ට ලබා දෙන කිරිපිට මිලත් අධිකය. එම දරුවන්ගේ ඉදිරි කටයුතු සඳහා උපකාර කිරීමට කැමැත්ත දක්වන්නේ නම් එම යුවලට 071-992885/070-1700123 යන දුරකතන අංකයට කතා කර උපකාරයක් කිරීමට හැකිය.

එස්. ජී. විජේරත්න - කටුගස්තොට සමූහ

# හෙරොයින් එක්ක 4ක් මාට්ටු

කටුගස්තොට පොලිසියේ දූෂණ මර්දන අංශය මඟින් වැරැල්ලගම ප්‍රදේශයේ පදිංචි පුද්ගලයන් සිව්දෙනකු හෙරොයින් සමඟ අත්අඩංගුවට ගෙන තිබේ. පසුගිය 24, 25 හා 26 යන තෙදින තුළ අත්අඩංගුවට ගෙන ඇති මේ සැකකරුවන් සන්තකයේ හෙරොයින් මිලිග්‍රෑම් 237ක් තිබුණු බව පොලිසිය ප්‍රකාශ කළේය.

මේ සැකකරුවන් සිව්දෙනාට අමතරව පසුගිය 26 හා 27 දිනවල කටුගස්තොට දුම්රියපොළ අසලදී හා යටිවාවල ප්‍රදේශයේදී කේරළ ගංජා ග්‍රෑම් 14යි මිලිග්‍රෑම් 780ක් සමඟ පුද්ගලයන් දෙදෙනකුද අත්අඩංගුවට ගෙන තිබේ.

සැකකරුවන් අධිකරණය හමුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඇප මත මුදාහැර ඇත. කටුගස්තොට පොලිසියේ දූෂණ මර්දන අංශයේ ස්ථානාධිපති ප්‍ර.පො.ප. සේනාරත්න මහතා ඇතුළු නිලධාරීහු වැටලීමට එක්ව සිටියහ.

ප්‍රියදර්ශනී කහවල - ඉංගිරිය මධ්‍යම සමූහ

# ලක්ෂ 163ක සිගරැට් අවුරුද්දට විකුණන්න ගෙනත්



ළඟ එන උත්සව සමය ඉලක්ක කරගෙන නීති විරෝධී අන්දමින් ගෙන්වන ලද රුපියල් එක්කෝටි හැටතුන්ලක්ෂ විසිදහසක් වටිනා විදේශීය සිගරැට් තොගයක් අත්අඩංගුවට ගැනීමට මාළිගාවත්ත පොලිසිය සමත් වී තිබේ. පෙරේදා (28) පොලිසියට ලද තොරතුරක් මත සිදු කළ වැටලීමකදී මෙලෙස අත්අඩංගුවට පත්ව ඇත්තේ මාළිගාවත්ත නිවාස සංකීර්ණයේ තාවකාලික පදිංචිකරුවකු වන 32 හැවිරිදි පුද්ගලයෙකි.

මාළිගාවත්ත මිල්ටන් පෙරේරා මාවතෙහි සිදු කළ මාර්ග බාධක සෝදිසියකදී ත්‍රිරෝද රථයක් නවතා සිදු කළ පරීක්ෂාවකදී සැකකරු සම්බන්ධයෙන් ඇතිවූ සැකයක් මත ඔහුගේ නිවෙස පරීක්ෂා කිරීමේදී පොලිසියට මේ නීති විරෝධී සිගරැට් සොයා ගැනීමට හැකිව තිබේ.

මේ සිගරැට් තොගය සැකකරුට ලැබුණු ආකාරය සම්බන්ධයෙන් මාළිගාවත්ත පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක අයි. එම්. ඒ. උදය කුමාර, උප පොලිස් පරීක්ෂක පතිරණ, කොස්තාපල්වරුන් වන (89163) සේනාධීර, (20634) දීපාල්, (39758) ජයලත් සහ (64206) ප්‍රියන්ත ඇතුළු නිලධාරීහු තොරතුරු සොයා පරීක්ෂණ සිදු කරති.

පරාක්‍රම ගුණසේකර - සූරියවැව සමූහ

# වෙලේවත්ත ඇල්ලේ නාන්න ගිය සිසුන් දෙදෙනෙක් මරුට

කොලොන්න පොලිස් වසමට අයත් වෙලේවත්ත ඇල්ලේ දිය නෑමට ගිය 17 හැවිරිදි පාසල් සිසුන් දෙදෙනෙක් පෙරේදා (28) දියේ ගිලී මියගොස් ඇත. මෙසේ මියගොස් ඇත්තේ දඹෙමඩ ප්‍රදේශයේ පදිංචිව සිටි තරුස රුක්ෂාන් (17) සහ හල්වින්න ප්‍රදේශයේ පදිංචිව සිටි රසික මිහිරංග (17) නමැති මිතුරන් දෙදෙනෙකි. මොවුන් පසුගියදා (28) සවස තවත් මිතුරන් කිහිපදෙනකු සමඟ දිය නෑමට වෙලේවත්ත දිය ඇල්ලට ගොස් තිබේ. එහිදී මේ දෙදෙනා දියේ ගිලී මියගොස් ඇත. මියගිය සිසුන් දෙදෙනාගේ මෘත දේහයන් කොලොන්න දිසා රෝහලේ තැන්පත් කර ඇති අතර කෙලොන්න පොලිසිය වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

විනිතා මානෙල් ගමගේ - හල්තොට සමූහ

# වරෙන්තු 9ක් තිබූ සැකකරුවෙක් අත්අඩංගුවට

වරෙන්තු නවයක් ඇති පුද්ගලයකු පසුගියදා (27) අත්අඩංගුවට ගත් බව හොරණ පොලිසිය ප්‍රකාශ කළේය. නීති විරෝධී මත්පැන් ජාවරමක් සම්බන්ධයෙන් මොහුට හොරණ අධිකරණය මඟින් මේ වරෙන්තු නිකුත් කර ඇති අතර වසර ගණනාවක් උසාවියට කට්ටි පනිමින් සිටි මේ පුද්ගලයාව හොරණ, මීමනපලාන ප්‍රදේශයේදී හොරණ මූලස්ථාන පොලිසියේ අපරාධ අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක විපුල අබේසිරි හා සැරයන් (35477) ලලිත් යන නිලධාරීන් විසින් සිදු කළ මෙහෙයුමකදී අත් අඩංගුවට ගැනීමට හැකි වී තිබේ.

ඩබ්. ඒ. පියතිලක - මැදිරිගිරිය සමූහ



# වේවැල් භාණ්ඩත් එක්ක ලොරිය ගෙදරකට ගිහින්

පොලොන්නරුව මින්නේරිය ප්‍රධාන මාර්ගයේ මින්නේරිය පොලිසිය අසන්නයේදී පසුගියදා (27) මාර්ගයේ ගමන්ගත් කුඩා ලොරි රථයක් මාර්ගයෙන් ඉවතට ගොස් අසල නිවෙසකට පෙරළී යෑමෙන් එහි රියැදුරා ඇතුළු සහායකයා සුළු තුවාල ලබා ඇති බව මින්නේරිය පොලිසිය ප්‍රකාශ කළේය.

මේ කුඩා ලොරි රථය මඩකලපුවේ සිට කොළඹට වේවැල් භාණ්ඩ රැගෙන යන අවස්ථාවේ රියැදුරුට වේගය පාලනය කර ගැනීමට නොහැකි වීමෙන් මාර්ගයෙන් ඉවතට පෙරළී ගොස් අසල තිබූ නිවෙසක ගැටී තිබේ. අනතුරෙන් එම නිවෙසේ කිසිවකුට හානියක් සිදුව නැති අතර නිවෙසට සුළු හානි සිදුව තිබේ. ලොරි රථයේ සිටි රියැදුරු සහ සහායක සුළු තුවාල ලබා ලොරි රථයට බරපතළ හානි සිදුව ඇත. අපරීක්ෂාකාරී ලෙස රිය ධාවනය සම්බන්ධයෙන් රියැදුරා මින්නේරිය පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන හිඟුරක්ගොඩ අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි. වැඩිදුර පරීක්ෂණ මින්නේරිය පොලිස් නිලධාරීහු සිදු කරති.

ලුණම සමූහ සනත් ගමගේ

# සප්තාසන කවි බණක් මැදින් පෝදා ලුණම විහාරස්ථානයේ

සප්තාසන කවි බණක් ලුණම විහාරස්ථානයේ දි මැදින් පුර පසොළොස්වක පෝයදා පැවැත්විණි. හම්බන්තොට නාගරවැව බුදුරජ වෙහෙර පිරිවෙනේ වැඩ සිටින ස්වාමීන් වහන්සේ හත් නමක් කවි බණ දෙසුමට වැඩම කළ සිටියහ. ලුණම අපි එකට මිතුරු සංසදය මගින් සප්තාසන කවිබණ දෙසුම සංවිධාන කර තිබිණි. ලුණම විහාරාධිපති ආචාර්ය මහගල්වැව සෝරත හිමියන්ගේ අනුශාසනා පරිදි මේ පින්කම පැවැත්විණි.



ගලහ සමූහ සී. කේ. වික්‍රම

## කැරියර් රථයේ රැහැන් පැටලී දුරකථන කණු 7ක් බිම



තලාතුඔය මාරස්සන මාර්ගයේ මුදුනකඩේ ප්‍රදේශයේ දී මාර්ග කාපට් කිරීමට යොදාගන්නා පී.ටී.ආර්. රෝල් යන්ත්‍රයක් පටවාගෙන ගිය කැරියර් රථයක් මාර්ගයේ දෙපස ඇති දුරකතන රැහැන්වල පැටලීමෙන් දුරකථන කණු හතක් (7) මාර්ගයට කඩා වැටීමෙන් එම මාර්ගයේ වාහන ගමනාගමනය පැය ගණනාවකට සම්පූර්ණයෙන් ම ඇනහිටීමට ලක්විය. මෙම කණු කඩාවැටීම නිසා අසල වූ නිවසක වහලකට ද අලාභහානි සිදුවී ඇත. මේ හේතුවෙන් මෙම මාර්ගයේ ගමන් ගන්නා වාහන රිය මඟින් දැඩි අපහසුතාවකට ලක්විය. මෙම රථය මහනුවර ප්‍රදේශයේ ඉදිකිරීම් ආයතනයකට අයත්වන අතර එහි රියදුරු ලෙස සේවය කළ ගොකරැල්ල ප්‍රදේශයේ පදිංචි පුද්ගලයකු අත්අඩංගුවට ගෙන ඇත. තලාතුඔය පොලිස් පරීක්ෂක කෝකිල ආරියදාස මහතාගේ උපදෙස් පරිදි පොලිස් නිලධාරී කණ්ඩායමක් පරීක්ෂණ පවත්වනු ලැබේ.

වැල්ලවාය විශේෂ ජී අයි ආර් ගරුසිංහ

# බාර් එකට විරුද්ධව කතා කරමින් සිටි මන්ත්‍රී පුටුව කඩාගෙන බිමට වැටෙයි



වැල්ලවාය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ඇතිලිවැව සතොසේ ආරම්භ කිරිමට සුදානම් වන මත්පැන් හල සම්බන්ධයෙන් හා කුඩාඔය ප්‍රදේශයේ විවෘත කළ මත්පැන් හලට විරුද්ධව කටයුතු කළේ නැතැයි පවසමින් වැල්ලවාය ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැලුම් ප්‍රදීප් (එක්සත් ජාතික පක්ෂය) මහතා අදහස් ඉදිරිපත් කිරිමත් සමග සභාවේ උණුසුම් තත්ත්වයක් ඇතිවු අතර ඔහු වාඩිවී සිටි අසුනට නැගි ඉදිරියෙන් වු මේසයට නැගීමට යාමේදි එය කඩාගෙන ඇද වැටුණි.

වැල්ලවාය ප්‍රාදේශීය සභා රැස්විම සභාපති ආර් ඩි හරමානිස් මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති අතර එහිදි වැඩිදුරටත් අදහස් දක්වමින් මන්ත්‍රිවරයා මෙසේ ද කියා සිටියේය.

නව තැබෑරුම්වලට විරෝධය ප්‍රකාශ කරලා මම ගෙනාපු යෝජනාවට ඡන්ද විමසිමක් කරන්න අවස්ථාවක් ලබාදෙන්න. ඡන්දයක් ඉල්ලනවා ඒ අවස්ථාව ලබාදෙන්න වැල්ලවාය කුඩාඔය ප්‍රදේශයේ තැබෑරමක් දානකොට එදා සභාපතිවරයා විදිහටත් සභානායකවරයත් කුඩාඔය තැබෑරුම නවත්වනවා කිව්වා විරෝධතාවය තියෙන තැනට ඇවිල්ලා පැහැදිලිව ප්‍රකාශ කළා. කවුද පක්ෂ අපි විරුද්ධයි. අම්මලා තාත්තතා අඩනවා. මේ අහිංසක මිනිස්සුන්ගේ ජීවිත බිලිගන්නේ. අපි සම්පුර්ණයෙන්ම එදත් විරුද්ධයි. අදත් විරුද්ධයි. තැබෑරුම්වලින් සල්ලි අපිට ඕනේ නෑ ඒවට විරුද්ධවෙන්න. සභාපතිතුමා සල්ලි ගත්ත ද ජනතාව චෝදනා කරනවා. මුනිවත රකින්නේ ඒකටයි කියලා.



පුත්තලම - හලාවත පාරේ ආරච්චිකට්ටුව ආනවිලුන්දාව ප්‍රදේශයේ පාර අද්දර රොබෙරොසියා ගස්වල මේ දිනවල කාගෙත් සිත් ගන්නා අයුරින් දර්ශනිය ලෙස මල් පිපී ඇති අයුරුයි මේ.

ජායාරූපය - පුත්තලම සමූහ

ඇඹිලිපිටිය සමූහ සේන වී. ගමගේ

## වසර 67කින් සංවර්ධනයක් නැහැ චන්ද්‍රිකා ජලාශයේ රොන් මඩ පිරිලා

සබරගමු පළාතේ ආරම්භක ජලාශය ලෙස සැලකෙන චන්ද්‍රිකා මහා ජලාශය මේ වන විට රොන් මඩ පිරීමෙන් ගොවිතැන සඳහා අවශ්‍ය ජල ප්‍රමාණය අවම වී ඇතැයි ගොවියෝ කියා සිටිති. වලවේ ගඟ සංවර්ධන ක්‍රමය යටතේ ප්‍රථම පියවර ලෙස හුලංදා ඔය හරස් කර 1952 දී එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා විසින් මුල්ගල තබා ඉදිකර ඇත. ඉන් පසුව මේ වන තුරුත් චන්ද්‍රිකා ජලාශයේ මඩ ඉවත්කොට නොමැත. වැව ආශ්‍රිත වනය කපා හේන් ගොවිතැන් කිරීම හා අනවසර පදිංචිකරුවන්ගේ ක්‍රියාකලාපයන් හේතුවෙන් වැසි කලට ගොඩබිම සෝදාවිත් ජලාශයේ රොන් මඩ පිරී ඇත. මෙම ක්‍රියා කලාපයන් තුළින් පෙර ගොවිතැන සඳහා ලබා දුන් ජලය විශාල ප්‍රමාණයකින් අඩු වීම ඇති බැවින් ජනපද අවසානයේ කුඹුරු ඉඩම්වලට ජලය නිසි ලෙස ලබා ගැනීමට නොහැකි වී ඇති බවද ගොවීහු පෙන්වා දෙති. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සංකල්පයකට අනුව ගොවි ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කර එමගින් රට ස්වයංපෝෂිත කිරීමේ අරමුණින් මහා පරිමාණ හා කුඩා පරිමාණ වැව් පිළිසකර කිරීවේ "වැව හදා රට හදන වාරි සෞභාග්‍යා වැඩ සටහන් තුළින් මෙම චන්ද්‍රිකා ජලාශය ද ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස ගොවි ජනතාව ඉල්ලා සිටිති.

ඇලහැර සරත් වෙලගෙදර

## ඇලහැර දිළිඳු පවුල් 300ක නිවාසවලට නොමිලේ විදුලිය



ඇලහැර ප්‍රදේශයේ වසර 40ක පමණ කාලයක් කුප්පි ලාම්පුවෙන් අඳුර මකාගත් දිළිඳු පවුල් 300ක නිවාසවලට නොමිලේ විදුලි පහසුකම් ලබාදීමට පොලොන්නරුව දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී හා පොලොන්නරුව දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ සභාපති අමර කිර්ති අතුකෝරල මහතා පියවර ගෙන ඇත.

විදුලි පහසුකම් ලබාදෙන නිවාසවල වයරින් කිරීමට අවශ්‍ය මුදල් සමෘධි අරමුදලින් සහන ණය පහසුකම් යටතේ ලබාදීමට නියමිතය.

විදුලි පහසුකම් නොමැති නිවාසවලට කිසිදු අයකිරීමකින් තොරව විදුලි පහසුකම් ලබාදීමේ සංකල්පය යටතේ දිවයිනේ සැම දිළිඳු පවුල්වලට නිවාසවලට විදුලි පහසුකම් ලබාදීමේ වැඩසටහන යටතේ දිළිඳු පවුල්වලට විදුලි පහසුකම් ලබා දෙන බව පොලොන්නරුව දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අමර කිර්ති අතුකෝරල මහතා පැවසීය.

දිළිඳු පවුල්වලට විදුලි පහසුකම් ලබාදීම සඳහා දැනුවත් කිරීමේ වැඩමුළුවක් ඇලහැර ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාර රැස්වීම් ශාලාවේදී පැවැත්විණි.

සූරියවැව විශේෂ නුවන් ජයසේකර

# තංගල්ලේ ලොකු ම හෙරොයින් තොගය කතරගම දී අත්අඩංගුවට



තංගල්ල පොලිස් කොට්ඨාස තුළින් අත්අඩංගුවට පත් වැඩිම හෙරොයින් මත් කුඩු තොගය කතරගම ගම්උදාව ප්‍රදේශයේදී අත්අඩංගුවට ගැනිමට තංගල්ල කොට්ඨාශ දුෂණ මර්දන ඒකකයේ නිලධාරින් 27 දින රාත්‍රි සමත් වි තිබේ.

මෙලෙස අත්අඩංගුවට පත්ව ඇති හෙරොයින් මත් කුඩු ප්‍රමාණය වන්නේ ග්‍රෑම් 152කි. හෙරොයින් මත් කුඩු සමඟ කතරගම 04 කණුව ප්‍රදේශයේ පදිංචි 28 හැවිරිදි ත්‍රිරෝද රථ රියදුරෙකු ද අත්අඩංගුවට ගෙන තිබේ.

තංගල්ල කොට්ඨාස බාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී රවින්ද්‍ර අබේපිටිය මහතාට ලද පුද්ගලික තොරතුරකට අනුව මෙම වැටලිම සිදුකර තිබේ. අත්අඩංගුවට පත් සැකකරුගේ නිවස පිටුපස මෙම හෙරොයින් තොගය වළ දමා තිබියදි සොයාගෙන තිබේ. සැකකරුගෙන් සිදුකළ ප්‍රශ්න කිරීමේදි අනාවරණය වි ඇත්තේ සැකකරු කලක් තිස්සේ ත්‍රි රෝද රථයෙන් කුලී ගමන් යන මුවාවෙන් මෙම හෙරොයින් ජාවාරම කරගෙන ගොස් ඇති බවත්, පානදුර ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකු විසින් මෙම ජාවාරම මෙහෙයවා ඇති බවත්ය. කතරගම හා අවට හෙරොයින් අවශ්‍ය පුද්ගලයන් පානදුර පදිංචි ප්‍රධාන ජාවාරම්කරුට ඊසි කැෂ් ක්‍රමයට මුදල් ගෙවු පසු ඔහු විසින් මෙම ත්‍රිරෝද රථ රියදුරාට අදාළ ගනුදෙනුව දැනුම් දීමට කටයුතු කරන අතර පසුව අත්අඩංගුවට පත් සැකකරු විසින් අදාළ ගැනුම්කරු වෙත හෙරොයින් මත්කුඩු රැගෙන ගොස් දීම සිදුකර තිබේ. සැකකරු වසය අවුරුදු 28ක ත්‍රිරෝද රථ රියදුරකු වන අතර ඔහු විවාහක දෙදරු පියෙකුද වෙයි. සැකකරු හෙරොයින් මත් කුඩු ග්‍රෑම් එකක් රුපියල් 13000ක මුදලකට අලෙවි කර ඇති අතර ඔහු සන්තකයේ තිබී අත්අඩංගුවට පත් හෙරොයින් මත් කුඩු වල වටිනාකම රුපියල් 1976000කි. මෙම ජාවාරමේ ප්‍රධාන සැකකරු සොයා පොලිස් පරික්ෂණ ආරම්භ කර ඇති අතර අත්අඩංගුවටපත් සැකකරු අධිකරණයට ඉදිරිපත් කිරීමට කතරගම පොලිසියට බාර දි තිබේ.

තංගල්ල කොට්ඨාස බාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී රවින්ද්‍ර අබේපිටිය, තංගල්ල කොට්ඨාස දූෂණ මර්දන ඒකකයේ ස්ථානාධිපති හිශාන්ත ලාල් යන මහත්වරුන්ගේ උපදෙස් මත වැටලීම සිදුකර තිබේ.

දිනමිණ දිසත දස අත ම එක තැන

ත්‍රිකුණාමලය විශේෂ

## කිඹුලකු ඩැහැගෙන ගිය සිසුවාගේ සිරුර සොයා ගනී

ත්‍රිකුණාමලය සාම්පුර් ඉත්ති කුලම් වැවේ දිය නාමින් සිටි පාසල් සිසුන් තිදෙනෙකු අතරින් කිඹුලකු ඩැහැගෙන ගිය පාසල් සිසුවාගේ මළ සිරුර පෙරේදා සොයාගත් බව සාම්පුර් පොලිසිය කියයි.

මෙලෙස මිය ගියේ සාම්පුර් පල්ලිකුඩු ඉරිප්පු පදිංචි පල්ලිකුඩු ඉරිප්පු කලෙහිමහල් හින්දු විද්‍යාලයේ 10 වසරේ ඉගෙනු ලබන කෝණලිංගම් දේනුජන් (15) නැමැති සිසුවාය. කිඹුලා මෙම සිසුවා ඩැහැගෙන යෑමෙන් පසුව නාවික හමුදාව පොලිසිය හා ප්‍රදේශවාසින් වැව පීරා සිසුවා සොයද්දි දිනකට පසුව මළ සිරුර සොයාගෙන තිබේ. කිඹුලාගේ දත් පහරවල් නිසා සීරීම් තුවාල සහිත මළ සිරුර පරික්ෂා කළ මුතූර් හදිසි මරණ පරික්ෂක ඒ.ජේ.ඒ.නුහුරුල්ලා මහතා කිඹුලා සිසුවා ඩැහැගෙන යන අයුරු සාක්ෂි තිදෙනෙකුගේ සටහන් කරගැනිමෙන් පසු පශ්චාත් මරණ පරික්ෂණය සිදු නොකර මළ සිරුර ඥාතින්ට භාරදිමට නියෝග කළේය.

සාම්පුර් පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරික්ෂක බුද්ධික රාජපක්ෂ මහතාගේ මෙහෙයවිම යටතේ පරික්ෂණ කටයුතු සිදු විය.

සීගිරිය විශේෂ

## විසි දරු පියා අවසන් ගමනේ



දරුවන් විසි දෙනෙකු ලොවට දායාද කළ පියාගේ අවසන් කටයුතු පුන් පොහෝ දින ගලේවෙල කටුපොත ප්‍රදේශයේ දී සිදුකෙරිණි. මෙරට වැඩිම දරුවන් පිරිසක් ජනිත කළ එනම් දරුවන් 20 දෙනෙකු ජනිත කළ මව හා පියා ගලේවෙල කටුපොත ප්‍රදේශයේ පදිංචි සිටියහ. මෙසේ අවසන් ගමන් ගියේ ගොඩයලගේ ජිනදාස නම්වූ වයස අවුරුදු 89 කුත් මාස 11 ක් ජීවත් වූ විසි දරු පියායි.

ගලේවෙල කටුපොත ප්‍රදේශයේ පදිංචිව සිටි ජිනදාස මහතා ත් එච්. ඒ. රොසලින් නෝනා අවුරුදු 84ක මාතාව දරුවන් විසි දෙනෙකු මෙලොවට බිහි කොට පසුගිය කාලයේ මුළු සමාජයේම කතාබහකට ලක් වෙමින් ජාතියේ උදාර පියා ලෙසත් ජාතියේ උදාර මව ලෙසත් මෙම මාපිය යුවළ උපහාර ලැබූහ.

ජිනදාස පියාණන්ට දරුවන් 20 ට අමතරව තුන් මුණුබුරන් දැක මේ වන විට දරු මුණුබුරන් ගණන හාරසිය පනස් තුනක් බව ඔවුන්ගේ මුණුබුරු වූ පවසති.

තම පියාණන් සීයා මුත්තා ආදී නම්වලින් හඳුනන දරු මුනුබුරන් දිවයිනේ දිස්ත්‍රික්ක 25ම නියෝජනය කරමින් විසිරී සිටින බවද එම ඥාතීහු ද ආඩම්බරයෙන් යුතුව අප සමඟ පැවසූහ.

සුදත් පුබුදු කීර්ති - දෙල්ගොඩ සමුහ

## සපුගස්කන්ද විශාඛා සිසුවියන් කාලෙකට පසු පාසල් ඇවිත්



බස්නාහිර පළාතේ පාසල් යළි ආරම්භ වීමත් සමග ඊයේ (29) සපුගස්කන්ද විශාඛා බාලිකා විද්‍යාලයේ සිසුවියන් නියමිත සෞඛ්‍ය මාර්ග උපදේශ අනුගමනය කරමින් පාසලට පැමිණි අයුරු.

කරාපිටිය සමූහ - එස්. ලොකුකරවිට

## දංගෙදර ජයවර්ධන විද්‍යාලයේ ලේ දන්දීමේ වැඩසටහනක්



ගාල්ල දංගෙදර ජයවර්ධන විද්‍යාලයේ ශිෂ්‍ය නායක මණ්ඩලය විසින් සංවිධාන කරන ලද ලේ දන්දීමේ වැඩසටහනක් එම විද්‍යාලයේදී පසුගියදා (24) පැවැත්විණ.

වැඩසටහන සාර්ථකව පැවැත්වුණු බවත් එහිදී 80 දෙනකු පමණ රුධිරය පරිත්‍යාග කළ බවත් විදුහල්පති දිනේෂ් කුමාර හෙට්ටිආරච්චි මහතා පැවසීය. විදුහලේ ගුරුමණ්ඩලයේ පූර්ණ අධීක්ෂණය යටතේ වැඩසටහන සංවිධාන කර තිබිණි.

මස්කෙළිය සමූහ

## නුවරඑළිය දිස්ත්‍රික් ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ මහා සභා රැස්වීම

නුවරඑළිය දිස්ත්‍රික් ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ මහා සභා රැස්වීම අප්‍රේල් මස 3 වන දින පෙ.ව. 09.00 ට හැටන්, හයිලන්ඩ්ස් විද්‍යාලය අසල පිහිටි ශ්‍රී ක්‍රිෂ්ණභවාන් හෝටල් ශ්‍රවණාගාරයේ දී පැවැත්වෙයි.

ඉදිරි වසර සඳහා නව නිලධාරි මණ්ඩලය එදිනට තෝරා පත්කර ගැනීමට නියමිතය.

තිරප්පනේ සමූහ ඩී ජේ දිසානායක

# කිලෝමීටර් 18ක විදුලි වැට කැඩිලා

# වෙල්ලමුදාව - පුංචිකුලම - ඉඟිනියාගම ගම් රැසකට අලි තර්ජන



වනඅලින්ගෙන් රාත්‍රියට වගාව ආරක්ෂා කරගැනීමට භාවිතා කරන උඩ පැල



විදුලි වැටේ කණු අලි බිම දමා ඇති අයුරු පෙන්වන ජයසිංහ මහතා

තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වෙල්ලමුදාව ග්‍රාම නිලධාරී වසමේ වෙල්ලමුදාව, පුංචිකුලම, ඉඟිනියාගම ඇතුළු ඒ අවට තවත් ගම්මාන බොහොමයකට වන අලි තර්ජන උග්‍ර වී ඇතැයි ඔවුහු පවසති.

මෙම ගම්මාන වන අලින්ගෙන් ආරක්ෂා කිරීමට රජය මඟින් කිලෝමීටර් 18ක දුරකින් යුත් විදුලි වැටක් ඉදිකර ඇතත් මේ වන විට එම විදුලි වැට ද වන අලින් විසින් ම බිම දමා තිබේ.

මෙම ගම්වල අලින්ගෙන් බැටකන ගොවීන් වෙනුවෙන් කටහඬ අවදි කළ එන්. ජයසිංහ මහතා මෙසේ පැවසීය.

"අපේ ගම්මානවලට වල් අලි එන එක වළක්වන්න කෝටි ගාණක් වියදම් කරලා විදුලි වැටක් ගැහුවා. දිග කිලෝමීටර් දහ අටක් විතර දුරයි. නමුත් දැන් විදුලි වැටේ විදුලිය නෑ. වැටේ කණු බිමට පෙරළලා. කණුවට පය තියලා කදිමට පෙරළනවා. කම්බි රෝල් කරලා ගුලි කරලා දාලා. හවස පහ හය වෙද්දී අලි ගම් වදිනවා. පොල්, කොස්, අඹ කිසිම දෙයක් ගෙවත්තක තියා ගන්න බෑ."

"දවසක් මට උදේ දහයට විතර අලියා ගැහුවා. සතියක් රෝහලේ හිටියා. එලොව ගිහින් මෙලොව ආව වගේ. විදුලි වැට නඩත්තුවට සිවිල් ආරක්ෂක නිලධාරීන් දහ දොළොස් දෙනෙක් ඉන්නවා. එයාලට කරන්න දෙයකුත් නෑ. හදන හදන පාරට වැට අලි කඩනවා. අපේ එකම ඉල්ලීම පුළුවන් නම් මේ අලි රංචුව රක්ෂිත භූමියකට පන්නා දමන ලෙසයි."

ඉන්ද්‍රානි ශ්‍රී අත්තනායක මහත්මිය මෙසේ කීවා ය.

"අපේ දුක් මහන්සියෙන් වගා කරන හේන් පිටි පමණක් නෙමේ ගෙවල් දොරවලුත් අලින්ගෙන් ආරක්ෂා කරගන්න වෙලා තියෙන්නේ. කරන්න ම දෙයක් නෑ. දැන් ගමේ කාන්තාවොත් පැල් යනවා. එළිවෙනකම් ඇහැරලා ඉඳලා ඇවිත් පහුවදා වැඩත් කරනවා. එක දවසක් පැල් නොගියොත් එදාට අලි හේනේ.

වනජීවීයට කිව්වට වැඩකුත් නෑ. එන්නෙත් නෑ. අලි වෙඩි දෙන්නෙත් නෑ. අලි ගහලා පහුගිය අවුරුදු ටිකේම ගම් අවටම දහයකට එහා මැරිලා තියෙනවා. අලිත් පහ හයක්වත් මැරිලා ඇති. ඉතිං අපේ දුක බලන්න කවුරුත් ගමට එන්නේ නෑ.

මේ සම්බන්ධයෙන් වගකිව යුත්තන්ගේ කඩිනම් අවධානය යොමුකර වටිනා අලි, මිනිස් ජීවිත හා ගොවිපළ ආරක්ෂා කර දෙන මෙන් ගම්මු ඉල්ලා සිටිති.

---

එස්. දියගහගේ - දකුණු පළාත් සංචාරක

## ගාල්ල කොන්ගහ මිනීමැරුම් නඩුවේ විත්තිකරුවෝ නිදහස්

ගාල්ල කොන්ගහ මිනීමැරුම් නඩුව විභාග කළ දකුණු පළාත් බද ගාල්ල මහාධිකරණ විනිසුරු ඩබ්ලිව්.පී.එස්. නිස්සංක මහතා පැමිණිල්ල සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කිරීමට අපොහොසත් වීම නිසා විත්තිකරුවන් සිව් දෙනාම පසුගියදා (26)නිදොස් කොට නිදහස් කළේය.මෙසේ නිදොස් කොට නිදහස් කරනු ලැබුවේ මොහොමඩ් නිසාම් මොහොමඩ් රියාස්, මොහොමඩ් ජලාල්දින් මොහොමඩ් සුහාෂ්, මොහොමඩ් ස්මයිල් මොහොමඩ් මින්නාස්, නූර් මොහොමඩ් මොහොමඩ් අප්වාම් නමැති විත්තිකරුවෝ සිව් දෙනෙකි.ගාල්ල පොලිස් වසමේ කොන්ගහදී 2005 ජූලි 30 වැනි දින හෝ ඊට ආසන්න දිනයකදී නීති-විරෝධී රැස්වීමක සාමාජිකයන් වී පැමිණිල්ල නොදත් අන් අය සමඟ මොහොමඩ් බුහාරි, රිශ්මිල් හුසෙන් හෙවත් ළම්සා යන අයට පහරදී ඝාතනය කිරීම එම ක්‍රියා කලාපයේදීම මොහොමඩ් පාරුක් මොහොමඩ් ෆයිසාල් යන අයට තුවාල සිදු කිරීම ඇතුළු අධිචෝදනා පහක් යටතේ විත්තිකරුවන්ට එරෙහිව ගාල්ල මහාධිකරණයේ නඩු පවරා තිබිණි.මියගිය අය සහ විත්තිකරුවන් අතර පැවති ආරවුලක් දුර දිග යෑමෙන් මෙම ඝාතනය සිදුව ඇති බවද නඩු විභාගයේදී අනාවරණය විය.රජයේ අධි නීතිඥ රන්දිමා ප්‍රනාන්දු මහත්මිය පැමිණිල්ල මෙහෙයවන ලද අතර විත්තිකරුවන් වෙනුවෙන් නීතිඥ ඇපා අරුණ ශාන්ත මහතා පෙනී සිටියේය.

---

රෝහණ ආරියරත්න හම්බන්තොට විශේෂ

## දකුණු පළාත් නි. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය චමල් සංජීව

දකුණු පළාත් භාර නව නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා ලෙස වෛද්‍ය ජී. ජී. චමල් සංජීව මහතා පත්කොට ඇත.

තංගල්ල ප්‍රාථමික විද්‍යාලය, තංගල්ල රාහුල විද්‍යාලය, සහ වීරකැටිය රාජපක්ෂ විද්‍යාලයෙන් ප්‍රාථමික හා ද්විතීක අධ්‍යාපනය ලැබූ ඒ මහතා රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයෙන් 2003 වසරේ දී මූලික වෛද්‍ය උපාධිය ලැබීය.

කොළඹ විශ්වවිද්‍යාලයෙන් රෝහල් පරිපාලනයය, ව්‍යාපාර කළමනාකරණය සහ රාජ්‍ය පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය සම්පූර්ණ කර ඇතිදී ඒ මහතා මැලේසියානු ආසියානු සරසවියෙන් සෞඛ්‍ය ආර්ථික විද්‍යා ආචාර්ය උපාධිය නිබන්ධනය ද සම්පූර්ණ කොට ඇත

වෛද්‍ය ජී ජී චමල් සංජීව මහතා මීට පෙර හම්බන්තොට දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වරයා දෙසත් තංගල්ල තිස්සමහාරහම සහ වලස්මුල්ල මූලික රෝහල්වල



වෛද්‍ය අධිකාරිවරයා ලෙස සේවය කොට ඇත.

---



## අරණායක මහජන ආරක්ෂක කමිටු නියෝජිතයෙන් දැනුවත් කිරීමේ හමුවක්

අරණායක සහ හෙම්මාතගම පොලිස් බල ප්‍රදේශවල මහජන ආරක්ෂක කමිටු නියෝජිතයෙන් දැනුවත් කිරීමේ හමුවක් 29 දා පෙරවරුවේ කෑගල්ල දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති ප්‍රියන්ත චන්ද්‍රසිරි මහතාගේ ප්‍රධානත්වයෙන් අරණායක ලක්මිණි උත්සව ශාලාවේදි පැවැත්විණි. මෙම අවස්ථාවට ග්‍රාමසේවා නිලධාරීන් සහ මහජන ආරක්ෂක කමිටු නියෝජිතයෝ ද සහභාගි වූහ.

**අරණායක ප්‍රදීප් කුමාර**

---

නාඋල සමූහ

## පහන් කන්දට පැමිණ ජයග්‍රහණය කළ දූ දරුවෝ



නාඋල ප්‍රාදේශීය සංස්කෘතික බල මණ්ඩලය සහ පහන් කන්ද කලා හවුල එක්ව සංවිධාන කළ කලා හැකියාවන් සහිත දූ පුතුන් තොරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයෙන් දූ දරුවෝ රැසක් සුදුසුකම් ලැබූහ.නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ස්ථිර පදිංචි කලා හැකියාවන් ඇති අයවලුන්ගෙන් කැඳවනු ලැබූ අයදුම් පත්‍රවලට අනුව පසුගියදා (26)නාඋල - අරංගල සංස්කෘතික මධ්‍යස්ථානයේ දී සම්මුඛ පරීක්ෂණ පැවැත්විණි. සංගීතය, ගායනය, නර්ථනය මෙන්ම විවිධ කලා හැකියාවන් සම්බන්ධයෙන් ප්‍රවීණයන් රැසකගේ සහභාගීත්වයෙන් පැවති සම්මුඛ පරීක්ෂණයේ දී බොහෝ පිරිසක් සිය හැකියාවන් ඉදිරිපත් කළහ. තෝරා ගන්නා ලද පිරිස වෙත ජාතික තරුණ සේවා සභාව මගින් නුදුරේදීම නොමිලේ විශේෂ පුහුණු නාඋල දීම ආරම්භ කරන බවත් එහිදී දක්ෂතා දක්වන පිරිස් ඉදිරි දේශීය හා ජාත්‍යන්තර ප්‍රසංග සඳහා බඳවා ගන්නා බවත් මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය සංස්කෘතික නිලධාරි ඒකනායක බණ්ඩාර මහතා කියා සිටියේය.

---

දිනමිණ දිසත - දස අත ම එක තැන

---

පී.අයි.ආර්. ගරුසිංහ - වැල්ලවාය විශේෂ

## තෙල් බවුසරයක් පෙරළිලා



තණමල්විල පොලිස් බල ප්‍රදේශයට අයත් තණමල්විල වැලිඔය මාර්ගයේ කිවුල ප්‍රදේශයේදී ඉන්ධන ප්‍රවාහනය කරමින් තිබූ බවුසරයක් මාර්ගයෙන් ඉවතට පෙරළී යෑමෙන් තෙල් බවුසරයක් අනතුරට පත්ව තිබේ. පෙරේදා (28)අලුයම 1.30ට පමණ මෙම අනතුර සිදුවී ඇති අතර රියැදුරුට නින්දයෑම හේතුවෙන් මෙම අනතුර සිදුවී ඇතැයි තණමල්විල පොලීසිය සිදු කළ මූලික පරීක්ෂණවලදී අනාවරණය වී තිබේ. බවුසරය පෙරළී යෑමෙන් පසු කාන්දුවන ඉන්ධන ප්‍රදේශවාසීහු විසින් එකතු කරන අයුරු දක්නට ලැබුණු අතර සිද්ධිය සම්බන්ධයෙන් තණමල්විල පොලීසිය පරීක්ෂණ සිදු කරයි.

---

ඒ.ටී. කහඳුගොඩ - වීරකැටිය සමූහ

## විදේශීය රටක නිෂ්පාදිත ගිනි අවියක් ළඟ තබාගෙන සිටි අයකු අල්ලයි

විදේශීය රටක නිෂ්පාදිත බෝර දොළහේ ගිනි අවියක් සන්තකයේ තබා ගෙන සිටි අයකු දඹේතලාවේ දී අත්අඩංගුවට ගත් බව මිද්දෙණිය පොලීසිය පවසයි.අත්අඩංගුවට පත් හැටපස් හැවිරිදි සැකකරු වලස්මුල්ල මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට පොලීසිය විසින් කටයුතු යොදා තිබිණි. මිද්දෙණිය, පොලීසිය මේ සම්බන්ධයෙන් තවදුරටත් පරීක්ෂණ පවත්වයි.

---

කේ.ඒ. මෛත්‍රීපාල - දමන සමූහ

## කාන්තා දින වැඩසටහනක් හිඟුරාණ උත්තර ජයමහ විහාරස්ථානයේ

අම්පාර දිස්ත්‍රික්කයේ ඓතිහාසික හිඟුරාණ උත්තර ජයමහ විහාරස්ථානයේ ධර්ම ශාලා පරිශ්‍රයේදී මැදින් පුන් පොහෝදා විහාරාධිපති හිඟුරාණේ සිරිධම්ම නායක හිමියන්ගේ අවවාද අනුශාසනා මත විහාරස්ථ විශාඛා කුලගණ සමිතිය මගින් සංවිධානය කළ කාන්තා දින වැඩසටහනක් පැවැත්විණි.ඒ වෙනුවෙන් කාන්තාවන්ට නිසි ගෞරවයක් ලබා ගැනීම අරමුණ කර ගනිමින් අම්පාර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වනිතා සංවර්ධන නිලධාරිනී ඒ.එම්. දයානි මහත්මිය විසින් විශේෂ වැඩසටහනක් සිදු කෙරිණි. එහිදී ඇය විසින් රටකි, දැයකි, ලොවකි, යන්න තේමා කර ගත් කාන්තා දිනය පසුගියදා ඉතාමත් උත්කර්ෂවත් අන්දමින් සමරනු ලැබූ බවත් නමුත් එම සැමරීමේ උණුසුම යන්නට ප්‍රථම කාන්තාවන්ට සිදුවන අගතීන් පිළිබඳ වාර්තාකරණයන් සුලබව දැක ගැනීමට හැකි වූ බවත් ඇය පැවසීය. මෙම අවස්ථාවට හිඟුරාණ උත්තර ජයමහා විහාරාධිපති හිඟුරාණේ සිරිධම්ම නායක හිමි, ඓතිහාසික නිව්ගුණ පුරාණ රජමහ විහාරවාසී තෙරිපැහැ සුගතරතන හිමි, විශාඛා කුලගණ සමිතියේ සාමාජිකාවන් හා පෙහෙවත් සමාදම් වූ උපාසක උපාසිකාවෝ පිරිසක් සහභාගිවී සිටියහ.

---

ඇලහැර සරත් වෙලගෙදර

## අත්තනකඩවල සිවු දරු පියා වන අලියාට බිලි

ඇලහැර, අත්තනකඩවල ගම්මානයට පසුගියදා (26) අලුයම කඩා වැදුණු අලියකු ගම්වැසියකුට පහරදී මරා දමා තිබිණි. අලියකුගේ පහරදීමකින් මිය ගොස් ඇත්තේ අත්තනකඩවල ගම්මිනයේ පදිංචි රණසිංහ ආරච්චිලාගේ විජේසිරි පෙරේරා නමැති සිව්දරු පියකි.මේ දිනවල අත්තනකඩවල සරුබිම සෑගල ජයසිරිපුර යන ගම්මානවලට රංචු පිටින් කඩාවදින අලින් ගම්මානවල සැරිසරමින් එහි නිවාස කඩා දමා ගෙවතු වගාද විනාශ කරන බව ගම්වාසීහු කියති.ගම්මානවලට කඩාවදින අලින් ගම්වාසීන්ටද පහරදී මරා දැමීම නිසා ගම්වාසීහු බියට පත්වී සිටිති.සවස 7 වනවිට ගම්මානවලට අලින් කඩාවදින නිසා නිවාසවලින් එළියට පවා පැමිණීමට නොහැකිව ගම්වාසීන් අන්ත අසරණ තත්වයට පත්වී තිබේ.මේ අලි කරදරය පිළිබඳව අංගම් මැඩිල්ල වන ජීවී අඩවි ආරක්ෂක ඩී.එම්.ඒ.ඒම්. ජිනේෂ් මහතාගෙන් විමසූ විට පැවසුවේ වස්ගමුව හා ගිරිතලේ රක්ෂිත කැලෑවල සිටින අලින් රාත්‍රී කාලයේ ගම්මානවලට කඩාවදින බවයි. ගම්මානවලට කඩාවදින අලින් එලවා හැරියත් අලින් නිතර නිතර ගම්මානවලට කඩාවදින බවද කිය.

---

කේ. කෝට්ටගේ - වලස්මුල්ල

## පරිභෝජනයට නුසුදුසු ආහාර අලෙවි කළ පිරිසකට දඩ

විශේෂකෘම් සතුන් ගහන භාණ්ඩ අලෙවි කළ හොරේවෙල ප්‍රදේශයේ වෙළෙඳසල් හිමියකුට රුපියල් 3,000ක දඩයක්ද ප්‍රමිතියට අනුකූල නොවන යෝගට් බෙදා හැරි මුල්ගිරිගල ප්‍රදේශයේ නිෂ්පාදන ආයතනයකට රුපියල් 3,000ක දඩයක්ද ප්‍රමිතියෙන් තොර මී කිරි බෙදා හැරි යක්ගස්මුල්ල ප්‍රදේශයේ කිරි නිෂ්පාදකයකුට රුපියල් 3,000ක දඩ මුදලක්ද ප්‍රමිතියෙන් තොර යෝගට් බෙදා හරින ලද වරාපිටිය ප්‍රදේශයේ අයෙකුට රුපියල් 3,000 ක දඩයක්ද වලස්මුල්ල දිසා/ මහෙස්ත්‍රාත් සුරංග මුනසිංහ මහතා නියම කරන ලදී. වලස්මුල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි එච්.කේ.ඒ. කුමාරසිරි අතිරේක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි සමිත් බලපිටිය හේවා යන මහත්වරුන්ගේ උපදෙස් මත පරිපාල මහජන සෞඛ්‍ය එච්. ජී. කුලසිරි, කිරම ජී. කුලරත්න වලස්මුල්ල ඩබ්ලිව්.ආර්. සම්පත් කුමාර යන මහත්වරුන් විසින් වැටලීම් සිදු කොට අදාළ පුද්ගලයන්ට නඩු පවරා අධිකරණයට ඉදිරිපත් කරන ලදී.

---

එම්. කීර්තිරත්න - යටවත්ත සමූහ

## ඉළුක්කුඹුර ලග්ගල පාරේ අබලන් තැන් සංවර්ධනය කරයි





මාතලේ රත්තොට හරහා රිවස්ටන්, ඉළුක්කුඹුර ලග්ගල දක්වා දිවෙන B274 මාර්ගයේ රත්තොට නගරයේ සිට අබලන් වී ඇති කොටස කාපට් අතුරා සංවර්ධන කිරීමේ වැඩපිළිවෙළ ආරම්භ කිරීම පසුගියදා මාතලේ දිසා පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහණ දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියිදා සිදු කෙරුණි. මහාමාර්ග අමාත්‍යාංශයේ සහ ග්‍රාමීය මාර්ග සහ අවශේෂ යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් ඉදිකරන මෙම මාර්ගය සඳහා රුපියල් මිලියන හාරසිය අටක් (408)වියදම ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එම කොටස රත්තොට නගරයට නුදුරින් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන බවද මෙහිදී අදහස් දැක්වූ දිසානායක මහතා පැවසීය.මෙමගින් රත්තොට ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ ආර්ථික කටයුතුවලට මෙන්ම ප්‍රදේශයේ සංචාරක කටයුතු සඳහා ද ඉමහත් ප්‍රතිලාභ ගෙනදෙන බව බවද හෙතෙම පැවසීය.මෙම අවස්ථාවට රත්තොට ප්‍රාදේශීය සභාවේ සභාපති කුමාරසේන තෙන්නකොන්, හිටපු පළාත් සභා මන්ත්‍රී ටී.ඩී. ජයතිස්ස, හිටපු සභාපති/ප්‍රාදේශීය සභා මන්ත්‍රී අතුල වික්‍රමනායක, මන්ත්‍රී නිශාන්ත බණ්ඩාර යන මහත්වරු ඇතුළු මාර්ගය සංවර්ධන අධිකාරිය නියෝජනය කරමින් නිලධාරීහු පිරිසක් එක්ව සිටියහ.

# ජාතික ඉතිරිකිරීමේ බැංකුව

## මූල්‍ය ප්‍රකාශන

(SL)AAA

### 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

## ආදායම් ප්‍රකාශය - විගණනය කළ

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා | බැංකුව 2020 රු. '000 | බැංකුව 2019 රු. '000 | සමූහය 2020 රු. '000 | සමූහය 2019 රු. '000 |
|---|---|---|---|---|
| **මුළු ආදායම** | **127,547,060** | **121,929,059** | **130,039,494** | **125,810,171** |
| පොලී ආදායම | 122,512,049 | 118,729,784 | 124,608,182 | 120,351,774 |
| පොලී වියදම | (87,621,868) | (89,897,770) | (88,425,490) | (90,868,139) |
| **ශුද්ධ පොලී ආදායම** | **34,890,181** | **28,832,014** | **36,182,692** | **29,483,635** |
| ගාස්තු සහ කොමිස් ආදායම | 2,710,487 | 1,261,268 | 2,723,087 | 1,269,521 |
| ගාස්තු සහ කොමිස් වියදම | (154,486) | (131,954) | (160,556) | (136,838) |
| **ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම** | **2,556,001** | **1,129,314** | **2,562,531** | **1,132,683** |
| වෙළඳාම් කටයුතුවලින් ලද ශුද්ධ ලාභය / (අලාභය) | 1,273,676 | 1,491,610 | 1,745,329 | 1,963,229 |
| සාධාරණ අගයට නම් කළ මූල්‍ය වත්කම් / වගකීම් මත ශුද්ධ ලාභ / (අලාභ) | - | - | - | - |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම්වල හඳුනාගැනීම අත්හැරීමෙන් ලත් ශුද්ධ ලාභය / (අලාභය) | 241,284 | 22,021 | 241,284 | 22,021 |
| වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ) | 809,564 | 424,376 | 721,612 | 2,203,626 |
| **මුළු මෙහෙයුම් ආදායම** | **39,770,707** | **31,899,335** | **41,453,448** | **34,805,194** |
| හානිකරණ ගාස්තු | (4,873,768) | (565,536) | (4,932,840) | (590,700) |
| **ශුද්ධ මෙහෙයුම් ආදායම** | **34,896,939** | **31,333,799** | **36,520,608** | **34,214,494** |
| සේවක මණ්ඩල වියදම් | (9,966,786) | (10,157,926) | (10,152,485) | (10,217,978) |
| ක්ෂය වීම් සහ ක්‍රමක්ෂය වීම් | (1,240,503) | (1,042,933) | (1,256,826) | (1,048,095) |
| වෙනත් වියදම් | (4,258,307) | (4,474,053) | (4,313,367) | (4,461,457) |
| **එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු සහ ණය ආපසු ගෙවීමේ බදුවලට පෙර මෙහෙයුම් ලාභය / (අලාභය)** | **19,431,342** | **15,658,887** | **20,797,931** | **18,486,964** |
| මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු | (3,786,717) | (3,045,921) | (4,006,877) | (3,208,584) |
| මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බදු | - | (366,157) | - | (383,614) |
| මූල්‍ය සේවා මත ණය ආපසු ගෙවීමේ බදු | - | (1,785,171) | - | (1,803,225) |
| **එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු සහ ණය ආපසු ගෙවීමේ බදුවලට පසු මෙහෙයුම් ලාභය / (අලාභය)** | **15,644,625** | **10,461,638** | **16,791,054** | **13,091,541** |
| ආශ්‍රිත සමාගම් වල සහ බද්ධ ව්‍යාපාර වල ලාභයෙන් හිමි කොටස | - | - | - | - |
| **බදුවලට පෙර ලාභය / (අලාභය)** | **15,644,625** | **10,461,638** | **16,791,054** | **13,091,541** |
| ආදායම් බදු වියදම් | (5,536,709) | (4,080,468) | (5,969,936) | (4,378,631) |
| **වර්ෂයට අදාළ ලාභය / (අලාභය)** | **10,107,916** | **6,381,170** | **10,821,118** | **8,712,910** |
| **ලාභය බෙදී යන ආකාරය** | | | | |
| පාලක සමාගමේ හිමිකරුවන්ට | 10,107,916 | 6,381,170 | 10,821,118 | 8,712,910 |
| පාලනයට යටත් නොවන හිමිකම් | - | - | - | - |
| **සාමාන්‍ය කොටසකට ඉපයීම** | | | | |
| සාමාන්‍ය කොටසකට මූලික ඉපයීම - (රු.) | 10.75 | 6.79 | 11.51 | 9.27 |
| සාමාන්‍ය කොටසකට තනුක ඉපයීම - (රු.) | 10.75 | 6.79 | 11.51 | 9.27 |

## විස්තීර්ණ ආදායම් ප්‍රකාශය - විගණනය කළ

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා | බැංකුව 2020 රු.'000 | බැංකුව 2019 රු.'000 | සමූහය 2020 රු. '000 | සමූහය 2019 රු. '000 |
|---|---|---|---|---|
| **වර්ෂය සඳහා ලාභය (අලාභය)** | 10,107,916 | 6,381,170 | 10,821,118 | 8,712,910 |
| **ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කළ යුතු වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | |
| විදේශ ගනුදෙනු පරිවර්ථනය මත වූ විනිමය වෙනස්කම් | - | - | - | - |
| ඉදිරි රැකුම් මුදල් ප්‍රවාහ කටයුතු වලින් ලත් ශුද්ධ ලාභ (අලාභ) | - | - | - | - |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට පවතින ණය උපකරණ මත වූ ශුද්ධ ලාභ / (අලාභ) | - | - | - | - |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට පත් කළ ණය උපකරණ | 273,544 | 127,928 | 329,820 | 227,305 |
| ආදායම් ප්‍රකාශයට මාරු කරන ලද ණය උපකරණවල ආයෝජනයෙන් ලද ශුද්ධ ලාභ / (අලාභ) | (241,284) | (13,717) | (241,284) | (13,717) |
| ඉහත දක්වා ඇති අයිතමයේ විලම්බිත බදු බලපෑම | (9,033) | (31,979) | (9,033) | (31,979) |
| **ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කළ යුතු වෙනත් විස්තීර්ණ ආදායම් එකතුව** | **23,227** | **82,232** | **79,503** | **181,609** |
| **ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කළ යුතු නොවන වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට පවතින හිමිකම් උපකරණ වල ආයෝජනයන්හි සාධාරණ අගයේ වෙනස්වීම් | (776,162) | (324,635) | (774,791) | (320,297) |
| ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට පවතින මූල්‍ය වගකීම් මත බැංකුවේ ණය අවදනම ආරෝපණය කිරීමේ සාධාරණ වෙනස්වීම් | - | - | - | - |
| සේවාවසාන ප්‍රතිලාභ බැඳීම් නැවත ආගණනය | (6,684,417) | (3,454,283) | (6,681,422) | (3,455,660) |
| ඉහත දක්වා ඇති අයිතමයේ විලම්බිත බදු බලපෑම් | 1,871,637 | 967,199 | 1,871,637 | 967,199 |
| සේවාවසාන ප්‍රතිලාභ බැඳීම් නැවත ආගණනය (බදු පසු) | (4,812,780) | (2,487,084) | (4,809,785) | (2,488,461) |
| ප්‍රත්‍යාගණන අතිරික්තයේ වෙනස | 1,482,472 | - | 1,921,578 | - |
| ඉහත දක්වා ඇති අයිතමයේ විලම්බිත බදු බලපෑම | (415,092) | - | (415,092) | - |
| ප්‍රත්‍යාගණන අතිරික්තයේ වෙනස (බදු පසු) | 1,067,380 | - | 1,506,486 | - |
| ආශ්‍රිත සමාගම්වල සහ බද්ධ ව්‍යාපාරවල ලාභයෙන් හිමි කොටස | - | - | - | - |
| **ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කළ යුතු නොවන වෙනත් විස්තීර්ණ ආදායම් එකතුව** | (4,521,563) | (2,811,719) | (4,078,090) | (2,808,758) |
| **වර්ෂයට අදාළ වෙනත් විස්තීර්ණ ආදායම (බදු පසු)** | (4,498,336) | (2,729,487) | (3,998,586) | (2,627,149) |
| **වර්ෂයට අදාළ මුළු විස්තීර්ණ ආදායම** | **5,609,580** | **3,651,683** | **6,822,532** | **6,085,762** |
| **ලාභය බෙදී යන ආකාරය** | | | | |
| පාලක සමාගමේ හිමිකරුවන්ට | **5,609,580** | **3,651,683** | **6,822,532** | **6,085,762** |
| පාලනයට යටත් නොවන හිමිකම් | - | - | - | - |

## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය - විගණනය කළ

| | බැංකුව 31.12.2020 දිනට රු. '000 | බැංකුව 31. 12.2019 දිනට රු. '000 | සමූහය 31.12.2020 දිනට රු. '000 | සමූහය 31.12.2019 දිනට රු. '000 |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| මුදල් සහ මුදල් සමානයන් | 6,491,963 | 5,376,715 | 6,598,595 | 5,564,824 |
| මහ බැංකුව සමඟ ඇති ශේෂ | - | - | 6 | 58 |
| බැංකුවල ඇති තැන්පතු | 13,253,499 | 12,364,469 | 17,456,660 | 15,745,184 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 19,897 | 11,622 | 19,897 | 11,622 |
| ලාභ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම් | | | - | - |
| සාධාරණ අගයට ගණනය කළ | 11,221,746 | 11,459,882 | 23,617,944 | 22,130,273 |
| සාධාරණ අගයට නම් කළ | - | - | - | - |
| **ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම්** | | | | |
| ණය සහ අත්තිකාරම් | 516,795,160 | 454,394,957 | 517,833,067 | 456,636,285 |
| ණය සහ අතිකුත් උපකරණ | 754,233,344 | 615,634,321 | 758,594,934 | 619,567,786 |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් | 15,271,822 | 3,478,811 | 16,059,841 | 4,626,582 |
| පාලිත සමාගම්වල ආයෝජනය | 4,811,000 | 4,811,000 | - | - |
| ආශ්‍රිත සමාගම් සහ බද්ධ ව්‍යාපාරවල ආයෝජනය | - | - | - | - |
| දේපළ, පිරියත හා උපකරණ | 15,315,772 | 13,564,578 | 16,197,837 | 13,857,882 |
| භාවිතයට අයිතිය ඇති වත්කම් | 1,226,183 | 1,073,507 | 1,271,525 | 1,130,868 |
| දේපළ ආයෝජන | - | - | 237,077 | 333,315 |
| කීර්තිනාමය සහ අස්පෘෂ්‍ය වත්කම් | 687,961 | 598,876 | 694,160 | 599,612 |
| විලම්භීත බදු වත්කම් | 1,446,249 | - | 1,446,249 | 338 |
| වෙනත් වත්කම් | 23,033,780 | 35,197,923 | 23,192,936 | 35,370,115 |
| **මුළු වත්කම්** | **1,363,808,376** | **1,157,966,664** | **1,383,220,728** | **1,175,574,745** |
| **වගකීම්** | | | | |
| බැංකුවලට ගෙවිය යුතු | 12,862,337 | 35,045,251 | 13,339,705 | 36,139,122 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | - | - | - |
| ලාභ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වගකීම් | - | - | - | - |
| **ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වගකීම්** | | | | |
| තැන්පත්කරුවන්ට ගෙවිය යුතු | 1,237,123,791 | 1,016,574,286 | 1,237,669,284 | 1,015,635,421 |
| ණය සුරකුම්පත් හිමියන්ට ගෙවිය යුතු | - | - | - | - |
| වෙනත් ණය ගැනීම් සඳහා ගෙවිය යුතු | 8,159,591 | 21,203,242 | 19,656,090 | 32,808,023 |
| කල්බදු වගකීම් | 1,274,713 | 1,066,882 | 1,320,877 | 1,121,441 |
| නිකුත් කළ ණය සුරකුම්පත් | 31,773,753 | 26,691,711 | 31,908,279 | 26,955,697 |
| සේවාවසාන ප්‍රතිලාභ බැඳීම් | 10,885,085 | 5,025,779 | 10,916,429 | 5,053,759 |
| ප්‍රවර්ථන බදු වගකීම් | 3,128,643 | - | 3,705,537 | 565,704 |
| විලම්භිත බදු වගකීම් | - | 482,241 | 1,121 | 483,005 |
| වෙනත් වෙන්කිරීම් | - | - | - | - |
| වෙනත් වගකීම් | 6,699,216 | 5,951,464 | 7,253,989 | 7,430,415 |
| පාලිත සමාගම්වලට ගෙවිය යුතු | 3,750 | 547 | - | - |
| **මුළු වගකීම්** | **1,311,910,879** | **1,112,041,403** | **1,325,771,311** | **1,126,192,586** |
| **හිමිකම්** | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය / පවරන ලද ප්‍රාග්ධනය | 9,400,000 | 9,400,000 | 9,400,000 | 9,400,000 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | 4,068,268 | 3,562,872 | 4,090,363 | 3,571,214 |
| වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත | (434,929) | 318,006 | (411,786) | 283,501 |
| රඳවාගත් ඉපැයුම් | 11,883,168 | 8,194,507 | 16,085,184 | 10,964,046 |
| වෙනත් සංචිත | 26,980,990 | 24,449,876 | 28,285,656 | 25,163,395 |
| අයිතිකරුවන්ගේ මුළු හිමිකම | 51,897,497 | 45,925,261 | 57,449,417 | 49,382,159 |
| පාලනයට යටත් නොවන හිමිකම් | - | - | - | - |
| **මුළු හිමිකම්** | **51,897,497** | **45,925,261** | **57,449,417** | **49,382,159** |
| **මුළු හිමිකම් සහ වගකීම්** | **1,363,808,376** | **1,157,966,664** | **1,383,220,728** | **1,175,574,745** |
| **අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්** | **23,787,099** | **10,355,197** | **23,850,325** | **10,691,602** |
| **නාමික තොරතුරු** | | | | |
| සේවක සංඛ්‍යාව | 4,641 | 4,715 | | |
| ශාඛා සංඛ්‍යාව | 259 | 256 | | |

**සටහන : හානිකරණයෙන් හා ක්ෂය කිරීමෙන් පසු ශුද්ධ අගයන් දක්වා ඇත.**

**පැහැදිලි කිරීමේ සටහන**

1. 2019 වර්ෂය සඳහා වූ වාර්ෂික ගිණුම් ප්‍රකාශයට පත් කළ තැන් සිට ගණනය කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ක්‍රමවේදයන්හි වෙනසක් සිදු වී නොමැත.
2. වඩාත් යෝග්‍ය ඉදිරිපත් කිරීමක් සඳහා තත්කාලීන වර්ෂයේ තොරතුරු සමග අවශ්‍ය ඕනෑම අවස්ථාවක සැසඳීමට හැකි ලෙස සන්සන්දනාත්මක තොරතුරු නැවත වර්ගීකරණය කර ඇත.
3. COVD - 19 නිසා ඇතිවන බලපෑම

කෝවිඩ් - 19 පැතිරීම ව්‍යාපාරික හා ආර්ථික කටයුතුවලට බාධාවක් වී ඇති අතර, ගෝලීය හා දේශීය ආර්ථිකයට අවිනිශ්චිතතාවයක් ඇති කර තිබේ. ශ්‍රී ලංකාවේ කෝවිඩ් - 19 පැතිරීයාමේදී බැංකුව සිය ව්‍යාපාරික කටයුතු සිදු කරන විට රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව (ශ්‍රී ල.ම.බැ.) විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ හා මඟපෙන්වීම් දැඩි ලෙස පිළිපැදි ඇත. ඒ අනුව, බැංකුව මේ වනවිට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද උපදෙස්වලට අනුකූලව බලපෑමට ලක් වූ ව්‍යාපාරිකයින්ට සහ පුද්ගලයන්ට සහන සැලසීමේ කටයුතු කරමින් සිටී. ඒ අනුව, බැංකුව විසින් ශ්‍රී ල.ම.බැ. විසින් නිකුත් කරන ලද උපදෙස් අනුව පීඩාවට පත් ව්‍යාපාරිකයින්ට සහ පුද්ගලයන්ට සහන ලබාදී ඇත.

**ණය සහන හා ණය කල් දැමීමේ බලපෑම**

ණය සහන හෝ ගෙවීම් කල්දැමීම ප්‍රතික්ෂේප කළ අය හැර සෙසු සියළු ගනුදෙනුකරුවන්ට බැංකුව සිය ණය හෝ ගෙවීම් කල්දැමීම ලබාදී ඇත. සිල්ලර ණය කළඹෙන් 90% ක් පමණ ණය සඳහා 7% සහන පොලී අනුපාතයක් යටතේ ණය සහනයක් හා ණය කාලසීමාව අවසානය දක්වා කල් දැමීමක් සිදු කර ඇත. ණය සහනය මාස දෙකේ සිට හය දක්වා ලබාදී ඇත. ඒ අනුව පළමු දින පාඩුව මූල්‍ය ප්‍රකාශනවලට හඳුනාගෙන ගිනුම්ගත කර ඇත.

**හානිකරණ තක්සේරුව**

සියලුම ආයතනික සේවාදයකයින් ඔවුන්ගේ ඓතිහාසික ගෙවීම් රටා, ඔවුන්ගේ ව්‍යාපාරික අංශයට හා භූගෝලීය ප්‍රදේශයට කෝවිට් 19 ආර්ථික බලපෑම, අපේක්ෂිත ක්ෂේත්‍රය යථා තත්ත්වයට පත් කිරීම, ආයතනයේ මූල්‍ය ශක්තිය, රජයේ සහ ශ්‍රී ල.ම.බැ. සහය සහ වෙනත් පරිපූර්ණ සාධක මත පදනම්ව තනි තනිව තක්සේරු කර ඇත. තක්සේරුව මත පදනම්ව සමහර ණයගැනුම්කරුවන් පළමු අදියර සිට දෙවන අදියර දක්වා ගෙන ගිය අතර සමහර ණය ගැනුම්කරුවන් අතීතයේ නියමිත තත්ත්වය නොතකා දෙවන අදියර සිට තුන්වන අදියර දක්වා අපේක්ෂිත මුදල් ප්‍රවාහ දුර්වලතා හේතුවෙන් ගෙන යන ලදී.

2020 දෙසැම්බර් 31 වන විට බැංකුව විසින් පැහැර හැරීමේ සම්භාවිතාව (PD) ගණනය කර ඇති අතර අපේක්ෂිත හානිකරණය අලාභ ((ECL) ගණනය කිරීමේදී ආර්ථිකයට සිදුවන අහිතකර බලපෑම පිළිබිඹු වන පරිදි ආර්ථික සාධක ගැලපුම් (EFA) සකස් කර ඇත. ඒ අනුව නරකම අවස්ථාවන් සඳහා පවරා ඇති බර ප්‍රමාණය 10% කින් වැඩි කිරීමට බැංකුව තීරණය කළ අතර, මූලික සිද්ධි සහ හොඳම අවස්ථාව සඳහා වෙන් කර ඇති බර පිළිවෙලින් 5% කින් අඩු කර ඇත.

කේවල ණය ගැනුම්කරුවන් සඳහා කළඹ මට්ටමේ හානිය තක්සේරු කිරීම සිදු කරන ලදී. කෙසේ වෙතත්, සමහර අවස්ථාවලදී කළමනාකරණ තීන්දු භාවිතා කරනු ලැබුවේ දීර්ඝ කාලීන ණය අත්හිටුවීම හෝ කල්දැමීම පිළිබඳ පාරිභෝගික ඉල්ලීමෙහි සාධාරණත්වය තක්සේරු කිරීමටය. ණය ගැනුම්කරුවන්ට ඔවුන්ගේ ක්ෂේත්‍රය සහ කළමනාකරණ විනිශ්චය මත පදනම්ව අදියර අතර වෙන් කරන ලදී. තක්සේරුව මත පදනම්ව සමහර ණය ගැනුම්කරුවන් පළමු අදියර සිට දෙවන අදියර දක්වාත් සමහර ණය ගැතියන් දෙවන අදියර සිට තුන්වන අදියර දක්වා අපේක්ෂිත මුදල් ප්‍රවාහ දුර්වලතාවය හේතුවෙන් ගෙනයන ලදී.

## හිමිකම් වෙනස් වීම දක්වන ප්‍රකාශය - බැංකුව - විගණනය කළ

| 2019-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | ප්‍රකාශිත ප්‍රාග්ධනය / පවරන ලද ප්‍රාග්ධනය | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | ප්‍රත්‍යාගණන සංචිතය | වෙනත් විස්තීරණ ආදායම් සංචිත | ඉදිරි රැකුම් මුදල් ප්‍රවාහ සංචිතය | රඳවාගත් ඉපැයුම් | වෙනත් සංචිත | මුළු හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|
| **2019 ජනවාරි 01 වන දිනට ශේෂය** | **9,400,000** | **3,227,960** | **7,793,317** | **528,430** | - | **3,869,070** | **18,160,874** | **42,979,655** |
| පෙර වර්ෂයට අදාළ ගැලපීම් | - | - | (2,182,129) | 31,979 | - | 2,833,244 | - | 683,094 |
| **2019 ජනවාරි 01 දිනට නැවත අගයන ලද ශේෂය** | **9,400,000** | **3,227,960** | **5,611,188** | **560,409** | - | **6,702,314** | **18,160,874** | **43,662,749** |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | | | | | | | | |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | - | - | - | - | | 6,381,170 | - | 6,381,170 |
| වෙනත් විස්තීරණ ආදයම් (බදු ගෙවූ පසු) | - | - | - | - | - | (2,487,084) | - | (2,487,084) |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට නම් කළ ණය උපකරණවල සාධාරණ අගයේ ශුද්ධ වෙනස් වීම් | - | - | - | 82,232 | - | - | - | 82,232 |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට නම් කළ හිමිකම් උපකරණවල සාධාරණ අගයේ ශුද්ධ වෙනස් වීම් | - | - | - | (324,635) | - | - | - | (324,635) |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | - | - | - | **( 242,403)** | - | **3,894,087** | - | **3,65 1,684** |
| **හිමිකමට සෘජුවම ගලපන ලද හිමිකරුවන් සමඟ සිදුකළ ගනුදෙනු** | | | | | | | | |
| හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මාරු කිරීම | - | - | - | - | - | - | 677,811 | 677,811 |
| ඒකාබද්ධ අරමුදලට දායකය - ලාභාංශ / විශේෂ බදු | - | - | - | - | - | (2,000,000) | - | (2,000,000) |
| ජාතික රක්ෂණ භාර අරමුදලට දායකය | - | - | - | - | - | (66,982) | - | (66,982) |
| වර්ෂය තුළ මාරු කිරීම් | - | 334,912 | - | - | - | (334,912) | - | - |
| **හිමිකම් දරන්නන් සමඟ සිදුකළ මුළු ගනුදෙනු** | - | **334,912** | - | - | - | **(2,401,894)** | **677,811** | **(1,389,171)** |
| **2019.12.31 දිනට ශේෂය** | **9,400,000** | **3,562,872** | **5,611,188** | **318,006** | - | **8,194,507** | **18,838,685** | **45,925,261** |

| 2020-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | ප්‍රකාශිත ප්‍රාග්ධනය / පවරන ලද ප්‍රාග්ධනය | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | ප්‍රත්‍යාගණන සංචිතය | වෙනත් විස්තීරණ ආදායම් සංචිත | ඉදිරි රැකුම් මුදල් ප්‍රවාහ සංචිතය | රඳවාගත් ඉපැයුම් | වෙනත් සංචිත | මුළු හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|
| **2020 ජනවාරි 01 වන දිනට ශේෂය** | **9,400,000** | **3,562,872** | **5,611,188** | **318,006** | - | **8,194,507** | **18,838,685** | **45,925,261** |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | | | | | | | |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | - | - | - | - | - | 10,107,916 | - | 10,107,916 |
| වෙනත් විස්තීර්ණ ආදායම් (බදු ගෙවූ පසු) | - | - | - | - | - | (4,812,780) | - | (4,812,780) |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට නම් කළ ණය උපකරණවල සාධාරණ අගයේ ශුද්ධ වෙනස් වීම් | - | - | - | 23,227 | - | - | - | 23,227 |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට නම් කළ හිමිකම් උපකරණවල සාධාරණ අගයේ ශුද්ධ වෙනස් වීම් | - | - | | (776,162) | - | - | - | (776,162) |
| ප්‍රත්‍යාගණන අතිරික්තයේ ශුද්ධ වෙනස | - | - | 1,067,380 | - | - | - | - | 1,067,380 |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | - | - | **1,067,380** | **(752,935)** | - | **5,295,136** | - | **5,609,580** |
| **හිමිකමට සෘජුවම ගලපන ලද හිමිකරුවන් සමඟ සිදුකළ ගනුදෙනු** | | | | | | | | |
| හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මාරු කිරීම | - | - | - | - | - | - | 1,463,736 | 1,463,736 |
| ඒකාබද්ධ අරමුදලට දායකය - ලාභාංශ / විශේෂ බදු | - | - | - | - | - | (1,000,000) | - | (1,000,000) |
| ජාතික රක්ෂණ භාර අරමුදලට දායකය | - | - | - | - | - | (101,079) | - | (101,079) |
| වර්ෂය තුළ මාරු කිරීම් | - | 505,396 | - | - | - | (505,396) | - | - |
| **හිමිකම් දරන්නන් සමඟ සිදුකළ මුළු ගනුදෙනු** | - | **505,396** | - | - | - | **(1,606,475)** | **1,463,736** | **362,657** |
| **2020-12-31 දිනට ශේෂය** | **9,400,000** | **4,068,268** | **6,678,568** | **(434,929)** | - | **11,883,168** | **20,302,421** | **51,897,497** |

## හිමිකම් වෙනස් වීම දක්වන ප්‍රකාශය - සමූහය - විගණනය කළ

| 2019-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | ප්‍රකාශිත ප්‍රාග්ධනය / පවරන ලද ප්‍රාග්ධනය | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | ප්‍රත්‍යාගණන සංචිතය | වෙනත් විස්තීරණ ආදායම් සංචිත | ඉදිරි රැකුම් මුදල් ප්‍රවාහ සංචිතය | රඳවාගත් ඉපැයුම් | වෙනත් සංචිත | මුළු හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|
| **2019 ජනවාරි 01 වන දිනට ශේෂය** | **9,400,000** | **3,227,960** | **7,793,317** | **390,210** | - | **4,445,441** | **18,745,544** | **44,002,475** |
| පෙර වර්ෂයට අදාළ ගැලපීම් | - | - | (2,182,129) | 31,979 | - | 2,833,244 | - | 683,094 |
| **2019 ජනවාරි 01 දිනට නැවත අගයන ලද ශේෂය** | **9,400,000** | **3,227,960** | **5,611,188** | **422,189** | - | **7,278,685** | **18,745,544** | **44,685,569** |
| **වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම** | | | | | | | | |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | - | - | - | - | - | 8,712,910 | - | 8,712,910 |
| වෙනත් විස්තීර්ණ ආදායම් (බදු ගෙවූ පසු) | - | - | - | - | - | (2,488,461) | - | (2,488,461) |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට නම් කළ ණය උපකරණවල සාධාරණ අගයේ ශුද්ධ වෙනස් වීම් | - | - | - | 181,609 | - | - | - | 181,609 |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට නම් කළ හිමිකම් උපකරණවල සාධාරණ අගයේ ශුද්ධ වෙනස් වීම් | - | - | - | (320,297) | - | - | - | (320,297) |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | - | - | - | **(138,688)** | - | **6,224,450** | - | **6,085,762** |
| **හිමිකමට සෘජුවම ගලපන ලද හිමිකරුවන් සමඟ සිදුකළ ගනුදෙනු** | | | | | | | | |
| හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මාරු කිරීම | - | - | - | - | - | - | 677,811 | 677,811 |
| ඒකාබද්ධ අරමුදලට දායකය - ලාභාංශ / විශේෂ බදු | - | - | - | - | - | (2,000,000) | - | (2,000,000) |
| ජාතික රක්ෂණ භාර අරමුදලට දායකය | - | - | - | - | - | (66,982) | - | (66,982) |
| වර්ෂය තුළ මාරු කිරීම් | - | 343,254 | - | - | - | (472,106) | 128,852 | - |
| **හිමිකම් දරන්නන් සමඟ සිදුකළ මුළු ගනුදෙනු** | - | **343,254** | - | - | - | **(2,539,088)** | **806,663** | **(1,389,171)** |
| **2019-12-31 දිනට ශේෂය** | **9,400,000** | **3,571,214** | **5,611,188** | **283,501** | - | **10,964,046** | **19,552,207** | **49,382,159** |

| 2020-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | ප්‍රකාශිත ප්‍රාග්ධනය / පවරන ලද ප්‍රාග්ධනය | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | ප්‍රත්‍යාගණන සංචිතය | වෙනත් විස්තීරණ ආදායම් සංචිත | ඉදිරි රැකුම් මුදල් ප්‍රවාහ සංචිතය | රඳවාගත් ඉපැයුම් | වෙනත් සංචිත | මුළු හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|
| **2020 ජනවාරි 01 වන දිනට ශේෂය** | **9,400,000** | **3,571,214** | **5,611,188** | **283,501** | - | **10,964,046** | **19,552,207** | **49,382,159** |
| **පෙර වර්ෂයට අදාළ ගැලපීම** | - | - | - | - | - | 882,070 | - | 882,070 |
| **පෙර වර්ෂයට අදාළ ගැලපීමෙන් පසු නැවත අගයන ලද ශේෂය** | **9,400,000** | **3,571,214** | **5,611,188** | **283,501** | - | **11,846,116** | **19,552,207** | **50,264,229** |
| **වර්ෂය සඳහා මුළු විස්තීරන ආදායම** | | | | | | | | |
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය | - | - | - | - | - | 10,821,118 | - | (10,821,118) |
| වෙනත් විස්තීර්ණ ආදායම් (බදු ගෙවූ පසු) | - | - | - | - | - | (4,809,785) | - | (4,809,785) |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට නම් කළ ණය උපකරණවල සාධාරණ අගයේ ශුද්ධ වෙනස් වීම් | - | - | - | 79,503 | - | - | - | 79,503 |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට නම් කළ හිමිකම් උපකරණවල සාධාරණ අගයේ ශුද්ධ වෙනස් වීම් | - | - | - | (774,790) | - | - | - | (774,790) |
| ප්‍රත්‍යාගණන අතිරික්තයේ ශුද්ධ වෙනස | - | - | 1,506,486 | - | - | - | - | 1,506,486 |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | - | - | **1,506,486** | **(695,287)** | - | **6,011,332** | - | **6,822,531** |
| **හිමිකමට සෘජුවම ගලපන ලද හිමිකරුවන් සමඟ සිදුකළ ගනුදෙනු** | | | | | | | | |
| හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මාරු කිරීම | - | - | - | - | - | - | 1,463,736 | 1,463,736 |
| ඒකාබද්ධ අරමුදලට දායකය - ලාභාංශ / විශේෂ බදු | - | - | - | - | - | (1,000,000) | - | (1,000,000) |
| ජාතික රක්ෂණ භාර අරමුදලට දායකය | - | - | - | - | - | (101,079) | - | (101,079) |
| වර්ෂය තුළ මාරු කිරීම් | - | 519,149 | - | - | - | (671,185) | 152,037 | - |
| **හිමිකම් දරන්නන් සමඟ සිදුකළ මුළු ගනුදෙනු** | - | 519,149 | - | - | - | (1,77,264) | 1,615,773 | 362,657 |
| **2020-12-31 දිනට ශේෂය** | **9,400,000** | **4,090,363** | **7,117,674** | **(411,786)** | - | **16,085,184** | **21,167,980** | **57,449,417** |

**1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත අනුව, එම බැංකුවේ ඔබේ ඉතුරුම් සහ ඒ මත පොලිය සඳහා රජයේ වගකීම සහතික කරයි.**

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

**විදුලි පාරිභෝගිකයින්ට අනර්ඝ සැපයුමක් හා සේවාවක් ලබාදීමේ අරමුණ සපුරා ගනු වස්, ලංකා විදුලිබල මණ්ඩලය පහත සඳහන් ප්‍රදේශවල විදුලි පද්ධතියේ නඩත්තු, පුනරුත්ථාපන හෝ තැනීම් කටයුතු කිරීමට අදහස් කරයි. මේ නිසාවෙන්, එම ප්‍රදේශවල විදුලිබල සැපයුම, පහත දක්වා ඇති දිනයන් හි / වේලාවන් හිදී තාවකාලිකව අත්හිටුවීමට සිදුවේ. මේ නිසා විදුලි පාරිභෝගිකයින්ට සිදුවන අපහසුතාවයට අපගේ කණගාටුව ප්‍රකාශ කරන අතරම, සැලසුම් කරන ලද වැඩ අවසන් වූ වහාම නැවත විදුලි සැපයුම යථා තත්ත්වයට පත් කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය විසින් පියවර ගනු ලැබේ.**

# නැගෙනහිර පළාත

## විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය : අම්පාර

### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : මහඔය

| | | |
|---|---|---|
| 2021.04.05 | 08:30-17:00 | පොල්ලෙබැද්ද. |
| 2021.04.06 | 08:30-17:00 | පදියතලාව, මීගස්වත්ත. |
| 2021.04.07 | 08:30-17:00 | කුඹුරුවෙල, ගමවෙල, ප්‍රාදේශීය සභාව. |
| 2021.04.08 | 08:30-17:00 | පදියතලාව, මීගස්වත්ත. |
| 2021.04.28 | 08:30-17:00 | පදියතලාව, හොලිකේ. |
| 2021.04.29 | 08:30-17:00 | 69 හන්දිය, නුවරගල, අරන්තලාව. |

### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : හිඟුරාණ

| | | |
|---|---|---|
| 2021.04.03 | 09:00-13:00 | දමන, හිඟුරාණ, තොට්ටම, මාත්තොට්ටම, නීත්ත, බක්මීටියාව, මඩවලලන්ද, මුවන්ගල. |
| 2021.04.05 | 08:30-17:00 | බක්මීටියාව, තොට්ටම. |
| 2021.04.10 | 08:30-17:00 | එරගම, වරිපතන්චේනයි. |
| 2021.04.19 | 08:30-17:00 | බක්මීටියාව, තොට්ටම. |
| 2021.04.20 | 08:30-17:00 | මුවන්ගල, හිඟුරාණ. |
| 2021.04.21 | 08:30-17:00 | බක්මීටියාව, තොට්ටම. |
| 2021.04.23 | 08:30-17:00 | මුවන්ගල, හිඟුරාණ. |
| 2021.04.28 | 08:30-17:00 | බක්මීටියාව, තොට්ටම. |

### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : අම්පාර

| | | |
|---|---|---|
| 2021.04.24 | 08:30-17:00 | කරන්ගාව, රජවැව, ගුවන් හමුද කඳවුර, මෙටල් ක්‍රෂර්, සමනලබැද්ද. |
| 2021.04.27 | 08:30-17:00 | කරන්ගාව, රජවැව, ගුවන් හමුද කඳවුර, මෙටල් ක්‍රෂර්, සමනලබැද්ද. |

### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : පොතුවිල්

| | | |
|---|---|---|
| 2021.04.01 | 08:30-17:00 | කළුගොල්ල, මනල්චේනයි. |
| 2021.04.07 | 08:30-17:00 | මහකළුගොල්ල, හුලන්නුගේ. |
| 2021.04.08 | 08:30-17:00 | කළුගොල්ල, මනල්චේනයි. |
| 2021.04.17 | 08:30-17:00 | පාක්කියවත්ත. |
| 2021.04.21 | 08:30-17:00 | ලාහුගල, තාමියියාවෙල, නීලගිරි. |
| 2021.04.29 | 08:30-17:00 | කළුගොල්ල, මනල්චේනයි. |

### පාරිභෝගික සේවා මධ්‍යස්ථානය : අක්කරෙයිපත්තු

| | | |
|---|---|---|
| 2021.04.01 | 08:30-17:00 | පනම්කාඩු, කෝලාවිල්, සාගම පාර, ඉත්තියඩි, තිවුකාලයි, කබඩාපිටි, කන්නගිපුරම් |
| මුතුපන්තිය මීටර් 115 රිවට්මන්ට් බැම්ම ඉදිකිරීම CCD/CD/2021/51 | ටොන් 12 එක්ස්කැවේටර් යන්ත්‍රයක් පැය 210<br>කියුබ් 01 ලෝඩර් යන්ත්‍රයක් පැය 180 | රු. 19,000.00 දින 49 | | පුත්තලම | |
| මඩිහ මීටර් 120 රිවට්මන්ට් බැම්ම ඉදිකිරීම CCD/CD/2021/45 | ටොන් 12 එක්ස්කැවේටර් යන්ත්‍රයක් පැය 310<br>කියුබ් 01 ලෝඩර් යන්ත්‍රයක් පැය 240 | රු. 24,200.00 දින 63 | | මාතර | ප්‍රාදේශීය ඉංජිනේරු (මාතර/ හම්බන්තොට) 041-2234572 |

2. ජාතික තරඟකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ. එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් සඳහා වෙන් වශයෙන් ලංසුලේඛන නිකුත් කරනු ලැබේ.

3. කොන්ත්‍රාත් ප්‍රදානයට සුදුසුකම් ලැබීමට, සාර්ථක ලංසුකරුවා අසාදු ලේඛනගත වූ අයෙකු නොවිය යුතුය. තවද, 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ සඳහන් සුදුසුකම් සපුරාලිය යුතුය.

4. කොන්ත්‍රාත් ප්‍රදානයට සුදුසුකම් ලැබීමට, ලංසුකරුවන් විසින් පහත සඳහන් ලේඛන, තම ලංසු සමග ඉදිරිපත් කළ යුතුය.

**(අ) ද්‍රව්‍ය සැපයුම සඳහා**

- අ) ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කරනු ලබන යන්ත්‍රෝපකරණ, ටිපර් රථ, ට්‍රැක්ටර්, ඩ්‍රම්ප් ට්‍රක් රථ හා අනෙකුත් වාහනවල සහතික කරන ලද ලැයිස්තුවක් සමග වාහන/ යන්ත්‍ර සූත්‍රවල ලියාපදිංචි සහතිකවල පිටපත්
- ආ) පසුගිය වසර 05 තුළ අප දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් ආයතනයක කරන ලද සැපයුම් පිළිබඳ විස්තර
- ඇ) 2021 වර්ෂය සඳහා වූ පුපුරණ ද්‍රව්‍ය සඳහා බලපත්‍රය, පාරිසරික ආරක්ෂණ බලපත්‍රය සහ කාර්මික කැණීම් බලපත්‍රයෙහි පිටපත්
- ඈ) ව්‍යාපාර ලියාපදිංචි සහතිකය, වැට් බදු සඳහා ලියාපදිංචි සහතිකවල පිටපත්

**(ආ) බර වාහන හා යන්ත්‍රසූත්‍ර සඳහා**

- අ) ටිපර් රථ, ලෝඩර්, වීල් එක්ස්කැවේටර්, උස් තට්ටු හා පහත් තට්ටු සහිත ට්‍රේලර් රථ සහ ඩ්‍රම්ප් ට්‍රක් රථ වල සහතික කරන ලද ලැයිස්තුවක් සමග වාහන / යන්ත්‍ර සූත්‍රවල ලියාපදිංචි සහතිකවල පිටපත්
- ආ) පසුගිය වසර 05 තුළ අප දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් ආයතනයක කරන ලද සැපයුම් පිළිබඳ විස්තර
- ඇ) යන්ත්‍රෝපකරණ හා බර වාහනයන්හි අයිතිය තහවුරු කිරීමේ සහතිකවල පිටපත්
- ඈ) වාහන රක්ෂණ සහතිකවල පිටපත්
- ඉ) ව්‍යාපාර ලියාපදිංචි සහතිකය, වැට් බදු සඳහා ලියාපදිංචි සහතිකවල පිටපත්

5. මේ සඳහා රුචිකත්වය දක්වන ලංසුකරුවන්ට අවශ්‍ය වැඩිදුර විස්තර කොළඹ 10, මාළිගාවත්ත, නව මහලේකම් කාර්යාලයේ, 04 වන මහලේ, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තුමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු (වෙරළ සංවර්ධන) වෙතින් ලබා ගත හැකි අතර, ඕනෑම රාජකාරී දිනයක 0900 පැය හා 1500 පැය අතර කාලය තුළ ලංසු ලේඛන පරීක්ෂා කර බැලිය හැක. ලංසුකරුවන්ට අදාළ නිලධාරීන් සමග දුරකථන අංක 011-2472622, 011-2387920 හා ෆැක්ස් අංක 011-2387920 ඔස්සේ සම්බන්ධ විය හැක.

6. ව්‍යාපාර ලිපි ශීර්ෂයක් මඟින් ඉහත ලිපිනයේ ප්‍රධාන ඉංජිනේරු (වෙරළ සංවර්ධන) වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු ගෙවනු නොලබන ගාස්තු රුපියල් එක් දහසක් (රු.1,000.00) ගෙවීමෙන් 2021.03.30 දින සිට 2021.04.15 දින දක්වා, 0900 පැය හා 1500 පැය අතර කාලය තුළ උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, ලංසු ලිපිලේඛන කට්ටලයක් මිලදී ගත හැක.

7. සම්පූර්ණ කොට මුද්‍රා, තැබූ, වෙරළ ආරක්ෂක ව්‍යුහයන් ඉදිකිරීමට ද්‍රව්‍ය සැපයීම සඳහා වන ලංසු 2021.04.16 දින 1400 පැය දක්වාත්, වෙරළ ආරක්ෂක ව්‍යුහයන් ඉදිකිරීමේ වැඩබිමට බර වාහන හා යන්ත්‍ර සූත්‍ර සැපයීම සඳහා වන ලංසු 2021.04.16 දින 1500 පැය දක්වාත්, ගෙනවිත් භාර දීමෙන් හෝ ලියාපදිංචි තැපැලෙන්, **සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, 04 වන මහල, නව මහලේකම් කාර්යාලය, මාළිගාවත්ත, කොළඹ 10** යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය.

8. අදාළ මුද්‍රා, තැබූ කවරවල කොන්ත්‍රාත් නාමය, කොන්ත්‍රාත් හඳුනා ගැනීමේ අංකය සහ සැපයුම් නිර්ණායක (ද්‍රව්‍ය / යන්ත්‍ර) පැහැදිලිව සඳහන් විය යුතුය.

9. අදාළ ලංසු භාරගැනීමේ කාලය අවසන් වූ වහාම කොළඹ 10, මාළිගාවත්ත, නව මහලේකම් කාර්යාලයේ, 04 වන මහල, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේදී පැමිණ සිටින ලංසුකරුවන් හෝ බලය පැවරූ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

10. සියලුම ලංසු සමඟ, ඉහතින් විස්තර කර ඇති පරිදි ලංසු ඇපකරය, බැංකු ඇපකරයක් හෝ මුදල් ගෙවීමේ කුවිතාන්සියක් මඟින් තිබිය යුතු අතර, එම ලංසු ඇපකරය, ලංසු වලංගු කාලය ඉක්මවා දින 28ක් දක්වා වලංගුව පැවතිය යුතුය. අදාළ ලංසු ඇපකරය දෙපාර්තමේන්තුවේ සරප් වෙත මුදලින් ගෙවීම් කළ හැක. ලංසු වලංගු කාලය, ලංසු විවෘත කිරීමේ දිනට පසු දින සිට ගණනය කරනු ලැබේ.

11. ප්‍රමාද ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව,**
**04 වන මහල, නව මහලේකම් කාර්යාලය,**
**මාළිගාවත්ත, කොළඹ 10.**

**දුරකථනය : 011-2449197 / 011-2472622 / 011-2387920**
**ෆැක්ස් : 011-2438005 / 011-2438005**

# ලුහුඬු දැන්වීම්



රථවාහන



බස් හා ලොරි රථ 119
විකිණීම

**NW-LN** - 4895 - ISUZU-BKG-NPR85AN ELF - ලොරි රථය - 2011- White ඉහළම ඉල්ලුමට. CBC ෆිනෑන්ස් සමාගම, 187, කටුගස්තොට පාර, මහනුවර. දු.ක. 081-2200272 024392



රැකී රක්ෂා



ඇබෑර්තු 308
වෙළඳ/අලෙවිකරණ

අලෙවිකරණයට ගැහැණු/ පිරිමි සහ පරිඝණක දැනුමැති ගැහැණු කාර්යාලය ලිපිකාරිනියක් ඕනෑකර තිබේ. ටෙලි 0774904386, 2422943, 2472666, නො. 51A, පළමුවන හරස් වීදිය, කොළඹ 11. 024360



ඇබෑර්තු 322
මේසන්වරු/වඩුබාස්වරු

හලාවත සැටලින් වැඩබිමක් සඳහා බාස්වරු සහ අත්උදව්කරුවන් අවශ්‍යයි. වැටුප දිනකට බාස්වරු සඳහා රු. 2800/ - සිට ගෝලයන් සඳහා 1800/ - සිට. 0767068398, 0712788849 024441



ඇබෑර්තු 325
විවිධ

විවිධ ආහාර ද්‍රව්‍ය සෑදිය හැකි අයෙකු සහ සුපවයිසර්වරයෙකු බුලත්සිංහල හෝ මතුගම ප්‍රදේශයෙන් අවශ්‍යයි. 077-3516618 / 011-2587441 024424



නිවාස හා ඉඩම්



වතුපිටි 607
විකිණීම

ඉබ්බාගමුව, දීයාව සංවර්ධනය කළ අක්කර 9 1/2 පොල් ඉඩම විකිණීමට. විමසීම් 0704067432 024388

ඔබ සොයන වාහනය තෝරාගන්න බලන්න
දිනමිණ වාහන

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, හෙයියන්තුඩුව, මා බිම, බියගම පාර, අංක 311/04 දරන ස්ථානයේ පදිංචි **චමිලා දිල්රුක්ෂි පෙරේරා** (ජාතික හැඳුනුම්පත් අංකය : 707741996V) වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි වැසියන්ටත් දැනුම් දෙනු ලබන්නේ මා විසින් මාගේ නීත්‍යානුකූල ඇටෝර්නිවරයා ලෙස ප්‍රසිද්ධ නොතාරිස් එල්.එම්. තිලකරත්න කබ්රාල් විසින් ලියා සහතික කළ වර්ෂ 2019 මැයි මස 14 වන දින හා අංක 3882 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් කැලණිය, ගෝනවල, අංක 337/1C දරන ස්ථානයේ පදිංචි **විතානගේ අර්ශිකා ශිරන්ති පෙරේරා** (ජාතික හැඳුනුම්පත් අංකය : 768511870V) යන අය පත් කරනු ලැබූ අතර, එකී ඇටෝර්නි බලපත්‍රය අද දින සිට අවලංගු සහ බල රහිත වන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි වැසියන්ටත් මෙයින් දැනුම් දෙනු ලබන අතර, මේ දින පටන් විතානගේ අර්ශිකා ශිරන්ති පෙරේරා යන අය විසින් මා වෙනුවෙන් සහ මාගේ නමින් කරනු ලබන කිසිදු ගනුදෙනුවක බල පැවැත්මක් නොමැති බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

දිනය : 2021.03.30
චමිලා දිල්රුක්ෂි පෙරේරා

තරුණී
කාලීන දැනුම | මැහුම් | ගෙතුම් | අත්කම් | අතිරේක
දශක පහක් පුරා - කාන්තා නැණ පහන් දැල්වූ
කාන්තා පුවත්පත

# ප්‍රසම්පාදන දැන්වීමයි

## සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (බ.ප.)

01. පහත උපලේඛනයේ සඳහන් ඉදිකිරීම් කාර්යයන් සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා, තබන ලද ලංසු බස්නාහිර පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් භාරගනු ලැබේ. ඉදිකිරීම් කටයුතු සඳහා ඇස්තමේන්තු ගත මුදල හා ප්‍රසම්පාදන විස්තර උපලේඛනයේ දක්වා ඇත.

02. ජාතික තරගකාරී ලංසු කැඳවීම මගින් කොන්ත්‍රාත්කරුවන් තෝරාගනු ලැබේ.

03. කොන්ත්‍රාත් ප්‍රදනය සඳහා තෝරාගනු ලබන ලංසුකරු අපලේඛනගත නොවී සිටිය යුතු අතර, ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනයේ පහත උපලේඛනයේ දක්වා ඇති ශ්‍රේණිය හෝ ඊට ඉහළ ශ්‍රේණියක් සඳහා ලියාපදිංචි වී සිටිය යුතුය.

04. මේ පිළිබඳ වැඩි විස්තර සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු බස්නාහිර පළාත් අධ්‍යක්ෂ කර්යාලයෙන් ලබාගත හැකි අතර, ලංසු කැඳවීමේ ලේඛන සාමාන්‍ය කාර්යාල වැඩ කරන වේලාවන් තුළ දී මෙම කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැක.

05. පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා පහත උපලේඛනයේ දක්වා ඇති පරිදි ආපසු නොගෙවන ගාස්තු හා ආපසු ගෙවනු ලබන ලංසු තැන්පතු ගෙවා ඉල්ලුම්පතක් ඉදිරිපත් කිරීමෙන් ලංසු ඉදිරිපත් කිරීමේ ලේඛන සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු බස්නාහිර පළාත් අධ්‍යක්ෂ වෙතින් මිලදී ගත හැක. (මෙම මුදල් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශය වෙත ගෙවිය හැක.)

06. සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන පහත ලිපිනයේ සඳහන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂගේ ප්‍රසම්පාදන කමිටුව වෙත පහත උපලේඛනයේ සඳහන් දින පෙ. ව. 10.00 ට පෙර ඉදිරිපත් කළ යුතු වේ. ප්‍රමාද වී ලැබෙන ලංසු ලේඛන ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ලංසු භාරගැනීම අවසන් කර, පසු දින එනම් 2021.04.20 දින උපලේඛනයේ සඳහන් වේලාවන්වල පහත ලිපිනයේ දී ඒවා විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට ලංසුකරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයින්ට සහභාගි විය හැකිය.

### උපලේඛනය

| වැඩ විස්තරය | ඉදිකිරීම් සඳහා ඇස්තමේන්තු මුදල (බදු රහිත) | අවම ලියාපදිංචිය (CIDA) | ආපසු නොගෙවන ගාස්තුව | ආපසු ගෙවන තැන්පත් මුදල | ලංසුපත් නිකුත් කිරීම | ලංසු විවෘත කරන දිනය |
|---|---|---|---|---|---|---|
| කොටදෙනියාව සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානයේ මුරකුටිය ඉදිකිරීම | රු. 902,993.95 | C-8 / C-9 | රු. 500.00 | රු. 5,000.00 | 2021.03.31 සිට 2021.04.19 | 2021.04.20 පෙ.ව. 10.00 |
| කොටදෙනියාව සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානයේ අලෙවිසැල ඉදිකිරීම | රු. 11,467,684.70 | C-5 / C-6 | රු. 4,000.00 | රු. 200,000.00 | 2021.03.31 සිට 2021.04.19 | 2021.04.20 පෙ.ව. 10.00 |
| සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානයේ පැරණි මී ගව ගාල අලුත්වැඩියාව | රු. 2,438,686.30 | C-8 / C-9 | රු. 1,000.00 | රු. 10,000.00 | 2021.03.31 සිට 2021.04.19 | 2021.04.20 පෙ.ව. 11.30 |
| කොටදෙනියාව සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානයේ නව ගවගාලේ බාහිර වැඩිදියුණු කිරීම් | රු. 1,731,555.40 | C-8 / C-9 | රු. 1,000.00 | රු. 10,000.00 | 2021.03.31 සිට 2021.04.19 | 2021.04.20 පෙ.ව. 11.30 |
| බේරුවල පශුවෛද්‍ය කාර්යාලයේ අලුත්වැඩියාව | රු. 5,246,785.51 | C-6 / C-7 | රු. 3,000.00 | රු. 100,000.00 | 2021.03.31 සිට 2021.04.19 | 2021.04.20 ප.ව. 2.00 |
| පළාත් අධ්‍යක්ෂ කාර්යාලයේ පැරණි පරිපාලන ගොඩනැගිල්ල අලුත්වැඩියාව හා නවීකරණය | රු. 3,006,483.40 | C-7 / C-8 | රු. 2,000.00 | රු. 25,000.00 | 2021.03.31 සිට 2021.04.19 | 2021.04.20 ප.ව. 3.30 |

**කේ.කේ. සරත්**
**පළාත් අධ්‍යක්ෂ**
**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (බ.ප.)**
**වැලිසර, රාගම.**
**දුරකථන අංක : 0112958474 / 0112967453**

2021 මාර්තු 30 අඟහරුවාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

# බද්දර මල්ල

සතියේ 'තුන පහ' මඩිස්සලේ



## බරණ ගණිතයා හා නීලකොබෝ සන්දේශය

අපේ කතා නායකයා බොහෝ ප්‍රසිද්ධ නැකැත්කරුවෙකි. එමතු නොවේ. ඔහු වස්කවි කියන්නද මහා සමතකු සේ රට පුරා ප්‍රසිද්ධව සිටියේ ය. ඔහුගේ වස් කවි කීමේ සමත්කම පැරණි ජනශ්‍රැතිවලින් වර්ණනාත්මකව කියැවී තිබේ. වරක් ඔහුගේ නිවෙසේ සරණ මංගල්‍යයක් පැවැත්විණි. ඊට සරිලන මස් මාළුවක් නොවූයෙන් හේ දඩයමේ ගියේය. දඩයමේ යන විට ඕළු මුවකු දුටු හෙතෙම කොකා ගැස්සුවේය. එහෙත් තුවක්කුව පත්තු නොවිණි. ඔහු එතැනම සිටගෙන පහතින් දැක්වෙන වස් කවිය කීවේ ලු.

යාලුවේ මෙමට කළ අවමාන්නෙට
වේලුවේ තිත්තකඩයින් බඳින්නට
මාලුවේ දෙයක් නැත මුසු කරන්නට
ඕලුවේ නොගොස් සිටපන්න මඟුලට

ඔහු කවිය කී සැනින් ඕළු මුවා නැවතුනණේ ලු. තුවක්කුව ද පත්තු වී දඩයම් කාර්යය සපල වී ලු.

මේ තැනැත්තා බරණ ගණිතැදුරාය. ඔහු කීර්ති ශ්‍රී රාජසිංහ (ක්‍රි. ව. 1747 - ක්‍රි. ව. 1780) රජ සමයේ මෙන් ම රාජාධිරාජසිංහ (ක්‍රි. ව. 1780 - ක්‍රි. ව. 1798) රජ සමයේ ද ජීවත් වූ අයෙකි. බරණ ගණිතයා සිටිනාමළුවේ ධම්මජෝති හිමියන්ගේ කුලුපග ශිෂ්‍යයකු ව සිටි අවධියේ දී මහනුවර සිටි සුප්‍රකට බමුණු පඬිවරයකුගෙන් නැකැත් ශාස්ත්‍රය හදාළ බව කියැවේ. එසේම ඔහු එදවස සිටි සඟරජ හිමි, තිබ්බටුවාවේ හිමි, මොරතොට හිමි, කරතොට හිමි, සාලියාලේ මණිරතන හිමි, පත්තායමේ ලේකම්, දුනුවිල ඒකනායක, දිසානායක මුහන්දිරම්, කිරම ධම්මානන්ද හිමි වැනි ශාස්ත්‍රවන්තයන්ගේ ගණයට වැටෙන්නෙකි.

විවිධ සිද්ධිවලට වස්කවි කියමින් සිටි බරණ ගණිතයා වරක් අමාරුවේ වැටුණේ කතරගම දෙවියන් ද සම්බන්ධ කර වස් කවි කියන්නට යෑමෙනි. ගණිතයා ඇසුරු කළ එක්තරා කාන්තාවක් ඔහු හැර යන්නට ගියාය. කෝපයට පත් ගණිතැදුරු සිය කෝපය එල්ල කළේ මහ බලැති කතරගම දෙවියන් වෙතය. ඒ පහතින් සටහන් වෙන කවිය.

අත්බර අයුද දරමින් සිටි කඳ
කුමර
විත්තෙද අසුර යුද වනි ජය ගතෝ පෙර
පත්කර නොදුනි නම් මගෙ සුපුරුදු සොඳුර
අත්අර වා ගනිම් මම තගෙ කදිර පුර

පවරා කදිර පුර පුද ලබනා තුම්මා
නොහැරා මම් කියම් මගෙ දුක වැඳ නිම්මා
පවරා නුදුනි නම් මගෙ දිගැසිය නම්මා
උදුරා ගනිම් මම තගෙ වල්ලී අම්මා

සිය සොඳුර අහිමි වීමෙන් ලද පශ්චත්තාපය හා කෝපයත් නිසා, කතරගම දෙවියන් ගේ කදිර පුරය අල්ලා ගන්නා බවටත්, ඔහුගේ ප්‍රිය දිගැසිය නම්මා නොදුනහොත් කතරගම දෙවියන්ගේ ප්‍රිය දිව්‍යාංගනාව වූ වල්ලි අම්මා උදුරා ගන්නා බවටත්, වහසි බස් මුසු වස්කවි දෙසා බෑ මුත් බරණ ගණිතයා පසුව සැබවින්ම බියපත් වන්නට ඇත. මහා බලගතු කතරගම දෙවියන් අරභයා පැවසූ වහසි බස් නිසා ඔහු තුළ පශචත්තාපයක් හා මහා බියක් ඇති වන්නට ඇත. කියූ වහසි බස් මුසු වස් කවි දැන් ආපසු ගන්නට ද නොහැක. මෙම මානසික පීඩාව ප්‍රකට නොවූව ද ඔහු එයින් කම්පිතව ජීවත් වන්නට ඇත. පසු කලෙක බරණ ගණිතයාගේ අත්වල පාවල වණ ඇතිවී, සම මිය ගොස් බලන්නට බැරි තරමට අප්‍රිය වූ කුෂ්ට රෝගයෙක් හට ගත්තේය. ඇවිදින්නට වත් නොහැකි තරමට ඔහු ඔත්පළ වූයේය. නිසැකයෙන්ම තමන්ගේ වස්කවියෙන් කතරගම දෙවියන් කෝපයට පත්ව මේ බියකරු රෝගය වැළදෙන්නට ඇතැයි ඔහුට සිතෙන්නට ඇත.

බරණ ගණිතයා කතරගම දෙවිඳුන් වෙත යවන්නට සන්දේශ කාව්‍යයක් ලීවේය. නීල කොබෙයියෙකු අත කතරගම කදිර සුරිඳුන් වෙත යවන සන්දේශයක් සේ ලිවූ මෙය නීල කොබෝ සන්දේශයයි. බරණ ගණිතයා වාසය කළ සිටිනාමලුවේ සිට කතරගම වෙසෙන කදිර සුරිඳුන් වෙත යැවුණු නීල කොබෝ සන්දේශය කවි 148 කින් සමන්විතය.

සාමාන්‍යයෙන් සන්දේශ කාව්‍ය ලියැවෙන්නේ රටට, රජුට සහ රජ පවුලට සෙත් පැතීම, සතුරු උවදුරු දුරුවීම, යුධ වදින සෙන්පතියකුට සෙත් පැතීම, අනාගත රාජ්‍යත්වය සඳහා පුත් කුමරකු පැතීම වැනි රටට පොදු යයි සැලකෙන කාරණා මුල් කරගෙනය. එහෙත් නීල කොබෝ සන්දේශය ඊට වෙනස් ව යමින් සන්දේශ කතුවරයාට වැළඳුණු කුෂ්ට රෝගය සුව කර දෙන ලෙස කදිර සුරිඳුන්ට ආයාචනා කර සිටියි.

මහාචාර්ය පුංචි බණ්ඩාර සන්නස්ගල සඳහන් කරන ආකාරයට (සිංහල සන්දේශ සාහිත්‍ය) තමාගේම අභීෂ්ට සංසිද්ධිය වෙනුවෙන් කහ කුරුලු සන්දේශයෙන් පසු ලියැවුණු සන්දේශ කාව්‍යය මෙයයි. කතුවරයා සන්දේශ දූතයා ලවා පහත අයුරින් ඔහුගේ ගත පත් රෝගය සුව කර දෙන මෙන් ඉල්ලා සිටියි.

වාත රෝග ඔහුගේ සියොලඟ විහිදී
ගාත වල දෙයටිපලු සම්ගුළු ම සැදී
නීත කුරිරු මේ මේ රෝගෙන් ම සැදී
බීත නිසරු විසරු තද වෙහෙස විඳී
(142 කවිය)

කඳ බල රෝගපත් උගෙ එවෙනි සියගත
පෙද නීල වන් වෙලසිඳ ලමිනි නොනැවත
තෙද බල මහිම යසසින් ඔබගෙ බරනෙත
සිදු කළ මැනවි පවතින උසිත අබිමත
(143 කවිය)

නීල කොබෝ සන්දේශයේ නීල කොබෝ දූතයා සිටිනාමළුවේ සිට කතරගමට පැමිණෙනුයේ රාත්‍රී සතරක් නවාතැන් ගැනීමෙන් පසුව ය. පළමු රැය තංගලු වැල්ලේ ද (24 කව), දෙවන රැය නිල්ලාට වනයේ ද (34 කව), තෙවන රැය වැලිගත්ත ගමේ ද (66 කව), සතරවන රැය වෙහෙර අසබඩ සිත්තලා විල නුදුරෙහි ද (82 කව) නවාතැන් ගනියි. නීලකොබෝ සන්දේශයේ ඇති උසස් වර්ණනා ලෙස මහාචාර්ය පුංචි බණ්ඩාර සන්නස්ගල වර්ණනා දෙකක් නම් කරයි. එකක් ඓතිහාසික හා ස්වාභාවික කරුණුවලින් පෝෂිත කතරගම් පුර විස්තරයයි. (92 – 114 කවි) අනෙක කදිර කුමරුන් කෙරෙහි කවියාගේ භක්තිය නිරූපණය කෙරෙන කතරගම දෙවියන් පිළිබඳ වැනුමයි. (116 – 136 කවි) දූතයා ගමනේ දී ගම් දනවු සතළිස් තුනක් පමණ පසු කළ බව සඳහන්ය.

බරණ ගණිතයාගේ කෘතියක් සේ දැක්වෙන්නේ නීල කොබෝ සන්දේශය පමණි. එහෙත් ඔහුගේ වස්කවි රසවත්ය. තම්පලා සොරා ගත් තැනැත්තෙකුට ඔහු කවි තුනක් කියයි. පළමු කවිය ඔහු මෙසේ නිම කරයි.

වැටට වැටබැඳ තම්පලා ගස් උනිමු මම දැඩිවෙන තුරා
හැටට දාකර වැදූ වේසිගෙ පුතෙක් උදුරා ගති සොරා

දෙවන කවියෙන් ගණිතයා සොරාගේ අඹුව පතයි.

කීවා මෙපද බොරු නැහැ අනෙ හරි සත්තේ
එවාපන් මල්ලි උඹෙ අඹු මේ පැත්තේ

තෙවන කවියේ අවසන් දෙපදයෙන් කියන්නේ සොරාගේ අඹුවට දරු පැටියෙක් ලබා දෙන බවයි.

කාටවත් නොකියා ම රහසේ අඹුව ගෙන දුන්නොතින් මා හ ට
ඇට ටික කලෙකින් ම පුළුවනි ගණිත පැටියෙක් හදා ගන්නට

වස් කවියට හා නැකැත් සතට පසිඳු බරණ ගණිතයාගේ නීල කොබෝ සඳෙසින් ඔහුගේ රෝගය සුව විණිදැයි නිශ්චිත තොරතුරක් නම් නැත.

**මහානාම දුනුමාල**

## බර්ග්මාන් ලුහුබැඳීම



උඩුපෙළ සහ යටිපෙළ

50 දශකය මැද භාගයේ පමණ එක් සැඳෑවක කොළඹ ලයනල් වෙන්ඩ්ට් රඟහලේ ප්‍රදර්ශනය කෙරුණු චිත්‍රපටයක් නැරඹීම සඳහා තිස් දෙනකුට නොවැඩි ප්‍රේක්ෂක පිරිසක් රැස්ව සිටියහ. ඒ අතර ලෙස්ටර් ජේම්ස් පීරිස් නමැති තරුණ සිනමා ලෝලියාද විය.

චිත්‍රපටය 'Sawdust And Tinsel' ය. අධ්‍යක්ෂවරයා ස්වීඩන් ජාතික ඉංග්මාර් බර්ග්මාන් (Ingmar Bergman) ය. එය ලෙස්ටර් ඇතුළු ශ්‍රී ලාංකික ප්‍රේක්ෂක පිරිසේ පළමු බර්ග්මාන් අත්දැකීම විය. මෙම චිත්‍රපටය බර්ග්මාන්ගේ 13 වැනි නිර්මාණය වූ අතර ඊළඟ දශකය වන විට ඔහු ලෝක සිනමාවේ ශ්‍රේෂ්ඨයකු බවට පත්ව සිටියේය.

1973දී ඉන්ටර්නැෂනල් ෆිල්ම් ගයිඩ් මඟින් තෝරන ලද වසරේ හොඳම චිත්‍රපට අධ්‍යක්ෂවරුන් පස් දෙනා අතරට ද බර්ග්මාන් එක්ව සිටියේය. 1983 වන විට ඔහු විසින් චිත්‍රපට 40ක් නිර්මාණය කොට තිබිණි.

1958 වසරේ කොළඹ ඔලිම්පියා සිනමාහලේදී බර්ග්මාන්ගේ 'වයිල්ඩ් ස්ට්‍රෝබෙරීස් (Wild Strawberries) චිත්‍රපටය තිරගත කිරීම ඇරඹිණි. එක් දිනයක එය නැරඹීමට අසුන්ගත් ප්‍රේක්ෂකයන් අතර තිස්ස අබේසේකර ද විය. ගැලරිය මුළුමනින්ම හිස්ව තිබූ අතර ශාලාවේ තැන තැන හිඳ සිටි පිරිස විසි පහක් තිහක් පමණ විය.

පසු කලෙක තිස්ස අබේසේකරයන් තම පළමු 'බර්ග්මාන් හමුව' ගැන මෙසේ ලිවීය.

'එදා එම චිත්‍රපටය නරඹා මා සිනමාහලෙන් පිට වූයේ ශුද්ධ පෙළහරක් දැකීමෙන් පහන් වූ සිත් සතන් ඇති බැතිමතකු මෙන් යැයි කිවහොත් එය අතිශයෝක්තියක් නොවේ. මුල් විනාඩි දහයෙන් පසු එතෙක් මා නුදුටු අපූර්ව ලෝකයකට පිවිසුණෙමි. ඊට පෙර මා එවැනි සහනුභූතියක් ලැබ තිබුණේ දස්තයෙව්ස්කිගේ, තෝමස් මාන් ගේ එසේත් නැතිනම් හෙමිංවේගේ නවකතාවක් කියැවීමේදී පමණි. එම සාහිත්‍ය කෘතීන් කියැවීමෙන් මා ලද රසයත් ජීවිත පරිඥානයත් සිනමාවෙන් කිසිදාක ලබාගත හැකි යැයි මම විශ්වාස නොකළෙමි. එදා මෙදා තුර බර්ග්මාන් චිත්‍රපට නරඹද්දී මා තුළ ඇතිවන්නේ ආගමික බැතියට සමාන ශුද්ධ වූ ආධ්‍යාත්මික තෘප්තියකි.'

ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ 'දෙලොවක් අතර' චිත්‍රපටයේ තිර රචනයට තිස්ස අබේසේකරගේ ද දායකත්වය ලැබිණි. 'දෙලොවක් අතර' තුළ බර්ග්මාන්ගේ 'වයිල්ඩ් ස්ට්‍රෝබෙරීස්' හි නිර්මාණාභාසය දක්නට ලැබිණි. ආචාර්ය ලෙස්ටර් පීරිස්ගේ මුල්ම චිත්‍රපටය 'රේඛාව' 1957දී කෑන්ස් චිත්‍රපට උලෙළේ තරගකාරී අංශයේ තිරගත වෙද්දී බර්ග්මාන්ගේ 'සෙවන්ත් සීල්' (Seventh Seal සත්වෙනි මුද්‍රාව) චිත්‍රපටය ද උලෙළට ඇතුළත්ව තිබීම සොඳුරු අහඹුවකි.

තිස්ස අබේසේකරට වැලඳුණු 'බර්ග්මාන් උන්මාදය' ලෙහෙසියෙන් සුවපත් වන්නක් නොවීය. ඔහු බර්ග්මාන් ලුහුබැඳ යන්නට ගත්තේය.

බර්ග්මාන්ගේ අවසන් චිත්‍රපටය වූ 'ෆැනී සහ ඇලෙක්සැන්ඩර්' (Fanny and Alexander) ලන්ඩන් නුවර තිරගත වන කාලයේ තිස්ස ද එහි ගොස් සිටියේය. ලද අවස්ථාවෙන් උපරිම ඵල නෙළාගත් ඔහු සරත් සෘතුවේ අධික ශීතල ද නොතකා දින පහක් පිට පිට පස් වතාවක් එම චිත්‍රපටය නැරඹීමට ගියේය.

ඊට වසර කීපයකට පසු ස්වීඩනයට යන තිස්ස බර්ග්මාන්ගේ තවත් චිත්‍රපට 14ක් නරඹයි. 1989දී ඔහු යළිත් ස්වීඩනයට යන්නේ බර්ග්මාන්ගේ ඉතිරි චිත්‍රපට නරඹනු පිණිසය.

තිස්ස අබේසේකරයන් තමන් බර්ග්මාන් සිනමාවෙන් විඳි 'ආධ්‍යාත්මික උණුසුම' (ඔහුගේම යෙදුමකි.) ශ්‍රී ලාංකික රසික ජනයාට ද බෙදාදීමට අදහස් කළේය.

1989දී කොළඹ එල්ෆින්ස්ටන් සිනමාහලේ පැවති ඉන්ග්මාර් බර්ග්මාන් චිත්‍රපට උලෙළ එහි ප්‍රතිඵලයකි.

ශ්‍රී ලංකාවේ පමණක් නොව දකුණු ආසියාවේම ප්‍රථම වරට සංවිධානය කෙරුණු බර්ග්මාන් සිනමා දැක්මක් වූ එයට යොදා තිබූ තේමාත්මක සිරස්තලය වූයේ 'අපරදිග අධ්‍යාත්මයේ මෘත රංගනය' යි. බර්ග්මාන්ගේ අති විශිෂ්ට සිනමා කෘතීන් 6ක් (Summer with Monika, Smiles of a Summer Night, Seventh Seal, Through a Glass Darkly, Winter Light Silence) ඊට ඇතුළත් විණි.

ඔහුගේ 'ෆැනී ඇන්ඩ් ඇලෙක්සැන්ඩර්' නමැති විශිෂ්ට චිත්‍රපටය ද උලෙළට නියමිතව තිබූ නමුත් මෙරට ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය එහි ඇතැම් දර්ශන අසභ්‍ය යැයි තීරණය කර ඒ තැන් ඉවත් කළ යුතු යැයි දැන්වීය. එහෙත් මේ අවියත් තීරණය දෙස සාවඥ ඇසින් බැලූ ස්වීඩන තානාපති කාර්යාලය ප්‍රතිචාර දැක්වූයේ ලොව කිසිදු රටකදී බර්ග්මාන්ගේ චිත්‍රපටයක එක අඟලක් හෝ කප්පාදුවට ස්වීඩනය ඉඩ නොදෙන බවත් ඒ අනුව යමින් චිත්‍රපටය උලෙළින් ඉවත් කර ගන්නා බවත්ය. එය එසේම සිදු විය.

පසුව සංවිධායකවරුන් වූ 'ස්වර්ණ සංඛ පදනම' හා ස්වීඩන් තානාපති කාර්යාලයේ මෙහෙයවීමෙන් 'ෆැනී ඇන්ඩ් ඇලෙක්සැන්ඩර්' හි විශේෂ දර්ශනයක් ආරාධිත අමුත්තන් පිරිසක් සඳහා පැවැත්විණි. එදා එම චිත්‍රපටය නැරඹූ මා ඇතුළු රසික සමූහය ශාලාවෙන් පිටතට පැමිණියේ අපේ වාරණ මණ්ඩලයේ අමනකම ගැන බැණ වදිමිනි. ඔවුන් කියූ ආකාරයේ සිනමාත්මක නොවන හෝ අශ්ලීල කිසිදු දර්ශනයක් අපට නම් ඒ චිත්‍රපටය තුළ දක්නට නොලැබිණි.

මෙම සිද්ධියෙන් ද සනාථ වූයේ කිසියම් කලා කෘතියක සමුදයාර්ථය අවධාරණය නොකර කිසියම් කොටසක් පමණක් සැලකීමට ගෙන එය 'කතුරට හසුකිරීමට යෑමේ මුග්ධ සාහසිකභාවයයි. විචාරකයකු සඳහන් කර ඇති අන්දමට 'ෆැනී ඇන්ඩ් ඇලෙක්සැන්ඩර්' හෘදයාන්ගම හැඟීම්වලින් පිරි මානව ගුණ ගහණ මහා සිනමා නිර්මාණයකි.

ලෝකයේ සිනමා අධ්‍යක්ෂවරුන්ගෙන් බහුතරය බර්ග්මාන්ගේ චිත්‍රපට තුළින් මහත් ආස්වාදයක් ලැබූ අතර ඇතැමකුගේ නිර්මාණ තුළ ඔහුගේ ශෛලියේ ආභාසයද පිළිබිඹු වේ. ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ විශිෂ්ටතම සිනමා කෘතිය වන 'නිධානය' ද බර්ග්මාන්ගේ සිනමාවේ ඇති අඳුරු ගූඪත්වය තේමා කර ගත්තකි.







බර්ග්මාන් චිත්‍රපට රස විඳීමට සැරසෙන්නකු ඔහුගේ සිනමා ශෛලිය පිළිබඳ පූර්ව අවබෝධයක් ලබා තිබීම වැදගත් වන්නේ යැයි සිතමි. ඔහුගේ චිත්‍රපට අවබෝධ කර ගැනීමේදී ස්වීඩනයේ දේශගුණය පවා දැන සිටීම ප්‍රයෝජනවත්ය. වසරින් හරි අඩක් පමණ දැඩි ශීත අඳුරු පරිසරයක වෙසෙන ස්වීඩන ජනතාවගේ සංස්කෘතිය ද ඊට සරිලන සේ සකස් වී ඇත. එම අඳුරු ශීත ස්වීඩන් ගතිය බර්ග්මාන්ගේ සිනමාව තුළ ද පිළිබිඹු වේ.

(ඔහුගේ මුල්කාලීන චිත්‍රපට සියල්ලම වාගේ කළු සුදු නිර්මාණයන්ය.)

බර්ග්මාන්ගේ පියා කිතුනු ලුතර් නිකායික පාස්ටර්වරයෙකි. තම දරුවන්ගේ විනය පිළිබඳව දැඩි අවධානයක් දැක්වූ ඔහු ඔවුන්ට තම බඳ පටියෙන් පහර දීමටත් අඳුරු කාමරයක දැමීමටත් කටයුතු කළේය. දැඩි ආගමික හික්මවීම බර්ග්මාන්ගේ ළමා කාලය අඳුරු කළ නමුදු එය යම් තරමකට ආලෝකමත් වූයේ තෑග්ගක් ලෙස ලද මැජික් ලන්තෑරුමකිනි. එමගින් 'ස්ලයිඩ් රූප රාමු' බිත්තියට ප්‍රක්ෂේපණය කරමින් නැරඹීමට ඔහුට හැකි විය. ඇතැම් විට ඔහු තම සොහොයුරියට ඇසෙන සේ එම රූප සඳහා පසුබිම් කථනයෙහි ද යෙදුණේය. මෙය බර්ග්මාන් රූප භාෂාව පිළිබඳව ලද ප්‍රථම අත්දැකීම ලෙසද සැලකේ. පසු කලෙක ඔහු ලියූ තම ස්වයං ලිඛිත අපදානයට ද 'මැජික් ලැන්ටන්' නම යෙදුණු අතර කුඩා ළමයකු මැජික් පින්තූර නරඹන දර්ශනයක් ෆැනී ඇන්ඩ් ඇලෙක්සැන්ඩර් චිත්‍රපටයට ද ඇතුළත් කෙරිණි.

නාට්‍යකරුවකු වශයෙන් ද දිගු කලක් කටයුතු කර ඇති බර්ග්මාන්ගේ චිත්‍රපට ද අති නාටකීය අවස්ථාවන්ගෙන් බහුලය. විටෙක ඔහු අධි තාත්වික ආඛ්‍යාන ශෛලියකට නැඹුරු වෙයි. දීර්ඝ දෙබස් බයිබල් පාඨ කවි ආදිය නිසා බොහෝ රසිකයෝ ඔහු සාහිත්‍යයික සිනමාකරුවෙකැයි සිතන්න පෙලඹෙති. එහෙත් බර්ග්මාන් එම මතය ප්‍රතික්ෂේප කරන්නෙකි. සිනමාව හා සාහිත්‍ය එකිනෙක ගැටෙන මාධ්‍ය දෙකක් බව පැවසූ ඔහු සාහිත්‍ය කෘතියක් චිත්‍රපට ගත කරන්නේ නම් බොහෝ වෙනස්කම් කිරීමට සිදු වන බව කීය. එසේ වුවද බර්ග්මාන්ගේ කාව්‍යාත්මක සිනමා සංකල්ප රූප හා සංකේත භාවිතය නිසා ඔහුට 'සිනමාවේ මහා කිවිඳා' යන විරුදනාමය ද යෙදිණි. ගාර්ෂියා මාකේස් ආදීන්ගේ සාහිත්‍යයෙහි ඇති ඉන්ද්‍රජාලික බව බර්ග්මාන් සිනමාවේදී නොඅඩුව දැකගත හැකිය.

බර්ග්මාන් අදේවවාදියකු මෙන් දෙවියන් පිළිබඳ විශ්වාසය ප්‍රශ්න කළේය. මරණය, නිරය, මිථ්‍යා විශ්වාස, ලිංගිකත්වය වැනි කරුණු ඔහුගේ චිත්‍රපට තුළ සුලබව කතිකාවට ගැනේ.

'සෙවන්ත් සීල්' චිත්‍රපටයෙහි 'මරණය Death' එක් චරිතයකි. නයිට්වරයකු සිය ජීවිතය බේරා ගැනීම සඳහා මරුවා සමඟ චෙස් ක්‍රීඩාවේ යෙදෙයි. අවසානයේ ඔහු පරාජය වෙයි.

වින්ටර් ලයිට් (සිසිරාලෝකය) චිත්‍රපටයේ ප්‍රධාන චරිතය වන පියතුමා ද ආධ්‍යාත්මික ව්‍යාකූලතාවෙන් පීඩා විඳින්නෙකි. දිවි නසාගැනීමට තැත් කරන ධීවරයකු ඉන් ගලවා ගැනීමට ඔහු අසමත් වෙයි. පියතුමාගේ පැරණි පෙම්වතිය ඔහු පසුපස එයි. එහෙත් එය ඔහුට කරදරයකි. ජීවිතයේ නිස්සාරත්වයට විසඳුම දෙවියන් වෙතින් ලබාගත හැකි ද යන්න ඔහුටම ගැටලුවක් වෙයි.

බර්ග්මාන් චිත්‍රපට නොදැක තිබූ සිනමාලෝලී තරුණියෙක් මගෙන් මෙසේ විමසීය.

'මා පටන්ගත යුත්තේ කොතනින් ද?'

මම මෙසේ පිළිතුරු දුනිමි.

'කැමති තැනකින් පටන් ගන්න. ඒ හැම තැනම බර්ග්මාන් මුද්‍රාව දැකගත හැකියි.'

සැබැවින්ම බර්ග්මාන් සිනමාව යනු මහා සාගරයකි. එහි එතෙර සොයමින් වෙහෙසීම අවශ්‍යම නොවේ. මඳ දුරක් යන යාත්‍රිකයකුට පවා බොහෝ අපූර්ව දෑ දැකගත හැකිය.

**කපිල කුමාර කාලිංග**

# බද්දර මල්ල

සතියේ 'තුනපහ' මඩිස්සලේ







# මුහුණු පොතේ අපි ආදරය රැගෙන දරුවන් සොයා ගියෙමු





මුහුණු පොත සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණ සමූහය (IQ Tests & General Knoledge) සමග මා සම්බන්ධ වී කටයුතු කරන්නේ 2013 තරම් දුර ඈත අතීතයක සිටය. නවගත්තේගම නවෝදයා විදුහලේ පවැත්වුණු පහ වසර ශිෂ්‍යත්ව වැඩමුළුවට සමගාමීව උසස් පෙළ සිංහල විෂය හදාරන දූ පුතුන් සමග කාව්‍ය රසාස්වාදනය පිළිබඳ වූ කතිකාව සමූහයේ ක්‍රියාකාරකම් හා බැඳුණු මගේ පළමුවන අත්දැකීම විය. එතැන් පටන් අවස්ථා කිහිපයක් දීම ඔවුන් විසින් සංවිධානය කළ සාහිත්‍ය දේශන, ගී රස විඳීමේ වැඩ සටහන් කීපයකටම මා සහභාගී වූයේ දැඩි කැමැත්තකින් හා ආශාවකින්ය. නගරයෙන් ඈත එපිට දිඹුලාගල, මොනරාගල, මඩුල්ල, පලුගොල්ල වැනි ගම්මානයක දූ පුතුන් හමුවීම මෙන්ම එවන් දිගු ගමනක දී සමූහයේ ළෙන්ගතු මිත්‍රසමාගමය හා ගෙවුණු කාලය අතිශය සුන්දර වූ බව සටහන් කළ යුතුමය. ඇතැම් දිගු ගමනක් සඳහා පෙර දා රාත්‍රියේ සිට පසු දා පහන් වන තෙක් ගමන් ගැනීමට සිදු වූව ද එවැනි එකදු ගමනක් හෝ නීරස කම්මැළි චාරිකාවක් බවට පත් නොවූයේ සහභාගී වූ මිතුරු කැලගේ විනෝදකාමී සහභාගීත්වය ද නිසාය.

නොයෙක් වයස් මට්ටම්වල සිටි යෞවන යෞවනියන් මෙන්ම වැඩිහිටි මව්වරුන් හා පියවරුන් ද සමූහයේ චාරිකාවලට සහභාගී වූව ද නිසැක වශයෙන් ම ඔවුන් අතර වැඩිමහලුම පුද්ගලයා මා වූ බව නම් මම දනිමි.

දිඹුලාගල පසු කොට කිලෝමීටර් අටක් පමණ ගිය පසු හමුවන මඟුල්දමන මහ විදුහල, සියපත සාහිත්‍ය හා කලා උලෙළෙහි ආරාධිත දේශනයට මා සහභාගී වූයේ 2015 සැප්තැම්බරයේ දිනයක දීය. ඇතැම් පාසලක එවන් කලා කටයුත්තකට සමූහය අනුග්‍රහය හා සම්බන්ධීකරණයෙන් දායක වන අතර බොහෝ අවස්ථාවල දුෂ්කර ගම්මානවල අකුරු කරන දූ පුතුන්ගේ අවශ්‍යතා සඳහා, පොත්පත්, පාසල් බෑග්, පාවහන්, පාසලට අවශ්‍ය සංගීත භාණ්ඩ, වෙනත් උපකරණ හා ඇතැම් අවස්ථාවක මූල්‍යමය පරිත්‍යාගයෙන් ද සමූහයේ සාමාජික සාමාජිකාවන් දායක වූ බව මම දනිමි. ඕපාදූප, පෞද්ගලික මඩ ගැසීම්, චරිත ඝාතන, ජනප්‍රිය පුද්ගලයන්ගේ අඹු සැමි සබඳතා පිළිබඳ රස කරමින් මුහුණු පොත බිත්ති අවලස්සන කරන බහුතරය අතර මෙම සමූහය මා දන්නා කාලයේ සිට ඉටු කොට ඇති හා සම්බන්ධ වූ අර්ථවත් ව්‍යාපෘති රැසක්ම වූ බව දනිමි.

ඉතා දුක සේ අකුරු කරන්නට පාසල් එන දුවා දරුවන්ගේ ශුභ සිද්ධිය වෙනුවෙන් සමූහය නිහඬවම ඉටු කරන සේවය අති විශාලය. ජනප්‍රියත්වය පසුපස හඹා නොයමින් ආධාර අවශ්‍යම පාසල් තෝරා ගනිමින් ව්‍යාපෘතියට ඉතා සුදුසු සම්පත්දායකයන් ද සොයා ගනිමින් තම සහෝදර ජනතාවට උදව් උපකාර කිරීම මුල් තන්හිලා සලකන සමූහයක් බැවින් අත්‍යවශ්‍යම හේතුවක් නිසා සහභාගීවන්නට නොලැබුණ හොත් හැර අන් සෑම අවස්ථාවක දීම ස්වෙච්ඡාවෙන් ඔවුන්ගේ ව්‍යාපෘතිවලට දායක වීමෙන් මා ලබන තෘප්තිය, මානසික සැහැල්ලුව, අප්‍රමාණය. එය මිලට ගත නොහැක්කකි.

කොවිඩ් 19 වසංගතයෙන් මුළු ලොවම බැටකන්නට පටන් ගත් පසු සමූහයේ සමාජ සත්කාර වැඩ සටහන් සඳහා නැවතීමේ ලකුණක් වැටුණ ද අවසන් වතාවට මා එකතු වූ ගමන් දෙකක් පිළිබඳ මතකයේ ඇත. පලුගොල්ල ගම්වාසීන්ගේ කියවීම සඳහා පුස්තකාලයකට පොත්පත් පරිත්‍යාග කිරීම ද පලුගොල්ල මහා විද්‍යාලයේ සිසුසිසුවියන් වෙනුවෙන් ගී රස වින්දන වැඩ සටහනක් ඉදිරිපත් කිරීම ද 2017 ඔක්තෝබරයේ පලුගොල්ලට ගිය ගමනේ දී සිදු විය. 2018 පෙබරවාරියේ දී සමූහය යළි පලුගොල්ලට නැගම් ගියේ යාය 10 නික/පලුගොල්ල මහවිදුහලේ 344 ක් වූ සමස්ත ශිෂ්‍ය පිරිසට අලුත් පාවහන් ද පාසල් පොත්පත් හා ලිපිද්‍රව්‍ය ද පරිත්‍යාග කිරීමටය. ඉන්පසුව ද ඔවුන්ගේ ගමන් බිමන් කිහිපයක් තිබුණු බව දනිමි. 2020 මාර්තුවේ සිට නිද්‍රාවක සිටින්නට වූ මුත් යළිත් පසු ගිය දවසක ඔවුන් හා එක් වී වෙනදා මෙන් විශාල පිරිසක් සමගින් නොවූව ද අප කිහිප දෙනෙක් එක් වී සහභාගී වූ අපූරු අත්දැකීමක තොරතුරු සටහන් කිරීම වටී යයි සිතමි. සමූහයේ නායිකා අනූ ඉලංගන්තිලක මිතුරියගේ ඇරියුමින් ඒ අසිරිමත් දවස උදා වූයේ පසුගිය 16 වන දාය.

## ඒ දවස සොඳුරුමය

කොළඹින් ඈතට නොයන, උදේ ගොස් හවසට ආපසු එමට හැකි, වෙනදා මෙන් සංවිධානය වූ ගමන් පහසුකමකින් තොරව දුම්රියේ කොළඹ සිට අම්බලන්ගොඩට ගොස් එතැන් සිට සමූහයේ මිතුරකු වූ, නිපුල් ගුණසේකර විසින් සංවිධාන කොට තිබූ ප්‍රවාහන පහසුකමින් ඇල්පිටිය අධ්‍යාපන කලාපයේ නවඳගල ගම් ඉම කනිෂ්ඨ පාසලට හා බද්දේගම අධ්‍යාපන කලාපයේ වැයිහේන ප්‍රාථමිකයට ගොස් හවස් කාලයේ හික්කඩුවේ සිට කොළඹට දුම්රියෙන් ඒම ගමනෙහි සැලැසුම විය. ගමනෙහි අරමුණ වූයේ ගම් ඉම කනිෂ්ඨයේ දූ පුතුන්ට පාසල් ලිපිද්‍රව්‍ය, ශිෂ්‍යාවන්ට කරපටි, ශිෂ්‍යයන්ට පලඳනා (Badges), සියලුම දරුවන්ට, එනම් 93 දෙනකුට පාසල් බෑග් පරිත්‍යාග කිරීමය. වැයිහේන ප්‍රාථමිකයට යෑමේ අරමුණ වූයේ පහ වසර දක්වා ඉගෙනුම ලබන දූ පුතුන්ට අත්කම් වැඩ මුළුවක් පැවැත්වීම හා පාසලේ දූ පුතුන්ගේ සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් ඇතුළත් ගායන නර්තන වැඩ සටහනක් ඉදිරිපත් කිරීමත් සම්පත්දායිකා මානෙල් ගමගේ සොයුරිය විසින් සියලු දරුවන් වෙනුවෙන් නිර්මාණාත්මක අත්කම් වැඩමුළුවක් පවැත්වීමත්ය. පෙරවරුවේ මරදානෙන් පටන් ගන්නා දුම්රියේ ගමනට එක් වූයේ මානෙල් ගමගේ, නදී සුදසිංහ හා මා පමණි. දුම්රියේ සේවය කරන චරිත් සාරංග සවනවඩු මිතුරා පාසලට පරිත්‍යාග කළයුතු පොත්පත් රැගෙන ආවේය. ඊට ඔහුට සහාය වී තිබුණේ නිශංකා කෞශල්‍යා මිතුරියයි. වාද්දුවේ දී අනූ ඉලන්ගංතිලක මිතුරිය අපට එක් වූවාය.

ගමනට ගත වූයේ හෝරා දෙකක් පමණ වුව ද දිගු කලකින් මුහුදුබඩ මාර්ගයේ දුම්රිය ගමන ආස්වාද ජනක වීය. අම්බලන්ගොඩ සිට අප සිව්දෙනා භාර වූයේ මිතුරු නිපුල් ගුණසේකරටය.

ගම් ඉම කනිෂ්ඨයේ විදුහල්පති අනිල් ගුණසිංහ හමුවීමෙන් අනතුරුව දූ පුතුන්ට කරපටි, පලඳනා, පාසල් බෑග්, පරිත්‍යාගය සිදුවිණ. නිපුල් ගුණසේකර සොයුරා විසින් ඔහුගේම මුදලින් පළමුවන ශ්‍රේණියට ඇතුළු වූ සිසුන් 12 දෙනකුට රුපියල් දහස බැගින් මුදල් වවුචර ලබා දීම ද එහි දී සිදු විය. එතෙක් ගෙදර දී කිසිදු ප්‍රමිතියකින් තොරව පොප්ලින් රෙදි කබැල්ලකින් මැසු කරපටි වෙනුවට සුදුසු රෙද්දකින් නියම වර්ණයෙන් හා ලාංඡනය මුද්‍රිතව නිමැවුණු කරපටිය නිල ඇඳුමට එක් වූ මොහොතේ ඔවුන්ගේ මුහුණේ ඇඳුණු මඳහස මට සිහිකරන්නට හැකිය.

ගම් ඉමෙන් සමුගෙන අප ඊළඟට පැමිණියේ වැයිහේන ප්‍රාථමිකයටය. විශේෂ දරුවන් වෙනුවෙන් ඒකකයක් ඇති දකුණු පළාතේ එකම පාසල වැයිහේන ප්‍රාථමිකයයි. එහි විදුහල්පති බන්දුසිරි රූපසිංහ නවීන අදහස් ඇති ගුරු පියකු බව සැණෙකින් මට වැටහුණේ පාසලේ හා දරුවන්ගේ සංවර්ධනය වෙනුවෙන් ඔහු විසින් හඳුන්වා දී තිබූ අපූරු ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර ඇසීමෙනි.

විදුහල්පති රූපසිංහ සමග කතාබහේ දී ඔහු විසින් පාසලට හඳුන්වා දී තිබූ ආදර්ශවත් සංකල්ප දෙකක් පිළිබඳ මට පැවසුයේ මෙසේය.

'මම හැම ළමයකුටම කොළ පාට බෑග් එකක් දීල තියෙනව හැමදාම පාසලට ගේන්න. පාසලේ ඉන්න කාලය පුරා දරුවා ඉවත දාන කඩදාසි, ගෙදරින් කෑම ඔතාගෙන එන කොළ, පැන්සල් උල්කරල ඉවත දාන ද්‍රව්‍ය මෙකී නොකී සියලුම ඉවතලන දේවල් තමන්ට දී ඇති මල්ලෙ දාගෙන ගෙදර ගියාට පස්සෙ ඒව ඉවත් කරලා මල්ල ආපහු පිරිසුදු කරගෙන පසු දාට පාසලට ගේන්න ඕනෑ.' එය පරිසරය අපවිත්‍ර නොකොට පිරිසුදුව තබා ගැනීමේ අපූරු සාර්ථක ක්‍රමයැකැයි මට සිතිණ. දෙවැන්න ඔහු විසින් හඳුන්වා දී ඇති ලාංඡන (Badge) ගැලවීමේ ක්‍රමය. අප සාමාන්‍යයෙන් දැක ඇත්තේ ලාංඡන පලඳවනු ලැබීමක් වුවත් රූපසිංහ විදුහල්පතිවරයා විසින් හඳුන්වා දී ඇත්තේ ශිෂ්‍යයාගේ හැසිරීමෙහි ස්වභාවය අනුව ලකුණු ක්‍රමයක් මගින් ලාංඡනයේ වටිනාකම ක්ෂය වී ඔහුගෙන් හෝ ඇයගෙන් ලාංඡනය ගැලවී යෑමේ තත්වයක් උදාවිය හැකිය. එනිසා එය රැක ගැනීමට නම් පාසල් කාලය තුළ විනීතව විනයානුකූලව හැසිරිය යුතුය. ශිල්ප හැදෑරිය යුතුය. ළමයින්ට තරවටු කොට බිය ගන්වනවාට වඩා මෙවන් සරල ක්‍රමවේදයකින් සාර්ථක ප්‍රතිඵල ලැබෙනු ඇතැයි විශ්වාස කරමි. වැයිහේන ප්‍රාථමිකයේ දූ පුතුන්ගේ ගායන නර්තන මිහිර විඳි පසු ඔවුන් හා ඉතා කෙටි පිළිසඳරක යෙදෙමින් අපගේ වීරයන් සිහිපත් කළෙමි. ඉතිහාසයේ කියැවෙන වීරයන් පිළිබඳ මෙන්ම කලාව සාහිත්‍යය සිනමාව නාට්‍යය වැනි ක්ෂේත්‍රයන්හි මෑතකාලයේ වීරයන් කවුරුන්දැයි බොහෝ දරුවෝ දැන සිටියහ.

සමූහයේ සම්පත්දායිකා මානෙල් ගමගේ සොයුරිය සියලුම දූ පුතුන් සහභාගී කරවා ගනිමින් පැවැත්වූ ප්‍රායෝගික අත්කම් වැඩ මුළුවට දූ පුතුන් ඉතා ආසාවෙන් සහභාගී වූ අතර ඇතැම් දරුවකුගේ නිර්මාණයක් ඉතා ඉහළ මට්ටමක තිබූ බව පෙනිණ. නදී සුදසිංහ සොයුරිය, නිපුල් හා අනූ මානෙල්ට සහායවෙමින් වැඩමුළුව සාර්ථක කර ගැනීමට සහය වූහ.

එක් දිනක සත්කාරයක් වුව ඊට අදාළ පරිත්‍යාග සඳහා විශාල මුදලක් වැයව තිබූ අතර සමූහයේ සාමාජිකත්වය නොමසුරුව ඊට දායක වී තිබිණ. නිපුල් ගුණසේකර තම මුදලින් වැයිහේන ප්‍රාථමිකයට සර්පිනාවක් හා ප්‍රින්ටරයක් කලින්ම ලබා දී තිබුණු අතර සමූහයේ ක්‍රියාකාරකම් පිළිබඳ විශ්වාසය තබමින් මුදලින් හා සංවිධානයෙන් දායක වූ පිරිස සිහි කළ යුතු යයි සිතමි. ඇතැමෙක් මුදල් එකතු කොට එවා තිබිණ. අනුෂා සිල්වා හා ඇගේ මිතුරු කැල ඔස්ට්‍රේලියාවේ සිට මුදල් එවා තිබිණ. රොෂින් ප්‍රනාන්දු, මනුජා ඕෂදී, ලියනගේ සිරිමාන්න, ජනක ප්‍රසන්න කුරුප්පු, දිල්හානි මැණික්පුර, සචින්ත චතුරංග, ප්‍රදීප් රුවන්, නිරෝෂි සේනානායක ආදීහු මේ සමාජ සත්කාරය සඳහා දායක වී සිටි අතර පවතින වාතාවරණය නිසා සහභාගීවීමෙන් වැළකී සිටියහ. එක්දින විනෝද චාරිකාවක් නොවුණ මුත් දකුණු ලක සම්පත් හිඟ පාසල් දෙකක දූ පුතුන් හමුවීම හා ඔවුනට ශක්ති ප්‍රමාණයෙන් උපකාර කිරීමේ මහඟු පින්කමට සහභාගී වීමේ සතුට සිත දරාගෙන අප සිව්දෙනා, අනූ පාණදුරින් ද නදී මොරටුවෙන් ද මානෙල් හා මම දෙහිවලින් ද බැස අපගේ දුම්රිය චාරිකාව නිමා කළෙමු. ඉතා ආසන්න දිනෙක මීට වඩා පුළුල් සහභාගීත්වයකින් යුතුව මෙවන් සමාජ සත්කාරයකට යළි සහභාගී වීමේ සිහිනය අප සැමගේ සිත්හි වූ බව මට දැනිණ.

**බුද්ධදාස ගලප්පත්ති**

# ඉංග්‍රීසි





ඉංග්‍රීසි භාෂාව අන්තර්ජාතික භාෂාවක් බව ද එය අපගේ දෙවන භාෂාව බව ද නොකිවමනාය. ඉංග්‍රීසි නොදැන සිටීම ජීවිතයේ නොයෙකුත් අවස්ථාවන්හි මහත් ගැටලු ඇති කරන බව අපි අත්දැකීමෙන්ම දනිමු.

ලොව පුරා බිලියන 1.3ක් පළමු හෝ දෙවන බස ලෙස භාවිත කරන ඉංග්‍රීසි, රටවල් පනහක පමණ නිල රාජ්‍ය භාෂාව වශයෙන් සැලකේ.

එය ලෝකයේ වඩාත්ම භාවිතයට ගැනෙන භාෂාව ලෙස අප සිතා සිටිය ද එය එසේ නොවන්නේය. ලොව වැඩි ම ජන සංඛ්‍යාවක් අතර සන්නිවේදන කටයුතු සිදුවන්නේ සාම්ප්‍රදායික චීන භාෂාව වන මැන්ඩරින් ඔස්සේය. දෙවැන්න ලෙස ගැනෙන්නේ ස්පාඤ්ඤයේත්, ලතින් ඇමරිකානු රටවලත් භාවිත කෙරෙන ස්පාඤ්ඤ භාෂාවයි. ඉංග්‍රීසි භාෂාවට හිමිවන්නේ තෙවැනි ස්ථානයයි.

වර්ෂ 1815 සිට 1948 පෙබරවාරියේ 04 දා දක්වා අවුරුදු 130කට අධික කාලසීමාවක් ලක්දිව රාජ්‍ය පරිපාලන භාෂාව වූයේ ඉංග්‍රීසිය. බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස ලැබූ තැන් පටන් ස්වදේශීයත්වය ගරු කළ යුතුයැයි බොහෝ ලාංකිකයෝ ඉංග්‍රීසි ඉගෙනීම පවා අත්හැර දැමූහ.

1956 ආණ්ඩු පෙරළියත් සමග 'සිංහල' රාජ්‍ය භාෂාව බවට පත්වෙද්දී ඉංග්‍රීසි භාෂාව සුද්දාගේ භාෂාව යැයි පිළිකෙව් කරන්නට පවා සිංහලයෝ පෙලඹුණහ. එය නිවැරදි කරගත යුතු වැරදීමක් බව ලාංකික අපට අවබෝධ වූයේ පසුකාලීනවය.

පරිගණකය, අන්තර්ජාලය, ජංගමය සහ අන්තර්ජාතික පාසල් අප වටා භ්‍රමණය වන වත්මනෙහි අපේ සමහර දරුවන් මව් භාෂාවටත් වඩා ඇසුරු කරන්නේ ඉංග්‍රීසි භාෂාවයි. සැබවින්ම දරුවන්ට ඉංග්‍රීසි ඉගැන්වීම අද දෙමව්පියන්ගේ යුතුකමකැයි පැවසුව ද එහි වැරැද්දක් නැත.

කෙසේ වෙතත් දරුවන්ට බලහත්කාරයෙන් ඉංග්‍රීසි උගන්වන්නට උනන්දු වන අම්මලා තාත්තලා අපේ සමාජයේ සුලබය.

රට පුරා පරිගණකය , අන්තර්ජාලය, ජංගම දුරකතනය හෝ අන්තර්ජාතික පාසැල් නොතිබූ 80 දශකයේ දී මට මුණගැසුණු දරුවකු පිළිබඳව මට මේ මොහොතේදී සිහිපත් වේ.

## 'ප්‍රින්ස් වෙලින්ටන් ගෝල්ඩ්හාර්ට්'

ඒ දරුවාගේ නමය. පියාගේ පරම්පරා නාමය ජයවික්‍රම විය. එසේ නමුත් දරුවාගේ උප්පැන්න සහතිකයට ඒ නම එක් නොකරන්නට ඔහු වග බලාගෙන තිබුණි. ඒ තම දරුවාට සිංහල නමක් යොදන්නට තිබූ අකැමැත්ත නිසාවෙනි.

එපමණටම ඉංග්‍රීසියට නතු වී ගැති වී හුන් මේ පියා ද ඉංග්‍රීසි ගුරුවරයකු වූයේය. දරුවාගේ මව ද ප්‍රාථමික අංශයේ ගුරුවරියක් වූවාය.

දරුවාට ඉංග්‍රීසියෙන් තොර ලෝකයක් නොදෙන්නට පියා හැකි හැම විටම වග බලා ගත්තේය. අම්මා දරුවා සමග සිංහලෙන් කතා කළේ නම් ඒ තාත්තාට හොර රහසේය.

ඒ දිනවල ඔවුන් පදිංචිව සිටියේ ප්‍රාථමික පාසලක ගුරු නිවාසයේය.

## 'No Use of Sinhala'

('සිංහලෙන් කතා කිරීම තහනම්')

ගුරු නිවාසයේ දොරටුවට ඉහළින් එවැනි දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කෙරිණි.

ඒ පිටිසර ගමෙහි ඉංග්‍රීසියෙන් කතා කළ හැකි වුවන් සිටියේ නම් ඒ අතෙහි ඇඟිලි ගණනටත් වඩා අඩු සංඛ්‍යාවකි. එබැවින් ගමෙහි කිසිවෙක් වුවමනාවක් තිබුණ ද ගුරු නිවාසයට ගොඩ වන්නට මැලිවූහ.

එහි බාල්ක පුරා සුදු රටහුණු කුරුවලින් ඉංග්‍රීසි ආප්තෝපදේශ ලියා තිබුණි.

## 'Rolling Stones Gather No Moss.'

**(පෙරළෙන ගලේ පාසි නොබැඳේ.)**

එහෙත් තම දරුවා ඉංග්‍රීසිය නමැති පොකුණේම බහා තබන ලද නොපෙරළෙන ගලක් හා සමාන බව ඒ ගුරු පියා වටහා නොගත්තේය.

## 'Make Hay When The Sun Shines.'

(පිදුරු නිපදවා ගත යුත්තේ හොඳින් හිරු එළිය ඇති විට දීය.)

එහි අර්ථය අවැසි දේ නිසි කලට කළ යුතු බව ය. එහෙත් වේලාව අවේලාව නොබලා තම දරුවාට ඉංග්‍රීසි උගන්වන්නට බලපෑම් කිරීම නොනිසි බව ඔහු තේරුම් ගත්තේ නැත.



නිවසට කිලෝ මීටර් පහක් දුරින් ඇති කුඩා නගරයට ඔවුන් යන්නේ බොහෝ විට සති අන්තයේදී පමණකි. එසේ යන විටෙක ඔහු ඉරිදා පුවත්පතක් රැගෙන ආවේය. එය ද හැම විටම ඉංග්‍රීසි පුවත් පතක්ම විය. දරුවා සිංහල පොත පතට ප්‍රිය නොකළා නොවේ. එහෙත් ඔහු සිංහල පොතක් පතක් ඉඳ හිට හෝ කියවූයේ නම් ඒ තාත්තාට හොර රහසේය .

දරුවා හයවන ශ්‍රේණියේ දී වෙනත් පාසලකට ඇතුළත් කෙරුණි.

"'ප්‍රින්ස් එක්ක සිංහලෙන් කතා කරන්න එපා."

පියාගෙන් අලුත් පාසලේ ගුරුවරුනට ද ඉල්ලීමක් කෙරිණි.

අලුත් පන්තියේ දරුවන් විවේක ලද විටෙක ආ ගිය තැන් ද, කළ කී දෑ ද කතා බහ කරද්දී ප්‍රින්ස් ඒවාට හවුල් වන්නට ගියේ නැත. අලුත් පාසලේදී සිංහලෙන් කතා කිරීම සම්බන්ධයෙන් තාත්තා සම්බාධක පනවා තිබූ හෙයිනි. එහෙත් ඉංග්‍රීසි කතාවට හුරු අලුත් සාමාජිකයා පන්තියේ අනෙකුත් දරුවන්ට පිටස්තර ලෝකයකින් ආ අමුත්තකු ලෙස මිස මිත්‍රයකු ලෙස ඔවුනට පෙනුණේ නැත.

ඔහුට අලුත් මිතුරන් හඳුනාගැනීමේ අවස්ථාව තවදුරටත් සීමා කරමින් ගුරු පියා සෑම උදෑසනකම දරුවා පාසලට ගෙන ආවේය. පාසල ඇරුණු විගස ඔහු පාසලෙන් ගෙදරට ගෙන ගියේය.

කෙසේ වෙතත් දරුවා දක්ෂයෙකි. අලුත් පාසලේ ගුරුවරු දරුවාගේ දක්ෂතාව හැඳින ගත්තෝය. ඔහු අ.පො.ස. සා.පෙළ. විභාගය මහ ඉහළින් සමත් විය. විභාගයේ විෂයයන් නවයටම A සාමාර්ථයයන් හිමි ගත්තේය.

"පුතා නීතිඥයෙක් වෙන්ඩ ඕනෑ."

උසස් ප්‍රතිඵල නිසා පුතා කොළඹ ජනප්‍රිය පිරිමි පාසලකට ඇතුළත් කරගැනීම පියාට එතරම් අපහසුවක් වූයේ නැත. ඔහු එම පාසැලට ඇතුල්වූයේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් සියලු විෂයයන් හදාරන්නටය.

එහෙත් දෙසතියක් ගත වූ පසු පුතා පාසල අතැර ආපසු ගමට ආවේය.

"මට එහේ ළමයි එක්ක ඉන්ඩ බෑ අම්මේ. බෝඩිමේ අයත් මට රුස්සන්නෙ නෑ. එයාලා කවුරුවත්ම මට කැමති නෑ."

ඔහු පුන පුනා කීවේය. සමාජ ආශ්‍රයෙන් බොහෝ දුරස්ව හැදී වැඩුණු ඔහු ඒ ආගන්තුක සමාජයට අනුගත වීමට උත්සාහ ගත්තේ හෝ නැතිවා විය හැකිය.

ඒ අවදියේදී ඉංග්‍රීසි මාධ්‍යයෙන් උසස් පෙළ විෂයයන් හැදෑරිය හැකි පාසලක් ආසන්න නගරයක නොතිබිණි. එසේ වුවද ඔහු තරමක් කිට්ටු නගරයක පාසලකට ඇතුළත් කෙරුණි. හේ කෙසේ හෝ උසස් පෙළ ද ඉහළින්ම ජය ගත්තේය. සියළුම විෂයයන් සඳහා A සාමර්ථයයන් ලබා ගන්නට ඔහු සමත්ව සිටියේය.

ඒ වන විට සුකුමාර තරුණයකු වූ ප්‍රින්ස් පේරාදෙණිය සරසවියට තෝරා ගැනුණේ ඔහුගේත්, දෙමව්පියන්ගේත් සිත් අතිශය ප්‍රමෝදයට පත් කරවමිනි. ඔවුන්ගේ ජීවිතවලට නැවුම් බලාපොරොත්තු රාශියක් අමුණා තබමිනි.

එහෙත් විශ්ව විද්‍යාලයට ඇතුළත්ව ගෙවී ගියේ එක් මසක් පමණකි. එක්තරා මධ්‍යාහ්නයකදී ප්‍රින්ස් ආපසු ගෙදර ආවේ තමා සතු පොත් පත් ද ඇඳුම් පැලඳුම් ද සියලු සබ්බ සකලමනාවම තම විශාල ගමන් මල්ලේ පුරවාගෙන ය; විශ්ව විද්‍යාල ජීවිතයට ආයුබෝවන් කියලාය.

"මට ආපහු විශ්ව විද්‍යාලෙට යන්ඩ බෑ අම්මේ. මට එහේ නවක වදේ දරාගන්ඩ අමාරුයි." ප්‍රින්ස් හඬා වැටුණේය.

මව්පියන් කොතෙකුත් බල කළ ද ප්‍රින්ස් ආපසු පේරාදෙණි ගියේම නැත.

**සුනිලා විජේසිංහ**

# බද්දර මල්ල

සතියේ 'කුනපහ' මඩිස්සලේ



## ටොම්සන් මහත්තයා

## ගොබෙල්ස් සහ ගොළුබෙල්ස්

ටොම්සන් මහත්තයා... මේ මොනරාගල දිස්ත්‍රික්කයේ ගිය අවුරුද්දේ ගස් හැට තුන් දාහක් කපන්න බලපත්‍ර දීලා කියලා මේ අන්තර්ජාල ප්‍රවෘත්තියක පළ වෙලා තියෙන්නේ... ඉතින් කොහොමද වන විනාශයක් සිද්ධ වෙන්නේ නෑ කියලා කියන්නේ...?" කියමින් උන්නැහේ ස්මාට් දුරකතනයත් දිගු කර ගෙන ගෙන සාලයට ආවේය.

"තව මොනවද කියලා තියෙන්නේ..." කියා ටොම්සන් මහත්තයා ඇසුවේය.

"මොනරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල එකොළහකින් ගස් හැටතුන් දාහක් කපන්න බලපත්‍ර දීලාලු... මගෙ අප්පෝ.... ගස් හැට තුන් දාහක්...?" කියා උන්නැහේ විස්මයෙන් හුස්මක් ඇරියේය.

ටොම්සන් මහත්තයා ගානක්වත් ගන්නේ නැතිව සාලයේ හාන්සි පුටුවේ හිඳ ගෙන උන්නැහේ දිහා බලා ගෙන සිටියේය.

"ඒ කියන්නේ උන්නැහේ බලපත්‍ර දීලා නේ... එහෙම බලපත්‍ර දෙන්න ප්‍රාදේශීය ලේකම්වරුන්ට බලතල තියෙනවානේ... ඒකෙන් කියවෙන්නේ නෑනේ... වන විනාශයක් වෙනවා කියලා... යම් කිසි පිළිවෙළකට තමයි ගස් කපන්න බලපත්‍ර දෙන්නේ... දැන් ඔය ප්‍රවෘත්තියේ තියෙනවාද ප්‍රාදේශීය ලේකම්ලා හොරට බලපත්‍ර දීලා කියලා...?" කියා කියමින් ඇම්බන් මහත්තයාද එතැනට ආවේය.

"නෑ... ඇම්බන් මහත්තයා... එහෙම නම් කියලා නෑ... ඒ වුණාට ගස් හැට තුන් දාහක්... මගෙ අප්පෝ..." කියා උන්නැහේ දෑතින් හිස අල්ලා ගත්තේය.

"එහෙම නෙවෙයි උන්නැහේ... ගිය අවුරුද්දේ ඉඳන් ද මොනරාගල දිස්ත්‍රික්කයේ ගස් කපන්න බලපත්‍ර දීම පටන් අරන් තියෙන්නේ... ඊට කලින් අවුරුදුවල එහෙම බලපත්‍ර එකක්වත් දීලා නැද්ද?" කියා ටොම්සන් මහත්තයා ඇසුවේය.

"අනේ ටොම්සන් මහත්තයා... මේ ප්‍රවෘත්තියේ නම් එහෙම විස්තරයක් පළ වෙලා නෑ... අර කිව්වත් වාගේ ඊට කලින් අවුරුදුවලත් ඔය විදිහට ගස් කපන්න බලපත්‍ර දීලා ඇති නේද? එතකොට මේකේ අලුත් ප්‍රවෘත්තියක් නෑ නේ... ඇයි ටොම්සන් මහත්තයා.. මේ ගිය අවුරුද්දේ බලපත්‍ර ගණන විතරක් දාලා මේ විදිහට ප්‍රවෘත්ති පළ කරන්නේ... කියවන උදවිය නන්නත්තාර වෙනවානේ..." කියා උන්නැහේ කීවේ විමතියෙනි.

"ඒක තමයි උන්නැහේ නූතන ගොබෙල්ස් පරපුරේ න්‍යාය... අර හිට්ලර්ගේ කාලේ ගොබෙල්ස් කළෙත් ඕකම තමයි... ඊළඟට පහු ගිය ජන්දෙකට ඉස්සෙල්ලා ලැම්බෝගිනි, රත්තරන් අශ්වයෝ ගැන ප්‍රචාරය කෙරුවෙත් ඔහොම තමයි... අර පොලිසියේ තියෙන්නේ සංවිධානාත්මක අපරාධ කියලා වර්ගයක්. ඒ වගේ තමයි මේවත් සංවිධානාත්මක අපරාධ. ඒ කියන්නේ සංවිධානාත්මක බොරු.... ඒ වුණාට මුළු සමාජයක්ම නන්නත්තාර කරන්න පුළුවන්...." කියා ටොම්සන් මහත්තයා කීවේය.

"අනේ මන්දා ටොම්සන් මහත්තයා... එතකොට අර සිංහරාජ වනාන්තරයේ මහා වන සංහාරයක් ගැනත් අර ගෑනු ළමයෙක් හෙළිදරව් කළා කියන කතන්දරේත් ඒ වාගේ එකක් ද?" කියා උන්නැහේ ඇසුවේය.

"දැන් දැන් හෙළිදරව් වේගෙන එන්නෙත් ඒ වගේ තමයි... අනික ඒ ගෑනු ළමයා වෙනුවෙන් පෙනී සිටින උදවිය ගැන ඇහුවාම ඒ සංවිධානාත්මක න්‍යාය පත්‍රය යන්තම් පේනවා නොපෙනෙනවා වාගේ... මං දැක්කා ගිය සතියේ සති අන්ත පත්තරේක තිබුණා ඒ ඉඩම පුද්ගලික එකක්ය. ඒක වන රක්ෂණ සීමාවෙන් පිටත තියෙන එකක්ය. ඒකේ අයිතිකරු කරන ඉදිකිරීමක් ගැනය ඒ කියලා තියෙන්නේ... ඒ ගෑනු ළමයාම කියනවානේ... මෙම ප්‍රදේශය අයිතිවෙන්නේ සිංහරාජ වනාන්තරයටම ද කියලා මං දන්නේ නෑ... පෞද්ගලික ද? රජයේ ද? කියන එකත් මම දන්නේ නෑ කියලා. ඉතින් ඊට එහාට මොන කතා ද? ඉස්සර වාගේ නෙවෙයි... මේවා ඉතාම සියුම් න්‍යාය පත්‍ර.... නිකම් හිතන්නකෝ අර ඇමෙරිකන් කාරයෝ කියුබාවේ පිදෙල් කස්ත්‍රෝ බොන හවායි සුරුට්ටුවට වස දැම්මා කියන එක. ඒ වගේ තමයි මේවා සියුම් වැඩ... කරන්නේ කවුද? පිටිපස්සේ ඉන්නේ කවුද කියලවත් හිතා ගන්න බෑ... "

උන්නැහේ සාලයේ ඒ මේ අතට ඇවිදින්න පටන් ගත්තේය.

"එතකොට ටොම්සන් මහත්තයා... අර පාස්කු ප්‍රහාරය පිටිපස්සේ හිටියේ අහවලා... ඒකට මුදල් වියදම් කළේ අහවලා කියලා අර අශෝක කුමාරයා කරපු ප්‍රකාශය ගැන පොලිසියෙන් ප්‍රශ්න කළාම කිව්වේ ඒ ගැන මං ළඟ කිසිම සාක්ෂියක් නෑ... ඒක නිකම් කිව්වේ කියලා... රට ගිනි තියන ඒ වගේ බොරු ප්‍රකාශ කළාට කමක් නැද්ද? මං මේ දැන ගන්න අහන්නේ..." කියා උන්නැහේ ඇවිදින එක නතර කර ඇසුවේය.

"ඒක නිකම්ම අතේ පත්තු වුණා... ඒකටත් මාධ්‍යයෙන් මොන තරම් විශාල ප්‍රචාරයක් ලැබුණා ද? හැබැයි උන්නැහේගේ තනියට පොලිසි ගිය උන්නැහේලාවත්, අර මොකක්ද ප්‍රකාශයක් අකුරෙන් අකුර විශ්ලේෂණය කරලා තමන්ට මරණ තර්ජනයක් කරලා තියෙනවා කියලා පැමිණිලි කරපු උදවියවත් මේ අතපත්තු බොරුව ගැන එක වචනයක් කීවේ නෑ..."

"ඒ කියන්නේ රට ගිනි ගන්නවා දකින්න ඒ අය ආසයි ද ටොම්සන් මහත්තයා...?" කියා ඇම්බන් මහත්තයා හරස් ප්‍රශ්නයක් ඇසුවේය.

"නැතුව.... රට ගිනි ගත්ත තරමට තමයි උන්නැහේලගේ කරල පැහෙන්නේ... හැබැයි කරලත් ගින්නට අහු වෙනවා කියලා දැනෙන්නේ පස්සේ.... හොරට ගස් කපන උන් කොයි කාලෙත් ඒක කෙරුවා... ඔය දේශපාලක උන්නැහේලා කොයි කාලෙත් ඒ හොරුන්ව රැක ගත්තා... ඒකනේ ඇත්ත..." කියා ටොම්සන් මහත්තයා කීවේය.

"මට තේරෙනවා ටොම්සන් මහත්තයා... මේවා සංවිධානාත්මක ගොබෙල්ස් ව්‍යාපාර.... ඒකට මේ වගේ සමාජ මාධ්‍ය තියෙනවානේ... සල්ලි ටිකක් වියදම් කරන එක විතරයි තියෙන්නේ... රට ගිනි තියා ගෙන යන්න පුළුවන්... අර හනුමා වලිගෙන් රටම ගිනි තිබ්බා වාගේ... අර ඇමේසන් වනාන්තරයේ ගස් කපන එකේ පින්තූරත් අපේ රටේ ගස් කැපිල්ලට දාලා කියලා එක ඇමැත්තෙක් කියලා තිබුණා... ඒක ඇත්ත නම් මේ රටේ මාධ්‍ය නිදහසෙන්වත් නිදහස් මාධ්‍යවලින්වත් වැඩක් නෑනේ... අන්තිමට මේ හැම මාධ්‍යයක්ම ගොනාට අන්දවන්නේ මේ රටේ මහජනතාව නේ..." කියා උන්නැහේ කීවේය.

"ඕක ගැන මොකටද දුක් වෙන්නේ උන්නැහේ.... කවුරු හරි උන්නැහේට කියලා නියම කරලා තියෙනවා ද ඔය ස්මාට් පෝන් එකෙන් සමාජ මාධ්‍යවල සංවිධානාත්මක පච ප්‍රවෘත්ති බලන්න කියලා... නෑ නේ... තමන් කැමති නම් විතරයි නේ බලන්නේ.... ඒකට තියෙන්නේ ඕවා නොබලා ඉන්න එක... යමක හරි තොරතුරු දැන ගන්න නිල මාධ්‍ය පරිහරණය කරන්න ඕනෑ... අනික හරි තොරතුරු දැන ගන්න මහජනයාට ඒකට අවශ්‍ය සාක්ෂරතාවකුත් තියෙන්න ඕනෑ... ඒවා තමයි මේ ප්‍රශ්න... මහජනතාව අඳුරේ තියා ගෙන ඉන්න තරමට බලකාමීන්ට වාසියි.... මහජනතාව තමන්ට කැමති කැමති පැත්තට දක්කන්න පුළුවන්..."

"ටොම්සන් මහත්තයා කියන දේ හරියටම හරි... මේ රටේ දැනුවත් - බුද්ධිමත් මහජනතාවක් ගොඩ නැංවීම තමයි මේ ගොබෙල්ස් න්‍යායට උත්තරේ.... ඒ වුණාට එහෙම මහජනතාව දැනුවත් කිරීම - බුද්ධිමත් කිරීම සිද්ධ වෙන්නේ ගොළුබෙල්ස් න්‍යායට අනුව නේ... ඒකයි ප්‍රශ්නේ... නැද්ද මං අහන්නේ...?" කියමින් ටොම්සන් මහත්තයා හුනස්නෙන් නැගිට එළියට ගියේය.

**බන්දුල පී. දයාරත්න**

# සෞම්‍ය රාත්‍රිය





## කැදැල්ලක නෙත

නිල් අහස අරා පොළොව දවන තවන හිරුගේ මහිමයෙන් උණුසුම් වන දිවා කාලය කොතෙක් ගොරහැඩි ද යන වග පසක් කර දෙන්නේ රාත්‍රියයි.

අඳුරට එරෙහිව දිළෙන සඳ තරු ද රාත්‍රියට එක් කරන්නේ සුන්දරත්වය විනා අන් කවරක් ද?

අනේක විදුලි බුබුළින් ද නා නා ශබ්ද හා කලිකලහයන් මධ්‍යයේ ද තවදුරටත් සෞම්‍ය නොවන රාත්‍රියට පවා සෞම්‍ය සුන්දරත්වයක් ගෙන එන්නට සමත් වන ස්මියුල් රේඩියෝ පිළිබඳව මුල්වරට මා දැනුම්වත් කලේ ප්‍රිය මිතුරු ජයන්ත අබේරත්න ඇදුරුතුමා ය. ඉතා අපූරු රස වින්දනයකින් හෙබි "ජයන්ත අබේරත්න සෞම්‍ය රාත්‍රිය අහන්න." යි කී කල එය සැබැවින්ම සෞම්‍ය රාත්‍රියක් වග මම අනුමාන කළෙමි.

පෙබරවාරි 7 වන දා සෞම්‍ය රාත්‍රියේ ආරම්භක වැඩසටහන දෙසවන ද හදවත ද සනහාලූ බව අපමණ සොම්නසකින් සඳහන් කරමි.

වින්ද්‍යා කල්පනී අබේරත්න වැඩසටහන ඉදිරිපත් කරමින් ඒ හරවත් හා මියුරු ගීත උදෙසා ගෙනහැර පාන පූර්විකාවක් අනගිභවනීය ය. ඇගේ හඬ පෞරුෂය ස්ත්‍රී සුකුමාලත්ත්වයෙන් ඔබ්බට යමින් අප වෙත පුදන අවබෝධය ද ආලෝකය ද අති විශාලය.

තාක්ෂණය වූකලි අවැඩක්ම නපුරක්ම ගෙන එන වසංගතයකැයි දෝෂාරෝපණය කරන අයුරු නිබඳ දකිමු. අසමු. එහෙත් තාක්ෂණය අතිශයින් ඵලදායක ලෙස භාවිතයට ගන්නා කල්පනා අනුන්ගේ ඕපාදූප හාරා අවුස්සමින්, වසුරු වළක ලගින අන්තර්ජාල සූකරයන්ට ද එල්ල කරන්නේ කදිම අතුල් පහරකි.

අමෙරිකාවේ දිලංක චාමර ද ඕස්ට්‍රේලියාවේ රජිත් පංකජ ද ස්මියුල් රේඩියෝ හි නිර්මාතෘවරු වෙති. එංගලන්තයේ ජේන් දිසානායක ඇමරිකාවේ අසංක සංජය මෙන්ම ශ්‍රී ලංකාවේ ලහිරු හසන්ත ද අයේශා තෙන්නකෝන් උදේනි මාපිටිගම හා කල්පනා අභයරත්න ස්මියුල් රේඩියෝ කණ්ඩායමයි. ඔවුන් සංගීත සුයාමය, යයයි සින්දුයි sing with තාල, සෞම්‍ය රාත්‍රිය හා දාර්ශනික ටෝක් යන වැඩසටහන් ඉදිරිපත් කරමින් ශ්‍රාවකයාට අපූරු අත්දැකීමක් තිළිණ කරති. එය හුදු සෞන්දර්යාත්මක අත්දැකීමකට සීමා නොවන්නකි.

ඇත්තටම ස්මියුල් රේඩියෝ එකට මුදල් ඉපයීමේ පරමාර්ථයක් නෑ. ආකල්පමය වෙනසක් එක්ක රස වින්දනය පුළුල් කරන්නයි අපි වෙහෙසෙන්නේ. වඩාත් සිත්ගන්නා සුලු කාරණාව තමා

සංගීත සුයාමය යැයි සින්දුයි දාර්ශනික talks වගේ විවිධ වැඩසටහන් ඉදිරිපත් කරන අපි සියලු දෙනා එක එක පළාත්වල හා විවිධ රටවල්වල සිටිමින් තාක්ෂණයේ උපරිම පල ලබා ගනිමින් සාමූහික ප්‍රයත්නයක් උදෙසා ස්ථානය හෝ දුර බාධාවක් නොවන බව පසක් කරවන එක.

ඇය අතිශයින් ළගන්නා අන්දමින් ස්මියුල් රේඩියෝ නිර්මාණය වූ ආකාරය විස්තර කළාය.

රේඩියෝ වංහුං හෙළිකරන කල්පනී අබේරත්න ගේ අපූරු හඬ නොනැවතී ගලා එයි

විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ ගිහාන් මධුශංක අපේ අත්හදා බැලීම්වලට මුලින්ම බෙල්ල දුන්නේ එයා. ලහිරු හසන්ත තමා අපේ තාක්ෂණික වැඩ සේරම කරන්නේ. අපි හැමදෙනාගේම පවුල්වල අයගෙන් ලැබෙන සහයෝගය අගය කරන්න ඕනෑ. සිංහල ස්මියුල් අපේ මුහුණු පොත ස්මියුල් රේඩියෝ තමයි චැනල් එක.

අධිවේගී යැයි අප හෙළා දකින අපේ තරුණ පරපුර හරවත් දෑට ඇලුම් කරන අයුරු හා ඒ වෙනුවෙන් වෙහෙසෙන අයුරු අප තුළ තව

අපේක්ෂා ජනිත නොකරන්නේ ද?

ස්මියුල් රේඩියෝ හි සෞම්‍ය රාත්‍රිය උදෙසා මග පෙන්වූ ආරාධනා ස්වර දැහැන සංගීතමය ගුවන්විදුලි වැඩසටහන ද සිහිපත් කරන්නට තරම් කල්පනී අබේරත්න කෘතවේදී වූවාය. එමෙන්ම මධුර මනෝහර ගීත උදෙසා පූර්විකාව සපයන්නට පිටපත් රචනය කරන ජයන්ත අබේරත්න පියාට ද නිරන්තරයෙන් ධෛර්යමත් කරන චිත්‍රා කුමාරි අබේරත්න මවට ද ගෞරවාදරය වරින්වර පිරිනමන්නට අමතක නොකළාය.

සෞම්‍ය රාත්‍රියට තෝරාගන්නා ගීතවල මුල් නිර්මාණකරුවන්ට හිමි ගෞරවය නොඅඩුව ලබා දෙන්නට ද ස්මියුල් රේඩියෝ තරයේ වගබලා ගනියි. වෙනත් වෘත්තීන්හි නිරත වන අතරේ ගී ගයන මේ ආධුනික ගායක ගායිකාවන්ගේ පැහැදිලි මියුරු හඬ ඒ හැම ගීතයකටම එක්කරන අලංකාරය ද ප්‍රධානත්වය ද සාධාරණත්වය ද අපමණය.

ප්‍රදීප් වන්නිආරච්චි, කුමාරි පෙරේරා, තිලකරත්න, කල්පනා නිසංසලා ඇතුළු ගායක ගායිකාවෝ රැසක්ම සෞම්‍ය රාත්‍රියට චමත්කාරය ගෙන එති.




මනෝවිද්‍යා උපදේශක පුහුණුවේ නිරත වන අතරතුර ස්මියුල් රේඩියෝ වෙනුවෙන් දායකත්වය ලබාදෙන කල්පනී අබේරත්න පිළිසඳර නිමා කළේ මෙසේ කියමිනි.

'ඇත්තම කියනවානම් සෞම්‍ය රාත්‍රිය මනෝ ප්‍රතිකාරකයක් වගේම මානව ප්‍රගති කාරකයක්.'

අප පය ගසා තිබෙන අද්‍යතන සමාජයේ බහුතරයක් කායික මෙන්ම මානසික ව්‍යාධීන්ගෙන් පෙළෙන බව නොරහසකි. එහෙයින් තරුණ පිරිසකගේ පරිකල්පනය හැකියාව සහ වඩා යහපත් හෙට දවසක් වෙනුවෙන් වන අපරිමිත අපේක්ෂාවන් ද කැටිකරගත් ස්මියුල් රේඩියෝව අසන්න සෞම්‍ය රාත්‍රිය ඉසව්වේ සුන්දරත්වයෙන් පිනා යන්න.

අර්ථපූර්ණ පද වැලකට හා සුමදුර නාද මාලාවකට ද සුගායනයකට ද මිනිස් හදවත් චමත්කාරයෙන් පුරවාලීමට ද නව ජීවනයක් පුද දීමට ද හැකි බව පසක් කරගන්නට සෞම්‍ය රාත්‍රිය ද ඉවහල් වන බව සොම්නසකින් ද ස්නේහයෙන් ද සටහන් කරමි.

තාක්ෂණයට වහල් වී නිස්සාරනත්වය හඹායන්නේයැයි නිබඳ චෝදනාවට ලක් වන අපේ තරුණ පරපුර පරිකල්පනයෙන් ද නිර්මාණශීලීත්වයෙන් ද උතුරා නොයන්නේදැයි අප යළි සිතා බලමු. අපේ සහයෝගයත් ආශිර්වාදයත් පිරිනමන්නට පසුබට නොවෙමු.

**ශාන්ති දිසානායක**

## අපරාදෙ මං බැන්දෙ



හෝදන්න තිබුණු රෙදි දෙගුණෙකින් වැඩි වුණා
තුන්වේල උය උයා බෙදන්නත් සිදු වුණා
අඳින ඇඳුමටත් අවසර පතන්නට වුණා
"අපරාදෙ මං බැන්දෙ" ඉබේටම කිය වුණා
ඒක ඇහිලා බැණුම් අහන්නත් සිදු වුණා

යන ගමන එන ගමන කියල යන්නත් වුණා
යාලුවෝ මිත්‍රයෝ හලන්නත් සිදු වුණා
රෑට රෑ වෙන්න පෙර ගෙදර එන්නත් වුණා
"අපරාදෙ මං බැන්දෙ" ආයෙමත් කිය වුණා
ඒ පාර බණිනකොට මං ටිකක් බය වුණා

මගුලටත් මරණෙටත් නිතර මං වුව මනා
ඥාති හිතමිත්‍රයෝ මාව හොය හොය එනා
ඒ වැඩත් ටිකෙන් ටික අඩු කරන්නට වුණා
"අපරාදෙ මං බැන්දෙ" ඔහ් ඕං කිය වුණා
යාන්තම් ඒ සැරේ ගුටි නොකා බේරුණා

හතර අත පෙරළෙමින් හිටපු ඇඳ පටු වුණා
මහ කඳන් ඉරන හඬ රෑ මැද්දෙ සැර වුණා
කන් දෙකට කොට්ට දෙක අත් දෙකෙන් තදවුණා
"අපරාදෙ මං බැන්දෙ " කිව්වෙ නෑ සිහි වුණා
හිතන දේ ඇහෙන්නැති නිසා මං බේරුණා

ඕං එක පාරටම තද උණක් වැළඳුණා
නැගිට ගන්නට බැරුව මාව ඇඳටම වුණා
කෑම ටික බීම ටික ඇඳ උඩට පැමිණුනා
"හොඳ වෙලාවට බැන්දෙ" කියල මට සිහිවුණා
බඳින එක ඒ තරම් නරක නෑ වැටහුණා

බේත් අප්පිරියාව මකන්නට වුවමනා
රස කෑම ගෙනත් දී තුරුලු කර සනසනා
දුකට ළඟ රැඳෙන කොට ආදරේ වැඩි වුණා
"හොඳ වෙලාවට බැන්දෙ" ඇහෙන්නම කියවුණා
එයත් කියනව ඇහුණ, "මදෑ ඔය තේරුණා"

**දිල්රූ ජයසේකර**

